


WWW.SINHALAELIBRARY.COM 1

# ගල් කන්ද වලව්ව - ගයනා එස්. ලක්මාලි

කන්නාඩිය ඉදිරියට ගිය චේතිය යළිත් වරක් තම රුව පිරික්සා බැලුවේය.. නමුත් ඔහුට තම කොණ්ඩය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි බවක් දැනුණි.. එහෙයින් එම බොරු කොණ්ඩය ගලවා දැමූ ඔහු ක්රේවල් හිස කෙස් සහිත කොණ්ඩය පැළඳ ගත්තේය.. එය නම් ඔහුගේ හිසට මනාව ගැලපුණි..

"මොකද පුතේ ඔය කොණ්ඩ මාරු කරන්නෙ.. ? අදත් කොහේ හරි නාට්ටියකට යන්නද..?"

දොර රෙද්ද අතරින් මොහොතක් තම පුතු දෙස බලා උන් ගුණවතී විමසුවාය..

"ඔව් අම්මා.. හවස පොඩි රිහසල් එකක් තියෙනවා.."

මවගේ මුහුණ බලාගෙන එය කීමට නොහැකි නිසා චේතිය එය කීවේ බිම බලාගෙනය.. නමුත් ගුණවතීට එහි වෙනසක් දැනුණේ නැත.. ඈ තවත් මොහොතක් පුදු දෙස බලා හිඳ හිමිහිට යන්න ගියාය..

ඉතා දුගී පවුලක එකම පුතු වූ චේතිය මෙම වෙස් ගැන්වීම් කළේ නාට්යමය පුහුණුවකට හෝ්ව රැවටීමට නොව තම අනන්යකතාව සගවා ගැනීමටය.. පියාත් නොමැතිව තනිව පවුල ගොඩ ගැනීමට වෙර දරන අසරණ මව හා පුංචි නැගණිය රැකබලා ගැනීම තම යුතුකමක් සේ ඔහු සැලකුවේය.. බොහෝවිට නාට්යනය පුහුණුවීම් ඇති බව මවට පවසා ඔහු පාසල අවසන් වූ පසු අමතර රැකියාවක හෝ කුලී වැඩක නියැලුණි..

"අයියා.. මමත් එන්නද ඔයාගෙ නාට්ටිය බලන්න..?"

තවමත් හත් හැවිරිදි වියේ පසු වූ නැගණිය ඇගේ බෝල ඇස් පුංචි කර විමසද්දී චේතිය කල්පනා លොවින් මිදුණි..

“නාට්ටිය පෙන්නන්න තව ගොඩක් කල් තියෙනවා චූටි.. මං ඔයාව එදාට ගෙනියන්නම්කො..”

නැගණියගේ නාසය මිරිකූ ඔහු බොරු කොණ්ඩය හා වෙස් ගන්වන උපකරණ කට්ටලය සිය ගමන් බෑගයේ දමා ගත්තේය.. පාසලේ බාල දක්ෂ ඇදුමද වෙනම නවාගත් ඔහු පාසල් නිල ඇදුමින්සැරසුණි..

“අනේ මංදා.. නිවාඩු දවසකවත් ගෙදර ඉන්නෙ නෑ නොවැ.. ආ.. මේ බත් ඩිංගිත්ත කාලා යන්න..”

සුදු හාලේ බතට පොල් සම්බෝලයක් කොටා ගත් ගුණවතී එය මැටි කෝප්පයකට දමාගෙන පුතුට කැවීමට සූදානම් විය..

“අයියෝ අම්මා.. දැන් බත් කාලා ගිහින් මං ප්‍රැක්ටිස් කරන්නෙ කොහොමද..?”

චෛතියගේ හඬට ගුණවතී ඇනූ බත්කට යළිත් මැටි කෝප්පයට දැමුවේ සිත් වේදනාවෙනි.. පුතු  නොකන්නේ වෙනකක් නිසා නොව හොදි , මාළු නොමැති නිසා බව ඇය දනී.. කොතරම්     අගහිඟකම් තිබුණත් චෛතියට කටට රසට කෑම වේල තිබිය යුතුය.. රජ බොජුන් නොමැති වූවාට කරවල බැදුමක් සමග හෝ දැවිල්ලට යමක් ඔහු අපේක්ෂා කරයි..

“අම්මා ඕක චූට්ට කවන්න.. මං යන්නම්..”

සිය මවට බාගෙට නැමී වදින ලද චෛතිය කඩුල්ල ළගට ගොස් යළි හැරුණේය..

“අම්මා අද වලව්වට යන්න එපා.. චූටිත් ගෙදර තනියමනේ..”

ඔහු එය නැවත මතක් කර දුන්නේ මව ගල් කන්ද වලව්වට ගියහොත් තම සැලැස්ම අපතේ යන  නිසාවෙනි.. ඔහුගේ ඔවදනට මුනිවත රැකි ගුණවතී පුතු යන මග දෙසට නෙත් යොමා    උන්නේ ඔහු නොපෙනී යන තුරුය..

ගල් කන්ද වලව්ව යනු එම පලාතටම තිබෙන විසල් වලව්වයි.. ගුණවතීලා වසන මෙම නිවසද ගල් කන්ද වලව්වට අයිති වූවකි.. ගුණවතීගේ මියගිය සැමියා වූ ධර්මතිලකද ජීවිතයෙන් හරි අඩක්ම කළේ වලව්වට ආවතේව කිරීමය.. ඔහු මියගිය දා පටන් ගුණවතී එම වගකීම කරට ගත්තාය.. ඈ එය කැමැත්තෙන් නොකලද තම පුංචි පුතු රැකබලා ගැනීමට හා වාසස්ථානය අහිමි කර නොගැනීමටද ඇයට ගත හැකිව තිබූ එකම හා හොදම තීරණයඑයයි..

නමුත් ඉන් ඇයට හිමිවූයේ කුසට අහරක් හා හිසට සෙවනක් පමණක් නොවේ.. ඒ අදුරු යට ගියාව යළි සිහිපත් කිරීමට අකමැති වූ ඈ සුසුමකින් ලය සැහැල්ලු කර නිවසට පාතැබුවාය..

******************************

"අයියෝ චේති.. උඹ පරක්කුයි හොදටම.."

"ඒ මදිවට යුනිෆෝම් පිටින්.."

පාසල් ගේට්ටුවෙන් ඇතුළු වූ චේතිය දුටු සැනින් මිතුරෝ කෑ ගැසූහ.. ඒවා කනකට නොගත් චේතිය පාසල ඇතුළට ගොස් යොමා බැලුවේ බාල දක්ෂ කමිටුව භාරව කටයුතු කරන මහින්ද සර් පෙනෙන්නට ඇත්දැයි කියාය..

"විනාඩි දෙකක් දියන්.. මං පට ගාලා චේන්ජ් කරන් එන්නම්"..

මොහොතක්වත් පමා නොවූ චේතිය ළඟම තිබූ පංති කාමරයට රිංගා බාල දක්ෂ ඇඳුම ඇඟලා ගත්තේය.. ඔහු පිරිස අතරට එන විට මහින්ද සර්ද ඔවුනට එක් වුනි..

"අද මේ වැඩේට මං ප්‍රින්සිපල් සර්ගෙන් පර්මිෂන් ගත්තෙ හරි අමාරුවෙන්.. ඔයාලා මේ චාන්ස් එකෙන් උපරිම ප්‍රෂයෝජන ගන්න ඕනෙ.."

පහළොස් දෙනෙක්ගෙන් යුත් නඩය අමතා සර් සර් පවසද්දී ළමෝ එය වටහාගත් විලස හිස් සැලූහ.. බාල දක්ෂ අරමුදල තර කර ගැනීමට

ඔවුන් මෙම සෙනසුරාදා දිනය යොදා ගත්තේ       එවිට පාසල් වැඩ කටයුතු අතපසු නොවන හෙයිනි..

"චෛතිය මොනවද ඔයාලගෙ යෝජනා.?"

මහින්ද සර් එය චෛතියගෙන්ම විමසා සිටියේ ඔහු බාල දක්ෂ කමිටුවේ නායකයා වූ නිසාය..එපමණක් නොවේ.. ඔහුගේ අසාමාන්‍යම පෞරෂය හා සහජයෙන්ම උරුමව තිබූ නායකත්වයේ ගති ලක්ෂණ නිසා සෙසු පිරිස ඔහුගේ බසට අවනත වන ගතියක්ද තිබිණි..

ගමේ පාසලකින් උසස්පෙළ සඳහා නගරයේ පිරිමි පාසලකට ඇතුළත් වූ ඔහුට වසරක් ඉක්ම යාමට     මත්තෙන් මෙම තනතුර හිමි වූයේ ඔහුගේ එම අසාමාන්‍යම ගති ලක්ෂණ නිසාය.. එහෙන්මමහින්ද සර්ද සුදුස්සාට සුදුසු තැන දෙන ආකාරයේ මහත්මා ගති ඇති ගුරු භවතෙකි..

"සර්..  මට හිතෙනවා මෙතන පහළොවක් ඉන්න නිසා තුන්දෙනා ගානෙ කණ්ඩායම් හැදිලා පැති  පහකට ගියානම් හොඳයි කියලා.. ඒ වගේම අපි ඊයෙ කතා උනා මේ අවට තියෙන පැරණි    බංගලා වලව් වගේ ඒවා පැත්තෙ ගිහින් බලන්න.."

"ඒ මොකද..?"

මහින්ද සර් හරස් ප්‍රශ්නයක් නැඟුවේ ඔහුගේ එම කතාවේ යටි අරමුණ එකවර වටහාගත නොහැකි වූ නිසාය..

"මේකනේ සර්.. සාමාන්‍යු ගෙවල් වලට ගියාට ඒ මිනිස්සු අපෙන් වැඩ ගන්න කැමති නෑ.. ඇරත්  ඒ ගෙවල් වල අපිට කරන්න තරම් වැඩත් නෑ.. එයාලා අපිට නිකං රුපියල් විස්සෙ    පනහෙ ඒවා දෙනවා.. අපි එතකොට නිකං හිගන්නන්ගෙ තත්වෙට වැටෙනවනේ සර්.. අනික්අපි වැඩ නොකර පිනට සල්ලි ගන්න එක නම් මේ යුනිෆෝම් එකටත් කරන අගෞරවයක්..  ඉතිං අපි    හිතුවා මේ පළාතෙ වලව් එහෙම කීපයක්ම තියෙන නිසා ඒවලට යන්න.. ඒවයේඅවුරුදු ගණන් පුස්කාපු දූවිලි තට්ටු ටිකක් හරි අපට සුද්ද කරන්න බැරුවයැ..  අනික සර්.. ඔය

වලව්කාරයො හරි ලොකු මාන්නයක් තියෙන අය.. එයාලා සල්ලි කීයක් හරි දුන්නත් දෙන්නෙ එයාලගෙ නම්බුව බේර ගන්න පුළුවන් විදියට.."

"ඒ කිව්වෙ..?"

"ඒ කිව්වෙ සර්.. ඔය මොණරු.. බෙරකාරයො වගේ කොළ වලින්"..

චේතිය එය කීවේ හඩ තරමක් බාල කරය.. ඒ කතාවට මහින්ද සර්ගේ පමණක් නොව සියළුම දෙනාගේ මුවේ සිනාවක් විසිරුණි..

"හරි.. චේතියගෙ යෝජනාව බොහොම හොද එකක්.. ඒකට විරුද්ධ කවුරු හරි මෙතන ඉන්නවද..?"

සර් පමණක් නොව චේතියද ඔවුන් දෙස බැලුවේ කුතුහලය මිශ්‍රි දැසිනි.. ඔහු මෙම අදහස ඊයෙ පිරිස සමග කතා කල බව සර්ට කීවද ඔහු එය කතා කලේ තම සමීපතම මිතුරන් දෙදෙනා වූ රංග හා කලන සමග පමණක් වීම එයට හේතුවයි.. නමුත් ඔහුගේ අදහසට කිසිවෙකු එරෙහි නොවීම නිසා චේතියගේ සිතට දැනුණේ සහනයකි..

"හරි.. එහෙනං ඔයාලා කතා කරගත්ත විදියට වැඩේ කරන්න.. මගෙත් පොඩි අදහසක් තියෙනවා.."

මහින්ද සර් අමුතුම ආකාරයේ සිනහවක් මුව රදවා කියද්දි සැවොම එකිනෙකාගේ මුහුණු බැලුවහ..

"ඔයාලා කට්ටිය අද දවසට දහ දාහකට වඩා හොයන්න ඕනෙ.. මං කිව්වෙ එක කණ්ඩායමකින් අවමය දෙදාහක්.."

"අයියෝ සිම්පල්නෙ මචං.."

රංග සිය මිතුරා වූ චේතියගේ කනට කර කීවේ දැඩි ආත්ම විශ්වාසයකිනි..

“දැන් චෛත්‍ය කිව්ව විදියට මොණර කොළ හම්බ වෙනවානං එක ටීම් එකක් ගෙවල් දෙකකට ගියත් මැදැයි.. ඉතිං.. ඔයාලා මේ නිවාඩු දවසෙ පංති යන්නෙ නැතුව ගෙවල් වල වැඩත් පාඩු කරගෙන මේ ගමන ආපු එකේ වැඩක් වෙන්නත් එපැයි.. ඒ නිසා ඔයාලා අද දහදාහකට වඩා එකතු කරන හැම සතේම මං ඔයාල පහලොස් දෙනා අතරෙ බෙදලා දෙනවා..”

“හුරේ..”

ළමුන් පිරිස සතුටු සිතින් ජය ඝෝෂා නැංවූයේ එය එතරම් අසීරු ඉලක්කයක් නොවන හෙයිනි..

“හැබැයි එකක්.. මේ කතාව ඔයාලා පහළොස් දෙනාගෙන් පිට යන්න බෑ..”

මහින්ද සර් අවසන් මොහොතේ අනතුරු ඇඟවීමක්ද කළේ බොහෝ දුරට කල්පනා කිරීමෙන් පසුවය..ඔහුගේ තීක්ෂණ ඥාණය හා ළමුන්ට ඇති කරුණාව හොඳින් දැන උන් චෛත්‍ය ඇතුළු කණ්ඩායම එයට එකගව හිස් සැලූහ..

******************************

“ඇත්තටම ඇයි උඹ අද අම්මට බොරුවක් කියලා මේ ගමන ආවෙ..? ආන්ටි දන්නවනේ උඹ බාල දක්ෂයෙක් කියලා.. ඉතිං කියලා එන්න තිබුනනේ..”

රංග චෛත්‍යගෙන් විමසා සිටියේ කුරුණෑගල නගරය මධ්‍යකයටත් පැමිණි පසුවය.. එතෙක් ඔහු එය නොඇසුවේ චෛත්‍යගේ සැබෑ තතු දැන උන්නේ තමාත් කලනත් පමණක් හෙයිනි..

“කියලා එන්න තිබුණා අපි ගල් කන්ද වලව්වට නැතුව වෙන කොහේ හරි යනවනං.. කරුමෙට ඉතිං අපේ අම්මා වැඩ කරන්නෙත් එතනනෙ.. නිකං හරි අද එහෙට බාල දක්ෂයො ආවා කියලා එයාදැන ගත්තානං සැක හිතනවා..”

තම මව ගල් කන්ද වලව්වේ මෙහෙකාරකම් කරන බව ගමේ පාසලට යන කාලයේ පටන්ම දැන උන් මේ මිතුරන් දෙදෙනාට බොරුවක් කීමේ අවශ්‍යටතාවක් චේතියට නොවිණි..

“උඹ අම්මටත් රෙස්පෙක්ට් එක දාලා වලව්වට නොගිහින් හිටියට මොකෝ ඒකට රිංගන්න උඹේ යට හිත කැමතියි නේද?.”

මිතුරාගේ වදන් කොතරම් සත්‍යයි දැයි චේතිය සිතා බැලුවේය.. සැබැවින්ම ඔහු ශිෂ්‍යත්වය කරන සමයෙන් පසු ගල් කන්ද වලව්වට පය ගැසුවානම් ඒ වරක් හෝ දෙකක් පමණි.. මතක ඇති මෑත ඉතිහාසයේ නම් ඔහු එහි නොගිය තරම්ය.. නමුත් කුමක්දෝ නොතේරෙන හේතුවක් මත ඒ වලව්වේ සැගවී ඇති ගුප්තභාවය රසවිදීමට චේතියගේ සිතේ කැමැත්තක් ඇති වී තිබිණි.. එය මෑත කාලයේ පෙරටත් වඩා ඔහුගේ සිතට වද දෙන්නට විය.. බාලදක්ෂ කමිටුවේ මුවාවෙන් ඔහු මෙම ගමන යොදා ගත්තේ එම සිතැගි ඉටු කර ගැනීමටය..

“මචං.. ඇතුලගකාරයා උඹව අඳුර ගනියිද.?”

කලන ඇසූවට චේතිය ඔලොක්කුවට මෙන් සිනාසුණේය..

“අඳුරගන්නෙ මං මේ විදියට ගියොත්නෙ..”

මිතුරාගේ වෙස් ගැන්වීම් පිළිබද දැන උන් රංග කලන දෙස බලා ඇසග් ඉගි කළේ චේතියගේ බෑගය පෙන්වමිනි..

“ආ.. උඹ අදත් ටූල් කිට් එක අරගෙනද ආවෙ.?”

චේතියගේ වේශ නිරූපණ කට්ටලය මිතුරන් දෙදෙන හැදින්වූයේ ටූල් කිට් එක ලෙසය.. ඔහුගේ බෑගය තරමක් විශාල නම් ඔහු නොවරදවාම එය රැගෙන එන බව දෙමිතුරෝ දැන උන්හ..

“උඹේ ඔය ඩබල් ඇක්ටින් පාර තාමත් ඉස්කෝලෙට මාට්ටු උනේ නැති එක හොදයි.. දැනගත්ත දාට උඹගෙ පටි රෝල්”.

රංග  කියූවට චේතිය සැහැල්ලු ලෙස සිනාසුණේ එවැන්නක් කිසි දිනෙක සිදු නොවන බව  දන්නා නිසාය.. චේතියලාගේ දුප්පත්කම නිසා මෙන්ම ඔහුගේ මවගේ රැකියාව නිසා ගමේ  පාසලේදී මිතුරන්ගේ අවමන් වලට ලක් වූ චේතිය සාමාන්යන පෙළින් පසු පාසල මාරු කිරීමට තීරණය කළේ දෙවරක් නොසිතමිනි..

තමාට එම කඩඉම තරණය කිරීමට ඇති එකම මග හොඳින් සාමාන්යස සමත්වීම බව දැන උන් චේතිය එම  අවස්ථාව මග  හැරියේ නැත.. නමුත් පළමු වසරේ පටන් එකටම හැදී වැඩුණු තුන්  යහළුවන්ට වෙන්ව සිටීමට හිත හදාගත නොහැකි වූහ.. රංග හා කලනත් විභාග ප්රතිඵලහා මුදල් යන දෙකේ සංකලනයෙන් පින් සිදු වෙන්නට චේතිය ඇතුළු වූ නගරයේ ජාතිකපාසලටම රිංගා ගත්තේ එහෙයිනි..

ගමේ පාසලේ උන් සමයේ තම මිතුරා විදි මානසික පීඩනය දැන උන් මිතුරෝ මෙම පාසලේදී චේතියගේ දුප්පත්කම වසාලන්නට ඔහුට උදව් දුන්හ..

“මගේ පටි රෝල් වෙන්නෙ උඹලා දෙන්නා කට ඇරියොත් විතරයි.. මට උඹලා දෙන්නව මං තරමටම විශ්වාසයි.. ඒ නිසා අවුලක් නෑ”.

චේතිය එය කීවේ සිනාසෙමින් වුවද එය ඇසූ රංග හා කලනගේ මුහුණු බොහෝ හැඟීම්බර වූහ..

“රා..යිට් කිට්ටුවටම ආවා.. දැන් මට පොඩි සපෝර්ට් එකක් දියන්”.

කතාවෙන් කතාව ගල් කන්ද වලව්ව කිට්ටුවටම පැමිණ තිබූ ඔවුන් වසා තිබූ පාළු කඩයක්  අභියස මොහොතකට නතර විය.. කරේ දමා උන් බෑගය ගැලවූ චේතිය සිය බොරු කොණ්ඩය හා  කණ්නාඩි කූට්ටම අතට ගත්තේ මිතුරන් දෙදෙන පුදුමයෙන් බලා හිදිද්දීය..

“දැන් කොහොමද..?”

ක්රේදල් කොණ්ඩය පැළඳ කණ්නාඩි දැමූ පසු ඔහුගේ ස්වරූපය බොහෝ දුරට වෙනස් වී තිබිණි..

"කොණ්ඩෙනං එළ.. ඒත් ෆේස් කට් එක අඳුරයිද මංදා.."

එසේ කීවේ රංගය..

"රැවුලක් දාගන්න තිබ්බා මචං.. ඒත් මේ ඇඳුමෙ හැටියට ඒක කරන්න බෑ.."

එසේ කියනා අතරතුර චේතිය උපන් ලපයක් සේ පෙනෙන පොඩි ස්ටිකරයක් තම වම් කම්මුලේ අලවා ගත්තේය..

"ෂා.. දැන්නං අයිසෙක් නිව්ටන් වගේ.."

ඔවුන් සිනාසෙමින් යළිත් පාරට පිවිසියහ.. ගල් කන්ද වලව්ව පිහිටා තිබුණේ අක්කර ගණනාවක අති විශාල පොල් වත්තක් මධ්‍ය.යේය.. එම සුවිසල් වත්තේ එක් පැත්තක් දිගටම විශාල කළු ගල් කන්දකට මායිම් වුනි.. වලව්වට එම නම ලැබී ඇත්තේ එකී කළුගල් කන්ද නිසා බව ගම්මුන් කියනවා චේතිය අසා ඇත..

"ඇතුගලයට දුවෙක් නෑ නේද මචං.. ? වයස ප්‍ර ශ්නයක් නෑ.. නාඩි වැටෙනවානං එච්චරයි.."

සුවිසල් වලව්ව නෙත ගැටෙත්ම කලන කීවේ මිතුරන් දෙදෙන හිනස්සමිනි..

කොතරම් විහිළු කරමින් පැමිණියද වලව්වේ මිදුලට පය ගැසූ සැනින් චේතියගේ හිත අමුතුම හැඟීමකින් හිරි වැටී ගියේය.. එය මේ යැයි පැහැදිලිව වටහාගත නොහැකි තරමටඔහුගේ සිත අවුල් වී තිබිණි..

"චේති.. මෙහේ බල්ලො නෑ කියලා උඹට ෂුවර් නේද.?"

කෑ ගසමින් පැමිණි රංගගේද කටහඬ බොහෝ දුරට අඩු වී ඇත..

"බල්ලො මේ වෙලාවට ගෙදර නෑ බං.. ඌ දඩාවගේ ගිහින් ගෙදර එන්නෙ රෑට.."

චෛතිය කීවේ ඒ හා සමාන පහත් ස්වරයකිනි..

"ඒ මොන බල්ලොද..?"

එයට පිළිතුරු දීමට පමා නොවූ චෛතිය වටපිට බැලුවේ හේතු හාමි සිටීදැයි කියාය..

"චොචර්කාරයා කෝ බං.? මේ පට්ට දවාලෙ මිනිහා බුදිද.?"

එවර ප්‍රශ්නය නැගුනේ කලනගෙනි.. එයට පිළිතුරු දීම වෙනුවට චෛතිය කළේ කලන දෙස රවා බැලීමය.. ඈතින් දිව එන හේතුහාමි දුටු මිතුරන් තිදෙනා ප්‍රශ්න කිරීම නවතා අඩියක් දෙකක් ඉදිරියට ඇවිද ගියහ..

"මේ දරුවො... ඉස්කෝලෙකින් වෙන්ටැති."

බුලත් කහට රැදි දත් පෙලද පෙන්වා සිනාසුන හේතුහාමි ඔහුන් පිරික්සන ආකාරයේ බැල්මක් හෙළුවේය..

"කෝ අන්කල්.. වලව්වෙ කවුරුත් නැද්ද.?"

රංග විමසා සිටියේ මේ අවස්ථාවේ චෛතිය කතා කළහොත් කටහඬ අඳුරා ගනීවි යන සැකයෙනි..

"හාමු මහත්තයා ඔපිසියෙ වැඩ වගයක්.. ඩිංගක් ඉන්නකෝ.. "

එසේ කී හේතු හාමි උරහිස රැදි අඳුරු පැහැ තුවා කැබැල්ලෙන් තම කට පිසිමින් වලව්ව තුළට ගමන් ගත්තේය..

"මේක ටුවරිස් හොටෙල් එකකට මරු ප්ලේස් එක නේස චෛති..? අර පහළට වෙන්න පූල් එකකුත් හැදුවනං මාර ඩිමාන්ඩ් එකක් තියෙයි.."

ව්‍යාපාරිකයෙකුගේ්කම පුතු වූ රංග වලව්ව දෙස බැලුවේද ව්‍යාවපාරික ඇසිනි.. ඔහු එය නිකමට කියුවාක් වුවද ඒ කතාව කොතරම් සත්‍යියක්දැයි චෛතියට වැටහුණේ ඈතට දිව යන බෑවුම් සහිත පොල්

ඉඩම දකිද්දීය..

“උඹලගෙ අම්මා ඇවිත් නැතුව ඇති නේද.. ?”

“නෑ රංග.. අද චූටි ගෙදරනේ.. අම්මා එයාව වලව්වට එක්කගෙන එන්නෙ නෑ.. ”

මිතුරාට පිළිතුරු දුන්නද චෛතිය උන්නේ වලව්ව තුළට යාමේ දැඩි ආශාවකිනි.. පුංචි සන්ධියේ තමාට ආදරය දැක්වූ වලව්වේ ළමාතැනී විටින් විට චෛතියගේ අතීත මතකය අළුත් කලේය..

“මේ ළමයි.. ?”

වෙන වෙනම කල්පනා ලෝකවල සිරවී උන් තිදෙනා එම ගැඹුරු කටහඬින් සසලව ගිය තරම්ය.. ඒ පැමිණ උන්නේ අනෙකෙකු නොව වලව්වේ ඇතුගල හාමුය..

තම පාසල හා බාල දක්ෂ අරමුදල ගැන කෙටියෙන් හැඳින්වීමක් කළ කලන ඔවුනට කළ හැකි වැඩක් ඉල්ලා සිටියේය..

“හේතුහාමී.. මොනවද අපි මේ ළමයින්ට කරන්න දෙන්නෙ.. ?”

ඇතුගල හාමු හේතුහාමි දෙසට හැරී විමසිය.. උස මහත ශ්වේත වර්ණ සිරුරකින් යුතු ඇතුගල හාමු අභියස උන් හේතුහාමිව චෛතියට පෙණුනේ ගලිවර් ළඟ ඉන්නා ලිලිපුට්ටෙකු ලෙසිනි..

“වැඩනං එමටයි හාමු මහත්තයා.. ”

ඇතුගල හාමු ඉදිරිපිටදී කොන්ද නමාගෙන හේතුහාමි පැවසුවේ බොහෝ බය පක්ෂපාතීවය..

“මම කියන්නද.. ඒබරං අසනීපයි කියලා පණිවිඩයක් එවලා තිබුණා.. ඒ නිසා අපි අර පොල් ටික ලෙලි ගස්සව ගමු.. ”

මිතුරන් තිදෙන එකිනෙකාගේ මුහුණු පිරික්සුවේ එවන් වැඩක් ඔවුන්

කිසිසේත්ම අපේක්ෂා නොකළ බැවිණි.. නමුත් දැන් කළහැකි දෙයක් නැත.. තින්දුව දුන් ඇතුගල හාමු නොපෙනී ගොස්ද අවසන්ය..

"මේ පැත්තෙන් එන්න ළමයිනේ.. "

වලව්වේ පිටතින් ඔවුන් තිදෙනාව කැඳවාගෙන ගිය හේතු හාමි වත්තේ බෑවුමකට වෙන්න ගොඩගසාතිබූ විශාල පොල් කන්දක් අභියට නතර විය.. එහි පහළ සිට මුදුනට නෙත් යැවූ කලනගේ දෑස්ද පොල් ගෙඩි තරම්ම විසල් විනි..

"මේ පොල් කන්දටද බං අරූ පොල් ටික කියලා කිව්වෙ.. ?"

කලනගේ සිතැගි වටහා ගත්තාක් මෙන් චෛතියද කියා සිටියේය..

"මේං මෙතන පොල් උලවල් දෙකක් තියෙනවා.. "

පොළවටම ගසා තිබූ හැඩලයේ උල් දෙකක් පෙන්වූ හේතුහාමි ඔවුන්ව එතන තනිකර දමා නැවතත් වලව්ව දෙසට ගමන් ගත්තේය..

"ෂිට්.. අදනං රාහු කාලෙට එළියට ඇවිත් තියෙන්නෙ.. මදැයි කීයක් හරි වැඩියෙන් එකතු කරගන්න ආවා.. "

"මූ කුණු නප්පියෙක්ද කොහෙද.. අර ඒබරංද අබරංද මොකාගෙද මන්දා වැඩේ අපේ කර පිටින් තියලා ෂේප් කළා.. "

කලන හා රංග මැසිවිලි නගමින් පොල් ලෙලි ගැසීමට සැරසෙද්දී චෛතිය වලව්ව හොඳට පෙනෙන තැනකින් ඉඳ ගත්තේය..

"අප්පට සිරි.. මෙන්න ඒ පාර මූ හාමු වෙලා.. උඹේ ගොන් අයිඩියා එක නිසා තමයි අපිට අද පොල් ලෙලි ගහන්න උනේ.. "

"හරි හරි බං.. උඹලගෙ අත රිදෙද්දි මට දියන්.. අපි මාරුවෙන් මාරුවට ලෙලි ගහමු.. "

ඔවුන් විහිළුවෙන් විහිළුව පැය දෙකක් පමණ පොල් ලෙලි ගැසීමේ

නිරත වුවද පොල් කන්දේ නම් කිසිම අඩුවක් පෙනෙන්නට නොවිය.. නමුත් ඒ වන විට තිදෙනාගේම දෑත් රෝස පැහැ ගැනිවී කර ගැට මතු වී තිබිණි..

“ළමයිනේ..ආ මේක බීලා ඉමු.. ”

දහඩිය පෙරා වැඩ කරන ඔවුන් වෙත හේතුහාමි රැගෙන විත් තිබුණේ සීත කල කොකා කෝලා කෑන් තුනකි.. වෙලාවේ හැටියට ඔවුනට එය මහගු ඖෂධයක් විය..

“ඔය ළමයින්ට කන්න මොනව හරි හරිගස්සන්න තිබුණා ගුණවතීවත් හිටියනං.. කොහෙද වෙලාවටම ඒකිත් අද නෑනෙ.. ”

හේතුහාමි කොකා කෝලා පිළිගන්වන අතරතුර කීවේ චෛතිය දෙස විපරමින් බලමිනි.. ඔහු තමාව හඳුනා ගනීදෝ යන සැකයෙන් චෛතිය තරමක් පිරිස මග හැරියේය..

“කවුද අන්කල් ගුණවතී කියන්නෙ.. ?”

රංග කිසිත් නොදන්නා ලෙස විමසුවේ කොකා කෝලා කෑනය ඇඟිල්ලෙන් විවර කරන අතරතුරය.. තරමක් ඈතක උන්නද චෛතියද මෙම කතාවට දෙසවන් යොමා සිටියේය..

“ගුණවතී තමා මෙහෙ වැඩ කටයුතු බලා කියාගෙන උයලා පිහලා දෙන්නෙ..”

“එතකොට අන්කල්ගෙ නම.. ?”

“මම හේතුහාමි.. අපිත් ඉතිං මේ වලව්වට සින්න වෙච්චි උදවිය නොවෑ..”

එතරම් ළඟ පාත නොවුනද එකම ගමේ නිසා රංග හා කලනද ගල් කන්ද වලව්ව ගැන බොහෝ විස්තර දැන උන්හ.. නමුත් ඔවුන් හේතුහාමි සමග කතාබහ කළේ ඒ කිසිත් නොදන්නා අයුරිනි..

“හාමු මහත්තයගෙ නෝනා වලව්වෙ නැද්ද අන්කල්.. ?”

“අනේ.. අපේ ළමාතැනී සීදේවී නෝනා කෙනෙක්.. ඒත්.. ඒත්.. ”

හේතුහාමි එකවරම කතාව නවතා ගත්තේය.. ළමුන් සිතුවේ ඇතුගල හාමු තමන් සිටිනා ඉසව්වට එතැයි කියාය.. නමුත් ඔහු පෙනෙන ඉසව්වකවත් නොවිණි..

“ඇයි අන්කල්.. ?”

“ළමාතැනී.. නැති වුනා දරුවනේ.. ”

හේතුහාමිගේ කටහඬ වෙව්ලා යද්දී ඔහුගේ කතාවට කන් දී උන් චෛතියගේ දෑසද කඳුළු පටලයකින් වැසී ගියේය..

“අදට ඔය ඇති ළමයිනේ.. මේං මේක දැනට තියා ගන්න.. ”

සිසිල් බීම පානයෙන් අනතුරුව ඔවුන් නැවත වැඩය පටන් ගැනීමට

සැරසෙද්දී ඔවුන් අභියසට පැමිණි ඇතුගල හාමු එක් අයෙකුට රුපියල් දාහ බැගින් බෙදා දුන්නේය..

"හාමු මහත්තයා තරහා නැතුව දීපු ගාන මේ පොතේ ලියලා අත්සන් කරනවද..?"

කලන බෑගයෙන් එළියට ගත් බාල දක්ෂ කමිටුවේ සී ආර් පොත ඔහු වෙත දික් කළේය.. එය එතරම් මායිම් නොකළ ඔහු කලනගේ පිටට තට්ටුවක් දැම්මේ සිනාසෙමිනි..

"මං ඕක දුන්නෙ කමිටුවට නෙමෙයි.. ඔයාලා තුන් දෙනාට.. ඔයාලට ලියන්නම ඕනෙනම් කැමති විදියට ඕක ලියා ගන්න.. "

ඊට ගෞරව පූර්වකව සිනාසුන කලන පොත වසා නැවත බෑගයට දමා ගත්තේය.. මිතුරන් දෙදෙනා අභියස උන්නද චෛතිය වැඩිය හිස ඔසවා බැලුවේවත් කතාබහ කළේවත් නැත..

"ලබන සතියෙ විතර අපේ වලව්වෙ පොඩි උත්සවයක් තියෙනවා.. බැරිද ඔය ළමයි තුන් දෙනාට දවසකට දෙකකට ඇවිත් පොඩි උදව්වක් දෙන්න..?"

තිදෙනා විනිවිද යන බැල්මක් හෙලූ ඇතුගල හාමු කියා සිටියේය.. ඔවුන් මොහොතක් නිහඬව එකිනෙකා දෙස බැලුවේ එකවර තීරණයක් ගත නොහැකි නිසාවෙනි..

"මං කිව්වෙ මේ.. බාල දක්ෂයො විදියට නෙමෙයි.. තුන් දෙනක් එක්ක නිවාඩු වෙලාවක පොඩ්ඩක් ඇවිත් යන්න.. මං ඒවට සලකන්නම්.. "

ඔහු හක හක ගා අමුතුම ලෙස සිනාසුනේ මිතුරන්ගේ සිත් වල ඇතිව තිබූ පැහැදීම මොහොතකට බිඳලමිනි..

"අපි එන්නම්..                                                    "

බොහෝ කල් වේලා ගත් කලන අවසාන මොහොතේ කියා දැම්මේය.. පෙර දිනක බාල දක්ෂ කම්ටුවෙන් ලත් අමතර මුදලින් නිවෙසට අවශ්‍යක බඩු කිහිපයක් හඅමතර ආහාර පාන ස්වල්පයක් ගත් චේතිය නංගිට ගවුම් රෙද්දක්ද මිලට ගත්තේය.. ඔහු කුඩා කල සිට පටන්ම නැගණියට දැක්වූයේ අසීමිත සෙනෙහසකි.. ඇගේ මුතු මුතු කැරලි කොණ්ඩයත් සුදෝ සුදු රවුම් මුහුණත් බෝල ඇස් දෙකත් චේතියගේ සිත සුවපත් කිරීමට සමත්ය.. ගමේ මිනිසුන් නැගණිය සම්බන්ධයෙන් කියනා නොයෙකුත් කටකතා නිසාද චේතියගේ සිතේ ඇ ගැන ඇති බැඳීම දිනෙන් දිනම වැඩි විය...

"අයියා.. නතාලි අක්කා ආවා.."

චේතිය නිවසේ කඩුල්ල පනිද්දිම දිව ආ නැගණිය එය කීවේ ඔහුගේ අතැගිල්ලක එල්ලෙමිනි..

නතාලි අක්කා යනු අම්මාගේ වැඩිමල්ම සොයුරියගේ දියණියයි.. ඕ තවමත් විසි දෙහැවිරිදිය.. පේරාදෙණිය සරසවියේ දෙවන වසරේ සිසුවියක වන ඇ චේතියලාගේ දුක සැප සොයා බැලූ එකම ඥාතිවරිය වූවාය.. ඇ පැමිණෙන්නේද නිවෙස් වලට නොදන්වාහසිනි..

"මල්ලිට අද වාසියක් වෙලා වගේ.?"

ඔහු රැගෙන ගිය මාළු ස්වල්පය මේසයක් මත තබද්දීම නතාලි අක්කා කීවේ සුපුරුදු ලෙන්ගතුකමිනි..

"මේ ළමයත් ඔය ඉස්කෝලෙ අමතර වැඩ වලට ගිහින් හොයා ගන්න සොච්චරමත් ගෙදරටම ඉවරයි දරුවො.. අනේ ඉතිං අර මනුස්සයත් අකාලෙ ඇහැ පියව ගත්තනෙ.."

ගුණවතී සුපුරුදු පරිදි සිය ඥාති දියණිය ඉදිරිපිට තම දුක දිගහැරියාය.. ඊට නතාලිගෙන් දිගු හුස්මක් පිට විණි..

"අම්මෙ ඔය බෑග් වල මාළුයි එළවළුයි වගයක් ඇති.. අස් කර ගන්න.."

"අනේ හොඳයි මගේ පුතේ.. මං මේ දූට හරියට කෑම වේලක් දෙන හැටි කල්පනා කලා විතරයි.."

චෛතියගේ උරහිසේ සිට අතැඟිලි තුඩු දක්වාම සෙනෙහසින් අතගෑ ගුණවතී බෑග් ටිකද රැගෙන කුස්සි කෑල්ල වෙත ගියාය.. නතාලි ඉද උන් පුටුවෙන් නැගිට පිලට ගියේ චෛතිය සමග ටිකක් කතා කිරීමේ අරමුණින්ය..

"අක්කා මේ ගෙදර ඉඳලා එන ගමන්ද.?"

"නෑ මල්ලි.. හොස්ටල් එකේ ඉඳලා ආවෙ.. අපේ විභාගෙත් ඉවර නිසා ගෙදර ගිහින් එන්න කියලා බැලුවෙ.."

විශේෂ හේතුවක් නැතිවද තමාගේ තොරතුරු සියල්ල චෛතිය සමග කියන්නට ඇය පුරුදුව සිටියාය..

නොගැලපෙන විවාහයක් හේතුවෙන් පවුලෙන් පිටමන් කල ගුණවතී පුංචිට මුදල් අතින් අගහිගකම් තිබුණද ඇ මනුස්සකම් අතින් ඉදිරියෙන්ම සිටින බව නතාලිට නොරහසකි.. නිවැසියන්ට හොරෙන් වුවද ඇ මෙහි ආව ගියේ එනිසාය.. බාප්පා මිය ගොස් වසර කිහිපයකින් දියණියක් මෙලොවට බිහි කිරීම නිසා පුංචි පවුලෙන් පමණක් නොව මුළු මහත් සමාජයෙන්ම කොන් වූ බව දැනගත් නතාලී පෙරටත් වඩා ඇගේ දුක සැප සොයා බැලීමට උත්සුක විය..

නතාලිත් චේතියත් අතර දැඩි සොයුරු දමක් හට ගත්තේ එහි ප්‍රතිඵලයක් ලෙසය..

"ලොකු අප්පච්චි අසනීප වෙලා මල්ලි.."

බොහෝ වෙලාවක් බර කල්පනාවක ඇත බලා උන් නතාලී චේතියට කීවේ යුතුකමක් වශයෙනි..

"ඇයි.. අත්තම්මා සලකන්නෙ නැතිලුද.?"

චේතිය විමසා සිටියේය.. ඔවුන් ලොකු අප්පච්චි ලෙස හැඳින්වූයේ සීයාය.. එනම් ගුණවතීගේ පියාය..

"අත්තම්මා දුෂ්ඨකම නිසාම ලෙඩ වෙලා.. එයා තමන්ගෙම කුසින් වදපු දරුවන්ටත් වෛර කරනවනේ.."

ඇ ඒ කීවේ ගුණවතී පුංචි හෙවත් චේතියගේ මව සම්බන්ධ කරුණකි.. නමුත් චේතියට ඒ ගැන එතරම් හැඟීමක් දැණුනේ නැත.. ඔහුට දැන් මවගේ පවුලේ ඥාතීන් පිටස්තරයින් භාසමානය..

"අර අච්චර තියෙන දේපල හරි විදියට ළමයින්ට බෙදලා දුන්නනම් අද ඔයාලා උනත් මෙහෙම දුක් විදින්නෙ නැනෙ මල්ලි.."

"අනේ අක්කෙ.. අපිට ඔය තන්හා කාරයින්ගෙ දේපල නැතුවට මේ ඉන්න විදිය හොදයි.. අපි සැප විදින්නෙ නෑ තමයි.. ඒ උනත් අපිට වේලක් ඇර වේලක් හරි කන්න තියෙනවා.. වැටිලා ඉන්න කාගෙහරි තැනක් තියෙනවා.."

චේතිය කියාගෙන ගියේ තම ඥාතිවරුන් ගැන උපන් කලකිරීමෙනි.. ඔහු නැගණිය උපත ලද කාලයේ පටන්ම ඔය කියන නෑදෑයන් ඇහැටවත් දැක නැත.. කොටින්ම ලොකු අප්පච්චිගේ හා අත්තම්මා මොන වගේද යන්න ඔහුට මතකවත් නැති තරම්ය..

“ඔය මහ මිනිස්සු හරි කියලා මං කීයටවත් කියන්නෙ නෑ.. ඒත් අපි ඒ මිනිස්සුන්ට වෛර කරන්න ඕනෙ නෑ මල්ලි.. එයාලා කරන පව් එයාලා ගෙනියයි..”

“මගේ හිතේනං ඇති වෛරයක් නෑ.. වෛර කරන්න මට ඔය මිනිස්සු මතකත් නෑ.. කොහොම උනත් නතාලි අක්කෙ.. ඔයා ඇරුණම අපිට වෙන නෑයො නෑ කියලා තමයි මං හිතාගෙන ඉන්නෙ”.

දිගු හුස්මක් හෙලූ නතාලි ඉන් පසු ඥාතින් ගැන කතා කිරීමෙන් වැළකී සිටියාය..

“කොහොමද ඔයාගෙ ගර්ල් ෆ්රෙන්ඩ් එහෙම්”..

එවර ඈ කතාවට ඇද ගත්තේ වෙනස්ම මාතෘකාවකි.. එයට චේතියගේ මුහුණේ ඇඳුණු අපූරු සිනහව ටික වේලාවක් යනතුරු මැකීගියේ නැත.. සම්මානි.. ඈ මොහොතකට චේතියගේ මනසේ සක්මන් කරන්නට විය..

“අම්මේ.. මූණෙ තියෙන පෙම් පාට..”

“ඒකට ප්රේ.මයක් කියන්න බෑ අක්කෙ.. එයා නෙතට සුන්දර දසුනක්.. ඉතිං මං ඒ සුන්දරත්වය ඈත ඉඳන් රස විඳිනවා.. එච්චරයි”.

“ඇයි.. ළඟට ගියොත් සුන්දරත්වය නැතිවෙයි කියලා හිතනවද?.”

“අපි ඉඳිමෙන්න ඕනෙ අපේ ඇඟිල්ලෙ තරමටනේ.. එයාලා ඉන්නෙ අපිට ළං වෙන්නවත් බැරි තරම් උඩකින්.. ඉතිං මං මොකටද නිකං හිත රිද්දගන්නෙ..”

නතාලිට චේතිය පිළිබඳ දැනුනේ දැඩි පැහැදීමකි.. ඔහුට ආදරය යනු සෙල්ලමක් නොවේ.. එහෙත් චේතිය වැනි සොඳුරු කඩවසම් දගයෙකු ආදරය ගැන සිතුවට වරදක් නොවේ යැයි නතාලි වුව සිතුවාය.. ඔහුට දැනෙන අඩුපාඩුවකට ඇත්තේ දුප්පත්කම පමණි..

“ඔයා එයාට ආදරෙයිද..?”

ඔළුව වටේ කැරකුණෝතින් නාසයට ළගා වීමට අසීරු බව දැන උන් ඇ ඍෘජුවම විමසා සිටියේය..චේතිය වුව නතාලිගේ මෙම ඍෘජු බව ප්රිුය කළේය.. ඇ කිසිදා හිතේ එකක් සගවා වෙනකක් අසන ජාතියේ අයෙකු නොවේ.. ඇසිය යුතු දේ ඍෘජුවම අසයි..

“ආදරේ කියන්නෙ මොකක්ද කියලා මං දන්නෑ අක්කෙ.. ඒත් මං සම්මානිට කැමතියි.. ඒත් ආෆ්ටර් ස්කූල් කියලා අම්මට හොරෙන් වෙස් මාරු කරගෙන කුලී වැඩ කරන මං කොහොමද ඒ වගේ කෙනෙක්ට ළං වෙන්නෙ.. ? එයා ක්ලාස් එන්නෙ වෑන් එකේ.. අදින්නෙ හයි ෆයි විදියට.. කන්නෙ බොන්නෙ සුපිරි කෑම.. ඒ අතින් මං මොන හිඟන්නෙක්ද..?”

නතාලිට ඔහු ගැන ඇති වූ දුක පහදා දිය නොහැකි තරම්ය.. ඇ චේතියට ළංව ඔහුගේ උරහිසට අත තැබුවාය..

“ඔයා හිඟන්නෙක් වෙන්නෙ කොහොමද මල්ලි..? අපි උඩරට හොද පෙලපත් වලින් එන බෞද්ධයො.. කොටින්ම ලොකු අප්පච්චිලා වලව්කාරයො.. අපි දෙන්නා එක බඩවැල කඩාගෙන ආපු සහෝදරියන්ගෙ ළමයි.. ඉතිං මං වංශවත් වෙලා ඔයා දුප්පතෙක් වෙන්නෙ කොහොමද..?”

ඇ එය ඇසුවේ ලොකු කමට නොව ඔහුට යථාර්තය පහදා දීමටය..

“වංශෙ කබල් ගාන්නද අක්කෙ..? අද කාලෙ හැම දේම මනින්නෙ සල්ලි වලින්.. ඔයාලට දේපල මිල මුදල් හැමදේම තියෙනවනේ.. මං වලව්වෙ ඉඳුල් හෝදන ගුණවතීගෙ පුතා.. සම්මානිලත් වලව්කාරයො නෙමෙයි.. ඒත් එයා සේනාධීර ගෘප් එකේ අයිතිකාරයගෙ එකම දුව.. සේනාධීරකාරයට මුළු කුරුණෑගල ටවුමම යටයි.”

“වංශෙන්වත් සල්ලි වලින්වත් සහකාරයෙක් හොයන්න බෑ මල්ලි.. ඒකට ඕනෙ එකිනෙකා තේරුම් ගැනීම.. ආදරය.. විශ්වාසය.. වගේ දේවල්.. අනික සැබෑ ආදරයක් ඉස්සරහ මුදල් කියන්නෙ බොහොම නොවටිනා දෙයක්..”

නතාලි මේ කතා කරන්නේ අත්දැකීමෙන් බව චෛතිය දනී.. අත්තම්මා හා ලොකු අම්මා පෙළපත  නිසා හිස උදුම්මවාගෙන උන්නද නතාලි අක්කා සාමාන්‍ය  පවුලක තරුණයෙකු සිය අනාගත   සහකරු ලෙස තෝරාගෙන අවසන්ය.. සරසවියේ අවසන් වසරේ සිසුවෙකු වන විශ්ව අයියා අනාගතයේ ඉන්ජිනේරුවරයෙකි..

"පුතාලා කතා කරන අතරෙ මං විගහට කෑම ටිකක් රත් කරා.. යං දරුවො කලා ඉමු.."

ඔවුන්  දෙදෙනා කතා කරන තැනට පැමිණි ගුණවතී නතාලිව නිවස තුළට කැඳවාගෙන ගියාය..  තමාගේ අතින් අල්ලා යන පුංචි අම්මා දකිද්දී නතාලිට සිතුණේ ඈ වයසට වඩා වයසට   ගොස් ඇති බවය.. ඇතැම් විට එයට හේතුව පුංචි අම්මා පමණට වඩා දුක් විදීම වන්නට ඇතැයි ඈ සිතුවාය..

"නතාලි අක්කෙ.. ඔයා අද මට කවනවද.?"

චෛතියගේ නැගණිය මිහිරාවි ඇගේ කුඩා පුටුව මේසය අද්දරට රැගෙන එන අතරතුර විමසා සිටියේය..

"චූටි.. අක්කට කරදර කරන්න එපා.."

මවගේ හඬට පුංචි කෙල්ලගේ සුදු මුහුණ රෝස පැහැයට හැරිණි.. ඒ දැක දුක සිතුනේ නතාලියට.. මිහිරාවි ලොකු වන විට සොඳුරු රුවකට හිමිකම් කියනු ඇතැයි ඇයට     ක්ෂණිකව සිතුණි.. තමන්ගේ මුළු පරම්පරාවේම මෙවන් හුරුබුහුටි දරුවෙකු උන්නේ        නැත.. ඈ සැබැවින්ම මඩේ පිපුණු නෙළුමක් වැනිය..

"චූටිට කවන එක මොන කරදරයක්ද.? මං කවන්නං.."

එසේ කී   නතාලි කුඩා බත් ගුලි අනා මිහිරාවිට කවන්න පටන් ගත්තාය.. එදෙස බලා උන්  ගුණවතී සිය දෑසට නැගුණ කඳුළ වසන් කළාය.. ඈ සිතා උන්නේ තමාට වූ කරදරය නිසා මිහිරාවි සමාජයෙන්

කොහේ වී ඇතැයි වුවද ඈ දැන් දුටුවන්ගේ නෙත් සිත් සනහන රෝස කුසුමක් වී ඇත..

"චූටි.. ඔයාට මං ලොකු චොක්ලට් එකක් ගෙනාවා.. හැබැයි ඒක දෙන්නෙ බත් ගොඩක් කෑවොත් විතරයි.."

කලකට පසු රසවත් කෑම වේලක් ලැබුනු බැවින්දෝ ආසාවෙන් කෑම කන නැගණිය දෙස බැලූ චේතය කීවාය..

"මට අක්කිත් ලොකු බෝල චොක්ලට් පෙට්ටියක් ගෙනාවා.."

හුරතල් ලොකු ඇස් නටවමින් ඈ කීවේ සතුටිනි..

******************************

දරු දෙදෙනා පාසල් ගිය පසු ගුණවතී සුපුරුදු ලෙස තම රාජකාරී කටයුතු සඳහා ගල් කන්ද වලව්වට පිය නැගුවාය..

"ඈ ගුණවතියො.. උඹ අදත් පරක්කුයිනෙ.. අහවල් එකක් කරාද බං මෙච්චර වෙලා..?"

ඈ  පසුපසම මිදුලට ගොඩවදිනු දුටු වනම හේතුහාමි ආඩපාලි කියන්නට විය.. නමුත්  හේතු  හාමි එසේ කියන්නේ අහිතකින් නොවන බව ගුණවතී සුපුරුදු සිනහවම මුවට නගා  ගන්නට උත්සාහ කළාය..

"ආං අදත් අශේන් බේබි උදේ පාන්දරම ජවුසං පටන් අරන්.. බලන්න එපැයි උන්දැගෙ කටේ සවුදම.."

ඔහු ඒ  කීවේ ගල්කන්ද වලව්වේ එකම දරුවා ගැනය.. ඔහු පියාටත් පාලනය කළ නොහැකි ආකාරයේ  හිතුවක්කාරයෙකි.. මෙම පියාත් පුතාත් බොහෝ විට දවස පටන් ගන්නේ කුමක් හෝ  ගැටුමකිනි.. නමුත් දවල් වන විට දෙදෙනාටම එවා මතක නැති තරමය.. කොටින්ම පියාට පුතාත් පුතාට පියාත් නැතිව බැරිය..

“ඕක මේ වහල යට අමුත්තක්යැ හේතුහාමි අයියෙ.. අද මොකක්ද කාරණේ..?”

ඈ එසේ ඇසුවේ හේතුහාමිට පමණක් ඇසෙන තරමට රහසිනි..

“අශේන් බේබිගෙ උපන් දිනේ ලබන සිකුරාදනේ.. ඒකට පාටියක් දාන එක ගැන තමයි.. අප්පොච්චා කියනවා වලව්වෙ ගනිමුලු.. පුතණ්ඩියා කියනවා හෝටලේක ගනිමුලු.. මෙතන එකගෝරියයි..”

“කෝ දැන් දෙන්නා..?”

“හාමු මහත්තයා කාමරේ.. අශේන් බේබි නං බයිසිකලේ නැගලා ඉගිලිලා ගියා ඕං..”

හේතුහාමිගෙ කතාවට හූ මිටි තැබීමට නොගිය ගුණවතී දූවිලි පිස්නාවත් කොස්සත් රැගෙන වලව්ව තුළට ගමන් කරද්දී හේතු හාමිද මිදුලේ ගල් තලාව දෙසට පා නැගුවේය.. වලව්වේ මැද සාලයේ තබා ඇති රාමු කරන ලද පින්තූර වල දූවිලි පිසින අතරතුර ගුණවතීගේ සිත අතීතය කරා ඉගිලුණි..

ළමාතැනී ඉන්නා සමයේ මේ වලව්ව පිරී ඉතිරී තිබුණා වැනිය.. සොඳුරු සිහින් සිරුරකට උරුමකම් කී ඈ වෙනත් වලව්කාරියන් මෙන් ඔසරිය ඇන්දේ නැත.. ඈ බොහෝ විට ඇන්දේලේස් රෙද්දෙන් මසන ලද අත් දිගට දමන ලද ලා පැහැති දිග ගවුම්ය.. ඒවා ඇඳ දිගු වරලස මුදා හැරි කල් හී ඈ සැබැවින්ම දෙව්දූවකි.. විසිවන වියේසි පමණ විවාහ වූ ඈ මිය යන විට තිස් පස්වන විය පසු කලා පමණි..

ළමාතැනීගේ අඩි තුනක පමණ වූ රාමු කරන ලද පින්තූරය ගුණවතීට පසෙකින් තැබීමට සිතුණේ නැත.. ඈ එම සොඳුරු රුව දෙස බලා තව තවත් දෑ සිහිපත් කළාය..

එකල තමාගේ අඩුපාඩු සොයා බැලූ තමාට ඇඳුම් පැළඳුම් පිළිගැන්වූ ඒ උත්තමාවිය මිය යන මොහොතේ ළඟින් සිටීමට නොහැකි වීම ගැන ගුණවතීගේ සිතේ ඇත්තේ පසුතැවිල්ලකි.. ඇය තුනටියේ හා පාදයේ

ආබාධයක් නිසා එක්තැන් වී කල් ගත කල සමයේ වලව්වේ වැඩ පමණක් නොව ළමාතැනීගේ වැඩද සියල්ල කලේ ගුණවතීය.. ඇගේ රෝගී තත්වය උත්සන්න වූ අවදියේ ගුණවතී පමණක් නොව චේතියද ඇගේ ළඟින් සෙලවුණේවත් නැත.. එකල චේතියට වලව්ව හොඳින් හුරු පුරුදුය.. අශේන් බේබි කොළඹ නේවාසික පාසලක ඉගෙන ගත් නිසා වලව්වේ දුව පැන ඇවිදීමට දරුවෙකුට සිටියේ චේතිය පමණි.. ළමාතැනීද චේතියට ඉමහත් සෙනෙහසක් දැක්වූවාය..

නමුත් සියල්ල වෙනස් වූයේ ක්ෂණයකිනි.. ගුණවතී මුහුණ දුන් ඒ අභාග්‍යී සම්පන්න සිදුවීම නිසා ඇයට ළමාතැනීගේ අසනීපය මොහොතකට අමතකව ගියාය.. මතක් වුවද ඇයට වලව්වට යාමට හැකියාවක් තිබුණේ නැත.. ළමාතැනී මිය ගිය ආරංචිය චේතිය කඳුළු පෙරමින් නිවසට දුව එන විට ඇයට වාවාගත නොහැකි වූ තරමය..

"ගුණවතී.. ගුණවතී.."

හාමු මහත්තයාගේ කටහඬ දෙසවන් අද්දරින්ම ඇසෙද්දී තිගැස්සුණු ගුණවතී පිංතූරය පසෙක තබා දෑස් පියා ගත්තාය.. නමුත් ඊට පෙර එම කඳුළු හාමු මහත්තයා දැක තිබුණි..

"නම අමායා උනාට එයා අපේ ජීවිත වලට පෙනිලා යන්න ආපු මායාවක් ගුණවතී.. අමායා කියන්නෙ සුන්දර මායාවක්"..

ඇතුලග හාමුගේ කටහඬ වුව පසුතැවිල්ලෙන් පිරී ඇතැයි ගුණවතීට සිතුනි.. නමුත් ඔහු ඉදිරියේ දොඩමළු වීමේ පුරුද්දක් ඇයට කවදාවත් තිබුණේ නැත.. එහෙත් ඒ හැඟීම ගෞරවයක් ලෙස හැඳින්විය නොහැක..

තම සැමියා වූ ධර්මතිලක වලව්වේ වැඩ කරන සමයේ නම් ගුණවතීගේ සිතේ වලව්වෙ ඇත්තන් කෙරෙහි වූයේ දැඩි භක්තියකි.. ඔහුගේ හදිසි අභාවයෙන් පසුව ක්‍රමයෙන් එම හැඟීම්දියව යන්නට පටන් ගත්තේය.. ළමාතැනී මිය යන කාල වකවානුවේ ඇගේ සිතේ ඇතුගල හාමු ගැන දැඩි වෛරයක් හා පිළිකුලක් තිබුණු.. නමුත් සැමියාගේ සරණත් නොමැතිව ළමාතැනීගේ උදව් උපකාරයත්

නොමැතිව ගිය කල්හී ඇයට අන් හච්හරණක් නොමැති විය.. කොටින්ම ඔවුන් පදිංචිව සිටියේ වලව්වට අයිති ගේ කෑල්ලක වූ බැවින් ඇයට වලව්වට පිටුපෑමට හැකියාවක්ද නොතිබිණි.. එහෙයින් ඇ අකමැත්තෙන් වුවද නැවතත් වලව්වටම පා නැගුවේ පිච්චෙන බව දැන දැනම ගින්දරට ඇදෙන පළගැටියෙකු විලසිනි..

"මේ ගේ දොර ටිකක් පිළිවෙලක් කරලා දාපන් ගුණවතී.. බේබි හාමුගෙ උපන් දිනෙත් ළගයිනෙ.. මං තව ළමයි ටිකකටත් එන්න කිව්වා.. උන්ට කියලා වත්ත පිටිය සුද්ද කරව ගන්නත්ඕනෙ.."

කල්පනාබරව උන් ගුණවතී දෙස මොහොතක් බලා උන් ඇතුගල හාමු ඒ කීවේ චේතියලා ගැනය.. නමුත් චේතිය ඇතුළු මිතුරු පිරිස පසුගිය දිනෙක මෙහි පැමිණි බව නොදැන උන් ගුණවතීට එහි විශේෂත්වයක් දැනුණේ නැත..

"මොනම හේතුවක් නිසාවත් ළමාතැනීගේ කාමරේ දොර ඇරලා තියන්න එපා ගුණවතී.."

එතනින්නික්ම යාමට මත්තෙන් ඔහු නැවත අවධාරණය කර සිටියේය.. ළමාතැනීගේ කාමරේ ලෙස හැදින්වූයේ ඇ මිය යාමට ආසන්න අවසාන කාලයේ උන් කාමරයයි.. හාමු මහතා සමග උඩු මහලේ සුවිසල් නිදන කාමරයේ උන් ඇ අශේන්ට දස වසරක් පමණ වන කාලයේ පහල මාලයේ එම කාමරය ඇගේ තනි පාවිච්චියට තොරා ගත්තේය.. ඇ වසර පහකට ආසන්න කාලයක් උන්නේඑහිය.. එසේ සිටින්නේ ඇයිදැයි ගුණවතී ඇගෙන් කිසි කලෙක නෑසුවද ළමාතැනීම එය ගුණවතීට පවසා තිබිණි..

"හාමු මහත්තයට හැම තැනම ගෑණු ඉන්නවා ගුණවතී.. මහ ලොකු වලව්කාරයො උනාට මුන්ට හැදියාව කියන එක ගැව්ච්ච තැනක නෑ.. මේ වගෙ මිනිහෙක් ආයෙ මගෙ බල්ලටවත්එපා.."

ඇගේ එවදන් ගුණවතීට අද මෙන් මතකය.. නමුත් එකල හාමු මහතාට විරුද්ධව වචනයක් හෝ කීමට උත්සුක නොවුණ ගුණවතී ඇගේ එවදන් අසා උන්නා පමණි..

ළමාතැනී එසේ තනි කාමරයකට පැමිණීමෙන් පසුව වලව්වේ එතෙක් තිබූ සාමකාමී වාතාවරණය හොරු ගෙන ගියා වැනිය.. සතියකට දින දෙක තුනක්වත් එහි රණ්ඩුවක් වැරදුනේ නැත..

වලව්ව තුළට පැමිණි පසු සැමදා අතීතය කරා ඉගිලෙන තම සිත එක්තැන් කර ගත් ගුණවතී වෙනදාට වඩා කල් වේලා ගෙන වලව්ව ඇතුළත පිරිසිදු කර දැමුවාය.. නමුත් එය සම්පූර්ණයෙන්ම සුද්ධ පවිත්‍රන කිරීමට නම් සතියක්වත් අවැසි වේ.. ගල් කන්ද වලව්ව වූ කලී එතරම්ම සුවිසල් මැදුරකි..
චෛතිය අමතර පංතියේ පොත් කිහිපයද බෑගයේ ඔබා ගනිමින් හනිකට බස් නැවතුමට දිව ගියේ තමා එනතුරු රංග හා කලන එහි රැඳී සිටින බව දන්නා නිසාය.. ඔහු අත් ඔරලෝසුව දෙස බැලුවේය.. එහි වෙලාව හතයි තිහ ලෙස සටහන්ව ඇත.. තමා රංගලාට එන්න කීවේ හතටය.. අදනං මිතුරන්ගේ ගෝරණාඩුව අනිවාර්යය බව දැන උන් චෛතිය බස් නැවතුමට ළඟා වූයේ හිස පහත් කරගෙනමය..

නැත.. කිසිදු බැනුමක් නැත.. ඔහු හිස එසෙව්වේ රංගලා පැමිණ නැත්දෝ සැකයෙනි.. රංග හා කලන කියූ වේලාවටම පැමිණ උන්හ.. ඔවුන් දෙදෙන කවුදෝ කෙල්ලෙකු සමග බර කදයකි.. චෛතියද එදෙසට ළං වූයේ ඒ සුරූපිණියගේ මුහුණ දැක ගැනීමේ අටියෙනි.. ඔහුට තම දෑස් අදහාගත නොහැකි තරම් විය.. ඒ උන්නේ ඔහුගේ සිත දිනූ සම්මානි මිස අනෙකෙකුනොවේ..

“සොරි මචං.. මං ටිකක් ලේට් උනා.. ගුට් මොනිං”.

සම්මානිව එතරම් තැකීමක් නොකල බව පෙන්වීමට මෙන් චෛතිය එය කීවේ කලන දෙසට හැරීය.. ඔරලෝසුව දෙසට දෑස් පෑ කලනගේ මුහුණේ ඇඳුනේ සමච්චල් සහගත සිනහවකි..

“තව විනාඩි පහක් බලලා අපි යන්න හැදුවෙ.”

රංග කීවේ සම්මානි දෙසද බලාගෙනය.. ඔහු තම අවධානය සම්මානි වෙත යොමු කරවීමට උත්සාහගන්නා බව දුටු චේතිය එය නොහැසුණ සේ හැසිරීමට වෙර දැරිය..

"මේ ළමයත් ඉදලා ඉදලා බස් එකෙ ආව දවසෙම අපි නිසා පරක්කු උනා.."

ඔවුන් දෙදෙනාම ප්රබමුඛත්වය දෙන්නේ සම්මානිට බව වැටහුණු චේතිය තරහින් අහක බලා   ගත්තේය.. නමුත් සම්මානි බලා ඉන්නේ තම මුහුණ දෙස බව ඔහුගේ යටි සිතට දැණුනි..

"අන්න බස් එක.. වරෙන්.. යමු.."

මිතුරන් දෙදෙනාට පෙර බසයට නැගගත් චේතිය එහි තිබූ හිස් අසුනක් වෙත ගොස් එය ආවරණය වන   සේ සිට ගත්තේය.. සැබැවින්ම ඔහු එය තබා ගත්තේ සම්මානි වෙනුවෙනි.. වායු සමනයකරන ලද රථයක ගමන් ගන්නා මේ යුවතියට බසයක සිටගෙන යා නොහැකි යැයි චේතියට සිතුණි..

"උඹ කාටද මේ සීට් එක තියාගත්තෙ.?"

පිළිතුර දැන දැනම රංග ප්රිශ්නය නැගුවේය..

"කැමති කෙනෙක් ඉදගත්තුදෙන්.. මට තාම හිටගෙන යන්න හයිය තියෙනවා.."

වේගයෙන් එවදන් පිට කල චේතිය එම අසුන ළඟින් මෑත් වූයේය.. මොහොතක් ඔහු දෙස නිහඬව බලා  උන් සම්මානී නිහඬව එහි අසුන් ගත්තාය.. චේතියගේ මෙම හැසිරීම රංග හා කලනට ගෙන ආවේ දැඩි කුතුහලයකි.. චේතිය සම්මානීට කැමති බව ඔවුන් දෙදෙනාම දැන උන්හ.. ඔහු පන්තියේ වුව අසුන් ගත්තේ ඇගේ රූප පෙනෙන තැනකිනි.. ගැහැනු ළමුන්  දිරවන්නේම නැති චේතිය සම්මානි ගැන කතා කිරීමට ගත් කල නොනවත්වාම කතා කරයි..  ඉතිං මේ වෙනස ඔවුනට අදහා ගත නොහැකිය..

අහම්බෙන් බසයේ යාමට පැමිණි සම්මානිව ඔවුන් විනාඩි විස්සක් පමණ බස් නැවතුමේ රඳවා ගත්තේ චෛතිය එනතුරුය.. එසේ කල්පනා කරන විටදී රංගගේ සිතේ තරහක්ද හට ගත්තේය..

"තරහ ගන්න එපා බං.. ඌ පරක්කු උනේ ඇයි කියලවත් අපි ඇහුවෙ නැනෙ.. ගෙදර මොකක් හරි ප්‍රශ්නයක්ද දන්නෙ නෑ..

රංගගේ සිතැගි වටහා ගත් කලන චෛතියට රහසින් ඔහු අස්වසාලුයේය.. එතැන් සිට පන්තියට ළඟා වන තෙක්ම ඔවුන් අතර කතාවක් හුවමාරු වූයේ නැත..

"ෂා.. හඳ මොකද අද බිමට බැහැලා.?"

පන්තියට යන කොලුවෙකු කෑ ගැසුවේ සම්මානි දෙස බලාය.. ඇ එය නෑසුන විලස ගමන් ගත්තීය.. ඔවුන් සිව් දෙනාම ළං වූයේ කාඩ් පරික්ෂා කරන පෝළිම වෙතය.. ඒ ආසන්නයේ වූ කොලු රැනක් සම්මානිට මොනවදෝ කියනු චෛතියට පෙනුණි..

"මචං අර කියමන වෙනස් කරන්න වෙයි වගේ.."

"මොකක්ද..?"

"ඒක් ඵුල්.. දෝ මාලික්.."

"ඒ කිව්වෙ..?"

අසා උන් තැනැත්තා ප්‍රශ්නය නැගුවේය.. චෛතිය ඔවුන් දෙස හොඳ හැටි බලා උනි.. ඔවුන් චෛතියලාට වඩා වයසින් වැඩිමල් බව බැලූ බැල්මට පෙනුණේය..

"එක මලයි බඹරු දෙන්නයි.. අන්න ඒක වෙනස් කරන්න ඕනෙ.. එක මලයි බඹරු තුන්දෙනයි කියලා.."

ඔවුන් එය කීවේ තම පිරිසට බව චෛතියට වැටහුණි.. ඔහුට තම ගතේ ලේ ගමනාගමනය වේගවත් වන බවක් දැනුණි..

"ඒ මලට නං බඹරු තුන්දෙනෙක් වැඩි නැතුව ඇති බං.. සල්ලි කදක් නේ.."

කිසිවෙකුට කිසිවක් සිතා ගැනීමට තරම් කාලයක් ඉතිරි වූයේ නැත.. එකී වදන් පිට වන සැනින්ම චේතියගේ දකුණු අත එය කී තැනැත්තාගේ කණ හරහා වේගවත්ව පතිත උනි..

"ඇයි.. ඇයි..? මේකිට මොකක් හරි කියද්දි උඹට අමාරුද.? මේ.. උඹ උඹගෙ වැඩක් බලාගෙන පැත්තකට වෙලා හිටපං.."

සංවාදයේ අනික් තැනැත්තා පිටු පසින් පැමිණ චේතියගේ කමීස කොලරය අල්ලා ගනිද්දී පසුපස හැරුනු චේතය ඔහුටද බිම පතිත වන සේ පහරක් එල්ල කළේය..

ඉන්පසු ආරම්භ වූයේ එකම ගුටි කෙලියකි.. ප්‍රතිවාදීන් තිදෙනෙකු බිම වැටෙන තුරු චේතිය ඔවුන්ට පහර දුන්නේ විනාඩි දෙකක් ඉක්ම යාමටත් මත්තෙනි.. කාඩ් පොළිමේ වූ සිසුන් පමණක් නොව පන්තිය ඇතුළත වූ සිසුන්ද තම අසුන් වලින් නැගිටිමින් මෙම දර්ශනය නරඹමින් උන්හ.. රංග හා කලන චේතිය දෙසට දුව එන විට විය යුතු දේ සිදු වී හමාරය..

"ඔය ඇති චේති.. ඔය ඇති.."

රංගලාට පෙර චේතිය වෙත දිව ආ සම්මානී ක්ෂනිකව ඔහුගේ අතේ එල්ලී ගත්තාය.. ඇගේ අත ගසා දැමූ චේතිය එතැනින් පිටව පාරට පැමිණියේ මිතුරන් දෙසවත් නොබලමිනි..

"මොකක්ද සම්මානි මේ උනේ.? ඇයි අරූ මුන් ටිකට ගැහුවෙ.?"

චේතියගෙන් ගුටි කෑ රස්තියාදුකාරයින්ගේ කතා නෑසුන රංගට ඇති වූයේ දැඩි කුතුහලයකි.. පසුපසින් ශබ්දයක් ඇසී බලන කල ඔවුන් දුටුවේ චේතිය තිදෙනෙකුට එක දිගට පහර දෙනබව පමණි.. එහෙයින් ඔවුන්ට මේ කිසිවක් වටහා ගත නොහැකි විය..

“මේ කට්ටිය අපිට මොනවද කිව්වා.. ඒකට චේතියට තරහා ගියා”.

ඇ කීවේ දෑසින් ගලන කඳුලු පිටි අත්ලෙන් පිසිමිනි..

“ඔයා පන්තියට යන්න සම්මානි.. අපි ගිහින් බලන්නම් අරූ කොහෙද ගියේ කියලා..”

බිම වැටී උන් තිදෙනා දෙසද තිබුණු බැල්මක් හෙලූ කලන ඔවුන්ගේ ඇගවල් උඩින් පැන චේතිය ගිය ඉසව්වට දිව ගියේය.. කිසිවක් සිතාගත නොහැකි වූ රංගද ඔහුව අනුගමනයකළේය..

“මචං මූ නෑනේ.. මේ ඩිංගට කොහේ වාෂ්ප උනාද?.”

ප්රාධාන පාර තෙක්ම පැමිණි කලන පසු පසින් පැමිණි රංග දෙස බලා කීවේය..

“ඌ ආවෙත් මොකක් හරි අප්සට් එකකින්නෙ.. ඒ කේන්තියටම අරුන් ටිකටත්දීලා අරින්න ඇති වැටෙන්නම.”

“වැටිලා විතරක් නම් මැදැයි.. උඹ දැක්කෙ නැද්ද උන් දෙන්නෙක්ගෙ කටවල් වලින් ලේත් එනවා.. අනිකගෙ ෂර්ට් එකත් ඉරිලා.. මේ යකත් මාර පොරක් තමයි..”

“ඇයි උඹට අමතක උනාද ඌ බ්ලැක් බෙල්ට් කාරයෙක් කියලා?.”

කතා කරන අතරතුර දෙදෙන බස් නැවතුමට පැමිණියේ චේතිය එහිවත් ඇත්දැයි බලමිනි..

“අර ඉන්නෙ බං..”

බස් නැවතුමේ නවතා තිබූ බසයක පසු පසම අසුනේ වාඩි වී ඉවත බලා උන් චේතියව පෙන්වූ කලන හැකි ඉක්මනින් රංගවද ඇද එම බසයට ගොඩ විය..

“චේති.. උඹට මොකෝ උනේ බං.?”

ඔහුගේ දෙපසින් වාඩිගත් දෙමිතුරෝ ඔහුගේ අතකින් අල්ලා ගත්හ.. ඒ දැත් වෙව්ලන බව රංගට හා කලනටද වහා වැටහුණි.. එයට හේතුව ඔහු පාලනය කල නොහැකි කේන්තියකින් පසුවන බව දැන උන් කලන චේතියගේ පිටට තට්ටුවක් ඇම්මේය..

"කාම් ඩවුන් චේති.."

ඔවුව සන්සුන් කිරීමට වෙර දරමින් කලන වටපිට බැලුවේ ත්‍රීනරෝද රථයක් නවතා ගැනීමේ අරමුණෙනි..

"වරෙන් යං.."

චේතියවද බසයෙන් බස්සවා ගත් ඔවුන් දෙදෙනා ත්‍රීීරෝද රථයකට ගොඩ විය.. යන්නෙ කොහෙදැයි නොඇසූ චේතිය තව දුරටත් නිහඬවම පසුවූයෙ තම සිත එක්තැන් කර ගැනීමට අවැසි වූ හන්දාය.. කලන ඔහුව රැගෙන ගියේ බේක් හවුස් එක වෙතටය..

"උඹලා ඉඳ ගනිං මං කන්න මොනව හරි අරන් එන්නම්.."

චේතිය හා කලන කොණේම මේසයක් කරා ගමන් ගනිද්දී රංග කවුන්ටරය වෙත ගියේය..

"උඹ දාගත්තෙ පොඩි පහේ ලෙඩක් නෙමෙයි මචං.. උන් මහ මදාවියො වගයක්.. පෙනුමෙන් නං අපේ ක්ලාස් එකෙත් නෙමෙයි.. අපේ වයසෙත් නෙමෙයි.."

"මටත් හිතාගන්න බෑ බං මට මොනවා උනාද කියලා.. උන් සම්මානිට අර වගේ කතාවක් කියද්දි මට අහන් ඉන්න බැරුව ගියා.."

"මොනවද උන් කිව්වෙ..?"

කලන ඇසූවට ඔහු පිළිතුරු දුන්නේ රංගද මේසයට පැමිණි පසුවය..

“ෂිට්.. ඔය කතාව අපිට ඇහුණෙ නැනෙ.. ඇහුනා නං උන්ට ගහලා විතරක් නෙමෙයි අතක් පයක් කඩලත් එන්න තිබ්බා.. සම්මානි එහෙම ජරා කෙල්ලෙක් නෙමෙයිනෙ..”

රංග කීවේ දැඩි ආවේගයෙනි.. මිතුරා කල දේ සාධාරණ බව මේ වන විට ඔහුට හැඟෙමින් තිබිණි..

“ඒක හරි.. දැන් ගිය දේ ගියා.. අපි ඉස්සෙල්ලම හොයාගන්න ඕනෙ උන් කාගෙ කවුද කියලා.. මොකද චේති.. උන් ඕකෙ රිටන් එක නොගෙන ඉඳී කියලා හිතන්න බෑ.. ඒ නිසා අපි ඒකට දැන් ඉඳලම ලෑස්ති වෙන්න ඕන..”

බොහෝ දුර කල්පනා කල කලන එය කීවේ මිතුරන්ට මෙම තත්වයේ බරපතලකම වටහා දීමේ අරමුණෙනි..

“ඒ කවුරු උනත් බං සම්මානි ගැන දන්න එකෙක්නං වෙන්න බෑ.. කෙල්ල සේනාධීරගෙ දුව කියලා දන්න කිසි එකෙක් ඒකිට වචනයක් කියන්න එන්නෙ නෑ.. කිව්වනං ඇඩ්රස් නැති වෙනවා කියලා දන්නවනේ..”

රංග කී දෙයට චේතිය සිනාසුණේ නුහුරටය..

“උඹට පිස්සුද.. උන් කෙල්ල ගැන හොඳටම දන්නවා.. ඒකනේ කිව්වෙ සල්ලි කදක් කියලා..”

ඔහු ඒ පිළිබඳව යළි යළිත් සිහිපත් කරමින් උන්නේය.. ඔහුට දැනුනේ තම ඔළුව විකාර වී එන බවකි.. නිවසේ තිබෙන ජරකශ්න මදිවාට තමා ඉල්ලාගෙන ලෙඩක් දා ගත්තාදැයි සැකසිතුණු ඔහු ගැඹුරු හුස්මක් පිට කලේය.. ඒ දුටු රංග හා කලන මුහුණින් මුහුණ බලා ගත්හ..

“හරි.. ඒක දැන් ඉවරයි.. කියපංකො උඹ මොකද අද මෙච්චර පරක්කු උනේ කියලා..?”

රංග කතාව මාරු කලේ චෛතිය දිගින් දිගටම කල්පනා කල නිසාවෙනි..

"අද උදේ අපේ චූටි අසනීප උනා බං.. අම්මා එක්ක මොන මොනවදෝ කියවලත් තියෙනවා.."

කුඩා කල සිටම එකටම හැදී වැඩුණු හෙයින් රංග හා කලන චෛතියගේ නිවසේ මෙම ගැටළුව ගැන දැන උන්හ.. වයස අවුරුදු දෙකේදි පමණ සිටම චෛතියගේ කුඩා නැගණිය වරින් වර අමුතුම ආකාරයකට අසනීප වන බව චෛතිය ඔවුනට කියා තිබිණි..

"මේ පාර මොනවද කියවලා තියෙන්නෙ.. ? අම්මා උඹට කිව්වෙ නැද්ද..?"

"නෑ බං.. එයා ඒ කතා හැමදාම යට ගහනවා.. දැන් මං එනකොටත් චූටිට සහලෝලා උණ.."

තම මව කිසියම් කරුණක් තමාගෙන් වසන් කිරීමට වෙර දරතැයි චෛතියට පෙර දින වලදී මෙන්ම මෙවරත් සිතුණි..

"උඹ කිව්වා නේද නංගි පොඩි කාලෙත් ඔය වගේ දේවල් කිව්වා කියලා..? උඹ පොඩ්ඩක් හොයාලා බැලුවෙ නැද්ද චෛති..?"

"චූටි මුලින්ම අසනීප වෙලා තියෙන්නෙ අම්මා වලව්වෙ උත්සවේකට ගිය දවසකලු.. එදා එයා චූටිවත් අරගෙන ගිහින්.."

චෛතිය කලකට පෙර සිදු වූ සිදුවීමක් නැවත මිතුරන් ඉදිරියේ දිග හැරියේය..

"ඉතිං.."

"මං හිතන්නෙ අම්මා ඒ චූටිව වලව්වට ගෙනියපු පළවෙනි දවස.. චූටිටත් වයස අවුරුදු දෙක තුනක් විතර වෙන්න ඇති.. එදා ඇතුගලකාරයව දැකලා එයා අම්මට ගෑ ගැහුවලු ගෙදර යමු කියලා.. අම්මා ඒ වෙලාවෙ ඉඳලා තියෙන්නෙ කුස්සියෙ උය උයලු.. ඒ පාර

ඇතුගලයා චූටිව වඩාගෙන.. මේ කෙල්ල පොඩිකමට උගේ මූණට කෙළ ගහලා මචං.."

"නෑහ්.. උඹලගෙ නංගි සිරා පොරක්නෙ.."

කලන කීවේ මවිතයෙනි.. ඇතුගල හාමුගෙ මුහුණට කෙළ ගැසීමට තරම් ජගතෙක් ඇතැයි ඔහු සිතුවේ නැත..

"ඊට  පස්සෙ අපේ අම්මා එතැනට දුවගෙන ඇවිත්.. හාමු චූටිව වඩාගෙන ඉන්නවා දැකලා  අම්මා බයවෙලා.. එයා චූටිව උදුරගෙන වගේ ගෙදර දුවගෙන ඇවිත්.."

"එදා උඹ එතන හිටියෙ නැද්ද..?"

"නෑ මචං.. චූටි පොඩි කාලෙදිම තමයි මං එහේ යන එක නතර කලේ.."

"හරි ඉතිං.. ඊට පස්සෙ මොකද උනේ කියපංකො.."

මිතුරාගේ සිතේ ගල් කන්ද වලව්ව ගැන තරහක් තිබෙන බව දැන උන් රංග එය පසුව විමසීමට තීරණය කළේය..

"එදා අම්මා චූටිව උස්සගෙන ගෙදර දුවන් එද්දි මං හිටියෙ පාඩම් කර කර.. එයා චූටිව    ඇද උඩින් තිබ්බා විතරයි කෙල්ලව ගැහෙන්න ගත්තා.. මං අල්ලලා බලද්දි චූටිටහොඳටම උණ.."

ඔවුන් තිදෙනාම මොහොතක් තම තමන්ගේ ලෝකවල අතරමංව කල්පනා කලහ..

"නංගි ඊට පස්සෙ නිතරම ලෙඩ උනාද..?"

"නිතරම නෙමෙයි.. ඒත් එයා සැරෙන් සැරේ වලව්ව ගැන එක එක දේවල් කියන්න ගත්තා.. අම්මා එදා ඉඳලා චූටිව වලව්වට අරන් ගියේ නෑ.."

“එහෙම වලව්ව ගැන කියන හැම වෙලාවෙම නංගිට ඔය විදියටම උණ ගන්නවද..?”

“එහෙමමත් නෑ මචං.. ඒත් සමහර වෙලාවට ඔය වගේ කතා වලින් පස්සෙ පැය ගණන් තනියම කල්පනා කරනවා.”

චෛතිය කීවේ නැගණියගේ අසාමාන්‍ය ගති ගැන නැවතත් මෙනෙහි කරමිනි.. ඈ කුඩා කල පටන්ම අනිත් ළමුන්ට වඩා බොහෝ වෙනස්ය.. ඉතා සුන්දර රූ සපුවකට උරුමකම් කී ඈ අන් ළමුන්ට වඩා ඉක්මනට කතා කිරීමටත් ඇවිදීමටත් පටන් ගත් බව ඔහුට අමතක කළ නොහැක..

“උඹලගෙ අම්මා මේ ගැන මොනවද කියන්නෙ.?”

“මටත් තියෙන ප්‍රශ්නෙ ඒකම තමයි බං.. චූටි කියන දේවල් අම්මා මටවත් හරියට කියන්නෙ නෑ.. එයත් ඉන්නෙ නිකං බයවෙලා වගේ”.

“ඉතිං උඹ කෙලින්ම නංගිගෙන් අහපංකො.”

රංග සිය අවසන් තීන්දුව දුන්නේ සියළු ප්‍රශ්න ඉන් විසඳාගත හැකි බව සිතමිනි..

“මං එහෙම අහන්න බය වෙන දෙයක් නිසා නෙමෙයි.. චූටි ලෙඩ වෙයි කියලා මට බයයි.. අනික බං තාම ඒකිය වයස අවුරුදු හතයිනෙ”.

“මේක යට මොකක් හරි රහසක් තියෙනවා.. චෛති උඹට උනත් හිතෙන්නෙ නැද්ද..?”

“මටත් එහෙම හිතෙනවා බං.. මං උදේ එද්දිත් හිත හිත ආවෙ ඒ ගැන තමයි.. ඒ වෙලාවෙ එක පාරටම සම්මානිව දැක්කා විතරයි මාව නිකං ෂොක් උනා වගේ.”

“රා..යිට්.. බය නැතුව ඉඳපං.. අපි මේ ගැන හොයා ගමු”.

මිතුරෝ ඔහුව අස්වැසූහ..

"මේකෙ කොන හොයන්න ඕනෙ වලව්වෙන්මයි කියලා මගේ යටි හිත කියනවා මචං.. ඒකයි මං කොච්චර අකමැති උනත් එදා වලව්වට යන්න තීරණය කළේ.."

"හරි මස්සිනා.. අපිට තවය චාන්සස් තියෙනවනේ.. කොහොමත් ඔය හාමුවා අපිට මේ සතියෙ එන්න කියලත් කිව්වනෙ.. ගිහිල්ලම බලමු"..

එයට එකග වූ චේතිය හිස සැලුවේ තම යටි සිතට දැනෙන මේ අභිරහස සොයා ගැනීමේ කැමැත්තෙනි..
අම්මට බොරුවක් කී චේතිය එදින පාසල් නොගොස් නතර වූයෙ තම මනස නිරවුල් නොවූ නිසාය.. ඊටත් වඩා පෙරදා ඇති වූ කලබගෑනිය නිසා ඔහුගේ වමතේ මැණික් කටුව ප්‍රිදේශය ඉදිමී රත් පැහැ ගැන්වී තිබිණි..

"පුතාට තනියෙම ගෙදර ඉන්න පුළුවනිද.. ? මං මේ වලව්වට ගිහින් එන්න කියලා බැලුවේ.."

මිදුලේ අඹ ගසක් යට බංකුවක් තබාගෙන පාඩම් කරමින් උන් චේතිය වෙත පැමිණි ගුණවතී විමසුවාය..

"එතකොට චූටි..?"

ඔහු ඇසුවේ අසනීපව උන් නැගණිය පාසල් නොගිය නිසාය..

"වෙනදටත් මං එනකල් කෙල්ල ඉන්නෙ ඇලිසලගෙ දිහානෙ.. මං එහාට චූටිව බාරදීලා යන්නම්.."

ඇලිසා යනු චේතියලාගේ නිවස ආසන්නයේ උන් කණවැන්දුම් ගැහැණියකි.. ඇයටද වයස දහයේ දොළහේ පමණ දරු තිදෙනෙක් වූ අතර මව නැගණිය නතර කර යන්නේ එහෙ බව චේතිය දැන උන්නේය..

“චූටි අසනීපෙන් ඉන්න එකේ ගෙවල් ගානෙ යවන්න එපා අම්මා.. එයාව තියලා යන්න..”

“ඉස්කෝලෙ යැව්වෙ නැතුවට මොකෝ ඒකිට ඒ හැටි උණක් නෑ දැන්.. ඒ වෙලාවෙ විතරයි උණ ගතිය තිබ්බෙ..”

එසේ කීවද ගුණවතී එදින ඇයව ඇලිසාට බාර කලේ නැත.. එහෙයින් චේතිය සිය නැගණිය සමග නිදහසේ කතා කිරීමට කාලය උදා වූයේය..

“චූටි ඔයාට නිදිමතද..?”

ඈ ඇදටම වී ඉන්නා නිසා චේතිය ඇයව මිදුලට කැදෙව්වේ මව ගල් කන්ද වලව්ව බලා පිටත් වූ පසුවය..

“නිදිමත නෑ..”

“එහෙනං මෙහෙන් ටිකක් ඉදගන්නකො.. මං ඔයාට කතන්දරයක් කියලා දෙන්නම්..”

ඇගේ මුහුණේ මෙතෙක් වූ අලස ගතිය පහ වී බොහෝ උද්යෝගයෙන් ඒ දෑස් දිදුලන්නට විය..

“අයියා.. මට වලව්වක් ගැන කතාවක් කියන්න..”

ඔහු මොහොතකට තිගැස්සුණි.. නැගණියගෙන් එවැනි ඉල්ලීමක් ඔහු කිසිසේත්ම බලාපොරොත්තු වූයේ නැත..

“ඔයා වලව්වක් ගැන දැන ගන්න ආසද..?”

ඔහු සිතුවේ මව දිනපතා වලව්වට යන බැවින් ඒ සම්බන්ධ කතා ඇගේ කණට වැටීම නිසා ඇය වලව් ගැන දැන ගැනීමට ආශාවෙන් පසුවනවා කියාය..

"ඔව්.. අපේ වලව්ව වගේ ලොකු.. එකක් ගැන කතන්දරයක් කියන්න.."

ඈ අපේ වලව්ව යන්න කීවේ තරමක් බර කරය.. චෛතිය පුදුම වී ඒ නෙතු දෙස බැලුවේය.. ඒ දෑස් ඔහුට කාගෙදෝ සොඳුරු රුවක මතකයක් අවදි කලද ඒ කවුදැයි චෛතියට සිතාගැනීමට අපහසු වුණි..

"අපිට කොහෙද චූටි වලව්වක්.? අපි ඉන්නෙ මෙහෙනෙ.."

"ඇයි අයියා.. අරහෙ තියෙන්නෙ.."

නැගණිය ඇඟිල්ල් දික් කර පෙන්වූයේ කල් කන්ද වලව්ව පිහිටි ඉසව්ව බව චෛතියට වැටහුණි.. නමුත් මෙම වත්ත අක්කර ගණනාවක් විශාල හෙයින් වලව්ව මෙම ඉසව්වට කිසිසේත්ම පෙනෙන්නේ නැත.. මව වුවද දිනපතා එහි යන්නේ පොල් වත්ත මැදින් වැටුණු අඩි පාර දිගේ පැය කාලකට අධික කාලයක් මග ගෙවාගෙනය..

"ඒකෙ අම්මා වැඩ කළාට ඒ වලව්ව අපේ නෙමෙයි චූටි.. ඒක හාමු මහත්තයලගෙ.."

"නෑ.. ඒක අපේ.."

කිසිත් නොතේරෙන තම පුංචි නැගණිය ගැන චෛතියට දැනුණේ අනුකම්පාවකි.. ඔහු නැගණියව තම උකුලට ගෙන ඇගේ හිස අත ගෑවැය..

"දහ අට අශේන්ගෙ උපන් දිනේ.."

තවත් මොහොතකින් ඈ කීවේ චෛතියව පුදුම කරවමිනි..

"කවුද අශේන් කියන්නෙ.? චූටිගෙ පංතියෙ යාළුවෙක්ද.?"

"නෑ.. වලව්වෙ පුතා.."

එවර ඔහු  ඈ දෙස බැලුවේ සැකයෙනි.. ඇතැම් විට අම්මා අශේන් බේබිගේ උපන් දිනය ගැන නිවසේදී කියන්නට ඇත.. එහෙත් ඈ ඔහුව බේබි හාමු හෝ අශේන් බේබි ලෙස හඳුන්වනවා  මිසක කිසි කලෙක අශේන් බෝ පුතා ලෙස හඳුන්වන්නේ නැත..

"කවුද ඔයාට ඉගැන්නුවෙ ලොකු මිනිස්සුන්ට නම් කියලා කතා කරන්න..?"

"එයා ලොකු නෑ.."

ඈ එසේ  කීවේ අශේන් බේබි හාමු මහතාට වඩා කුඩාවට දුටු නිසා වන්නට ඇත.. නමුත් නැගණිය  හතර පස් වසරකින් පමණ වලව්වට ගොස් නැති නිසා ඔහුගේ රූපයන් මතක තිබෙයැයි      සිතීමද අසීරු කරුණකි..

චේතියට මේ වෙලාවේ සිතුණේ කලනවත් ළග උන්නා නම් කියාය.. ඔහු මෙවැනි සියුම් දේ පිළිබඳව විගහු කිරීමට සැබැවින්ම දක්ෂයෙකි..

"චූටිට වලව්ව මතකද..? අශේන් බේබිව මතකද..?"

"ඔව්.."

කෙටි පිළිතුරක් දුන් ඈ ඉන් පසු දිර්ඝ කල්පනාවකට පිවිසියාය.. තමා උකුලේ හිඳුවාගෙන   ඉන්නා නැගණියගේ ගත තරමක් උණුසුම් වේගෙන එන බවක් චේතියට දැනුණි.. තමාඅනවශ්‍යග දෙයක් විමසමින් ඇයව ලෙඩ කලාදැයි සැක සිතුණු ඔහු වලව් කතාව එතනින්    නතර කළේය..

"චූටි.. මං ඔයාට කතන්දරයක් පස්සෙ කියලා දෙන්නම්.. දැන් ටිකක් නිදියන්න.."

"මට නිදිමත නෑ.. අනේ කතන්දරයක් කියන්නකො අයියෙ.."

ඈ හුරතල් වන්නට වූවාය.. නමුත් ඈ කී දේවල් ගැන සිතීමෙන් චේතියට උන්නේ දැඩි මානසික ව්‍යානකූල තත්වයකය..

"මගේ අත රිදෙනවා පැටියො.. අයියට ටිකක් අමාරුයි."

ඇගේ මනස වෙනතකට යොමු කිරීමට සිතූ චේතිය නැති අමාරුවක් මවා පෑවේය.. ඉන් කලබල වූ නැගණිය ඔහුගේ ඉදිමුනු අත ගෙන එහා මෙහා හරවා බැලුවේය..

"මොකද උනේ අයියා..?"

"ඉස්කෝලෙදි දුවන්න ගිහින් වැටුණනේ.."

ඔහුගේ බොරුව විශ්වාස නොකළ ලෙස ඇ මොහොතක් දෙකක් චේතියගේ මුහුණ බලා උන්නාය..

"නෑ.. අයියා කොල්ලො එක්ක ගහගෙන.."

ඔහු උඩ ගොස් බිම වැටුණි.. මවවත් නොදන්නා මේ කතාව ඇ දන්නේ කෙසේද..? ඇයට අනුන්ගේ සිත් කියවීමේ නුවණ පහළව ඇත්දැයි චේතියට සිතුනි.. ඇ වයසට වඩා දැනුමෙන් මුහුකුරා ගොස් ඇතත් මෙවැනි දේ ඔහු ඇගෙන් අපේක්ෂා කළේ නැත..

*****************************

එදින අමතර පන්තියකට සහභාගි වීම මගහැරි චේතිය හා මිතුරන් දෙදෙනා ගල් කන්ද වලව්වට පා නැගුවේ ඇතුලග හාමුගේ ඉල්ලීම මතය.. අනිද්දාට යෙදී තිබෙන අශේන් බේබිගේ උපන් දිනය නිසාවෙන් වලව්ව පිරිසිදු කිරීම ඔවුනට නියම වූ රාජකාරියයි.. වත්ත පිටිය උදළු ගා කල එළි කිරීමට කම්කරුවන් දෙදෙනෙක් පැමිණ තිබූ අතර තවත් පිරිසක් වලව්වේ පිටත තීන්ත ආලේප කරමින් උන්හ..

"උඹේ ඕනකමකට ආවා මිසක මං නං කැමැත්තෙන් ආපු ගමනක් නෙමෙයි චේති.. අපේ තාත්තා දන්නවනං මං වලව්වෙ කුලී වැඩ කරනවා කියලා.. මාව හම ගහයි."

රංගගේ කතාවට චේතියට පමණක් නොව කලනටද සිනා නැගුණි.. අතමිට යහමින් ගැවසෙන රංග අවසාන   මොහොතේ හෝ මෙවැනි වැඩකට කැමැත්ත දීම ගැන ඔවුන් උන්නේ පුදුමයෙනි..

"මුන්ට කඹුරනවා කියලා අපිට ඇති සෙතේ මොකක්ද බං.. ඕන නං කුකුල් අන්ඩක් එක්ක බත් එකක් දෙයි.."

"එහෙම නෑ බං.. එදා හාමු කිව්වනේ මේවට සලකන්නම් කියලා.. අදත් කීයක් හරි හම්බ වෙනයි.."

රංග වැඩය අතරමග නතර කර දමා යනු ඇතැයි සැක සිතුණු චේතිය සැනසිලි බස් දෙඩුවේය..

"උඹටනං ඉතිං ඔය බොරු කොණ්ඩෙයි.. උපන් ලපෙයි  , කණ්නාඩි කූට්ටමයි නිසා ටිකකක් හරි ජාමෙ බේරගන්න පුළුවන්.. අපිව කවුරු හරි දැක්ක ගමන් අඳුර ගන්නවා.."

ඔවුන්  සුළු වැඩ කිහිපයක් කරන අතර කතාවට වැටී උන්හ.. ඒ මොහොතේ මහ හඩින් රේස් කර පැමිණි බයිසිකලයක් මිදුලේ නතර වූයේ සැමගේ අවධානය එදෙසට යොමු කරමිනි..

"කවුද බං ඒ..?"

"ඒ තමයි අශේනයා.. උගේ පොඩ්ඩක් ගැට්ට වැඩියි.."

වලව්වට  නොපැමිණියද පාර තොටේදී නිතර දැක තිබුණ නිසා චේතියට, අශේනව අඳුනා ගැනීමටඑතරම් අසීරු වූයේ නැත.. වැඩිපුරම ඔහු දැන උන්නේ අශේන්ගේ බයිසිකලයයි..

"මචං අර පිටිපස්සෙ ආපු එකා.."

කලන පෙන්වූයේ අතට ප්ලාස්ටරයක් දමා උන් තැනැත්තෙකි.. ඔහුගේ මුහුනේ පැත්තක්ද ඉදිමී ඇත.. චේතිය සැනෙකින් ඔහුව අඳුනා ගත්තේය..

"ඒ අර මුගෙන් නැව් ගාණකට ගුටි කාපු එකානේ.."

කලනද ඔහුව අඳුනාගෙන තිබිණි..

"අඬෙ.. ඒ කියන්නෙ පොර අශේනයගෙ කකුලක්ද..?"

"කකුලක් උනත් අතක් උනත් තත්වෙ ටිකක් සීරියස් මචං.. ඌ අපිව අඳුන ගත්තොත් නං මෙතන දෙවන ලෝක සංග්‍රාමය දිගාරින්න වෙන්නෙ.."

රංග කීවේ චෛතිය දෙස බලාගෙනය.. මිතුරාගේ බොරු කොණ්ඩය හා වෙනස් පෙනුම නිසා ඔහුව හඳුනාගත නොහැකි යැයි එවර ඔහුටම සිතුණි..

"තුන් දෙනෙක්ට ගහපු මට දෙන්නෙක් වැඩි නෑ මචං.."

චෛතිය කීවේ දැඩි ආත්ම විශ්වාසයකිනි.. තමා මේ මොහොතේ ඉන්නේ වලව්වේ වුවද ඔහුගේ සිතට පුංචි හෝ චකිතයක් දැනුණේ නැත..

"ළමයිනේ.. හාමු මහත්තයා කිව්වා ඔය ළමයින්ට පුළුවන්නම් වලව්ව ඇතුළෙ මකුළු දැල් ටික කඩලා දාන්න කියලා.."

කොහෙදෝ සිට පැමිණි හේතුහාමි ඔවුන්ට අමතර වැඩක් පැවරුවේය.. එයට නම් චෛතිය එකග වූයේදැඩි කැමැත්තෙනි.. ඔවුට කොහොමටත් අවැසි වී තිබුණේ වලව්ව ඇතුළත රාජකාරියකි..

"පිස්සු හැදෙනවනේ.. මේකෙ වහලෙ උස බලපංකො.. අනික හතර අතට වහල කැලි එකසිය පනහක් විතර තියෙනවා.."

රංග උඩ බලාගෙන කියවද්දී චෛතිය වලව්ව ඇතුළත නෙත් දිවෙව්වේය.. තමා කුඩා කාලයෙදී දැක තිබුණාට වඩා විශේෂ වෙනස් කමක් කර නොතිබුණද මෙහි ඇතුළත ඇති මහේශාක්‍යව පෙනුම චෛතියගේ සිතේ අමුතුම හැගීමක් ඇති කරලීමට සමත් විය.. ගෘහ

භාණ්ඩ සියල්ල වුව  පැරණි මෝස්තරයන්ට අයත් ඉතා වටිනා දැව වලින් කැටයම් කර තනන ලද ඒවාය..

“මේ ඉන්නෙ ඇතුගලයගෙ වයිෆ් වෙන්න ඇති නේද.?”

දිගු සාලයේ කොණක එක පෙළට තාබා තිබූ රාම්රඟු කල පින්තූර කිහිපය අතරින් එකකට ඇඟිල්ල  දික් කල කලන අසද්දී චේතිය වහා එදෙස බැලුවේය.. ඔහුට දැනුණේ ළමා තැනී     ජීවමානව තමා දෙස බලා ඉන්නා බවය.. ඒ සොඳුරු රුව හිමි ඇ ජීවතුන් අතර නැතැයි      අදහා ගන්නටද නොහැකි තරම්ය..

“චේති.. මේ.. මේ..”

ඒ ඡායාරූපය දෙස මොහොතක් දෙකක් බලා උන් කලන කුමක්දෝ වැදගත් දෙයක් කියන්නට තැනුවේය..

“ආ ළමයිනෙ බඩු ටික.. යමු.. මුලින්ම උඩ තට්ටුවෙ ටික කඩලා දාමු..”

මකුළු  දැක් කැඩීමට අවශ්‍යබ ඉනිමං කොසු ආදිය රැගෙන පැමිණි හේතුහාමි පිරිස උඩටකැදවාගෙන ගියේය.. එනිසා චේතියට කලනගේ කතාව අසා ගැනීමට අවස්ථාවක් උදා වූයේනැත..

“මේ කැටයම් බර ගාණක් වටිනවා ඇති නේද.?”

තනි ලීයෙන් නිමවන ලද සියුම් ප්‍රතිමාවන් රැසක්ම උඩ තට්ටුවේ තබා තිබිණි.. ඒවා නරඹමින් පැමිණි ඔවුන් පිවිසියේ කොරිඩෝව කෙළවර වූ දිගු සැදැල්ලටය..

“අන්න  අර ඇත තියෙන ගල් තලාව උඹලට පේනවා නේද.   ?  ඕක දිගටම මායිම වෙලා තියෙන්නෙ වලව්  වත්තට ඒ කන්දෙ කොටසක් තමයි අර පොල් වත්ත පැත්තටත් විහිදිලා තියෙන්නෙ.”

චේතිය පෙන්වූයේ මිතුරන් දැන උන්නද මෙතෙක් දැක නොතිබූ දෙයකි..

"මාර ලොකේෂන් එකක්.."

කලනට නිතැතින්ම කියවිනි..

"ඔය ගල් තලාව නිසා තමයි මේකට ගල් කන්ද වලව්ව කියන නම හැදිලා තියෙන්නෙ.."

"මේ.. මේ.. ආපු වැඩේ කරලා ඉමු.. නැත්තං අපි ගල් කන්ද වලව්වට එන අන්තිම දවස වෙයි.."

ඔවුන් එක දිගට පැය කිහිපයක්ම ගල් කන්ද වලව්වේ මකුළු දැල් කැඩීමේ නිතරව උන්හ..

"දැන්නං උඩ බලන් ඉඳලම බෙල්ලත් රිදෙනවා.."

ඔවුන් මැසිවිලි නගමින් වුවද උඩ තට්ටුවේ වැඩ කොටස සම්පූර්ණයෙන්ම අවසන් කර දැමූහ..

"කෝ බං අශේනයයි.. අර ආපු අනිත් එකයි.."

කලන එය ඇසුවේ චේතියගේ කනට කරය.. සැබැවින්ම ඔවුන් කොහේට අතුරුදහන් වූයේදැයි චේතියට වුව තිබුණේ කුතුහලයකි..

"උඹලගෙ අම්මා අදත් ආවෙ නැද්ද චේති.?"

"ආවා.. ආවා.. මං හිතන්නෙ කුස්සියෙ වෙන්න ඇති.."

රංගට පිළිතුරු දෙන අතරතුර චේතියගේ දෙනෙත් උඩු මහලේ වූ කැටයම් කබඩයක් වෙත යොමුවිය.. තමා කුඩා අවදියේ මෙම කබඩය තිබුණේ පහල කන්තෝරු කාමරයේ බව ඔහුට හොඳින්ම මතක තිබිණි.. හාමු මහතා වටිනා ලියකියවිලි එහි තැන්පත් කරනු ඔහු දැක ඇත.. ඔහුගේ අවධානය නැවත වරක් බිඳිමින් හේතුහාමි එහි පැමිනියේය..

"එන්න ළමයිනෙ.. කාලා ඉමු.. දැන් හොඳටම මහන්සිත් ඇතිනෙ"..

ඔහු නගරයේ භෝජන ශාලාවක ලේබල් අලවන ලද බත් පෙට්ටි තුනක් සහිත බෑගයක් කලන අත තැබුවේය..

"ඇයි අන්කල් මේ කෑම කඩෙන් ගෙනත්.. ඇයි අර උයන්න ගෑණු කෙනෙක් ඉන්නවා කිව්වා නේද..?"

"ගුණවතී නම් ආවා.. උන්දැත් උදේ ඉඳලම කුස්සි කෑල්ල අස් කරනවා.. තාම ඉවරයක් නෑ.."

බත් පැකට් තුන අතට ගත් චේතිය ඇතුළු පිරිස පොල් වත්තේ මැද හරිය දක්වා ගමන් කළේ පිරිස මඟ හැර නිදහසේ ආහාර භුක්ති විඳිමිනි..

"මේ වලව්වෙ පුදුම කාමර තොගයක් ඇති මචං.. බලපංකො හෙන සද්දන්ත සයිස්නෙ.."

පොල් වත්තේ ගස් කිහිපයකට පිට දී ඉඳගත් ඔවුහු පසෙකින් වැජඹෙන මහා මන්දිරය දෙස බලා සිය කතාව ආරම්භ කළහ..

"ඕකෙ මට මතක විදියට කාමර විසි දෙකක්ද කොහෙද තියෙනවා.. ඒත් වැඩි හරියක් ඒවා වහලා.."

චේතිය සිය මතකය අවදි කළේය.. ඔහුට සැනෙකින් සිහිපත් වූයේ පෙරදා සිය නැගණිය මෙම වලව්ව සම්බන්ධව කී කතාවකි..

"අපේ චූටි කිව්වනේ කලන මේ වල්ව්ව අපේ කියලා.."

එය ඇසී සිනාසීමට ගිය රංගට කමින් උන් බත් පිඩ පිට උගුරේ ගියාය.. නමුත් කලන නම් දැඩි කල්පනාවකට වැටිණි..

"මං උඹට අර ෆොටෝ එක පෙන්නලා මොකක්ද දන්නවද කියන්න හැදුවෙ..?"

"මොකක්ද..?"

චේතිය කලනගේ මුහුණට එබී විමසුවේය..

"ඔය ළමාතැනී කියන කෙනාගෙ මුහුණුවර හරියට උඹලගෙ නංගිගෙ වගේ.. බලපං බොරුද කියලා.. ලොකු බෝල ඇස්.. හමේ ඇත් දල පාට.. කැරලි කැරලි කොණ්ඩෙ.."

එවර ගිනි වැදුණේ චේතියගේ සිතටය.. නැගණියගේ මුහුණ දකින වාරයක් පාසා තමාට යම් කෙනෙකු සිහිපත් වූවද ඒ කවුදැයි පැහැදිලිව වටහා ගැනීමට තරම් නිරවුල් මනසක් තමාට නොවූ බව ඔහුට සිහිපත් වුණි..

"උඹ කියන්නෙ එතකොට.."

සැබැවින්ම ඔහු පටලැවී උන්නේය..

"උඹලගෙ නංගි.. චූටි කියන්නෙ ළමාතැනීගෙ දුවෙක්ද.?"

එයනම් කිසිසේත්ම විය නොහැකි බව චේතියට වැටහුණි.. තම මව නැගණිය ලැබීමට ගැබ්බරව උන් හැටි තමව මතකය.. අනික වලව්වේ ළමාතැනී මියගියේ ඊට පෙරය.. එසේනම් තමාගේ නැගණිය ළමාතැනීගේ හැඩරුව ගත්තේ කෙසේද.?

"ඒක වෙන්න බෑ බං.. චූටි ඉපදුනේ අපේ අම්මගෙ කුසෙන්.. ඒක මට හොඳටම ෂුවර්.."

"මේ ගැන ඇහුවට උඹ මුකුත් හිතන්න එපා.. උඹේ තාත්තා නැති උනේ අපි බාලාංශ පංති වල ඉද්දි.. උඹේ නංගි හම්බ උනේ අපි ශිෂ්‍යපත්වෙ කලාටත් පස්සෙ.. අනික උඹලගෙ අම්මානංගි ගැන වැඩිය විස්තර මුකුත් කතා කරන්නෙත් නෑ.. ඒ මදිවට නංගි වලව්වෙ ළමාතැනී වගේ.. මේ සේරම එකකට එකක් පටලැවෙනවා වගේ දැනෙන්නෙ නැද්ද..?"

දැන් නම් චේතියගේ ඔළුව යකාගෙ කම්මල මෙන් වී තිබුණේය.. තම මවට සිටි දරුවා රෝහලේදී මිය ගියා වන්නට බැරිද.. ? නැගණිය

සැබැවින්ම ළමාතැනීගේ දරුවෙකු විය නොහැකිද..? නමුත් ළමාතැනී මිය ගියේ නැගණිය ඉපදීමට මාස ගණනාවකට පෙර නම්..

"මට තේරෙන්නෙ නෑ මචං.."

කටවල් දෙක්ක පමණක් කෑ බත්පත ගුලිකර දැමූ චේතිය වමතින් සිය නළල් තලය තද කර අල්වා ගත්තේය..

"උඹේ අම්මා කවදාවත් චූටිගෙ අම්මා කවුද කියලා උඹට කියලා නැද්ද..?"

"නෑ රංග නෑ.. මං අම්මගෙන් ඒ ගැන අහලත් නෑ.. ඒත් අම්මා දවසක් ඇලිසා නැන්දා එක්ක කිව්වා එයාට කාගෙන්ද කරදරයක් උනාලු.. එයා තමයිලු චූටිගෙ තාත්තා.."

"උඹට සැක හිතන්න පුළුවුන් කවුරුහරි කෙනෙක් චූටිව බලලා යන්න එහෙම උඹලගෙ ගෙදර ඇවිත් තියෙනවද..?"

"ඒත් නෑ.."

"අනේ මංදා බං.. දැන්නං උඹේ විතරක් නෙමෙයි මගෙත් ඔළුව අවුල් වෙලා.."

"හරි මචං.. දැන් ඔය කතා කියන්න එපා.. අපි මෙහෙම කරමු.. කාලෙකින් අපිට පන්සල පැත්තෙත් යන්න බැරි උනානෙ.. සෙනසුරාදා පංති නැති නිසා අපි එදා හවසට පන්සල් යමු.. ගිහින් හාමුදුරුවො එක්කත් මේ ගැන කතා කරමු.."

මිතුරාගේ මනස නිරවුල් කිරීමට අවැසි නිසා කලන තාවකාලික විසඳුමක් දුන්නේය.. චේතිය හා රංග එයට එකග හිස් සැලුවේ ගමේ පන්සලත් එහි ස්වාමීන් වහන්සේලත් තමාගේ පවුලෙ අය තරමටම ඔවුන්ට ලෙංගතු බැවිනි.

පසුදා  පාසල් ගියාද චේතියගේ සිත තිබුණේ කොහේදෝ අතරමං වීගෙනය.. අම්මා.. නැගණිය..     ගල් කන්ද වලව්ව මේ සියල්ල හතරවටින් විත් තම සිතට වද දෙන බවක් ඔහුට දැනුණි..

“උඹ විතරක් ඕවා ගැන කල්පනා කරලා හරියන්නෙ නෑ.. ඔන්න අපිට හෙට වලව්වෙ පාටියට  ඉන්විටේෂන් හම්බ වෙලා තියෙන්නෙ.. අර හම්බ උන සල්ලි වලින් හොද කිටක්වත් අරන්ලෑස්ති වෙයන්..”

අහස පොළව ගැටලන්නට මෙන් කල්පනා කරන මිතුරා දෙස බැලූ කල වලව්වේ ආරාධනය ඔහුට සිහිපත් කර දුන්නේය..

“මං හිතුවෙ නෑ බං මකුළු දැල් කැඩුවට ඒ වගේ ගාණක් දෙයි කියලා.. කුලීකාරයො දාලා  කරත් එකෙක්ට රුපියල් පන්සීයක් දාහක් විතර දෙන වැඩක්නෙ ඒක..”

චේතිය කීවේ හාමු මහතා එක් අයෙකුට රුපියල් දෙදහස බැගින් දීම තවමත් අදහාගත නොහැකි     වූ හන්දාය.. එතරම් මුදලක් ඔහු කිසිසේත්ම අපේක්ෂා කලේ නැත..

“මේ.. මේ.. උඹ ඇදුම් ගන්න ඒ සල්ලි වියදම් කරන්න එපා.. ඉදා.. මේකෙන් කිට් එකක් ගනිං..”

මිතුරන් තිදෙනාගෙන් පොහොසතා වූ රංග සිය බෑගයෙන් ගත් තරමක් විශාල ඉටි බෑගයක් චේතියට තිළිණ කලේය.. එයින් විදේශීය විලවුන් සුවදක් නික්මිණ..

“අපේ අයියා ගියසතියෙ වැකේෂන් එකට ආවනෙ.. මිනිහා ඊයෙ අපේ ගෙදර ඇවිත් මට ඇදුම්    ලෝඩ් එකක් දීලා ගිහිල්ලා.. මමත් තාම හරියට බැලුවෙ නෑ.. දැනට ඕක තියාගනිං..     පස්සෙ තව ගෙනත් දෙන්නම්..”

රංග    අයියා ලෙස හැදින්වූයේ ඔහුගේ බාප්පාගේ පුතාය.. ඕස්ට්‍රේලියාවේ පදිංචි ඔහුලංකාවට පැමිණෙන සෑම විටම රංගට මෙලෙස ඇදුම් ගෙන ඒම සිරිතක් වශයෙන් පැවතුනි..රංග ඉන් එකක්

හෝ දෙකක් චෛතියට දීම වරද්දන්නේ නැත්තේ ඔහුගේ දුප්පත්කම දැන උන් නිසාය.. එනිසා මෙය චෛතියට විශේෂයක් වූයේ නැත..

"පින් සිද්ධ වෙනවා මචං.. උඹලට පිං සිද්ධ වෙන්න තමයි මං මෙහෙමවත් ඇදලා කරලා ඉන්නෙ.. නැත්තං ඉතිං මාං හැමදාම හිගන්නා.."

චෛතිය රංගගේ අත දෝතින්ම අල්ලා සිය කෘතවේදීත්වය පළ කළේය.. හාමු මහතා ඇතැම් අවස්ථාවල අත දිගහැර වියදම් කළද ඔහු අම්මාට වැටුප වශයෙන් ගේවීවේ ඉතාම සුළු මුලදකි.. ඇතැම් විට තමාට ඉන්න නිවෙසක් දී ඇති නිසා එතරම් වැටපු අවශ්‍යනැතැයි ඔහු සිතුවා වන්නට ඇත.. තමා ඉදහිට මවට හොරෙන් අමතර වැඩක් කර කීයක් හෝ උපයා ගත්තද එය නිවසේම අවශ්‍යතා සඳහා වැය වේ.. එනිසා ඔහු බොහෝ විට ඇන්දේ පැළැන්දේ මිතුරන්ගේ ඇඳුම් පැළඳුම්ය..

"හරි.. හරි.. පිං වලින් වැඩක් නෑ.. උඹ අර නංගිගෙ සිද්ධිය ගැන තව ටිකක් හිතල බැලුවද..?"

මිතුරා සංවේදී වීම ඉවසාගත නොහැකි වූ රංග පෙරදා වූ කතාව සිහිපත් කළේය..

"මට ඕකෙ හරි විස්තරයක් ගන්න පුළුවන් නතාලි අක්කගෙන්.. එයා අපේ අම්මට ගොඩක් හිතවත් නිසා අපේ පවුලෙ විස්තර තරමක් දුරට දන්නවා.."

"වැඩිය ඕනෙ නෑ.. මුලින්ම අහලා බලපං නංගී උඹේ අම්මගෙම ළමයෙක්ද කියලා.. එයාගෙ තාත්තා කවුද කියලා විතරක්.. ඉතුරු ටික අපි පස්සෙ හොයාගමු.."

කලනද චෛතියට උපදෙස් දෙන්නට විය.. මෙය දැන් චෛතියගේ පමණක් නොව රංග හා කලනගේද කුතුහලය අවුස්සන සුළු මාතෘකාවක් වී ඇත..

“මම අදම අහලා උඹට කියන්නම්.. කොහොමටත් අපි හෙට මීට් වෙනවනේ..”

“අපිට ඊයෙ වගේ හෙටත් උඹලගෙ අම්මට මාට්ටු නොවී ඉන්න පුළුවන් වෙයිද.. ? එයා උඹව නැතත් අපි දෙන්නව හරි අඳුර ගත්තොත්..”

“එහෙම වෙන එකක් නෑ.. එයාගෙ රාජකාරිය කුස්සියෙම තමයි ඉතිං.. දැක්කත් එයා කීයටවත් හිතන එකක් නෑ අපි එනත ඉදියි කියලා”.

“පව් බං.. වෙලාවකට උඹලගෙ අම්මා ගැන මාර දුයි.. එයා කොයි තරම් සැප විදින්න පුළුවන් පවුල කෙනෙක්ද..? වලච්චක ඉපදිලා දැන් වලච්චක ඉඳුල් හෝදනවා..”

මිතුරාගෙන දැන තිබූ කරුණු සම්පින්ඩනය කර රංග පැවසුවට චේතියගේ නෙතු කඳුළු පටලයකින් වැසී ගියේය.. සැබැවටම තම මව මෙසේ දුක් විදිය යුතු අයෙක් නොවේ යැයි චේතියගේ සිත කියයි.. පියා සමග රහසේ පැන ආවා නම් ඈ අද සැපවත් ජීවිතයක් ගත කිරීමට ඉඩ තිබිණි.. අනෙක් සැප සම්පත් නොවූවාට ස්වාමියාගේ ආදරය ලැබීමට පවා ඈ අවාසනාවන්ත වූයේ කෙටි කාලයකි..

“දැන් උඹ හෙට කියන්න යන බොරුව මොකක්ද..? ක්ලාස්ද..? බාල දක්ෂද..? ඩ්රාරම්ද”.

චේතිය දිගින් දිගටම කල්පනා කරනු දුටු රංග කතාව වෙනතකට හැරවූවේය..

“මං මොනවා කිව්වත් අම්මට මාව සැක නෑ බං.. අනික ගෙදරට බොරු කිව්වා කියලා මං නරක දෙයක් කරන්නෙ නැනෙ”.

“අපි ඉන්නක් උඹට නරක දෙයක් කරන්න දෙන්නෙත් නෑ.. උඹ කවදහරි හොඳ තැනකට ඇවිත් ඔය පවුල ගොඩ ගන්න ඕනෙ චේති.. අපි හැමදාම උඹ ළඟ ඉන්නවා..”

පාසල ආරම්බ කරන සීනුව නාද වූ බැවින් මිතුරෝ තිදෙන කතාව නවතා පංති කාමරය වෙත ගමන් කළහ..

*****************************

පාසල අවසන් වූ සැනින් චේතිය නිල ඇඳුම පිටින්ම නුවර බලා යන බසයකට නැගුනේ නතාලි   අක්කා මුණ ගැසීමටය.. ඔහු ඇයට දුරකථන ඇමතුමක් දී තිබූ නිසා ඔහු යන විටත්   නතාලි අක්කා වැව රවුමට පැමිණ උන්නාය..

“ඇයි මල්ලි මේ හදිස්සියෙම.. ගෙදර මොකක්හරි කරදරයක්ද?.”

චේතිය කිසිදාක මෙසේ දුරකථන ඇමතුම් දී තමාව හදිස්සියේ මුණ ගැසෙන්නේ නැති නිසා නතාලි සැබැවින්ම උන්නේ කලබලයෙනි..

“කරදරයක් නෙමෙයි අක්කා.. මට ඔයාගෙන් පොඩි දෙයක් දැනගන්න තියෙනවා..”

එවර ඈ චේතිය දෙස බැලුවේ දෑස් තරමක් පුංචි කර තරමක කුතුහලයෙනි..

“පොඩි දෙයක් නං වෙන්න බෑ..”

චේතිය ඈ දෙස බලා සැහැල්ලු ලෙස සිනාසී තම නැගණිය වූ චූටිගේ අසනීපය ගැන තරමක   විස්තරයක් කලේය.. කොහොමටත් මේ පිළිබඳව නතාලි පෙර සිටම දැනුවත්ව උන් බව   චේතියට අමතකව තිබිණි..

“දැන් මල්ලිට දැනගන්න ඕන කරන්නෙ මොනවද.?”

“මෙච්චරයි අක්කෙ.. චූටි කියන්නෙ අපේ අම්මගෙම ළමයෙක්ද?.”

ඔහු ඇසූ දෙයට නතාලිගේ දෑස් නළලටම ගියේය..

"ඈ ළමයො.. ඔයාට ඒකවත් ෂුවර් නැද්ද.. ? ඔයාගෙ අම්මට නංගි හම්බවෙන්න හිටියා මතක නැද්ද.?"

"මතකයි අක්කෙ.. ඒත්.."

"ඒත් කිච්චෙ..?"

"මට සමහර දේවල් පැටලෙනවා.. අම්මට චූටිව හම්බවෙන්න හිටිය එක මට මතකයි.. චූටිව හම්බවෙලා ගෙදරට ගෙනාපු දවසත් මට මතකයි.."

"එහෙනං ඉතිං තව මොනවද.?"

"අම්මා ඒ ගෙදරට ගෙනාවෙ එයාගෙම කුසින් ලැබුණු දරුවද?."

"ඔව් මල්ලි ඔව්.. ඔයාට ෂුවර් නැතුවට මටනං ඒක හොඳටම ෂුවර්.. ඇයි ඔයා එහෙම ප්‍ර්ශ්නයක් ඇහුවේ."

එවර ඔහු කලන ගෙන ආ උපකල්පනය නතාලි හමුවේ දිගහැර සිටියේය.. එයට ඇගේ මුහුණේ ඇඳුනේ සාවඥ සිනාවකි..

"ඔයාට පැහැදිලි මතකයක් නැත්තෙ ඔයා ඒ දවස්වල පුංචි ළමයෙක් හින්දා.. ඔයාගෙ යාළුවා හිතන දේ සාධාරණයි.. ඒත් එහෙම දෙයක් උනේ නෑ මල්ලි.. ඒ කාලෙ උනත් නිතර එන්න විදියක් නොතිබ්බට මං ඉඳලා හිටලා හරි ගුණවතී පුංචිව බලන්න ගියා ආවා."

"ඉතිං.."

"ඔය වලව්වෙ ළමාතැනවී මැරුණ විස්තර.. අම්මට ළමයෙක් ලැබෙන්න හිටිය විස්තර එහෙම මං දන්නවා.. අනික ළමාතැනීට හිටියෙ අශේන් විතරයි.. එයාට වෙන ළමයෙක් ලැබෙන්න හිටියෙත් නෑ.. එයා කාලයක් තිස්සෙ හිටියෙ අසනීපෙන්නෙ."

"ළමාතැනී මැරුණ හැටි මටත් මතකයි.. එයා අන්තිම හුස්ම හෙලුවෙ මගේ අත අල්ලගෙන.."

ඒ දුක්බර දවස ඔහු නැවතත් මෙනෙහි කලේය.. එදා ඈ මිය යන විට ළග උන්නේ චේතිය පමණි..

"ඔය ළමාතැනී ගැන අහලා තිබුණට මං එයාව දැකලා නැහැනෙ.. ඒ නිසා චූටි එයා වගේද කියලා මං දන්නෙ නැහැ."

"චූටි ඒ  වගේ තමයි අක්කෙ.. චූටි පොඩි කාලෙ ඉදලම මට ඒ වගේ මූණක් මතක් උනා.. ඒත් ඒ  කාගෙද කියලා මට හරියටම තේරුණේ එදා වලව්වෙදි ළමාතැනීගෙ ෆොටෝ එක ආපහු දැකපුවසෙයි.."

"ඔයා වලව්වට ගියාද..?"

නතාලි ඇසුවේ පුදුමයෙනි.. චේතිය මෑත කාලයේ වලව්වට නොගිය බව ඇයට මතකය..

"ඔව් දවස් දෙකක් ගියා.. ඒත් අම්මට හොරෙන්."

"ඉතිං ඔයාලා අදුරගත්තෙ නැද්ද.?"

ඇයගේ ප්‍ර ශ්ණයට පිළිතුරු ලෙස චේතිය එම දින දෙකෙහි වූ සියළු සිදුවීම් ඇයට සවිස්තරව පැවසුවේය..

"මෙච්චර කාලයක් එහෙ නොගිහින් ඉදලා ආපහු ඇයි ඔයාට එහෙ යන්න හිතුනෙ..?"

"මං එහෙ යන එක නතර කලේ ළමාතැනී නැති උනාට පස්සෙ. එයා නැතුව එහෙ ගිහින් වැඩක් නෑ  කියන එක මට ඒ කාලෙ හිතුනා.. ඒ විතරක් නෙමෙයි, මට මොකක්දෝ හේතුවක් නිසා හාමු  මහත්තයව පේන්න බැරුව ගියා.. කල් යද්දි ඒක ඉබේම වෛරයක් වගේ දේකට පෙරළුනා.."

"වෛරයක් කිව්වෙ..?"

“සොච්චම් පඩියකට අපේ අම්මගෙන් මරව මරව වැඩ ගන්න එකත් එක හේතුවක් වෙන්න ඇති.. ඒත් ඊට වඩා ගැඹුරු දෙයක් මගේ හිතට දැනෙනවා අක්කෙ.. ඒ මොකක්ද කියලා හොයා ගන්නත්එක්ක තමයි මං එහෙට ආපහු යන්න තීරණේ කලේ..”

එවරනම් නතාලිට තරමක බියක් දැනුණි.. චේතියගේ මෙම හැංගි මුත්තම හෙළිවූ දාක ඔහු ලොකු විනාසයකට මුහුණ පාවි යැයි ඇයට සිතෙන්නට විය..

“ඇයි ඔයා ගුණවතී පුංචිට හොරෙන් වලව්වට යන්න තීරණේ කලේ?. එයාට කියලා ගියානං එයා කීයටවත් විරුද්ධ වෙන එකක් නෑ”.

“ඔව්.. විරුද්ධ වෙන එකක් නෑ.. ඒත් මං ගුණවතීගෙ පුතා කියලා හාමු දැනගත්ත දවසට මටත් හම්බවෙන්නෙ අපේ අම්මට වගේ කුඩම්මලගෙ සැලකිලි තමයි.. එහෙම උනොත් මට කිසිදෙයක් හොයාගන්න බැරි වෙනවා..”

“ඔතන මොකක් හරි රහසක් තියෙනවා කියලා ඔයාට හිතෙනවනං අපි හොයාලා බලමු.. ඒත් මල්ලි අපි ගොඩක් ප්රතවේශමෙන් වැඩ කරන්න ඕනෙ.. එහෙම නැත්තං අපිත් ගල් කන්ද වලව්වෙ පොළවට පස් වෙන්න බැරි නෑ..”

“මේ චූටිගෙ ප්රශ්නෙන් මගේ ඔළුවට හරි බරක් අක්ෂ්ක..

ඔහු නැවත වරක් ප්ර.ශ්නය මුලටම පැමිණියේය..

“ඔයා ඒ ගැන කලබල වෙන්න එපා.. අපි වෙන විදියකට මේ ගැන හොයලා බලමු..”

“වෙන විදියකට කිව්වෙ..?”

“ගුණවතී පුංචි මාර්ගයෙන්ම මං ඔක දැනගන්න බලන්නං.. එයා දන්න දෙයක් තියනවනං මට හරි කියයිනෙ..”

“චූටිගෙ තාත්තා කවුද කියලා ඔයා දන්නවද අක්කෙ..?”

ඇසීමට ප්‍රිය ජනක නොවූ එහෙත් දැනගත යුතුම මාතෘකාවක් චෛතිය කතාවට ඇදා ගත්තේය.. ඔහු එය මෙම වසර හත පුරාවට මවගෙන් නෑසූ දෙයකි..

“ඔයාගෙ අම්මට චූටිව හම්බවෙන්න උනේ මට අවුරුදු පහළොවක් විතර කාලෙදිනෙ මල්ලි.. ඒ කාලෙ මං කොහොමද කටක් ඇරලා පුංචිගෙන් ඔහොම ප්‍රශ්නයක් අහන්නෙ.. අදටත් මං ඒ ගැන පුංචිගෙන් අහලා නෑ.. අනික පාළු ගේක පොඩි ළමයෙක් එක්ක තනියම ඉන්න ඇහැට කණට පේන ගෑණු ළමයෙක්ට කොයි විදියෙ කරදර වලට මූණ දෙන්න සිද්ධ වෙන්න ඇත්ද..පුංචි අසරණ වෙන්න ඇති මල්ලි..”

“අම්මා දැන දැනම වැරැද්දක් කලා කියලා මම කියන්නෙ නෑ අක්කෙ.. ඒත් චූටිට තාත්තා කෙනෙක් ඉන්න එපැයි.. එයා හරියටම කවුද කියලයි මට දැනගන්න ඕන..”

“මමත් මේ ගැන තව හිතලා බලන්නම් මල්ලි.. දැන්ම කලබල වෙලා ප්‍රශ්න ඇති කරගන්න එපා.. මගේ ඔළුවෙත් පොඩි අදහසක් තියෙනවා.. අපි බලමුකො..”

නතාලි ඔරලෝසුව දෙස බැලුවේ තමා දැන් යා යුතු බව ඇඟවීමට මෙනි.. සම්මානි මුල් කරගෙන සිදු වූ ගුටි බැට හුවමාරුව නතාලිට පැවසීමට චෛතිය අදහස් කරගෙන උන්නද කාලයඹවුනට හරස් විණි..

“දැන් ඔයා වලව්වෙ පාටියට යනවද.?”

ඈ නික්ම යාමට මත්තෙන් විමසා සිටියාය..

“ඔව් හෙට යන්න ඕනෙ.. කොහොමටත් පොඩි දැන හැඳුනුම්කමක් නැතුව විස්තර හොයාගන්න අමාරුයි..”

“ඔයා සැරෙන් සැරේ කොමියුනිකේෂන් සෙන්ටර් වලට සල්ලි නාස්ති කරන්න එපා.. දැනට මේ ෆෝන් එක තියාගන්න.. අලුත් තොරතුරු මොනව හරි දැනගත්තොත් මට කෝල් කරන්න..”

සිය අත් බෑගය තුලින් කුඩා ජංගම දුරකථනයක් අතට ගත් නතාලි එය චේතියට පෑවාය..

"එතකොට අක්කට..?"

"මං තව අලුත් එකක් ගත්තා.. ඔයා ඕක පාවිච්චි කරන්න.. හැබැයි සිම් එකක්නං ගන්න වෙයි.."

චේතිය දුරකථනය එහා මෙහා හරවා බැලුවේය.. එය පාවිච්චි කරන ලද එකක් වුවද තරමක් මිල අධික එකක් බව ඔහුට වැටහුණි..

"අක්කට පිං සිද්ධ වෙනවා.. මං සිම් එකක් අරන් ඔයාට කෝල් එක්ක දෙන්නම්.."

"මං එහෙනම් යන්නම් මල්ලි.. තව ටිකකින් විශ්ව අයියත් එනවා කිව්වා.."

ඈ හදිස්සි වූ කාරණය වැටහුණු චේතිය සරදම් සහගත සිනහවක් නැගීය..

"හරි.. හරි.. ඔයාලත් එළිපිට නටන දවසක් එයිනෙ.. එදාට අපි බලමුකො.."

සිය ලැජ්ජාව සඟවා ගැනීමට විහිලුවක් කල ඈ කැන්ඩි සිටි සෙන්ටර් ගොඩනැගිල්ල දෙසට  පිය නැගීය.. චේතිය කුරුණෑගල බලා පිටත් වූයේ සම්මානි ගැන මෙනෙහි කරමිනි.
උදා වූයේ සැමටම කාර්යබහුල දිනයකි.. අශේන් බේබිගේ උපන් දිනය නිසා එදින ගුණවතී  උදෑසනම වල්වච්ට යා යුතු විය.. පුංචි මිහිරාවි සුපුරුදු පරිදි අසල්වැසි  ඇලිසාට බාරවිණි.. නිවසේ සිටම සූදානම්ව ගියහොත් තමාව හඳුනාගතැයි සිතුණ    චේතියද සිය ඇඳුම් පැළඳුම් සියල්ල රැගෙන රංගගේ නිවසට ළඟා විය..

"අද එතනට තද පොරවල් එහෙම එයි.. අශේනයගෙ කොල්ලො සෙට් එකට උනත් සෙකන්ඩ් වෙන්නෙ නැති විදියට අපිත් යං.!!"

එසේ කී  රංග දුරකථන ඇමතුමක් දී කලනවද සිය නිවසට ගෙන්වා ගත්තේය.. දහවල් වන විට ඔවුන් තිදෙනා රංගගේ සොහොයුරා ගෙන් දුන් විදේශිය ඇඳුම් වලින් සැරසුණි..

"උඹට ඔය බොරු කොණ්ඩෙ දාගෙන ජෙල් ටිකක්වත් ගාගන්න විදියක් නෑ නේද..?"

සුපුරුදු වේශ නිරූපණය දමාගත් චෙතියගේ කොණ්ඩය අතගා කලන විහිළු කළේය..

"තව ටික දවසයි බං මෙහෙම යන්නෙ.. ඊට පස්සෙ මං වලව්වට පය තියන්නෙ මගේ සැබෑ ස්වරූපයෙන්.."

"එදාට තමයි හාමුවා උඹට ඉලපත ගන්නෙ.."

"ඌ කොහෙද බං එච්චර කෙරුමෙක් වෙන්නෙ..    ?   කොහොමටත් තුරුම්පු ටික අතට ගන්නකල් මං හදිස්සි වෙන්නෙ නෑ"

රංග චෙතියගේ කතාවට සවන් දෙන අතරතුර සිය අල්මාරියෙන් මිල අධික විලවුන් බෝතලයක් ගෙන සිරුර පුරා තවරා ගත්තේය..

"ආ.. ගාපං.."

ඔහු එවරද සිය පරිත්‍යා ගශීලීත්වය පෙන්විය..

"අපිට එන්න කිව්වෙ දවල්ටද.. රෑටද.?"

කලන එම ප්‍රශ්නය නැගුවේ සියළු දෙනා පිටත් වීමට සැරසුණ විටය..

"වෙලාවක් කිව්වෙ නෑ බං.. අනික අපේ අම්මා කිව්වා දවසෙම පාටිය තියෙනවා කියලා.."

"මලා.."

චේතිය කතා කරන අතරතුර රංග කලබලයෙන් සිය නළලට අත ගසා ගත්තේය..

"කවුද මලේ..?"

කලන ඇසුවේ සිනාසෙමිනි..

"අපි යන්නෙ බර්ත් ඩේ පාටියකටනේ බං.. කෝ ඉතිං තෑග්ගක්?."

අනෙක් දෙදෙනාටද මෙතෙක් එය සිහිපත් වූයේ නැත..

"දැන් මොකද කරන්නෙ..? තෑගි හොයන්න යන්න වෙලාවකුත් නෑ.. අනික අශේනයා සෝබනකාරයා බං.. ඌට අපි දෙන තෑගි වැඩක් වෙන එකකුත් නෑ.."

චේතිය කීවේ අශේන්ගේ විස්තර ඔහු දැන උන් නිසාය..

"එහෙම කියලා අතපය වන වන යන්න බෑනෙ බං.."

එසේ කී රංග ඔහු සතුව තිබූ දවටනය ඉවත් නොකරන ලද විලවුන් බෝතලයක් අලුත්ම ඉටි බෑගයකට දමා ගත්තේය..

"මෙන මොනවා කරන්නද ඉතිං.. දැනට මේකවත් ගෙනියමු.. ඌ සෝබනේ දැම්මොත් ආපහු අරන් එමු.."

රංග කී දෙයට චේතියද හා කලනට සිනා නැගුණි..

"එහෙනං හරිනේ.. මං තාත්තට කිව්වා ටිකක් වෑන් එක එවන්න කියලා.. අපි ඒකෙ යමු.."

ඔවුන් දහවල් දොලහයි තිහ පමණ වන විට ගල් කන්ද වලව්වට ළගා වූහ.. පෙරදා දුටුවාට වඩා වලව්ව සෑහෙන වෙනස් මුහුණුවරක් ගෙන තිබීම ඔහුන්ගෙ මවිතයට හේතු විය..

"බලපංකො බං සරසලා තියෙන හැටි.. හරියට මගුල් ගේකට වගේ"..

මිදුල පුරා විදුලි බුබුළු වැල් එල්ලා පුටු දමා ඉතා උත්කර්ශවත් ලෙස සරසා තිබිණි..

"මුගේ හැම උපන්දිනේම මේ වගේද.?"

කලන චෛතියගේ කණට කර විමසුවේ මෙය අධික වියදමක් දරා සැලසුම් කර තිබූ උත්සවයක් නිසාය..

"දන්න තරමින් වෙනදට පාටි තිබුණෙ කොහේ හරි හෝටලේක.. මං හිතන්නෙ ළමාතැනී නැති උනාට පස්සෙ වලව්වෙ මේ තරම් ලොකු පාටියක් දාන පළවෙනි පාර.."

කතාවෙන් කතාව ඔවුන් පිරිස අතරින් ගල් කන්ද වලව්වේ ප්‍රධාන ද්වාරය කරා ළගා වූහ..

"කවුද මේ ඉලංදාරියා..?"

ඇතුගල හාමු මහතාට චෛතිය ඇතුළු මිතුරන් දෙදෙන හදුනා ගැනීමට නොහැකි වී තිබිණි..

"හාමු මහත්තයා.. අපි අර බාල දක්ෂ.."

"ආ.. මතකයි.. මතකයි.. කොල්ලො තුන්දෙනා අද අදුරන්නත් බැරි තරම්නෙ.."

කලන සිය හදුන්වා දීම අවසන් කරන්නටත් පෙර ඇතුගල හාමු සිය කටහඬ අවදි කළේය.. එය ඔවුනට තරමක ආඩම්බරයක්ද විය..

"කෝ.. අශේන් බේබි නැද්ද.?"

අශේන්ව බේබි ලෙස හැදින්වීමට තරම් කැමැත්තක් නොවුනද රංගට මේ අවස්ථාවේ වෙන කල හැක්කක් නොවිය..

"හිටියා.. හිටියා.. ඔය යාළුවො ටික එක්ක ගල් තලාව පැත්තට ගියේ.. ඔය ළමයි ගෙට ගිහින් මොනව හරි බීලා ඉමුකො.."

පිරිස පිළිගැනීමට උපන්දිනකාරයා නොවුනද හාමු මහතාගේ ඉල්ලීම පිට ඔවුන් වලව්ව තුළට පිවිසයහ.. පැමිණ උන් සියළු අමුත්තන් වැදගත් පෙනුමැති ප්‍රටභූවරුන් වුවද‍චේතියලා ඒ අතර හැල්ලු වන මට්ටමේ නොවූහ.. විශේෂයෙන් චේතිය අන් දෙදෙනාටම වඩා මනා පෞරෂයකින් යුක්ත විය..

“වලව්කාරයෙක් වෙන්නත් පෙර පිං කරලා තියෙන්න ඕන බං.. බලපංකො අශේන්ට තියෙන සැප..”

“මේ මිනිහගෙ කී වෙනි උපන්දිනේද චේති..?”

“මං හිතන්නෙ විසි හතරක් විතර ඇති..”

ඔහු පිළිතුරු දුන්නේ අනුමාන වශයෙනි..

“ඒ කියන්නෙ මිනිහා අපිට වඩා අවුරුදු හයක් විතර වැඩිමල්..”

වලව්ව ඇතුළත ලොකු කවිච්චියක වාඩි ගන්නා අතරතුර කලන විමසිය.. එයට යමක් නොකී චේතිය වලව්ව ඇතුළත බැලුවේ තම මව පෙනෙන්නට සිටීදැයි දැන ගැනීමේ අරමුණෙනි.. ඒ අතරතුර රංගගේ ඇස් දිව ගියේ ළමාතැනීගේ පින්තූරය වෙතය.. ඔහු එදා කලන කී දෑ ඔස්සේ ළමාතැනීව හා චේතියගේ නැගණියව සිතින් සංසන්දනය කරමින් උන්නේය..

“මචං.. අරුන් තුන්දෙනාම ඇවිත්..”

මොහොතකට පසු උඩුමහලේ සිට බැස එන කොලු රැන පෙන්වූ කලන රංගගේ කණට කර කීවේය.. චේතිය ඒ වන විට උප්පේ හේතුහාමි සමග කතාබහකය නියැලීගෙනය..

“කවුද තුන්දෙනා..?”

රංග ඇසුවේ කුතුහලයෙනි.. ඊට පිළිතුරු ලෙස කලන හිසින් පෙන්වූයේ අමතර පංතියේ සම්මානිගේ සිද්ධියට අදාල

රස්තියාදුකාරයින් තිදෙනාවය.. ඔවුන් දෙදෙනෙකුගේම තුවාල කැළැල් තවම ඉතිරිව ඇත..

"පොඩ්ඩක් ෂේප් වෙලා ඉමු.. පිටදි වගේ නෙමෙයි.. මේ වගේ තැනකදි වලියක් ගියොත් අපිට පාඩුයි.."

රංගට අනතුරු ඇඟවීමක් කළ කලන තම හිස පහතට හරවා ගත්තේය.. රඟෙන ආ තෑග්ගද තෑගි තැබීම සඳහා වෙන් කර තිබූ මේසයෙන් තැබූ රංග මිතුරන් දෙදෙනා සමග මිදුලේ පුටු දමා තිබූ නිස්කලංක පෙදෙසකට ගමන් ගත්තේය..

"තේරු මෝරු අස්සෙ හාල් මැස්සො රිංගන්නෙ මොකටද බං.. ? අපි මෙන්න මෙහෙට වෙලා ඉමු.. අනික මුගේ අම්මා උනත් මේ පැත්තට එන එකක් නෑනෙ.."

රංගට ඇසක් වසා ඉගි කළ කලන එවි වාඩි ගත්තේ අර මැරවරයන් තිදෙනා මග හැරීමට බව චෛතිය දැන උනනේ නැත.. ඔහු කලන කී දෑ ඔස්සේ සිය මව ගැන සිහිපත් කලේය.. තමා වටිනා ඇඳුම් පැළඳුම් වලින් සැරසී මෙම උත්සවයේ අමුත්තෙකු වී උන්නද තම මව මේ මොහොතේ වලව්වේ දාසියක වී කුස්සියේ කල් ගත කරන බව ඔහුට වාවාගත නොහැකි විය.. ඊටත් වඩා ඔහුගේ සිතට වද දුන් කාරණය වූයේ නැගණිය තම නිවසේ දමා තනිව රජ බොජුන් භුක්ති විඳීමට සිදු වීමයි..

"කෑම බීම සේරම කේටරින් එකකට බාර දීලද කොහෙද"..

මිදුලේ මේසයෙන් මේසෙට ගමන් කරමින් සංග්‍ර හ කරන වේටර්වරුන් දුටු රංග කීවේය.. එය නෑසුන චෛතිය තවමත් උන්නේ කල්පනාබරවය..

"මොනවද බං අහස පොළව ගැටගහන්න වගේ කල්පනා කරන්නෙ..?"

ගල් කන්ද වලව්වට පා නගන සෑම විටම චෛතිය කල්පනාවට යොමු වන නිසා කලන ඔහුගේ දෑහැන බිඳ දැමුවේය..

"මං මේ කල්පනා කරන්නෙ අදින් පස්සෙ මොනව කියලද වලව්වට රිංගන්නෙ කියලා.."

"උඹත් බලන් යද්දි අම්මයි තාත්තයි වගේ ගල් කන්ද වලව්වටම කඹුරන්නද කොහෙද හිතන් ඉන්නෙ.."

රංග සිතා මතා නොකිව්වාට චෛතියගේ සිත බිඳිණි.. ඔහු වලව්වට පැමිණියේ යටි සිතේ වූ කුතුහලයක් සන්සිඳුවා ගැනීමට මිස වලව්වට දාසකම් කිරීමට නොවේ.. මිතුරන් නොමැතිව හෝ පැමිණ තම සිතැගි ඉටුකර ගැනීමට ඔහු මේ වන විට අදියන් කරගෙනඋන්නේය..

"අපේ තාත්තා කාලයක්ම කළේ උඹ කිව්වා වගේ වලව්වට කඹුරපු එක.. සමහර විට හේතුහාමි එයා ගැන විස්තර දන්නවා ඇති"..

සුදු සරමක් හා අත් කොට ෂර්ටයක් හැද සෙනග අතරේ එහා මෙහා යන හේතුහාමි දෙස මොහොතක් බලා උන් චෛතිය කීවේය.. ඒ ඇසි රංගට තමා කල වරද වැටහිණි..

"සොරි මචං.. මං උඹව කන්ඩෙම් කරන්න හිතාගෙන එහෙම දෙයක් කිව්වෙ නෑ.. ඒත් උඹ මේක අස්සටම රිංගන්න හදනකොට මට තරහා ගියා.."

මිතුරා තමාව පහත් කොට නොසලකන බව නම් චෛතිය හොඳින්ම දන්නේය.. නමුත් ඔහුට ඉවසුම් නොදුන්නේ රංග තමාව තේරුම් නොගැනීම පිළිබඳවය..

"අපේ අම්මා.. තාත්තා.. මං.. චූටි.. අපි හැමෝම මොකක් හරි විදියකින් මේ වලව්වට සම්බන්ධයි.. එහෙම කියලා අපි හැමදාම මේ වලව්වෙ දාසයො වෙලා ඉන්න ඕනෙ නෑ බං.. මං මේ හදන්නෙ ඒ තත්වෙන් මිදෙන්න.."

ඔහු තම සිතැඟි මිතුරන්ට වටහා දෙන්නට උත්සාහ ගත්තේය.. ඒ අතරතුර එතනට පැමිණි අශේන් අනපේක්ෂිත ලෙස ඔවුන් ඉදිරියේ අසුන් ගත්තේය..

"ඔයාලා..?"

ඔහු ප්‍රශ්නාර්තයක් රැදි දෑසින් විමසුවේ තිදෙනා දෙසම තියුණු බැල්මක් හෙලමිනි.. නමුත් ඒ ඇස් වැඩි වේලාවක් රැදී තිබුණේ චේතියගේ මුහුණ මත්තේය..

"අපි බාල දක්ෂයො.. හාමු මහත්තයා තමයි අපිට අද එන්න කියලා ආරාධනා කළේ.."

කලන මවා පෑ සුහදත්වයකින් ප්‍රකාශ කර සිටියේය..

"රා..යිට අප්පච්චි කිව්වා තමයි.. නයිස් ටු මීට් යූ.."

තිදෙනාටම අතදුන් අශේන් එතනින් ඉවත් වීමට ගොස් යළි හැරුණේය..

"හිතේ හැටියට එන්ජෝයි කරපං මචං.. ඔන්න රෑ වෙනකල් යන්න බෑ හරී.."

චේතියගේ පිටටත් පහරක් එල්ල කළ ඔහු යන්න ගියේය..

"හිතපු තරම් යකා කළු නෑ බං චේති.."

ඒ සුහදත්වය අදහාගත නොහැකි තරම් වූ රංග කීවේය..

"කතා කරලා පුළුවන්ද බං මිහිහෙක් තේරුම් ගන්න.. ඕකගෙ කෙරුවාවල් මං දන්නවා.. දෙකක් දා ගත්තම ඌට මතක නෑ ඌ කවුද කියලා.."

චේතිය කීවේ මිතුරන් නොදැන උන් යමකි.. රංග කෙසේ වෙතත් කලන නම් එය වටහා ගත් නිසාවෙන් හිස සැලුවේය..

දහවල් ආහාරයද සිත් සේ භුක්ති විඳි චේතිය ඇතුළු පිරිස සවස් වන තුරු වලව් වත්තට වී සතුටු සාමිච්චියේ යෙදී උන්හ.. චේතියට විටින් විට තම මව සිහිපත් වුවද කුස්සියට ගොස් ඇය පිළිබඳ සොයා බැලීමට නුසුදුසු හෙයින් ඔහු ඉවසා සිටියේය..

"අශේනයා කිච්චට රෑ වෙනකල් ඉන්න බැනෙ මචං.. අපි ගෙදර යං"..

සවස තුන හතර පමණ වෙද්දී කලන විටින් විට පැවසිය.. නමුත් චේතියට නම් දැන්ම පිට වීමේ අවශ්‍යනතාවක් නොවිණි..

"එන තරමක් එන්නෙ ලක්සරි වාහනනෙ චේති.."

ගේට්ටුවෙන් ඇතුළු වූ නවීන පන්නයේ මෝටර් රථයක් පෙන්වූ කලන චේතියගේ අවධානය එදෙසට යොමු කළේය.. එදෙස මොහොතක් බලා උන් චේතියට ඉන් බසිනා රුව දැක සිය දෑස් අදහා ගැනීමට නොහැකි විණි.. ඔහු පමණක් නොව රංග හා කලනද එදෙස බලා උන්නේ පුදුමයෙනි..

"මොනවද බං මේ වෙන්නෙ..? මෙයා කොහෙද මෙහෙ..?"

සේනාධීර සමූහ ව්‍යාපාරයේ අධිපති නලින්ද සේනාධීර සමග රියෙන් බැසි සම්මානි මොහොතක් වටපිට බැලුවේ චකිතයෙනි.. අනෙක් පස දොර හැරී ඇගේ මවද රියෙන් බැස ගත්තාය..අලුත්ම විලාසිතාවේ දිගු ගවුමක් ඇඳ උන් සම්මානි සිය වරලස මුදා හැර තිබිණි.. ඉන් ඇගේ සුන්දරත්වය වඩාත් කැපී පෙනුණි.. ඇඳුමේ වර්ණයද ඇගේ සමේ වර්ණයට මනාව ගැලපුණේය..

"අයි කාන්ට් බිලීව් දිස්.."

රංග වදනක් හෝ දෙඩුවද චේතියගේ මුව අගුල් වැටී ඇත්තා සේය.. ඔහු දෙමාපියන් සමග වලව්ව දෙසට පිය නගන සම්මානි දෙස ඇසිපිය නොහෙලා බලා උන්නේය..

"එක අතකට පුදුම වෙන්න දේකුත් නෑ.. ඇතුගලලා සේනාධීරලා කියන්නෙ එක වල්ලෙ පොල්නෙ.. පොලිස් ලොක්කොයි ප්‍රාලදේශිය

සභාවෙ කට්ටියයි තව තදයොයි ආපු එකේ සේනාධීරලානාවනං තමයි ප්‍රවශ්ණේ..

තරමක් වේලා කල්පනා කල චේතිය සිදුව ඇති දේ අනුමාන කළේය.. නමුත් සම්මානිද ඇතුළුව සේනාධීර පවුලම මෙම සාදයට පැමිණීමේ යම් රහසක් ඇතැයි කලනට සිතුණි..

"අපෙත් වෙලාව නරක නෑ චේති.. ආපු එකෙ කෙල්ල හරි බලා ගත්තනේ.. බලපංකො ඒකිගෙ ලස්සන.. ජුහී චව්ලා වගේ."

රංග තත්වය සන්සුන් කිරීමේ අරමුණින් විහිළුවක් කර සිනාසුනේය.. නමුත් ඒ සැහැල්ලු මානසිකත්වය ඔවුන් වෙත පැමිණියේ තවත් අඩ හෝරාවක් යන තුරු පමණි.. අමුත්තන් සියළු දෙනා වලව්ව තුළට කැදවූ හාමු කියා සිටියේ චේතියගේ සිතට ගිනි අවුලනකතාවකි..

"මං අද මේ උත්සවේ සංවිධානය කළේ විශේෂ අරමුණක් ඇතිව.. මං කැමතියි මගේ පුතා අශේන් ඇතුගලගෙ අනාගත සහකාරිය හෙවත් මගේ ලේලිව අද ඔයාලට අදුන්වලා දෙන්න."

තරමක කෙටි දේශනයක් අවසානයේ එසේ කී ඇතුගල මහතා සම්මානිගේ අතක් අල්ලා තමුන් ළගට කැදවා ගත්තේය.. අනික් අත රැදී පැවතියේ අශේනගේ උරහිස මතය..

"මේ ඉන්න මිස් සම්මානි සේනාධීර තමයි මේ වලව්වෙ අනාගත හිමිකාරිය.."

චේතියට දැනුණේ තම පපුවට කවුරුන් හෝ ගිනි තැබූ බවකි.. වදනින් ප්‍රිකාශ නොකළාට තමාදුර සිට රස විදි ඒ සොදුරු රුවට තම සිත කොයි තරම් ආදරය කර ඇත්දැයි චේතියට වැටහුණේ දැන්ය.. ඔහු කලනගේ අත තද කර අල්වා සම්මානිගේ දෑස් දෙස බැලුවේය.. එහෙත් ඈ උන්නේ මුහුණ බිමට බර කරගෙන බැවින් ඔහු ඇයගේ නෙතු දුටුවේ නැත..

"චේති.. එළියට යමු.. උඹලගෙ අම්මත් ඉන්නවා."

සාලයේ සතුටු සාමිච්චිය ඇසුණු ගුණවතීද මුළුතැන් ගෙයි සිට සාලයට කර පොවා බැලුවේ තමාගේ අනාගත ළමාතැනීගේ මුහුණු පොඩ්ඩ දැක ගැනීමටය.. නමුත් ඈ තිගැස්සී ගියේ තම පුතු වැනිම වූ දරුවෙකු සාලයේ සිටිනු දැකීමෙනි.. එහෙත් ඒ චෛතිය විය නොහැකි බව ඈ අනුමාන කලේ ඔහුගේ කොණ්ඩය හා ඇඳුම් පැළඳුම් නිසා පමණක්ම නොවේ.. මෙවන් උත්සවයක අමුත්තන් අතරේ ගැවසීමට චෛතියට හැකියාවක් නොවූ බව ඈ දැන උන්නාය.. එසේම චෛතිය වලව්වට පැමිණීමට අකමැති බවද ඇයට සිහිවිණි..

"ආන්ටි අඳුරගත්තද මංදා බං.. උඹ දිහා හොඳට බැලුවා".

කලන කොතරම් දෑ කිව්වත් ඒවා චෛතියගේ කණට වැටුණේ නැත.. ඔහු උන්නේ තෝන්තුවාවෙනි..

"අශේනයට මේ ඉස්කෝලෙ යන කෙල්ලෙක්ව බන්දලා දෙන්න යන්නෙ සේනාධීරයට පිස්සු හැදිලද බං..?"

චෛතිය කල්පනා කරන්නෙ කුමක්දැයි දැන උන් රංග සම්මානිගේ පියාට බැන වැදුණේය..

"වංසක්කාරකමයි සල්ලි එකතු උනාම අනිත් දේවල් ඒ තරම් වටින්නෙ නෑ රංග.. ඒ ෆැමිලි දෙක මැච් වෙනවා කියලා මහ උන්ට හිතෙන්න ඇති.."

කලන තම අදහස් පළ කළේය.. ඒ කිසිවකට සවන් නොදුන් චෛතිය දැන් නම් උන්නේ නිවසට යාමේ හදිසියෙනි..

"මචං අරහෙන් ගුණවතී ආන්ටි.. අරහෙන් සම්මානි.. අනිත් පැත්තෙන් අරන මදාවි සෙට් එක.. මේකත් හරියට අර මරන තුනක් ඇති මිනිහා පැණි යෑය වගේ වැඩක්.. හොඳම දේ දැන් මෙතනින් මාරු වෙන එක.."

කලන එය රංගට පැවසුවේ චෛතියට නෑසෙන සේය.. එයට එකඟ වූ රංග පුටුවෙන් නැගිට්ටේ පිටව යෑමේ අරමුණෙනි..

"අශේන්.. අශේන්.."

පිරිස අතරින් ඇසුණු සිඟිති කට හඬකට අමුත්තන් සැවොම එකවර හැරී බැලුහ.. ඒ කටහඬ හුරු පුරුදු වූ චෛතිය හැරී බැලුවේ තිගැස්සුණු නෙතිනි..

"මචං.. චූටි.."

චෛතියට උන් හිටි තැන් පවා අමතකව ගියේය.. තම නැගණිය තනිවම මෙහි පැමිණීම ඔහුට අදහාගත නොහැක්කක් විය..

"උඹලගෙ නංගි කොහෙද මෙහේ.? අනික අශේන් හොයාගෙන.."

කලනගේද ඇස් ගෙඩි දෙක පුදුමයෙන් විසල් වී තිබිණි.. චෛතිය මේ මොහොතේ පෙනී උන්නේ  ගුණවතීගේ පුතු ලෙස නොවන නිසා ඔහුට සිය නැගණිය ළඟට යාමේ හැකියාවක්ද නොවිය..  ඔහුට කල හැකි වූයේ මේ සිද්ධිය බලා සිටීම පමණි..

"ඔයා මාව නේද හොයන්නෙ.? ඇයි බේබි..?"

රැස්ව සිටි අමුත්තන් අතරින් මිහිරාවි ළඟට ළං වූ අශේන් දණහිස නමා ඇය ඉදිරිපිට පාත් වූවේය..

"හැපි බර්ත් ඩේ.."

ඈ සැනෙකින් අශේන්ගේ කම්මුලක් සිප ගත්තේ සෑම නෙත් මත සිනහවක් විසිරුවමිණි.. එහෙත් චෛතිය.. අශේන්.. පමණක් නොව ඇතුගල හාමුද උන්නේ මේ කිසිවක් වටහාගත  නොහැකි ලෙසය.. පරණ ඇඳුමක් ඇද පැමිණි මේ පුංචි රුවැත්තිය කාගේ කවුදැයි සැවොම විපරම් කරද්දී ක්ෂණිකව පැමිණි හේතුහාමි ඇයව වඩාගෙන වලව්ව තුළට රැගෙන ගියේය..

"උඹ නංගි ගැන කියලා තිබුණට මෙහෙම දෙයක් වෙයි කියලා මං හීනෙකින්වත් හිතුවෙ නෑ..  ඒත්.. උඹ කිව්වා නේද එයා ඇලිසා නැන්දලගෙ ගෙදර කියලා.?"

ඒවාට පිළිතුරු දීම වෙනුවට චේතිය කළේ වලව්වට පිටතින් මුළුතැන් ගෙය දෙසට පා තැබීමය.. රංග හා කලනද ඔහු පිටපසින් ආවේ චේතිය යම් කලබලයක් ඇතිකර ගනීදැයිසිතුණු හෙයිනි..

"ආං උඹලගෙ අම්මා නංගිව වඩාගෙන වත්ත පහළට දුවනවා".

චේතිය කුස්සියේ ජනේල් වලින් ඇතුළට එබෙද්දී කලන අඩිපාර දිගේ දිව යන ගුණවතී පෙන්වූයේය..

"එහෙනං චූටි ඇවිත් තියෙන්නෙ අම්මට හොරෙන්.. ඒකයි අම්මා බයවෙන්න ඇත්තෙ.."

තම නිවස පිහිටි ඉසව්වට හනි හනිකේ පල්ලම් බසින මව දෙස බලා චේතිය කීවේ පැටළිල සහගතවය..

"අපි දැන් මොකද කරන්නෙ..? දැන්ම ගෙදර යමුද..?"

රංග විමසුවේ නිවසට දුරකථන ඇමතුමක් දී වාහනය ගෙන්වා ගතයුතු නිසාය..

"මට මේ විදියට එක පාරටම ගෙදර යන්න බෑ කලන.. අනික සම්මානි..?"

ඔහු උන්නේ කිසිවක් සිතාගත නොහැකිවය..

"දැන් කරුවලත් වැටීගෙන එනවනේ.. අපි තව පැය භාගයක් විතර ඉඳලා මාරුවෙමු.."

එසේ තීරණය කරගත් ඔවුන් නැවත්ත පෙර උන් මේසය කරා පැමිණ අසුන් ගත්හ.. ඔවුන් පැය කාලක් විනාඩි විස්සක් පමණ එසේ උන්නද කිසිවෙක් එකිනෙකා සමග කතා කළේ නැත.. සැඳෑ අඳුර හාත්පස වෙලා ගනිද්දී මිදුලේ තිබූ පාට පාට විදුලි බුබුළු වැල් අලංකාරව දැල්වෙන්නට විය.. වලව්ව තුළින් ඇසෙන වේග රිද්ම ගී හඬට

ඇතමුන් රංගනයේ නිරත වූ අතර පැමිණෙන අමුත්තන් සංඛ්‍යා වද ක්‍රමයෙන් ඉහළ ගියේය..

“සම්මානි අශේන් එක්ක ඇතුළෙ කතාවක්.. තව මෙතන ඉන්න එක තේරුමක් නෑ චේති.. අපි යමු..”

චේතිය බලෙන් නැගිට්ටුවාගත් රංග ඔවුන්ගේ වෑන් රිය පැමිණ ඇත්දැයි බලමින් ගේට්ටුව දෙසට පිය මැනිය.. ඒ අතර හඬාගෙන පැමිණි සම්මානී මිදුලේ නවතා තිබූ ඔවුන්ගේමෝටර් රථයට නගිනවා චේතියගේ ඇස ගැටුණි.. ඔහු රංගගෙන් අත ගසා දමමින් ඒ දෙසට දිව යන්නට විය..

“චේති.. පිස්සු නටන්න එපා.. මෙහෙ වරෙන්..”

නමුත් ඔහු කලනගේ බසට අවනත වූයේ නැත.. සම්මානිලාගේ රථයේ පිටුපස දොර හැරගත් චේතිය ඇසිපිය හෙළන පමාවෙන් එයට නැගී දොර වසා ගත්තේය..

දෙඅත්ල මත මුහුණ හොවා ඉකි ගසමින් උන් සම්මානි තම රථයට ගොඩ වූ නන්නාදුනන පුද්ගලයා දැක කෑ ගසන්නට සැරසුණා පමණි.. චේතිය ඇගේ මුව වසා සිය බොරු කොණ්ඩය හා කණ්නාඩි කූට්ටම ගලවා ගත්තේය.. ඔහුව හඳුනාගත් සැනෙන් සම්මානී කලේ ඔහුගේ උරහිසේ හිස හොවා ගැනීමය..

“මොකද උනේ සම්මානි..? ඇයි අඬන්නෙ..?”

අශේන් ගැන විමසීමට චේතිය සිතා උන්නද ඇගේ කඳුළු අභියස එවැන්නක් ඇසීම උචිත නොවේ යැයි ඔහුට සිතුණි..

“අනේ චේතිය.. මට අශේන්ව බදින්න බෑ..”

ඇගේ ඉකි බිඳුමට ඒ කටහඬ පවා අපහැදිලිය.. නමුත් චේතිය ඒ වදන් හොදින් ග්‍රහණය කළේය.. ඔහු අනවසරයෙන්ම ඇගේ කර වටා අතක් යවනා අතරතුර වටපිට බැලුවේ කවුරුන් හෝ මේ ඉසව්වට පැමිණේදැයි දැන ගැනීමටය..

මේ අතරතුර රංග හා කලන වාහන නවතා තිබූ ඉසව්වේ එහා මෙහා සැරිසැරුවේ චෛතියට හා සම්මානිව ආරක්ෂා කිරීමේ අරමුණෙනි..

"රංග.. මං මේ කාර් එක හරියෙ ඉන්නම්.. උඹ ගිහින් බලලා වරෙන් අශේනයයි සේනාධීර කාරයයි කොහෙද කියලා.. උන් මේ පැත්තට ආවොත් මාර අවනඩුවක් වෙන්නෙ.."

කළුවරේ නවතා තිබූ රිය තුළ ඉන්නා අයව පිටතට නොපෙණෙන බව සැක හැර දැනගත් රංග , කලනගේ උපදෙස් මත වලව්ව දෙසට පිය නැගිය.. ඔහු දිගු ආලින්දයට පිවිසියද එහි අශේන් පෙනෙන්නට නොවූ නිසා යළි පිටතට පැමිණියේය.. ඔහු ඉදිරිපස කාමරයේ ජනේලය අසලින් ගමන් ගනිද්දී අශේන්ගේ හා මිතුරන්ගේ කටහඬවල් ඒ තුළින් ඇසිණි.. වහා උස් කුළුණකට මුවා වූ රංග සිය ජංගම දූරකථනය අතට ගෙන එයට නෙත් යොමා ගත්තේ දුටුවන්ට සැක නොසිතෙන ආකාරයෙනි.. නමුත් ඔහුගේ දෙසවන් රැඳී තිබුණේ කාමරය තුළ සිදුවන කතා බහටය..

"ඒකි ඇඩවට මට අවුලක් නෑ බං.. දැන් කිරිල්ලි මගේ අතේ.."

"එහෙනං අශේන් උම ගිහින් ඒකිව හොයාගනිං.. අපි දැන් අර වැඩේට සෙට් වෙන්නම්.."

ඇතුළත උන් පිරිස යම් යම් දෑ ඉගි කර ගන්නා අයුරු දැනුණද රංගට එය වටහා ගැනීමට අපහසු විය..

"දැන් කළුවරත් වැටිලා නිසා වත්ත පහළට ඇදගෙන ගියා නම් අතක් පයක් කඩලම දාන්න පුළුවන්.. උන් තුන්දෙනා තාම ගියේ නෑ කියලා උඹට ෂුවර් නේද..?"

"උඹලට ගැහුවෙ ඒ කොන්ඩෙ ක්රේනල් උස පොර නෙමෙයි කියලා උඹලට ෂුවර්ද..?"

"නෑ බං.. ගහපු එකා ඊට වඩා වෙනස්.. ඒත් අනිත් ඩබලනම් එදා ඌ එක්ක හිටපු උන්ම තමයි.."

රංගගේ ඇගේ රෝම කූප කෙළින් වූයේ ඇතුළේ යන කුමන්ත්‍රණය හරි හැටි වැටහුණු නිසාය..එසේනම් තමන්ව හඳුනාගෙන ඇත.. චේතියගේ වෙස් ගැන්වීම නිසා ඔහුව හඳුනා නොගත්තද්‍දැන් නම් තිදෙනාටම ගුටි කෑමට සිදුවන බව රංගට වැටහුණි..

"මං උන්ට පොඩි බෝලයක් බස්සලා ආවෙ.. උන් ඒ නිසා ඉක්මනට යන එකක් නෑ.."

අශේන් යනු චේතිය කීවා සේම බැටළු හම පොරවා වෘකයෙකි.. ඔහු බොරු සුහදත්වයක් පෑවේ ඇයිදැයි රංගට වැටහුණේ මේ මොහොතේය..

"එහෙනං උඹම ගිහින් මොනව හරි කියලා උන්ව වත්ත පහළට අරන් වරෙන්.. අපි වැඩේ ඉතුරු හරිය ඉවරයක් කර ගන්නකම් උඹට බැරියෑ උඹේ රෝස කුමාරිව ෂේප් කරගන්න.."

එසේනම් සම්මානි පසුපස මේ ඔත්තුකාරයින් යොදවන්නට ඇත්තේත් අශේන්ම විය යුතුය.. දැන් තවත් සිත සිතා ඉන්නට වෙලාවක් නැත.. කළයුතු වන්නේ මිතුරන් දෙදෙනාත් රැගෙනහැකි ඉක්මනින් මින් පලා යාමය.. ඔහු හනිකට රථ ගාල දෙසට දිව යන්නට විය..

"මොකක්ද අවුල..? කවුරු හරි මේ පැත්තට එනවද.?"

කලබලයෙන් දිව එනු රංග දුටු කලන විමසුවේය..

"ලොකු අවුලක් මචං.. කිය කිය ඉන්න වෙලාවක් නෑ.. ඉක්මනට අරුවත් අරගෙන මෙතනින් මාරුවෙමු.."

කලන සම්මානිලාගේ රථයේ දොර හැර ඉක්මනින් චේතියව බිමට බස්සවා ගත්තේය..

"සම්මානි සොරි වෙන්න ඕන.. අශේන් ඔයාව හොයනවා.. අපි සෙනසුරාදට ක්ලාස් එකේදි මීට් වෙමු.."

රථයට එබුන රංග එසේ පවසා මිතුරන් දෙදෙනා සමග කඩිනමින් පාරට පිවිසියේය.. මේ කිසිවක් වටහාගත නොහැකි වූ චේතිය උන්නේ පුදුමයෙනි..

"මොකද උනේ කියපං.."

ඔහු රංග දෙසත් කලන දෙසත් මාරුවෙන් මාරුවට බලමින් විමසා සිටියේය..

"අශේනයා සම්මානිව හොයාගෙන ආවා බං.. තව පොඩ්ඩෙන් අතේ මාට්ටු.."

කලනට ඇසක් ඉගි කළ රංග චේතියගේ පැනයෙන් ලිස්සා ගියේය.. සිදුව ඇති දේ ඊට වඩා බරපතල  බව කලනට ඉන් වැටහුණි.. නමුත් මේ මොහොතේ එය දැනගත නොහැකි නිසා ඔහු නිහඬවූන්නේය. චේතිය එදින උදෑසන අවදි වූයේ තරමක් පමා වී නිසා ඔහුට පාසල් යෑමට නොහැකි වුණි.. ඔහු ඇදේ සිටම පෙරදා වූ සිද්ධිය යළි සිහිපත් කළේය..

රංග සමග ඔහුගේ නිවසට ගොස් ඇඳුම් මාරු කර තමා නිවසට ආවේ රාත්‍රීග නවයට පමණ බව චේතියමතක තිබිණි.. ඒ වන විට අම්මා පිල් කණ්ඩිය මත වාඩි වී පාර බලා උන් අතර සිය නැගණිය තද නින්දකට වටී සිටියාය.. තමා පමා වීමට හේතුව මව අසාවි යැයි බලා උන්නද ඇ කිසිවක් නෑසිම චේතියට තවත් ගැටළුවකි..

"පුතේ.. තේ කහට එක නිවෙනවා.. මේක බීලා හිටියනං.."

දොර  රෙද්ද මැත් කර කාමරයට එබුන මව කී දෑ අසා ඔහුගේ කල්පනාව බිදී වැටිණි.. ඊයෙ ප්‍රශ්ණය මග හැර උන්නද අද නම් ඇයට පිළිතුරු බැඳීමට සිදු වේ යැයි චේතියගේසිත කීවේය..

“චූටි ඉස්කෝලෙ ගියාද අම්මා.?”

ඔහු මවගේ සිත වෙනතකට යොමු කිරීමේ අටියෙන් ප්‍ර ශ්නයක් නැගුවේය..

“රෑ ඩිංගක් උණ වගේ තිබුණා.. ඒ උනාට මං ඉස්කෝලෙ ගිහින් දැම්මා.. ගෙදර හිටියනං කෙල්ල තවත් ලෙඩ වෙනවා.”

සරම බුරුල් කර යළි හැදගත් චෛත්‍ය ඇඳේ ඉඳගත්තේ මව සමග දිගු කතාවකට අර අදිමිනි..

“ඊයෙ රංගලගෙ අහ ගිය නිසා ටිකක් රෑ උනා අම්මා.. අම්මලා වලව්වෙ පාටියට ගියාද.?”

සුදානම් ශරීරය කොයි දේටත් හොඳයැයි හැගුණ චෛත්‍ය මව කිසිවක් විමසීමට පෙර කියා දැම්මේය.. නමුත් තම පුතුගේ කතාව සියට සියක් විශ්වාස නොකළ ගුණවතී ඔහුව පිරික්සන ආකාරයේ බැල්මක් හෙලීය.. පෙරදා වලව්වේ උත්සවයට පැමිණ උන් කණ්නාඩි දැමූ උස තරුණයා චෛත්‍යදැයි යන සැකය ඇගේ සිතින් තවමත් තුරන් වූයේ නැත.. ඔහුට තිබූ රැලි කොණ්ඩය වැනිම බොරු කොණ්ඩයක් චෛත්‍ය ළග තිබෙනවා ඈ දැක තිබිණි..එහෙයි ඇගේ සැකය තවත් වැඩි විය..

“මොනවද අම්මෙ ඔය තරම් කල්පනා කරන්නෙ.?”

චෛත්‍ය විමසුවේ තමාගේ පැණයට ඇගෙන් පිළිතුරක් නොලද හෙයිනි..

“මුකුත් නෑ..”

“අම්මා මගෙන් මොනවද හංගනවා.”

ඔහු කීවේ මව තම නැගණිය ගැන යමක් සිතනවා කියාය..

“ඉතිං පුතත් මට කරුණු කාරණා වහං කරනවනෙ.”

ඇගේ කතාවට ඔහු තිගැස්සී ගියේ මවගෙන් එවැනි කතාවක් ඔහු අපේක්ෂා නොකල නිසාවෙනි..

"මං අම්මට මොනව හංගන්නද අම්මෙ.. අම්මගෙ මනස්ගාත"..

"හංගන්නෙ මොනවද කියලා මගේ පුතා දන්නවා ඇතිනේ.. උඹට මේ අම්මව විශ්වාස නැත්තං කාරි නෑ පුතේ.."

ඈ චීත්තයේ කොණකින් තම දෑස් පිසදා ගත්තාය.. ඒ දුටු චේතිය ඇදෙන්බැස මව ළගට පැමිණ ඒ උරහිස් වල දෑත් රැදෙව්වේය..

"මං කවදාවත් අම්මව රවට්ටන්න හිතුවෙ නෑ අම්මෙ.. මං මේ හැමදේම කරන්නෙ මේ නරා වලෙන් ගොඩ එන්න"..

තමා මේ හැමදේම ලෙස හැදින්වූයේ මොනවාදැයි චේතිය මවට කීවේ නැතුවා සේම ගුණවතී තම පුතුගෙන් ඒ පිළිබඳව ඇසුවේද නැත.. නමුත් මවට සියළු දේ කිව යුතුය යන සිතුවිල්ල මේ වන විට ඔහුට පහළ වී තිබිණි..

"මං මූණ කට හොදං එන්නකො.."

මවට කිව යුත්තේ මොනවාද දැන්ම නොකිව යුත්තේ මොනවාදැයි පෙළ ගැසිය යුතු නිසා චේතිය මොහොතකට ප්‍රශ්නය මග හැරියේය.. එහෙත් නැගණිය නිවසට පැමිණීමට පෙර මේ පිළිබදව සාකච්ඡා කල යුතු යැයි ඔහු තීරණය කර උන්නේය..

චේතිය වත්ත පහළ ළිදට ගියේ නතාලි දුන් ජංගම දුරකථනය සගවා ගෙනය.. පෙරදා රංග සමග ගොස් සිම් කාඩ් පතක් මිලදී ගත් නිසා ඔහුට මේ වන විට ඇමතුම් ගැනීමේ හැකියාව තිබිණි.. ඔහු සිය අංකයෙන් පළමු ඇමතුම ලබාගත්තේද නතාලිටමය..

"හෙලෝ.. නතාලි අක්කෙ.. මම චේතිය.."

"මල්ලි.. ඔයා සිම් එකක් ගත්තද.? ඉතිං.."

ඇගේ හඩ පුදුමයෙන් හා සතුටින් පිරී තිබිණි..

"ඔයාට අද ලෙක්චර්ස් තියෙනවද අක්කෙ..? මට ඔයාව මීට වෙන්න ඕනෙ.."

"මට ලෙක්චර්ස් තියෙන්නෙ නං හවස.. උදේ වරුවෙ නං ෆ්‍රී.. මං කොහෙටද එන්න ඕන.."

නතාලිගේ පිළිතුරෙන් චේතියට දැණුනේ සතුටකි..

"එන්න ඕනෙ අපේ ගෙදරට.."

"ගෙදරට..? ඇයි පුංචි නැද්ද..?"

"ඉන්නවා අක්කෙ.. එයා එක්ක තමා කතාව තියෙන්නෙ.. සාක්කියට ඔයත් ඕනෙ.."

ඔහු තරමක් බැරෑරුම්ව කියා ඇම්මෙය.. ඊයේ වලව්වේ උත්සවයේදී මොනවා හෝ සිදුවන්නට ඇතැයි නතාලිට ඉවෙන් මෙන් දැණුනි..

"මං හොස්ටල් එකේ ඉන්නෙ මල්ලි.. ඔයාලගෙ දිහා එන්නනං ටිකක් පරක්කු වෙයි.."

"ඒකට කමක් නෑ.. ඔයා ටවුන් එක කිට්ටුවට එද්දි මට රින්ග් එකක් දෙන්න.. මං පාරට එන්නම්.."

වැඩි විස්තර පසුවට කල් තබා චේතිය කීවේය.. ඔහු ඇගපත සෝදා ඇඳුමක් දා ගත්තේ හන්දියටත් යා යුතු වූ හන්දාය. රංග හා කලන පාසල් ගොස් තමන්ව සිහි කරනවා ඇතැයි චේතියට විටින් විට සිහිපත් විණි.. පාසල් යාමට නොහැකි වුවද දුරකථන ඇමතුමක් දී හෝ ඔවුන් සමග කතා බහ කිරීමට තරම් අවශ්‍යොතාවයක් චේතියට දැනිණමුත් පාසල අවසන් වන වේලාව වන තුරු එයටද ඉවසා සිටිය යුතුය..

"අම්මා උයන්න මොනවත් තියෙනවද..?"

ඔහු මවගෙන් ඇසුවේ දහවල් කෑමට නතාලිද සිටින හන්දාය..

"කීරමින් වගයක් තිබුණා.. ඒක තෙල් දාලා පරිප්පුවකුයි මැල්ලුමකුයි හදලා ගන්නම්.."

ඇ සුපුරුදු ආහාර වට්ටෝරුව නම් කලේ කරවල පරිප්පු හැර කිසිවක් කුස්සිය අහලක නොවූ නිසාය.. එවන් ගැමි ආහාර වේලකට නතාලි වුව කැමති බව දන්නා හෙයින් චේතියකිසිවක් කීවේ නැත..

"මං ටිකක් පාරට ගිහින් එන්නම් අම්මා.."

පැයකට පමණ පසු නතාලිගෙන් ඇමතුමක් ලැබුණ බැවින් චේතිය හනිකට පාරට බැස්සේය.. නිවසට පැමිණීමට පෙර නතාලිට ඊයේ සිදු වූ සිදුවීම සවිස්තරව පැවසීමට ඔහුට අවැසි වීතිබිණි..

"පුංචි ඊට පස්සෙ ඊයෙ සිද්ධිය ගැන කතා කළේම නැද්ද?.."

හන්දියේ සිට පයින් එන අතර තුර චේතියගේ කතාවට සවන් දුන් නතාලි විමසුවාය..

"අම්මා මුකුත්ම නොකියා මට අහන්නත් බැනෙ අක්කෙ.. මං එතන හිටියා කියලා එයාට කිව්වෙ නැති නිසා මම දන්නෙ කොහොමද බලයි.."

"ඔයා එහෙ ගිය බව පුංචිට කියන්න මල්ලි.. අනික ඔයාට හැමදාමත් ඔය විදියට හොරෙන් යන්න බැනෙ.. පුංචි ඕක ඉක්මනටම දැනගනී"..

"මං අද ඒ ගැන කියනවා අක්කෙ.. අම්මගෙන් චූටිගෙ විස්තරේ අහගන්න ඕන ඊට පස්සෙ.."

ඔවුන් දෙදෙනා කතාවෙන් කතාව නිවස අද්දරටම පැමිණියහ.. චේතිය සමග මිදුලට පා නගනා නතාලි දුටු ගුණවතී ඉදිරියට දිව ආවේ පුදුමයෙනි..

"දූ.. කොහේදිද ඔයාට මල්ලිව මුණ ගැහුනෙ?.."

චේතියට ඇය මුණ ගැසුණේ අහම්බෙන් යැයි සිතූ ගුණවතී ප්‍රශ්න කළාය..

"ටවුන් එකේදි පුංචි.. ඉතිං.. චූටි ඉස්කෝලෙ ගිහින්ද?."

ඈ දෙපැත්තටම සරිලන පිළිතුරක් දුන්නේ චේතිය තවම ජංගම දුරකථනය ගැන කියා නොතිබූ බැවිනි..

"කෙල්ලට ටිකක් උණ වගේ තිබුණා.. ඒත් ඉස්කෝලෙ නොයවා බැහැනෙ.."

වටෙන් ගොඩින් විමසීමට පෙර ගුණවතී විසින්ම මාතෘකාවට පිවිසීම පිළිබඳ නතාලිට දැනුණේ සතුටකි.. ඈ ඉදිරිපස පුටුවකින් අසුන් ගෙන ගුණවතීවද ඒ අසලින් හිඳුවා ගත්තාය..

"චූටිට ආපහු ඒ අසනීපෙ හැදුනද.. ? ඇයි පුංචි.. අද මොනව හරි උනාද..?"

ඈ අද යන්න බර කර විමසුවේ ඊයෙ යන්න කිව නොහැකි නිසාය..

"අද නං මුකුත් උනේ නෑ.. ඉන්නකො.. තාම ආපු ගමන් නොවැ.. මං තේ කහට එකක් හදාන එන්නං.."

ඈ නතාලිගේ හිස අතගාමින් නැගිට මුළුතැන් ගේ දෙසට ගමන් ගත්තාය..

"පුංචි කියන එකක් නැති වෙයිද.?"

නතාලි චේතියගෙන් විමසුවේ ගොළු බසිනි..

"වරේයි එකක් දීලා බලන්න.. බැරිම උනොත් මං කතාව පටන් ගන්නිං..

ඔහුද පහත් හඬින් පිළිතුරු බැන්දේය..

"මං අද හදිසියෙම ආපු එක පුංචිට සැක ඇති.."

“බලමුකො..”

ඉන් පසු ඔවුන් දෙදෙනා මොහොතක් යනතුරු විශ්ව විද්‍යා ලය ගැන කතාබහක නියැලුනි.. ගුණවතී තේ පිළිගැන්වීමෙන් අනතුරුවද කිසිවි නොකියන බව හැගුණ නිසා චෛතිය සියකටහඩ අවදි කළේය..

“මං.. මං මේ අම්මට කියන්න හිටියෙ..”

චෛතිය ඔවැනි කතාවකට එළඹෙන බව ඉවෙන් මෙන් දැන උන් ගුණවතී කුස්සියට යාමට ගොස් යළි හැරුණාය..

“අම්මා මෙතනින් ඉදගන්නකො..”

ඇ ඔහුට අවනත වූයේ අකමැත්තෙනි..

“මං ඊයෙ ගල් කන්ද වලව්වට ගියා..”

ඒ ඇසී මව පුදුම වෙතැයි සිතා උන්නද ගුණවතී අමුතුම ආකාරයේ සිනාවක් පෑවාය..

“ඊයෙ උඹ එතන හිටියා කියලා මං දන්නවා.. නිකං නෙමෙයි.. බොරු කොණ්ඩෙකුත් දාගෙන..”

ගුණවතීගේ කතාවට නතාලි ගල් ගැසුනාය.. නමුත් ඊයේ වූ සිදුවීම යළි සිහිපත් කරද්දී චෛතිය එතරම් පුදුම නොවුනි.. ඇතුගල මහතා සම්මානිව හදුන්වා දුන් වේලේ තම මවද එතනට පැමිණි බව කලන කීවා ඔහුට මතකය..

“මං එහෙම ගියේ වලව්වෙ අය මාව අදුරගනී කියලා සැක හිතුන නිසා..”

“ඔයා කොහොමද මල්ලි ඒ පාටියට ගියේ..?”

නතාලි කිසිත් නොදන්නා විලස විමසුවේ චෛතියට කරුණු පැහැදිලි කිරීමට පහසු වන්නටය..

“හාමු මහත්තයා අපේ බාල දක්ෂ ටීම් එකට ඉන්විටේෂන් එවලා තිබුණා.. ඒකයි අපි තුන්දෙනා එහෙ ගියේ.”

“උඹ වලව්වට කැමති නැති එකා වෙච්චි.. ඉතිං උඹ අහවල් එහෙකටද එහේ රිංගුවෙ..? අනික මටත් නොකියා..”

මව කිසි දිනෙක තමාට මෙසේ තදින් කතා කරනු චේතිය අසා නැත.. එනිසා ඔහු පුදුම වී බැලීය..

“වලව්වට ළඟම ඉන්න කෙනා මං නිසා මහින්ද සර් මටත් යන්න කිව්වෙ.. කොහොමටත් ඒක මහ ගුප්ත තැනක්.”

ඒ බොරුව කීවේ ගුණවතීගෙ මුහුණ මගහරිමිණි..

“ඒවයින් කාරි නෑ.. උඹ ආපහු ඒ පැත්තෙ යන්න ඕනෙ නෑ.”

“අම්මා ඒකට හේතුව කියනවානං මං නොගිහින් ඉන්නං.”

“උඹ බොරුවක් කලා කියලා දැන ගත්තොත් හාමු මහත්තයා උඹට නපුරක් කරයි මගෙ පුතේ..”

ඈ කීවේ පිණ්සෙන්ඩු වෙමිනි.. එයට චේතියගේ තරහව ඉහ වහා ගියේය..

“එහෙනං ඉතිං මේ එයාට ගිය රටනේ.”

චේතිය කීවේ තරමක උස් හඬිනි.. ඒ දුටු නතාලි ඔහුට සන්සුන් වන ලෙස අතින් සන් කළාය..

“අපිට කලු ගල් වල ඔළුව ගහ ගන්න බෑ පුතේ.. ඒ ඇත්තො කවුද.. ? අපි කවුද..?”

මව වලව්වේ උදවියට මෙතරම් බය ඇයිදැයි චේතියට වැටහුණේ නැත.. ඔහු වලව්වටම ගොස් යටගියාව අගිස්සන්නට තීරණය කළේ එහෙයිනි..

“හරි.. අපි දැනට ඒ කතාව පැත්තක තියමුකො.. අපේ චූටිගෙයි වලව්වෙයි අතර තියෙන සම්බන්ධෙ මොකක්ද.?”

චෛතියගේ පැනයට ගුණවතීගේ මුහුණ යකෙක් දුටු කලක මෙන් සුදුමැලි වී ගියේය.. ඇයට වචන පවා අමතක විණි..

“පුංචි ඇත්ත කියන්න.. මටත් ඒ ගැන දැන ගන්න ආසයි.. ඇයි පුංචි චූටිව වලව්වට ගෙනියන්නෙ නැතුව හංගලා වගේ තියන් ඉන්නෙ?.”

චෛතියට පිළිතුරක් නොදුන්නද ඈ තමාට යමක් කියතැයි යන විශ්වාසය නතාලි තුළ තිබිණි..

“කෙල්ල පුංචි කාලෙ ඉඳලම අනිත් ළමයින්ට වඩා හරි වෙනස් පුතේ.. එයාගෙ කතාබහ.. ඇවිදීම උනත් හරි ඉක්මන්.. අනික.. කෙල්ල කතා කරන්න ගත්ත දවස් වල ඉඳලම වැඩිපුරකිව්වෙ වලව්ව ගැන..”

තවත් මේවා වසාලිය නොහැකි බව වැටහුණ ගුණවතී නතාලි හා චෛතිය ඉදිරිපිට මෙය පැවසීමට තීරණය කළාය..

“මං එයාව පුංචි සන්ධියෙ උනත් වලව්වට ගෙනිච්චෙ ඉඳලා හිටලා.. ඒ ගියපු දවසක තමයි මෙහා හාමු මහත්තයගෙ මූණට කෙල ගහපු සිද්ධිය උනේ.. එදා මං හොඳම බය උනා.. කෙල්ල වලව්ව ගැන දොඩෝන එකට වඩා මං බය උනේ හාමු මහත්තයා මේ පොඩි එකීගෙන් පළි ගනී කියලා.. ඒත් එහෙම උනේ නෑ.. කොයිකටත් කියලා මං එදයින් පස්සෙ කෙල්ලව වලව්ව පැත්තටවත් අරන් ගියේ නෑ.. මං ඒකීව ඇලිසගෙ අහට හුරු කලා.”

ඈ මොහොතක් කතාව අතරමැද නවතා කල්පනා කළාය.. ඒ අතර නතාලි, හාමු මහතාගේ මුහුණට චූටි කෙල ගැසූ සිද්ධිය චෛතියගෙන් අසා දැන ගතී..

"වලව්වට යන එක අඩු කලාට පස්සෙ කෙල්ල වලව්ව ගැන කියවන එක තරමක් අඩු කලා.. ඒත් ඉඳලා  හිටලා එයා මහා පුදුම දේවල් කියනවා.. ඊට පස්සෙ හිතලා හිතලා උණ හැදෙනවා".

"මොනවද පුංචි පුදුම දේවල් කිව්වෙ.?"

"කෙල්ල කියවන්නෙම ළමාතැනීගෙ විස්තර.. දවසක් එයාගෙ උපන් දිනේට ලේස් ගවුමක් මහලා දෙන්න කිව්වා.. මට බය හිතුනා පුතේ".

ඈ කීවේ චෛතිය දෙස බලා ගෙනය.. ඔහු පුදුම වී උන්නේ තමා නිවසේ උන්නද මෙතරම් දෑ නොදැන උන් නිසාය..

"ඇයි ඒ..?"

ඒ පැනය නතාලිගෙනි..

"ළමාතැනි හැමදාම වගේ ඇන්දෙ ලේස් ගවුම්".

නතාලි ගැඹුරු කල්පනාවකට පිවිසියේ මෙය දිගින් දිගටම පැටලිලි සහගත වන බැවිනි..

"අනික ඒ ඇත්ති කොණ්ඩෙ බැන්දෙ පාට පාට රිබන් පටි වලින්.. අපේ කෙල්ලත් එළියට බැස්සොත් රිබන් පටි ඉල්ලලා බේරුමක් නෑ".

නැගණිය සතුව පාට පාට රිබන් පටි එකතුවක් ඇති බව චෛතියටද සිහිපත් විණි..

"අම්මා අශේන්ගෙ බර්ත්ඩේ එක ගැන චූටිට කිව්වද..  ? නැත්තං චූටි ඉන්න තැන ඇලිසා නැන්දා එක්කවත් කතා උනාද.?"

චූටි අශේන්ගේ උපන්දිනය ගැන තමා සමග පැවසූ අයුරු සිහිපත් වූ චෛතිය මවගෙන් විමසුවාය..

“නෑ පුතේ.. මං කටේ කෙල බිඳක් හෙලුවෙ නෑ.. මං ඇලිසටත් කියලා තියෙන්නෙ අපේ කෙල්ල ඉන්න තැන වලව්ව ගැන කතා වෙන්න එපා කියලා..”

“එතකොට එයා කොහොමද ඒක දැනගත්තෙ..?”

“මට තියෙන පුදුමෙ ඒක තමයි.. මේ ළමයා ඊයෙ තනි පංගලමෙ වලව්වට ඇවිත් තියෙන්නෙ ඇලිසටත් හොරෙන්නෙ..”

“එතකොට ඇලිසා නැන්දා දැකලා නැද්ද චූටි එනවා..?”

“නෑ.. මං එද්දිත් එයාලා අපේ ගේ දිහාවෙ චූටිව හොයනවා..”

මව දිනපතා මේ සුවිසල් වත්ත හරහා ගල් කන්ද වලව්වට ගියද මතක ඇති කලකින් එහි නොගිය තම සිගිති නැගණිය අඳුර වැටෙනා වෙලේ තනිව වලව්වට යාම සිතා ගත නොහැකිතරම්ය..

“චූටි ඊයෙ අශේන්ගෙ මූණ ඉම්බ වෙලේ අම්මට මොකද හිතුණෙ..?”

ඔහු විමසුවේ අඩ සිනහවක් මුව රඳවාගෙනය.. තමා දැන් සිනාසුනද ඒ මොහොතේ තමා කොතරම් කැළඹී උන්නේදැයි චේතියට යළි සිහිපත් විනි..

“මට උන් හිටි තැන් අමතක උනා දරුවො.. ඒකයි මං හේතුහාමිට කියලා විගහින් දරුවා ගෙන්න ගත්තෙ..”

“චූටි නංගි මෙහෙම හැසිරෙන්න හේතුව මොකක් කියලද පුංචි හිතන්නෙ..?”

ගුණවතීගේ මතය කුමක්දැයි විමසුවද නතාලිනම් මේ වන විට යම් නිගමනයකට එළඹී උන්නාය..

“අපේ කෙල්ලට ළමා තැනීගේ දිෂ්ටිය වැටෙනවද කොහෙද.. ? ඒකනේ විටින් විට ඔහොම ලෙඩ වෙන්නෙ..”

ඇගේ මානසික මට්ටම අනුව එය සිතා බැලිය හැකි මට්ටමේ තිබුණි.. නමුත් එයට පරස්පර කරුණු රාශියක්ද නතාලිට සිහිපත් විය..

"හරි.. අම්මා කියන දේ ඇත්ත කියලා අපි හිතමුකො.. එතකොට අපේ චූටි කොහොමද ළමා තැනීගෙ හැඩරුව ගත්තෙ..? එයාගෙ මූණ.. කොණ්ඩෙ.. පාට.. මේ හැමදේම ළමා තැනීගෙ වගේනෙ".

තමාට වටහාගත නොහැකි වුයෙත් එයම නොවේදැයි ගුණවතී සිහපත් කළාය..

"ඒත් පුංචි.. චූටි නංගිට තියෙන්නෙ දිෂ්ටියක්.. ආවේශයක් වගේ දෙයක් නමං ඒකට මුහුණුවර සම්බන්ධ වෙන්න විදියක් නෑ.. අනික මං අහලා තියෙන විදියට මැරුණ කෙනෙක් ජීවත් වෙලා ඉන්න කෙනෙක්ට වැහුණම එයා කතා කරන්නෙ අර මැරුණ කෙනාගෙ කටහඬින්.."

"අපේ කෙල්ලගෙ එහෙම වෙනසක් නෑ පුතේ."

"ඒක තමයි මං කියන්නෙ.. මේක දිෂ්ටියක් නෙමෙයි."

නතාලි පැවසුවේ සියට සියක්ම නැත්ත සියට අනූවක තරමේ විශ්වාසයකිනි..

"අපේ චූටි කලින් ආත්මෙක අශේනගෙ ගර්ල් ෆ්රෙන්ඩ් කෙනෙක්ද දන්නෙ නෑ.. නැත්තං එයාගෙ උපන් දිනේ මතක තියාගෙන ඉදලා එදාටම ගිහින් මූණ ඉඹීයෑ.."

චෛතිය එය කීවේ හිතා මතා නොවේ.. එය ඔහුගේ මුවින් ඉබේටම පිටවුණි.. නමුත් ඒ ඇසුණු නතාලිගෙ ඇස් දීප්තිමත් විය..

"අන්න මල්ලි ඔයා පොයින්ට් එකට ආවා."

ඈ කීවේ සිය දකුණතේ ඇඟිලි තුනක් එකිනෙක තෙරපා ශබ්දයක් පිට කරමිනි..

“ඒ කිව්වෙ..?”

“මට හිතෙන හැටියට මේක පෙර බවය පිළිබඳ සිද්ධියක්.”

“මට තේරෙන්නෙ නෑ දරුවො..”

ගුණවතී සැබැවින්ම පටලැවී උන්නාය..

“මේකයි පුංචි.. මමත් පහුගිය ටිකේ මේ සිද්ධිය ගැන ස්ටඩි කලා.. මට දැනෙන විදියට ළමාතැනීගෙ යළි ඉපදීම තමයි අපේ චූටි නංගි.. ඒ කියන්නෙ පුනරුත්පත්තිය..”

“නියමයි නතාලි අක්කෙ.. මටත් ඕකම හිතුනා.”

චෛතිය කීවේ පෙරේදා පාන්දර එක දෙක පමණ වන තුරු කල්පනා කර ගොඩ නගාගත් අනුමානයක් පිළිබඳවය..

“සයිකොලොජී වලට උගන්වන තවත් එක් පැත්තක් තමයි ඔය පුනර්භාවය කියන්නෙ.. මං අපේ සයිකො කරන යාළුවෙක්ගෙන් ඔය පොත් වගයක් ඉල්ලගෙන කියවලා බැලුවා.. ඒවා මාරුස්ටරස්ටින්..”

චෛතිය දෙසට නෙත් යොමා නතාලි කීවේ බොහෝ උනන්දුවෙනි..

“ඕවා බොරු මනස්ගාත දරුවො.. ඒ වගේ රජ මැදුරක උනත් ඒ ඇත්ති මේ වගේ දුප්පත් පැලකට එන්නෙ අහවල් එහෙකටද..?”

සිය ඥාති දියණියගේ කතාව ගුණවතී බැහැර කළේ එසේ කියමිනි..

“පුනරුත්පත්තියට ඕවා අදාල නෑ පුංචි.. රජ මැදුරු වල අය මැරිලා පැල්පත් වල ඉපදෙනවා.. පැල්පත් වල අය මැරිලා රජ මැදුරු වලත් ඉපදෙනවා.. ඒකෙදි ඔය මිල මුදල් සැප සම්පත් කියන දේවල් වටින්නෙ නෑ.. කර්ම ශක්තිය වගේම කලින් ආත්ම වල තිබුණ බැඳීම් නිසයි එහෙම වෙන්නෙ..”

නතාලිගෙ පැහැදිලි කිරීම චේතියට වැටහුණද එය ගුණවතීට නම් එතරම් වැටහුණේ නැත..

"කර්ම ශක්තිය ගැන කිව්වට ළමාතැනී පැලක ඉපදෙන්න තරම් පව් කරපු කෙනෙක් නෙමෙයි.. ඒ කාලෙ ඒ ඇත්ති කළේම දාන මාන දීපු එක.."

"ඒක තමයි මං කිව්වෙ.. මෙතනදි අපට ගන්න පුළුවන් පෙර භවයේ බැඳීම කියන දේ.. ළමාතැනී මැරෙන මොහොතෙ එයාගෙ හිත තිබුණෙ ඔයාලා ළග.. ඉතිං මේ ගෙදර දරුවෙක් වෙලා ප්රෙතිසන්ධිය ලබන්නත් ඒ හැඟීම බලපෑවා වෙන්න පුළුවන්.."

"අනේ මන් දන්නෑ ඕවා.. හිටිං පුතේ බත් ඩිංගක් කාලා යන්න".

ගුණවතී කතාව මග හැරියේ ප්රනතිසන්ධිය හෝ පුනර්භාවය යන කරුණු කාරනා ගැන දැනීමක් නොතිබූ හන්දාය..

"පුංචිට මේවා විකාර වගේ තේරෙනවා ඇති මල්ලි.. ඒත් මං මේවා කියන්නෙ ලොකු විශ්වාසෙකින්.. මට හිතෙන විදියට වෙලා තියෙන්නෙ ඒක.. ඔයා කොහොමවත් තව ටිකක් හොයලා බලන්න.. පුළුවන් තරම් චූටිව නිරීක්ෂණය කරන්න.. අපිට මීට වඩා ඉස්සරහට යන්න පුළුවන් වෙයි.."

"මට තේරෙනවා අක්කෙ.. මමත් ඉස්කෝලෙ පුස්තකාලෙන් සැහෙන මනෝ විද්යානව.. පුනර්භවයඟැන පොත් කියවලා තියෙනවා.. එහෙම ඉපදෙන අය සමහර වෙලාවල් වලට පෙර භවයෙ එක්කෙනාගෙ රූප කාය ගන්නවා කියලා ඒවයෙ තිබුණා මටත් මතකයි.."

"මං කිව්වට විශ්වාස කරන්න එපා මල්ලි.. අපි තව ටිකක් මේ ගැන හොයමු.."

කතාව තාවකාලිකව නතර කල ඔවුහු දිහා ආහාරය භුක්ති වින්දහ.. කටට රසට යමක් සෑදීමට නොහැකි වීම පිළිබඳව ගුණවතී පසු තැවුණද එම ආහාර වේල නතාලිට නම් ඉහටත් උඩින්සෑහුණි.

නතාලිගෙන් ලැබුණු ජංගම දුරකථනය තම මවට පෙන්වූ චෛතිය ඉන්පසු එය එළිපිටම පාවිච්චි කළේය.. ඇතැම් විට ඔහු නැගණියගේ කතා එහි පටිගත කිරීමටද අමතක කළේ නැත.. රංග , කලන හා චෛතියගේ සම්බන්ධය තව වැඩි දියුනු කිරීමටද එය මහත් රුකුලක් වුනි..

"උඹටත් දැන් එහෙනං හැන්ඩ් ෆෝන් එකක් තියෙනවා.. ආ.. එහෙනං දැන් සම්මානි එක්ක මල් කඩන්නත් බැරියෑ.."

මිතුරා දුරකථනය අත දරා බස් නැවතුමට එනු දුටු කලන ඔහුට විහිළුවක් කළේය..

"සම්මානි එක්ක මල් කඩන්න එකෙක් සේනාධීරයා හොයාල දුන්නනේ.."

චෛතිය කීවේ තරහිනි..

"ඒ හොයලා දුන්නෙ සේනාධීරයනේ බං.. ඒක සම්මානි හොයාගත්තු එකක් නෙමෙයිනෙ.."

කලන එය කීවේ සිය මිතුරාගේ සිත හැදීමටය..

"ඒත් සම්මානිට කරන්න වෙන්නෙ ඒකම තමයි.. ඇතුගලයත් වැඩේට උඩින්ම කැමතියිනෙ.."

"එහෙනං මගුලටද එදා ඒකි උඹට තුරුල් වෙලා අඬ අඬා හිටියෙ".

එම සොදුරු විනාඩි කිහිපය චෛතියට සිහිපත් වුනි. ආදරය ගැන තියා සාමාන්‍යභයහෙළියක ලෙසවත් ඇසුරු නොකල සම්මානි තමාට ළංව ඉකි ගැසූ හැටි ඔහුට තවමසිහිනයක් සේය..

"ඔන්න.. ඔන්න.. ඒ පාර උඹත් හොට්ට පෙරන්න තියාගත්තා.. අන්න බස් එක.."

ඇතින් එන බසය දුටු කලන ඊට අත දමා හනික නැග ගත්තේය.. රංග ඔහු ළඟින්ම අසුන් ගත්තද චේතියට අසුනක් ලැබුණේ පසුපසිනි..

"මචං එදා සීන් එක චේතියට නොකියා ඉන්න හොඳ නෑ.. උගේ ආත්මාරක්ෂාවට හරි ඌ ඒක දැනගෙන ඉන්න එක හොඳයි නේද?."

එදා වලව්වේදී ඔවුන් පැන ආ සිද්ධිය මෙතෙක් චේතියට වසන් කල රංග හා කලන එය ඔහුට කීමට තීරණය කළහ.. ඔහු එය නොදැන උනහොත් ඔහුට ලොකු අනතුරකට මුහුණ පෑමට සිදුවන බව සහතිකය..

"අශේනයගෙ සෙට් එක ඕක අතාරියි කියලනං හිතන්න බෑ තමයි.. අපි පුළුවන් තරම් චේතියව තනි නොකර ඌ එක්කම ඉන්න බලමු."

කලනද එය අනුමත කළේ එය චේතියගේ ජීවිතයට පවා තර්ජනයක් බව දැන උන් හෙයිනි..

"අශේනයා අපේ ඔළුව අතගාලා ටොක්ක අනින්න හැදුවට ඌටත් රිටන් එක දෙන්න ඕනෙ.. අපි කොහොම හරි සම්මානිව චේතියට සෙට් කරමු.. අපේ එකාට සල්ලි විතරනේ බං අඩු.. නැත්තං ඌඅපිටත් වඩා හැන්ඩියනේ.."

දෙමිතුරෝ චේතිය ගැන කතා වෙවී පැමිණෙන අතර තුර චේතිය පෙරදා නතාලි කී දෑ ඔවුන් දෙදෙනාට කීමේ නොඉවසිල්ලෙන් පසු උනි.. ඊටත් වඩා සම්මානිව මුණගැසී අශේන් ගැන කතා බහ කිරීමටද ඔහුට අවැසි වී තිබිණ..

"චේති.. අපි ක්ලාස් එක ළඟට ත්‍රීවීලර් එකක යමුද..

බසයෙන් බැසි රංග කී කතාවට චේතිය පුදුමයෙන් මෙන් සිය ඔරලෝසුව දෙස බැලීය..

"මෙච්චර වෙලා තියෙද්දි මොකටත ත්‍රීවිල්.. මේක අපි හැමදාම යන පාරනේ.. ඔන්න ඔහේ පයින් යමු."

මිතුරන් වද වෙන්නේ කුමක් ගැනදැයි චේතියට ඉවෙන් මෙන් වැටහුණි.. නැත.. බය වෙන්නට කාරණාවක් නොවේ.. මෙම පාර තමාට හොදට හුරු පුරුදුය.. මග දෙපස කඩ සාප්පු.. පාරේ ගමන් ගන්නා සිසුන්.. සැමදෙනා තමාගේ පැත්තටය.. එහෙයින් ඔහු දැඩි ආත්ම විශ්වාසයකින් මිතුරන් දෙසට හැරුණි..

“උඹලා කියන්න හදන්නෙ මොකක්ද කියලා මට තෙරෙනවා.. මේ චේති ඉන්න කල් බයවෙන්න එපා බං.. මං බ්ලැක් බෙල්ට් ගත්තෙ ගමේ ඉස්කෝලෙ යන කාලෙදිමයි කියලා උඹලට අමතකඋනාද..?”

“අපිට බය අපි ගැන නෙමෙයි යකෝ.. උඹ ගැන.. උන් විශේෂයෙන්ම රිටන් එක දෙන්න ලෑස්ති වෙලා ඉන්නෙ උඹට.”

චේතියව බලෙන් මෙන් ත්‍රීරෝද රථයකට දමා ගත් රංග පංතියෙන් බැස ගත් පසු ත්‍රීබරෝද රථ රියදුරාට පංතිය ඇරෙන වේලාවටත් පැමිණෙන ලෙස දැනුම් දුන්නේය..

“ඇයි මල්ලි.. මොකක් හරි ලෙඩක් දාගත්තද.?”

නිතර හන්දියේ දැක පුරුදු එම ත්‍රීරවිල් රියදුරා විමසුවේ සුහද ලෙසිනි..

“එහෙම දෙයක් නෙමෙයි අයියා..”

එකවර කිසිවක් කිව නොහැකි නිසා කලන සැහැල්ලුවෙන් ප්රාශ්නය මග හැරියේය..

“මේ වැයික්කිය අපේ මල්ලි.. පිට උන්ට මෙහේ චන්ඩිකං දාන්න දෙන්න බෑ.. අවුලක් උනොත් මට කෝල් කරන්න.. මං රත්නේ..

ඔහු නැවත ඉගිල යාමට මත්තෙන් දුරකථන අංකය ලියූ කොල කැබැල්ලක් කලනගේ අත තැබීමට අමතක කලේ නැත..

මැරවරයන් තිදෙනාගේ කතාව රංග චේතියට කීවේ ඔවුන් ආරක්ෂාකාරී ලෙස පංතියට ඇතුල් වූවට පසුවය.. මිතුරන් මේ තරම්ම බියපත් වූයේ ඇයිදැයි චේතියට වුව වැටහුණේ ඉන්අනතුරුවය..

“මං උඹලට එදා කිව්වෙ නැද්ද අශේනයා ගැන.. ඌ ඔහොම හිටියට ලෝක අංකූරා..”

“එහෙනං ඉතිං අර සම්මානිට දෙයියන්ගෙම පිහිටයි!.”

කලන කීවේ සම්මානි පැමිණ ඇත්දැයි කියා විපරමින් බලමිණි..

“කෙල්ල තාම නෑ බං.. මටත් තියෙන බය ඒකමයි!.”

ඔහුගේ සිතැගි වටහාගත්තාක් මෙන් චේතිය කීවේය.. තමා මෙතෙක් සම්මානිට ළං නොවූයේ තම දුප්පත්කම නිසා වුවද සම්මානි කොන්දේසි විරහිතව තමාව විශ්වාසයට ගෙන තිබීම චේතියගේ උනන්දුව වඩවා තිබිණි.. එනිසා ඈ වෙනුවෙන් අවසන් මොහොත දක්වා අශේන් සමග සටන් කිරීමට ඔහු අදිටන් කර ගත්තේය..

“උඹ දවස් දෙකක් පිට පිට ඉස්කෝලෙ නාව එක ගැන මහින්ද සර්ත් ඇහුවා චේති.. ඇත්තටම මොකද උනේ.?”

පංතිය පටන් ගැනීමට තවමත් කල් වේලා තිබූ නිසා නිවසේ වූ කතා බහ මිතුරන්ට පැවසීමට චේතිය අදහස් කළේය..

“පෙරේදා නතාලි අක්කා ආවා බං.. අපේ චූටිගෙ කේස් එක ගැන සෑහෙන දුරට කතා උනා..”

එසේ කී ඔහු එදින සාකච්ඡාව ඔහුට කිය හැකි උපරිමයෙන් මිතුරන්ට විස්තර කර පැවසීය.. නතාලි කී පුනර්භව කතාව අසා රංගගේ දෙනෙත් පුදුමයෙන් විසල් විණි..

“ඒක හරි පුදුම කතාවක්නෙ.. එතකොට නතාලි අක්කා කියන්නෙ උඹේ නංගි විදියට ඉපදිලා තියෙන්නෙ අශේන්ගෙ අම්මා කියලද?.”

රංග ඇසුවේ සමච්චල් සහගත සිනාවක් පාමිනි..

“එහෙම කියන්න එපා රංග.. මූට නොකිව්වට මටත් කල්පනා කරගෙන යද්දි ඕකම හිතුනා.. උඹලා දන්නවනේ මං ඉස්සර ඉඳලම පොත් කියවන්න කැමතියි කියලා.. ඔය පුනරුත්පත්තිය කියන්නෙ මගේ ෆේවරිට් ෆිල්ඩ් එකක්.. ඒ පොත්වල තියෙන දේවල් මුගේ නංගිගෙ කතාවට සෑහෙන දුරට ටැලි උනා..”

චේතිය පුදුම වූයේ තමා.. නතාලි අක්කා.. පමණක් නොව කලනද එකම නිගමනයකට එළඹ මෙතෙක් කල් ඒවා සිත්හි සඟවාගෙන ඉදීම පිළිබඳවය..

“අපි කතා උනාට තාම බැරි උනානේ පන්සල පැත්තෙ ගිහින් එන්න. අපි අද හෙටම ගිහින් හේමවංශ හාමුදුරුවො එක්ක ඔය ගැන කතා කරමු.. උන් වහන්සෙ තමයි ඕකට හරියනමකෙනා..”

චේතියගේ කතාව කලන අනුමත කලද එය එක්වර පිළිගැනීමට මැලි වූ රංග විකල්පයක් ඉදිරිපත් කළේ ඒ තුළින් නිවැරදි තීරණයකට එළඹිය හැකි හෙයිනි..

“මමත් ඔය ගැන හිතුවා චේති.. හේමවංශ හාමුදුරුවො කියන්නෙ තනිකරම විශ්ව කෝෂයක්නෙ.. එයා ඔය ෆිල්ඩ් එක ගැන අපි නොදන්න දේවලුත් කියලා දෙයි.. ඕනෙමනං අපිට ලොකුහාමුදුරුවො එක්ක උනත් කතා කරන්න බැරියෑ..”

කලනද රංගගේ කතාව අනුමත කලේ මෙම ප්‍රශ්නය සාකච්ඡා කල හැකි හොඳම තැනැත්තා පන්සලේ පොඩි හාමුදුරුවන් බව වැටහුණු නිසාය.. පුංචි කාලයේ දහම් පාසල් යන අවධියේ පටන් ගමේ පන්සල සමග ඔවුනට තිබුණේ ඉතා හොඳ සම්බන්ධයකි.. ඔවුන් වයසින් වැඩෙත්ම ලොකු හාමුදුරුවන් ඌ සීලරතන හාමුදුරුවන්ට වඩා හේමවංශ හාමුදුරුවන්ට නිතැතින්ම ළං වුනි.. පන්සලේ ඕනෑම විශේෂ වැඩකට ඔවුන් තමන්ගේ සම්පූර්ණ දායකත්වය ලබා දුන්නේ මෙම බැඳීම නිසාය.. නමුත් මෑත කාලයේ ඔවුනට පන්සල පැත්තේ යාමට තරම් කල් වේලාවක් නොලැබුණි..

"මොකද කියන්නෙ.. අනිද්දා හවස් වරුවෙ පන්සල පැත්තෙ ගිහින් එමුද..? එදාට පංතිත් නෑනෙ.."

චේතියගේ යෝජනාවට දෙදෙනාම එකග වූයේ දෙවරක් නොසිතමිනි..

"අද සම්මානි එන පාටක් නෑ වගේ.. එනවනං කෙල්ල මේ වෙද්දි ඇවිත්.."

පන්තිය පටන් ගැනීමට ගුරුතුමා වේදිකාවටත් නැගුණු පසු රංග කීවේය.. ඒ ඇසි චේතියගේ මුහුණු මැලවුනි..

පංතිය අවසන්ව ඔවුන් පිටත්ව යාමට සැරසෙද්දී සම්මානිගේ මිතුරියක් කලබලයෙන් මෙන් චේතිය වෙත දිව ආවේය..

"චේතිය.. සම්මානි මේ නම්බර් එක ඔයාට දෙන්න කිව්වා.. පුළුවන් නම් රෑ දහයෙන් පස්සෙ ඕකට කෝල් එකක් ගන්න කියලත් කිව්වා".

තවත් යමක් කීමට පමා නොවූ ඈ ඔවුන් ළගින් නික්ම ගියේ පැමිණියාටත් වඩා වේගයෙනි..

"හුහ්.. බලපංකො.. ඒකි නිකං නියුරෝනයක් වගේනේ".

ඈ ගිය ගමට නෙත් යැවූ කලන ඇසක් ඉගිකර කීවේය..

"මොකක්ද මචං නියුරෝනයක් කියන්නෙ.?"

චේතිය අත තිබූ එම දුරකථන අංකයට එබෙන අතරතුර රංග විමසිය..

"මෙච්චර කල් බං මේ විශ්වයේ වේගයෙන්ම ගමන් කරන දේ විදියට අදුනගත්තෙ ආලෝකයනේ.. ඒත් මෑතකදි කැලිෆෝනියාවෙ විද්‍යාඥයො පිරිසක් කරපු පරීක්ෂණයකින් ඔප්පු වෙලා තියෙනවා නියුරෝනය ආලෝකයට වඩා වේගයෙන් ගමන් කරනවා කියලා.. බලපං ඉතිං මේ කෙල්ලත් ඒ වගේ නෙමෙයිද කියලා.. ආවා.. කොලේ දුන්නා.. පණිවිඩේ කිව්වා.. දිව්වා.. අඩුම ගානෙ අපිට එක වචනයක් කියන්න ඉඩක් ලැබුනද.. නෑනෙ.."

කලනගේ පැහැදිලි කිරීමට සවන් දෙන අනරතුර චෛතිය එම දූරකථන අංකය සිය ජංගම දූරකථනයේ සටහන් කර ගත්තේය..

"අනුමානයක් නෑ චෛති කෙල්ල උඹට කැමතියි.. දාපන් පහක්"..

සම්මානි දූරකථන අංකය එවීම පිළිබඳව සතුටට පත් වූ රංග සිය අත්ල දිහ හැර බලා උන්නේ චෛතිය අත දෙන තුරුය..

"දැනට කැමති ඇති.. ඒත් ඒ කැමැත්ත ඉවර වෙන්නෙ මං කාගෙ කවුද කියලා ඒකි හරියටම දැනගත්ත දවසට.. මං ගල් කන්ද වලව්වෙ කුස්සි අම්මගෙ පුතා කියලා දැනගත්තම    කෙල්ල ෆෝන් නම්බර් එකත් වෙනස් කර ගනියි.."

රංගට අත දීම වෙනුවට ඔහුගේ පිටට පහරක් ගැසූ චෛතිය එය කීවේ තරමක් හැගුම්බරවය.. ඔවුන්    පංතියෙන් පිටතට පැමිණෙන විට ත්‍රීවිලය පැමිණ තිබූ නිසා ඒ කතාව එතකින්ම නතිණි..

*****************************

එදින රාත්‍රි ෙය් සම්මානි සමග කතා කිරීමට චෛතිය බලා උන්නද රාත්‍රීත එකොළහ පසුවන තුරුත් මව අවදිව උන් නිසා ඔහුට තම සිතැගි ඉටු කර ගැනීමට නොහැකි වුණි.. මව හා නැගණිය නිදන්නේද තමා නිදන ඇද පාමුල වීම ඔහුට තිබුණ අනෙක් ගැටළුවයි..

ඔහුට ඇමතුම ගැනීමට ඉඩ ප්‍රඅස්ථාව ලැබුණේ පසුදා දහවල් පාසල් ඇරී නිවසට පැමිණියාටත් පසුවය..

"හෙලෝ.. සම්මානි.. මම චෛතිය."

ඔහු තමාව හඳුන්වා දුන්නේ සියුම් තිගැස්මක් සමගිනි.. සම්මානිගේ මව හෝ පියා අසල සිටින්නේද යන ගැටළුවද ඔහුගේ සිතට වද දුන්නේය..

"ආ.. ඔව් චෛතිය කියන්න.. මං ඔයා කතා කරනකල් ඊයෙ රෑ දොළහ විතර වෙනකල් බලන් හිටියා."

මේ ඈ  තමා සමග දුරකථනයෙන් කතා කරන පළමු අවස්ථාව වුවද ඇයට නම් එය වෙනසක් නැත්තා  සේය.. ගැහැණු ළමයෙකු වූ ඈ මෙසේ නොබියව කතා කරන්නේ නම් තමා පැකිලෙන්නේ  මන්දැයි සිතූ චේතිය දුරකථනයත් රැගෙන මිදුලේ පොල් කොටයක් මත හිද ගත්තේය..

"රෑට කතා කරන්න අමාරුයි සම්මානි.. අම්මා ළඟ ඉන්නවා"

"අපෝ.. ඔයා තාම නිදියන්නෙ අම්මා ළඟද.?"

ඈ කලේ විහිළුවක් වුවද තමාටත් අම්මාටත් නැගණියටත් නිදාගැනීමට නිවසේ ඇත්තේ එකම  කාමරයක් පමණක් යැයි කීමට චේතියට සිතුණි.. නමුත් එයට දැන්ම කල් වේලා වැඩි  බැවින් ඔහු ඉවසා උන්නේය..

"චේතිය.. ඔයාලා කොහොමද එදා ගල් කන්ද වලව්වෙ පාටියට ආවෙ..? ඔයාලා අශේන්ව දන්නවද.?"

"මේ ටවුන් එකේ කවුද අශේන්ව නොදන්නෙ.. අනික අපි එක ගමේනෙ.. ඒත් ඉතිං වැඩි හිතවත්කමක් නෑ.. කොටින්ම මට මිනිහව දිරවන්නෙ නෑ.."

"එහෙනං එදා ඇවිත් හිටියෙ.,?"

"දවසක් අපේ බාල දක්ෂ ටීම් එකේ කට්ටියක් ඔය වලව්වට ගියා.. එදා අපිට වලව්වෙ හාමු  මහත්තයා පාටි එකට ඉන්වයිට් කලා.. අපි නොගියොත් ඉතිං ඉස්කෝලෙටත් හොද නෑනෙ.ඒකයි අපි තුන්දෙනා එදා ආවෙ.."

"එහෙනං ඔයා ඇයි බොරු කොණ්ඩෙකුයි කණ්නාඩියි දාගෙන හිටියෙ..? ඔයා ක්ලාස් එකේදිවත් කණ්නාඩි දාන්නෙ නෑනෙ"

ඇගේ පැනයට චේතිය මොහොතකට ගොළු විනි.. සම්මානි මෙතරම් සියුම් ලෙස ප්‍රශ්න කරාවියැයි ඔහු මොහොතකටවත් සිතුවේ නැත..

“ඒක මට කියන්න බැරි හේතුවක්ද චේතිය.?”

ඔහුගේ නිහඬතාවය හමුවේ ඈ නැවතත් අසා සිටියාය..

“ඔයාට කියන්න බැරි කමක් නෑ.. ඒත් මං වෙලාව ආවම කියන්නං සම්මානි.. ඒක ටිකක් දිග කතාවක්.”

කියනවානම් ඇයට උඩින් පල්ලෙන් කියා පලක් නැත.. එහෙයින් පසු දිනෙක තමාගේ සැබෑ තතු ඇයට හෙළි කිරීමට චේතිය අදිටන් කර ගත්තේය..

“කමක් නෑ ඔයා කියනකල් මං ඒ ගැන ආපහු අහන්නෙ නෑ”.

යමක් සියුම් ලෙස නිරීක්ෂණය කිරීමටත් අවශ්‍යයි වේලාවේදී නිහඬ වීමටත් දන්නා මැය වැන්නියක තම ජීවිතයට ළගාකර ගැනීමට හැකිනම් කොතරම් අගනේදැයි චේතියට යළිත්වරක් සිතුණේය..

“මාව ඔයාගෙ හොද යාළුවෙක් කරගන්න ඔයා කැමතිද චේතිය.. ? මගේ හිතේ තියෙන දේවල් කියන්න විශ්වාසවන්ත කෙනෙක් මං ළග නෑ..”

ඈ සිය රූපයටම සරිලන සුන්දර කට හඬකින් විමසා සිටියාය.. ඒ ඇසී චේතියට දැණුනේ පුදුම සතුටකි..

“ඇයි ඔයාගෙ පංතියෙ යාළුවො සෙට් එක.?”

“ඒ අය නරකයි කියලා මං කියන්නෙ නෑ.. ඒත් මට ඕනෙ මාව තේරුම් ගන්න පුළුවන් කෙනෙක්.”

“ඔයා හිතනවද සම්මානි මට ඔයාව තේරුම් ගන්න පුළුවන් වෙයි කියලා.. අනික ළගින් ආශ්‍රතය කරපුවත් නැති මාව ඔයාට විශ්වාසිද..

සම්බන්ධයක් ගොඩනැගීමට පළමුව අවශ්‍යය වන්නේ එකිනෙකා තේරුම් ගැනීම හා විශ්වාසය බව චේතිය ඇදහුවේය.. ඔහු සම්මානිගෙන් ඒ පිළිබඳ ඍජුව විමසා සිටියේ එහෙයිනි..

"අපි ළඟින් ආශ්‍ර ය කරපු නැති බව ඇත්ත.. ඒත් අපි කාලයක් තිස්සෙ එකම ටියුෂන් පංතියට ආපු අය නේද..? කතා නොකලට අපිට අපේ මූණු මතක තිබුණා නේද..?"

තමාගෙ නිහඬ ආදරය සම්මානි වටහාගෙන ඇති බව චේතියට ඉවෙන් මෙන් දැණුනි.. තමා සැමදා ඇගේ රුව පෙනෙන තැනක අසුන් ගැනීම හා ඈ ගැන උනන්දු වන බව ඇය නිරීක්ෂණය කරන්නටඇත..

"ඔයා මාව විශ්වාස කරනවානං ඒ විශ්වාසෙ රකින්න මං ලෑස්තියි සම්මානි.. ඔයාගෙ හිතේ තියෙන ඕනම දුකක් ඔයා මට කියන්න"..

වදනින් නොකීවාට ඈ තමාව විශ්වාස කරනා බව චේතිය දනී.. එදා ගල් කන්ද වලව්වේ තමාගේ තුරුළට වී ඉකි බින්ද ඇය 'මට අශේන්ව බදින්න බෑ චේතිය' යනුවෙන් කීවේ ඒ නිසාය..

"කියන්න මහ හුගක් දේවල් මේ හිතේ හිරවෙලා තියෙනවා.. මට ඒ හැමදේම කාටහරි කියලා මගේ හිත නිදහස් කර ගන්න ඕනෙ.. අපිට දවසක මීට් වෙලා කතා කරන්න බැරිවෙයිද්‍ලචේතිය..?"

ඇයව මුණ ගැසී ඈ ළඟට වී ඉන්නට හැකි නම් දවසක් දෙකක් නොව මුළු ජීවිත කාලයටම එය කල හැකි බව ඔහුගේ සිත කීවද ඔහු හදවතට නොව බුද්ධියට මුල් තැන දුන්නේය..

"මට එන්න නං බැරි කමක් නෑ.. ඒත් අපි එහෙම මුණ ගැහිලා කතා කරන එක ඔයාට හොඳ නෑ සම්මානි.. ඔයා කෙල්ලෙක්නෙ.. අනික අශේන්ගෙ චර පුරුෂයො හතර වටේම ඉදන් ඔයාට ඇහැ ගහගෙන ඇති.."

චේතියගේ  කතාවට සම්මානිගේ සිතේ ඇතිවූයේ දැඩි පැහැදීමකි.. වෙනත් පිරිමි ළමයෙකුගෙන්මෙසේ ඇසුවේ නම් ඔහු තමා ගැන සිතීම පසෙකට දමා අවස්ථාවෙන් උපරිම ප්රයෝජන අනු..

"එදා ඔයාගෙන් ගුටි කාපු තුන්දෙනත් අශේන්ගෙ චරපුරුෂයො කියලා මං දැනගත්තෙ එදා පාටියෙදි තමයි.."

එසේනම් ඇයද එදින ඔවුන්ව දැක ඇත.. ඔවුන් පිරිස අශේන් සමග ඒක්වී තමන්ට ප්ර තිප්රහාරයක් කිරීමට සැරසුණු බව ඇ දන්නේ නම්.. නොවේ.. ඒ සියුමැලි සිත රිදිවිය යුතු    නොවේ.. එහෙයින් ඔහු එය නොකියා සිටීමට තීරණය කළේය..

"ගෙදර කවුරුවත් නැද්ද සම්මානි.?"

ඔහු කතාව වෙනතකට හැරවූයේ ඇගේ සාමාන්යන ජීවිතය ගැන තමා කිසිවක් නොදන්නා නිසාය..

"තාත්ති නම් කොහොමත් මේ වෙලාවෙ ගෙදර නෑ.. අම්මිත් ඉතිං අර උත්සවේට යන්න ඕනෙ   කියයි.. අරහෙ සමිතියක් කියයි.. මෙතන රැස්වීමක් කියයි.. එහෙම තමා එයාගෙජීවිතේ.."

"එතකොට ඔයා තනියෙමද ඉන්නෙ.?"

"නෑ.. ගෙදර වැඩ කරන සුමනා නැන්දා ඉන්නවා.. එයා තමයි මගේ කිට්ටුම හිතවතා.. ඒ ඇරුණම ගෙදර ඩ්රායිවරුයි මුර අන්කලුයි ඉන්නවා.."

අතට පයට වැඩකාරයන් උන්නද ජීවිතය කොතරම් නීරසදැයි වටහා ගැනීමට ඔහුට අසීරු නොවිණි..

"සල්ලි තිබුණට මං හිරකාරියක් වගේ චේතිය.. තාත්ති ළග වැඩ කරන මිනිස්සු නං දාස්  ගානක් ඉන්නවා.. ඒත් මගේ හිතේ තියෙන දෙයක් කියන්න මට කෙනෙක් නෑ.. සුමනා      නැන්දා මාව බලා ගත්තට හැමදේම එයා එක්ක කියන්න බැනෙ.."

ඇය කීවට ඔහුගෙන් බර හුස්මක් පිටවිනි.. රජ මැදුරක කිරිල්ලියක් වූ ඇ සිය සිතැගි පැවසීමට තමාව තෝරා ගැනීමට ඔහුට විශ්වාස කළ නොහැකි තරම්ය..

"ඔයා වගේ මං සල්ලිකාරයෙක් නෙමෙයි සම්මානි.. කොටින්ම මං ඔයා වගේ කෙනෙක්ට ආශ්‍රකය කරන්න තරම්වත් සුදුසු කෙනෙක් නෙමෙයි.. ඒ නිසා.."

"ඇති චේතිය ඇති.. තව ඔය ගැන වචනයක්වත් කතා කරන්න එපා.. ප්රෙශ්නයක් ආවොත් මං ඒ ගැන බලාගන්න්ම්..

ඔහුට සිය කතාව අවසන් කිරීමට ඉඩ නොදුන් ඈ එය කීවේ හැඩුම්බරවය. එය වටහාගත් චේතිය ඉන් එහා ඇගේ සිත රිදෙන කිසිවක් කීවේ නැත..

"ඔයාලගෙ තාත්තා ඔයාව අශේනට බන්දලා දෙන්න යන්නෙ එයා ගැන නොදැනද සම්මානි.?"

මාතෘකාවෙන් පිට පැන්න ඔහු විමසුවේ තමාට වැඩිපුරම නිරවුල් කර ගැනීමට අවැසි ඉසව්ව එය වූ බැවිනි..

"ඒ කියන්නෙ ඔයත් අශේන් ගැන දන්නවා.. එහෙම නේද චේතිය.. ? අපේ තාත්තිට ඔය ටික නොතේරෙන එකනේ කරුමෙ කියන්නෙ.. එයා ඇතුගල අන්කල් එක්ක හිතවත් නිසා එයාගෙ බොරු වංශක්කාරකමට රැවටිලා.."

"අපි පුළු පුළුවන් විදියට මේ ප්රශශ්නෙ ඉවරයක් කරන්න බලමු සම්මානි.."

සම්මානිගේ සිත රිදවීමට මනාප නොවූ ඔහු කතාව එතෙකින් නතර කළේය.
අමතර පංති නොතිබූ බැවින් මිතුරන් තිදෙනා සවස් යාමේ ගමේ පන්සල කරා පිය නැගූහ..ගල් කන්ද වලව් වත්තට මායිම් වන කළුගල් තලාවම පන්සලේ පසුපස දක්වාම විහිදී යයි.. ගල් තලාවෙන් ඔබ්බට

තරමක් කැලයකි.. ආසන්නයේ ගෙවල් නොවූ නිසාත් ඉහත කී ගල් තලාව හා කැලෑ පෙදෙස නිසාත් පන්සල නිරන්තරයෙන්ම නිහැඩියාව රජ කරන ඉසව්වක් විය..

"මේ ඉස්සර අපි කොයි තරම් ආව ගිය තැනක්ද.? ඒකට දැන්.."

කලන කීවේ පන්සල ඉදිරිපස වූ අරලිය ගස් සෙවනේ සිය පාවහන් ගලවා දමමිනි..

"කෙලින්ම ආවාසෙ පැත්තට යමු.. පොඩි සාදු ඇති.."

හේමවංශ හාමුදුරුවන්ට ඔවුන් පොඩි හාමුදුරුවෝ යැයි කීවද උන් වහන්සේ වයසින් තම දිවියේ තුන්වැනි දශකය අවසන් කරමින් උන්හ.. නමුත් නායක හාමුරුදුවන් වූ සීලරතනහාමුදුරුවන් සා සසඳන කල්හී උන් වහන්සේ ගමේ දායකයන් හට සැමදා පොඩිහාමුදුරුවන්ම වූහ..

"බොහොම අගෙයි.. කාලෙකට පස්සෙ අපේ ළමයින්ට පන්සල් භූමිය මතක් වෙලා තියෙන්නෙ.."

සීලරතන හිමියන් මග හැර යාමට සිතා උන්නද ඔවුනට මුලින්ම මුණ ගැසුනේ උන් වහන්සේය.. චෛතිය මිතුරන් දෙදෙනාට ප්‍රථමයෙන් ගොස් හාමුදුරුවන්ට නමස්කාර කළේය.. රංග හා කලනද ඔහු අනුගමනය කළ අතර කිසිවෙකුත් පැමිණි කාරණය එකවර හෙළි කළේ නැත..

"මොකෝ.. පහුගිය ටිකේ පන්සල අමතක් උනාවත්ද.?"

"එහෙම නෑ අපේ හාමුදුරුවනේ.. එක දිගටම පංති තිබුණ නිසා වෙලාවක් තිබුණෙ නෑ.."

"අවශ්‍යතාවය තියනවනං වෙලාවක් හදාගන්න බැරියෑ..හා.. හා.. එකෙන් කාරි නෑ ඔහොම්ම යමු කුස්සිය පැත්තට.. ගමේ ඇත්තෙක් ගෙනාව කැවිළි වගයක් තියෙනවා.."

ඔවුන් පැමිණියේ කලකට පසුව වුවද හාමුදුරුවන්ගේ සැලකුම් වල වෙනසක් නැත.. උන් වහන්සේ ඉස්සරත් ඔහොමය.. දහම් පාසල් දිනවල වුව මොවුන් පිරිස කුස්සියට කැදවාගෙන යන උන් වහන්සේ තේ පැන් සංග්‍රහයක් වරද්දන්නේ නැත..

“දැනම කන්න බෑ හාමුදුරුවනේ.. අපි මේ හේමවංශ හාමුදුරුවො මුණ ගැහෙන්න එක්ක ආවෙ..”

රංග බොහෝ අසීරුවෙන් කියා දැම්මේය..

“එහෙමද.. ආවාසෙ පැත්තෙ බලන්න.. පොඩි හාමුදුරුවො පාඩම් කර කර උන්නා.. සියදෝරිසුත් ඇති ඔය පිල පැත්තෙ..”

නායක හාමුදුරුවන් බුදු මැදුර දෙසට පා එසෙව්වේ එසේ කියාගනෙමය.. එයට ගෞරව පූර්වකව හිස සැලූ මිතුරෝ කඩිනමින් ආවාසය දෙසට ගමන් ගත්හ..

“පොඩි සාදු පාඩම් කරනවා කිව්වෙ විභාගයක්ද දන්නෙ නෑ..”

චෛතිය කීවේය.. ඔවුන් හේමවංශ හාමුදුරුවන් හා කතා කිරීමේදී බොහෝ විට උන් වහන්සේ ඇමතුවේ සාදු හෝ පොඩි සාදු යන වදනිනි.. නමුත් අන් අය ඉදිරියේදී නම් ඔවුන් කට පුරා පොඩි හාමුදුරුවෝ යයි කීමට පසුබට වූයේ නැත..

“ආ චෛතිය මල්ලි.. එන්න.. එන්න.. කාලෙකට පස්සෙ නේද?..”

ඇතදීම ඔවුන්ව දුටු හේමවංශ හිමියන් කියවමින් උන් පොතක්ද අත දරා ඔවුන් කරා පැමිණියහ..

ස්වල්ප වේලාවක් ආගිය තොරතුරු කතා කිරීමෙන් අනතුරුව චෛතිය තමා පැමිණි කාරණය උන් වහන්සේට විස්තර කර පැවසීය..

“ඔය කරුණු කාරණා ගැන ගුණවතී උපාසක අම්මත් මගෙත් එක්ක කතා කරා..”

හාමුදුරුවන් ඔවුන් මෙතෙක් නොදැන උන් කරුණක් හෙළි කර සිටියහ..

"අම්මා ඔය විස්තර ගොඩක් අපෙන් හංගනවා සාදු.. දැනට උනත් අපි දන්නෙ මං ඉන්න නැත්වලදි නංගි කියපුවා කරපුවා විතරයි."

"මිහිරාවි ගොඩක් වෙනස් දරුවෙක් කියලා මං දැනං උන්නා.. එයා දහම් පාසලේදි උනත් හැසිරෙන්නෙ අමුතු විදියට."

"ඒ කිව්වෙ පොඩි සාදු..?"

"මේ ළඟදි දවසක් ඒ දරුවා ඕං ඔය සන්ධාර කුළුණ පාමුල ඉඳලා මං එක්ක කිව්වා ඒ කුළුන හැදෙව්වෙ එයාලු.."

"මොකක්ද චෙති ඒ කතාවෙ තේරුම.?"

කලන පුදුමයෙන් ඇසුවේ එහි අගක් මුලක් නොවැටහුණු බැවිනි.. චෛතිය පවා අන්දමන්ද වී උන්නේය..

"ඇත්තටම සන්ධාර කුළුන හැදෙව්වෙ කවුද සාදු."

පිළිතුර අනුමාන වශයෙන් සිත දරාගෙන කලන විමසිය..

"මෙතන කලින් තිබුණ කුළුණ බොහෝම පැරණි එකක්.. ඒකෙ බදාම ඉරි තැලිලා ගිහින් කාලයක් යද්දි කැලි හැලෙන්න ගත්තා.. ඒක අන්තිමට කඩා වැටෙන තත්වයටම අබලන් වෙලයිතිබුණෙ.."

"මටත් ටිකක් මතකයි ඒ කාලේ අපේ තාත්තත් හිටියා."

චෛතිය යට ගියාව යළි සිහිපත් කළේ තරමක් වේදනාවෙනි..

"ඒ කාලෙ දවසක් ඔය වලව්වෙ ළමාතැනී පන්සලේ පිංකමකට සහභාගි වෙන්න ආවා.. ඒ ඇත්ති ඔය සන්ධාර කුළුන දැකලා කිව්වා

මේක ලොකු අනතුරක සේයාවක්.. ඒ ඇත්ති සම්පූර්ණ වියදම දෙන්නම්.. ඉක්මනින් අලුත් සන්ධාර කුළුනක් හදවන්න කියලා."

පොඩි හාමුදුරුවන් කියනා තුරු මෙම සන්ධාර කුළුණේ වියදම් දරා ඇත්තේ ළමාතැනී බව මෙම මිතුරන් තිදෙනා දැන උන්නේ නැත..

"ඒත් ළමාතැනීමට ඒකෙ වැඩ සිද්ධ වෙනවා බලන්න එන්න බැරි උනා.. ඒ ඇත්ති අසනීප උනා නොවැ.. අන්තිමට හේතුහාමි අතේ චෙක් කොලයකුයි ලියුමකුයි එවලා තිබුණා සේරම වැඩ කටයුතු ඉවර කරලා ඉතුරුවක් තිබුණොත් ඒක පන්සලට තියාගන්න කියලා.. කොහොම හරි සන්ධාර කුළුනෙ වැඩ ඉවර වෙද්දි ඒ ඇත්ති ජීවතුන් අතර හිටියෙ නෑ.. ඒ ඉතුරු වුන මුදල් වලින් අන්තිමේදි ලොකු හාමුදුරුවො මල් ආසනයකුත් හැදෙව්වා."

"මේකට සල්ලි වියදම් කළේ ළමාතැනී කියලා ගමේ කට්ටිය දන්නවද සාදු..?"

චෛතිය හරස් ප්‍ර ශ්නයක් නැගුවේය..

"ගමේ මිනිස්සු තියා චෙක් එක අරගෙන ආව හේතුහාමිවත් දැනං උන්නෙ නෑ සල්ලි දුන්නෙ ළමාතැනී කියලා.. එතුමිය ලොකු හාමුදුරුවන්ගෙන් ඉල්ලීමක් කරලා තිබුණා ඒ ගැන ප්‍රමසිද්ධ කරන්න එපා කියලා.. මං මේ ඔයාලට උනත් කිව්වෙ මේ සිද්ධිය නිසා."

"දැන් නං අපිටත් තේරෙනවා සාදු මේ පුනර්භවය කතාව ඇත්ත වෙන්න ඇති කියලා.. මගේ නංගි විදියට ඉපදිලා ඉන්නෙ ඇතත්ටම වලව්වෙ ළමාතැනි වෙනන ඇති.. එහෙම නැත්තං මේ සන්ධාර කුළුනෙ කතාව එයා දැනගන්න විදියක් නෑනෙ."

"ඒක ඇත්ත.. හේතුහාමිත් ලියුම් කවරයක් ගෙනත් දුන්න මිසක් ඇතුලෙ තිබ්බ දේ දැනං උන්නෙ නෑ.. ලොකු හාමුදුරුවො උන්දැට කිව්වෙ ඒ ළමාතැනීගෙ අසනීපෙට ලියපු සෙත්කවියක් කියලා.."

දිගු සුසුමක් පිටකල රංග දෙමිතුරන් දෙස බැලුවේ තීරණයක් ගත නොහැකිවය.. ඔහු මුල සිටම මෙම පුනරුත්පත්තිය පිළිගැනීමට මැලි වුවද එය දැන් පිළිගත යුතු තැනට වැඩසිද්ධ වී ඇත..

"පුංචි පුංචි සාධක ගොඩක් තියෙනවා සාදු මේක පිළිගන්න පුළුවන් විදියෙ.. ඒත්.. මට පොඩි ගැටළු වගේකුත් තියෙනවා".

චෛතිය නැගණිය හා වලව්ව සම්බන්ධ සියළු කතා පොඩි සාදුට විස්තර කළේය.. කලන හා රංග වුවද ඒ පිළිබඳව යළි යළිත් සිහිපත් කරමින් උන්හ..

"බුදු දහමෙදි කර්මය කියන දේ විශ්වාස කරනවනේ.. ඉතිං ළමාතැනි ගිය ආත්මෙ ඔය තරම් සැප සම්පත් මධ්‍යයශයේ ඉදලා ඔය තරම් පින් දහම් කරලා ඇයි මේ ආත්මෙ අපේ දුප්පත්ගෙදර ඉපදුනේ..?"

"කර්මට කියන දේ ඇත්ත චෛතිය මල්ලි.. ඒත් මේ ප්‍රමතිසන්ධිය ලැබීම පදනම් වෙලා තියෙන්නෙ කර්මය මත නෙමෙයි.. සසර බැදීම මත.. ළමාතැනීගෙ ජීවිතේ අන්තිම කාලෙ එයාට උදව් උපකාර කළේ ඔයාගෙ අම්මා.. එයා මැරෙන අන්තිම මොහොතෙ ළග හිටියෙ ඔයානෙ.. ඉතිං එයාට වලව්වෙ ඇත්තන්ගෙන් නොලැබුණු ආදරයක් කරුණාවක් ඔයාලගෙ පුංචි ගෙදරින් ලැබුණා.. සමහර විට ඒ බැදීම මත එයා ප්‍රයතිසන්ධිය ලබන්න ඔයාගෙ අම්මගෙ කුසමතොරගන්න ඇති.."

මේවා සීයට සීයක්ම පිළිගම්දෝ නොගම්දෝ යන සැකයෙන් චෛතිය කල්පනාවකට යොමු වූ අතර පොඩි හාමුදුරුවෝ ඔහුගේ දේශනය දිගටම කරගෙන ගියහ..

"මම දන්න තරමට මේ වලව්ව අයිති ඔය ළමාතැනීගෙ දෙමව්පියන්ට.. එයාලා ළමාතැනී බදින වෙලේ එයාගෙ දෑවැද්දට මේක ලියලා දුන්නා.. මේ වලව් වත්ත දාලා යන්නත් ඒ ඇත්ති කැමති නොවෙන්න ඇති.. මිනිස් සිතකට ඉතිං තෘෂ්ණාව කියන දේත් බලපානවනේ".

"අපි ඔය මොන නිගමන වලට එළඹුනත් පොඩි සාදු මේක තාම අපේ උපකල්පනයක් විතරනේ.. අපි මේක ඇත්ත කියලා කොහොමද ඔප්පු කරන්නෙ..? කාටහරි මේ ගැන කිව්වොත් හිතයි අපිටපිස්සු කියලා.."

"ඔව් මමත් මේ වැඩේට ඔයාලට සම්පූර්ණ සහයෝගය දෙන්නම්.. මං ළඟ ඔය පුනරුත්පත්තිය ගැන ලියවුන විශාල පොත්පත් ප්‍රමාණයක් තියෙනවා.. ඒවත් ඔයාලට දෙන්නම් කියවලා බලන්න.. අනික චෛතිය මල්ලි.. ඔයා මේ ගැන අම්මව දැනුවත් කරලා එයාගෙන් තොරතුරු දැනගන්න ඕනෙ.. මං කිව්වෙ නංගි ඔය ගැන කියන්න ගත්තෙ මොන කාලෙ ඉඳලද.. එයා කියපු කරපු දේවල් මොනවද..? එයාගෙ හැසිරීම් මොන වගේද..? වගේ දේවල්.. ඊට අමතරව අපි ඒ දරුවන්ගෙන් එයාට මතක තියන දේවල් එහෙම ප්‍රශ්න කරමු..

උන් වහන්සේ පිරිසට උපදෙස් දෙන්නට විය..

"ප්‍රශ්න කරන්න පුළුවන් සාදු.. ඒත් මට තියෙන බය ඒ ගැන කතා කරන සමහර වෙලාවට එයා අසනීප වෙනවනේ.. හිටපු ගමන් තදේට උණ ගන්නවා.."

චෛතිය කීවේ ඔහු ඒ අත්දැකීමට කිහිප වරක්ම මුහුණ දී ඇති නිසාය..

"ඔව් ඒක වෙන්න පුළුවන්.. කැනඩාවෙ ඉන්න ඉයන් කරී කියන මහාචාර්යවරයා ඔය ගැන ගැඹුරින් ප්‍රශ්න කරලා තියෙනවා.. ඒ මහාචාර්යවරයාගේ පොතකත් ඔය විදියෙ දරුවෙක් ගැන සඳහන් වෙනවා..

ඒ දරුවා තමන්ගෙ ගිය ආත්මෙ ගැන දේවල් හෙළි කරන හැම වෙලේම එයාගෙ අම්මා එයාව නිහඬ කරන්න බැනලා තරවටු කරනවා.. ඒත් ඒකෙන් ඒ ළමයගෙ අතීත මතකය අමතක වෙන්නෙ නෑ.. එයාට ඒ දේවල් මතක් වෙද්දි එයා අසනීප වෙනවා..

මට හිතෙන විදියට ඒ දරුවගෙ යටි සිතට දැනෙන්න ඇති එයා අසනීප වුනොත් මවගේ තරවටුවෙන් පහර දීම් වලින් බේරෙන්න පුළුවන්

කියලා.. ඒ මත මනස ක්රි යාත්මක වෙලා ඔය විදියට උණ ගන්නවා වෙන්නත් බැරි නෑ..”

“මමත් දන්න තරමින් අපේ අම්මා නංගිට ඒ ගැන කතා කරන්න දෙන්නෙ නෑ.. කොහොම හරි ඒ දේවල් යට ගහනවා”.

“අම්මා කෙනෙක්ගෙ පැත්තෙන් ගත්තොත් ඒ දේවල් සාධාරණයිනෙ චෛතිය මල්ලි.. කොයි අම්මද කැමති තමන්ගෙ දරුවා වෙන කෙනෙක්ට අයිතියි කියලා කියනවට..”

පොඩි හාමුදුරුවන් ගුණවතීගේ පැත්ත සාධාරණීකරණය කරන්න උත්සාහ ගනිද්දී මෙතෙක් වේලා නිහඩව මෙම කතාවට කන් දුන් කලන සිය කටහඩ අවදි කළේය..

“ඒත් චෛති කිව්වා නේද ඔයාලගෙ අම්මා පුනරුත්පත්ති විශ්වාස කරන්නෙ නෑ මොකක්ද දිෂ්ටියක් ගැන කිව්වා කියලා”.

ඒ කතාවට පොඩි හාමුදුරුවෝ චෛතිය දෙස බැලුවේ ප්රිශ්නාර්ථය රැදි දෑසිනි..

“පුනරුත්පත්තිය ගැන අවිශ්වාසයක් නෙමෙයි.. මං හිතන්නෙ එයාට ඒ ගැන වැඩිය තේරුම් නෑ.. එයා කියන්නෙ නංගිට ළමාතැනීගෙ දිෂ්ටිය වැහිලා කියලා..”

“පැරණි ගම්බද මිනිස්සු කොහොමත් ඔයවගේ මිත්යා මත වල ඇලිලා ඉන්නවා.. ඒ උනත් පුනරුත්පත්තිය ඒ වගේ බොරුවක් කියලා කාටවත් කියන්න බෑ.. ලෝකෙ ඒ වගේ සිද්ධී දස දහස් ගණනක් වාර්තා වෙලා තියෙනවා.. සමහර විශේෂඥවරු ඒ ගැන ගැඹුරින් පරියේෂණ කරලා පියවරෙන් පියවර ඒවා විස්තර කරලා තියෙනවා”.

නිහඩව උන් රංග උන්වහන්සේගේ මෙම දැනුම ගැන පුදුම වූවා පමණක් නොව තමා මෙතෙක් උනන්දුවක් නොදැක්වූ එම කේෂ්ත්ර ය ගැන අධයවනය කිරීමට පවා ඔහු සිතා ගත්තේය..

"මමත් කියවලා තියෙනවා පොඩි සාදු.. වර්ජීනියා විශ්ව විද්‍යාලයේ මනෝ විද්‍යාත මහාචාර්ය්‍යද ඉයන් ස්ටීවන්සන් ඒ වගේ පරීක්ෂණ ගොඩක් කරලා තියෙනවා නේද.?"

තමාගේ දැණුම උරගා බැලීමට සිතූ කලන ඔහු පොත් වලින් කියවූ යමක් සිහිපත් කළේය..

"හරියට හරි කලන.. එතුමා ඔය විදියෙ වාර්ථා එක් දහස් හත්සීයක් විතර උදාහරණ සහිතව පෙන්නලා දීලා තියෙනවා.. එතුමා කියන විදියට සමහර අයට පෙර භවයේ මතකය තියෙන්නෙ බොහොම ටිකයි.. ඒත් සමහරුන්ගෙ මතකය එයාලගෙ කලින් නම් ගම්.. උන්නු නගරය.. ගෙවල් වල පිහිටීම.. පවුල් වල විස්තර.. වගේ පුළුල් පරාසයක් කරා විහිදෙනවා.."

"අපේ නංගිත් වලව්වෙ අශේන්ගෙ උපන්දිනේ හරියටම මතක තිබුණා.. අනික එයා ළමාතැනීගෙ වගේම ලේස් ගවුම් අදින්න කොණ්ඩෙ රිබන් පටි ගැට ගහන්න හරි ආසයි.."

"ඔන්න ඔය වගේ කරුණු හරි වැදගත් මල්ලි.. ඔයා තව අධ්‍ය නය කරන්න.. එයා කරන කියන දේවල්.."

"එතකොට ඇයි සාදු අපිට අපේ පෙර භවය මතක නැත්තෙ?."

රංග ඇසූ ප්‍රශ්නයට චෛතියගේ හා කලනගේ මුහුණේ සිනාවක් මතුවිය..

"ඔය පෙර භවයේ මතකය රැදිලා තියෙන්නෙ විඥාණයෙ.. ඒත් හැමෝටම ඒ මතකය නෑ.. තිබුණත් සමහරුන්ට වසර කිහිපයකදී අමතක වෙලා යනවා.. තවත් සමහර අයට පෙර භවයේ ජීවත් වෙලා හිටපු තැන් වලට ගියහම විඥානයේ සැගවිලා තියෙන පෙර භවයෙ මතකය අවදි වෙනවා.. අපිට උනත් ජීවිතේ පළවෙනි පාරට යන සමහර තැන් වල හුරුපුරුදු ගතියක්දැනෙන්නෙ ඒ නිසා.."

ඔහුගේ පැනය පොඩි හාමුදුරුවන් අවඥාවෙන් බැහැර කලේ නැත.. උන් වහන්සේ තමන්ට හැකි පමණ එය විග්‍රහ කළේය..

"අපිට එහෙම පෙර භවය මතක නැති උනාට ඕනෙ නම් මෝහනය හරහා ඒ ගැන දැනගන්න පුළුවන්.."

කලන සිය මිතුරාට පෙර භවය දැන ගත හැකි මගක් කියා දුනි..

"මට කොහෙවත් ගියාමවත් ඔය සාදු කිව්වා වගේ මුකුත් මතක් උනේ නැත්තෙ මං ගිය ආත්මෙ ලංකාවෙ හිටියෙ නැති නිසා වෙන්න ඇති"..

වෙනදාටත් පොඩි හාමුදුරුවන් ඉදිරිපිටදී මෙසේ විහිළු කරගන්නා හෙයින් රංග තරමක් බැරෑරුම් ස්වරූපයෙන් කීවේය..

"ඔව් ඔව් උම ගිය ආත්මෙ ඇමරිකාවෙ හරි එංගලන්තෙ හරි තම්බපු සුද්දෙක් වෙලා ඉන්න ඇති.."

චෛතිය පිළිතුරු දුන්නේ සිනාසෙමිනි..

"ඒක විහිළුවකට ගන්න එපා චෛතිය.. පෙර භවය ගැන සඳහන් කරපු දරුවො ගොඩක් දෙනෙක් තමා විදේශයන් වල ජීවත් වුන බව කියලා තියෙනවා.. මොන්ටිසෝරිවත් යන්නෙ නැති සමහර ළමයි ලෝක සිතියමේ තමන් හිටපු රට හරියටම පෙන්නලා දීලා තියෙනවා.. ඒ විතරක් නෙමෙයි.. සමහර පුංචි ළමයි අම්මලා තාත්තලාවත් නොදැන ඉදපු විදේශ භාෂා වලින් කතා කරලා.."

"නෑ.."

රංගගේ මුවින් ඉබේම පිටවුනි.. නමුත් ඒ පිළිබඳව කියවා තිබූ කලන ඒ පිළිබඳව පුදුමයට පත් වූයේ නැත..

"මං මේ ගැන ඔය තරම් දුරට හිතුවෙම නෑ පොඩි සාදු.. ඔය විස්තර මගේ ඔළුවට ඇතුල් කලේ අපේ නතාලි අක්කා.."

“චෛතිය එයා ගැන කිව්වා මට මතකයි.. ඒ ළමයා දැන් විශ්ව විද්‍යාතලයෙලු නේද්”..

“එහෙමයි සාදු.. පේරාදෙණියෙ..”

“ළඟදි ගෙවල් පැත්තෙ ආවොත් නංගිත් එක්කම ඒ ළමයවත් පන්සලට එක්කගෙන එන්න..”

දීර්ඝ සාකච්ඡාවක් නිමා කිරීමට මෙන් කී උන් වහන්සේ යළි ආවාසය දෙසට පිය නැගිය..

“ලොකු හාමුදුරුවො තරහා වෙයිනෙ චෛති.. අපි අර කැවිලි ටිකටත් වැඩේ දීලා යමු..”

රංග හැරුණේ කුස්සිය පැතත්ටය.. ඔවුන් පැමිණි බව ලොකු හාමුදුරුවන්ගෙන් දැන ගත් සියදෝරිස් කැවිලි පෙවිලි මේසය මත සූදානම් කර තැබීය..

“සියදෝරිස් මාමා කරන මේ පින් කොහොම අරන් යන්නද මංදා”..

මේසය මත තබා ඇති කැවුම්.. වැලිතලප.. අලුවා ආදී කැවිලිද ලොකු ආනමාළු ඇවරියද දුටු කළන තමන් දෙසට සිනාසෙමින් එන සියදෝරිස් හට ලෙන්ගතු ලෙස කීවේය..

“පුතාලා ආවෙ ඉතිං කාලෙකින් නොවැ.. ලොකු හාමුදුරුවො කන්න බොන්න දීලා යවන්න කිව්වා..”

පන්සලටම සිය දිවිය කැපකර උන් සියදෝරිස් ගැන මිතුරන්ගේ සිතේ කවදත් වූයේ දැඩි සෙනෙහසකි.. ඔවුන් මතක ඇති දා සිට ඔහුට කට පුරා සියදෝරිස් මාමා යැයි කීවේඑනිසාය..

“සියදෝරිස් මාමේ.. පන්සලට අලුත් හාමුදුරුවරු කවුරු හරි වැඩලද..?”

තමා පොඩි සාදු සමග කතා කරන අතර තුර ආවාස ගේ තුල ඡායාවන් කිහිපයක් දුටු චේතිය ප්රතශ්න කර සිටියේය..

"ලොකු හාමුදුරුවන්ගෙ ගමේ පන්සලෙන් වැඩිය සාමනේර හාමුදුරුවරු දෙනමක් ඉන්නවා. උන්නාන්සේලව බලන්න ඒ ගමේ ඉඳලා ආව ඇත්තෙක් තමයි ඔවා ඇන්න ආවෙ.."

කෑම කා අවසානයේ සියදෝරිස්ගේ ඉගුරු දැමූ කහට කෝප්පයකද රස බැලූ මිතුරන් තිදෙනා නික්ම යාමට සැරසුනි.. ඔවුන් ආවාස ගේ පසුකර යද්දි පොත් කිහිපයක් අත දරා පොඩිහාමුදුරුවෝ බලා උන්හ..

"මං කියපු විදියෙ පොත් කිහිපයක්ම මෙතන තියෙනවා.. මේ ටික මාරු කරගෙන කියවලා බලන්න.. ඔයාලට ඔය ක්ෂේත්රලය ගැන පුළුල් දැනුමක් ලබාගන්න පුළුවන් වෙයි.."

උන්වහන්සේ දුන් පොත් කිහිපය එහා මෙහා පෙරලා බැලූ කලන තමා මින් සමහර පොත් කියමා ඇති බව සිහිපත් විණි..

"ඒ එඩ්ගාර් කේසි ගැන ලියවුනු පොත් පත් මං කියවලා තියෙනවා සාදු.."

"මං හිතුවට වඩා කලන මේ ක්ෂේත්රංය ගැන දැනුවත් වගේ.. ඔයාට එහෙනං පුළුවන් වෙයි ඒ කියපු දේවල් ඇත්තද කියලා චේතියගෙ නංගිගෙන්ම අධ්‍යනය කරන්න.."

එය ඔහුගේ සිතේ මේ වනවිටත් ක්රිියාත්මක වෙමින් පැවතුනි..

පොත් පත් කිහිපය හා සැදෑ අඳුර තරුලු කරගත් මිතුරන් තිදෙනා පන්සල් භූමියේ ගල් තලාව බැසීමට පටන් ගත්හ.
එදින වේලාසනින්ම පාසල් ගිය චේතිය හා කලන පාසල ආරම්භ වනතුරුම සාකච්ඡා කරමින් උන්නේ පොඩි හාමුදුරුවන් දුන් පොත් පත් වල තිබූ කරුණු ගැනය.. ඒ පොත් වලට අමතරව කල ඔහු සතුව තිබූ පොත් කිහිපයක්ද මිතුරන්ට කියවීමට ගෙනත් තිබුණි..

“මාත් ඊයෙ රෑ දෙක විතර වෙනකල් සාදු දීපු පොතක් කියෙව්වා.. ඒවයෙ තියෙන සමහර කතා මාරයි කලන.. ඒවා විශ්වාස කරන්නත් අමාරුයි..”

“ඊයෙ එළිවෙනකල් වමාත් කලේ ඕකම තමයි.. අපේ අම්මගෙ හිතේ විභාගෙ ළග නිසා මං පාඩම් කරනවා කියලා.. එයා මාර සැටිස්ි..

චෛතියට සිනා නැගුණේ තම මවද එසේ සිතූ හන්දාය..

ඔහු සාලයට වී පොත කියවද්දී ගුණවතීද දෙතුන් වරක්ම ඔය පාඩං කලා මැදැයි පුතේ දැන් ගිහින් නිදා ගන්න යැයි කීවාය..

“අපි දෙන්නා නං අමාරුවෙන් හරි නැගිටලා උදේ ආවා.. අරූ පොතක් බදාගෙන තාම නිදිද මංදා..”

රංග එනතුරු කිහිප විටක්ම පංතියේ දොර දෙස බැලූ කලන කීවේය..

“දැං කොහොමද සම්මානි..? කෙල්ල කතා කරනවද..?”

ඔහු නැවත විමසුවේ සම්මානි සමග පළමු දිනයේ වූ දුරකථන ඇමතුම චෛතිය මිතුරන් සමග කියා තිබූ නිසාය..

“රෑට කතා කරන්න බැනෙ බං.. අම්මත් ළග ඉන්නවනෙ.. ඉදලා හිටලා හවස් වරුවෙ කතා කලොත් තමයි ඉතිං..”

“කෙල්ලව ආපහු පංති එවන එකක් නැද්ද දන්නෙ නෑ.. සේනාධීර හිතනවා ඇති ළගදි බන්දලා දෙන්න ඉන්න කෙල්ල නිසා වැඩිය උගන්නන්න හොද නෑ කියලා..”

මැරයන් සම්මානි පසුපස සැරිසරන බව දන්නවා නම් සම්මානිගේ පියා නිසැකවම ඇයව පන්ති නොඑවනු ඇතැයි චෛතියට සිතුනේය..

“කෙල්ල ඕලෙවල් වලදිත් සර්ලා ගෙදරට ගෙන්නලලු ඉගැන්නුවෙ.. ඒ ලෙවල් වලටත් එහෙම කරන්න හදද්දි සම්මානිගෙ උවමනාවට

තමයි මේ පංතියට එවලා තියෙන්නෙ.. ඒකත් ඉතිං වැන්එකේ නැගලා පංතියට. ආයෙ පංතියෙන් ගෙදරට.."

චෛතිය සම්මානි පසුගිය දිනවල කියූ කරුණත් යළි සිහිපත් කලේ ඇ පිළිබඳ උපන් වේදනාවෙනි..

"මහ මිනිස්සු හිතනවා ඇති කන්න බොන්න දීලා යාන වාහන වල යැව්වම හැමදේම හරි කියලා.. ඔය කෙල්ල සමහර විට හිරකාරියක් වගේ ඇති චෛති.."

"ඔය ටිකම සම්මානි මගෙත් එක්ක කිව්වා.. තාත්තා බිස්නස්ම විතරයිලු.. අම්මට රැස්වීම් සමිති සමාගම් ඉවරයක් නැල්ලු.. කෙල්ල හැදෙන්නෙ අර සර්වන්ට්ලාඑක්ක.."

"ඒකිගෙ අම්මත් සුපර් ලක්සර් ලයිෆ් එකක්නෙ ගෙවන්නෙ.. මං දවසක් තාත්තා එක්ක ටවුමට ගිය වෙලේ ටොයොටා ප්‍රිනමියො එකක් ගියා දූවිලි පිඹගෙන.. තාත්තා කිව්වෙ ඒ ගියේ සේනාධීර නෝනා කියලා.."

"මමත් දැකලා තියෙනවා.. මෙරූන් කලර් කා එකක් නේද?.."

කලන එයට හිස සැලුවේ එහි සුපිරි බව දෙනෙතින් පෙන්වමිනි..

"තාත්තා ප්‍රාඩෝ එකේ.. අම්මා කා එකේ.. දුව ඩ්‍රයිවර් එක්ක වැන් එකේ.."

"අපි නං සුපුරුදු විදියට බස් එකේ.."

චෛතියගේ වාක්‍ය අවසන් කලේ කලනය.. එයට චෛතියගේ මුවේ සිනාවක් ඇඳුණි..

*****************************

එදින දහවල් පාසල ඇරෙන වේලාවට රංගලාගේ වැන් රිය පාසල් ගේට්ටුව ඉදිරිපිට නවතා තිබෙනු චෛතිය දුටුවේය.. රංග පාසල්

පැමිණෙන දිනවල්වලදී ඔහුව රැගෙන යාමට නොඑන   වැන් රිය අද පැමිණියේ මන්දැයි සිතමින් කලනත් චෛතියත් එයට ළං විය..

"ආ.. මං මේ මල්ලිලා දෙන්නව හම්බවෙන්නම තමයි ආවෙ.. නංගින්නකො.."

"ඇයි සේන අයියෙ අද රංගයා ආවෙ නැත්තෙ.?"

"ඒක කියන්න තමයි මට මල්ලිලා දෙන්නව එහෙ එක්කගෙන එන්න කිව්වෙ.."

හරස් ප්‍රශ්න නැසූ දෙමිතුරන් වැන් රියට නැගුණේ දහසකුත් දේ සිහිපත් කරමිනි.. නමුත් රංගගේ නිවසට එනතුරුම ඔවුනට රියදුරුගෙන් කිසිදු තොරතුරක් ලබා ගැනීමටහැකි වූයේ නැත..

"මල්ලිලා ගෙට යන්න.. යාළුවා ඇතුළෙ ඉන්නවා.."

රංගලාගේ  මිදුලේ නැවැත්තූ රථයෙන් චෛතියලාටත් පෙර බැස ගත්තේ රියදුරුය.. ඔහු ඉක්මනින්අඩි තබා නිවස පසුපසට යනු චෛතිය හා කලන බලා උන්නේ පුදුමයෙනි..

"මෙතන මොකක් හරි හොරයක් තියෙනවා බං.. සේන අයියා වෙනදට ඔහොම නෑ.. ෆිට් එකේ කතා කරනවනේ.. අද මූ නිකං ලබු කිරිබත් කාපු නරියා වගේ.."

ඔවුන්  දෙදෙනාගේ සිතේ ඇතිව තිබුණේ කුතුහලයකි.. එහෙත් කල හැකි කිසිවක් නොවූ මිතුරන්  දෙදෙන රියෙන් බැස නිවසට පිවිසියේ කෙලින්ම රංගගේ කාමරයට යාමේ අටියෙනි..

"පුතාලා.. ඔහොම පොඩ්ඩක් ඉන්නවද.?"

සාලයේ කොණකින් ඇසුණු ඒ ගැඹුරු කටහඬට ඔවුන් ඉද්ද ගැසුවාක් මෙන් නතර විණි..

"ආ.. අන්කල්නෙ මේ.."

සෙට්යේ ඉද උන් රංගගේ පියා දුටු කලන කීවේ මදක් චකිතයෙනි.. ඔහුගේ සිතට කුමක්දෝ වෙනසක් දැනෙමින් තිබුණේය..

"ඊයෙ හවස මොකද උනේ.? ඔයාලත් එතන හිටියනේ.?"

"අන්කල් මොනවා ගැනද මේ අහන්නෙ.?"

එය චෛතිය සිතාමතා ඇසූවක් නොව ඔහුට ඉබේටම ඇසුණි.. කලනද ගල් ගැසී බලා උන්නේය..

"ඔයාල දෙන්නත් ඊයෙ පන්සලට ගියා නේද.. ? ඒ සිද්ධිය වෙද්දි ඔයාලා එතන හිටියෙ නැද්ද.?"

ඔහු මේ අසන්නේ කුමක් ගැනදෝ වටහා ගත නොහුණු කලන ප්‍ර ශ්ණාර්ථ රැදි දෑසින් චෛතිය දෙස බැලුවේය..

"අපි පන්සලට ගියා තමයි.. ඒත් ඔය කියන සිද්ධියක් ගැන අපි දන්නෙ නෑ.."

චෛතිය සෘජුව පිළිතුරු දුන්නෙය.. රංගගේ පියා නිහඬවම ඉස ඉහල පහල හෙළුවේ ඊට පිළිතුරු ලෙසිනි..

"සමාවෙන්න පුතා.. මං මේ ඔයාලා ගැන සැකේකින් ඇහුවා නෙමයි.. රංග කාමරේ ඇති..ගිහින් බලන්න."

ඒ ඇසුණු අඩියට දෙකට ඔවුන් රංගගේ කාමරයට දිව ගියහ.. ඇදෙහි දිගා වී උන් රංගව දුටු ඔවුනට තම දෑස් අදහාගත නොහැකි විණි.. ඔහු උන්නේ තුවාල ලබාය..

ඔහුගේ එක් කකුලක දණහිසක් අනිත් කකුලේ වළලුකරත් එක් වැලමිටකුත් හිසත් සුදු බැන්ඩේජ් වලින් ඔතා තිබුණි.. ඇතැම් තුවාල වල ලේ පැල්ලම් බැන්ඩේජ් වලින් උඩට මතු වී ඇත.. මුහුණද තැනින් තැන ඉදිමිලාය..

“රංග.. මොකද මචං උනේ.?”

චෛතිය රංගගේ ඇඳේ පසෙකින් ඉඳගත්තේ මෙය අදහා ගත නොහැකිවය.. මිතුරන් දෙදෙන දෙස බැලූ රංග සන්සුන් වන ලෙස ඔවුනට ඉඟි කළේය..

“කියපං.. අරුන් ටිකද උඹට ගේම දුන්නෙ.?”

සිදුව ඇත්තේ කුමක්දැයි අනුමාන කල චෛතිය නැවත වරක් ඇසුවේය.. රංග එයට හිස සැලුවේ බොහෝ අමාරුවෙනි..

“උඹ ඉස්කෝලෙ ආවෙ නැතුවට අපි හිතුවෙ නෑ බං මෙහෙම දෙයක්.. කොහෙදිද මේක උනේ.?”

කලන විමසුවේ චෛතිය වලව් වත්තට හැරුණු පසු ඔහු රංග සමග හන්දියටම පයින් ආ හන්දාය..

“උඹ ගියාට පස්සෙ මං අපේ ගෙවල් පාරට හැරුණා විතරයි.. කළු ග්ලාස් දාපු වෑන් එකකින් කට්ටියක් ඇවිත් මාව ඇදලා දා ගත්තා.. ඊට පස්සෙ කෙලින්ම ගියේ පහල වෙලපැත්තට..”

කතාව මොහොතකට අතර මග නතර කල රංග හති ඇරියේය..

“එවලෙ කළුවරත් වැටිලනේ.. මාව බිමට ඇදලා ගත්තු සෙට් එක එකසිය ගානට නෙලුවා බං.. පාරෙ මිනිස්සු කට්ටියක් එනවා දැක්කා විතරයි උන් වෑන් එකට නැගලා ඉගිලිලාගියා..”

මිතුරාට මෙම ඉරණම අත්වූයේ තමා නිසා බව දැන උන් චෛතියගේ සිත බොහෝ නොසන්සුන් වී තිබිණි..

“ඊට පස්සෙ උඹ කොහොමද ගෙදර ආවෙ.?”

කලන විමසිය..

"මං ළඟ ෆෝන් එක තිබුණනෙ.. ඒකෙන් සේනට කෝල් එකක් දීලා කිව්වා වෑන් එක අරන් වෙල ළඟට එන්න කියලා.."

"සේන අයියද උඹව බෙහෙත් දාන්න එක්කගෙන ගියේ..?"

"ඔව්.. අපි ගෙදර ආවෙ මගින්ම බෙහෙත් දාගෙන.. ගෙදර ආවා විතරයි අම්මයි තාත්තයි කුලප්පු වෙලා.. මෙතන එක ගෝරියයි.. එයාලගෙ/ හිතේ මේක වෙද්දි උඹලත් හිටියා කියලා.. එහෙම නැත්තං මං වගේම උඹලත් ගුටි කාලා කියලා.."

"ඉතිං..?"

මිතුරාට එක දිගටම කතා කිරීමට අසීරු බව දැනුනද සිද්ධිය දැන ගැනීමේ කුතුහලය නිසාම කලන ඔහුව උනන්දු කළේය..

"අපේ තාත්තා රූම වාහනේ අරගෙන උඹලගෙ ගෙවල් වලට එන්නයි ලෑස්තිය.. මං බොහොම අමාරුවෙන් ෂේප් කරලා අද උඹලව ගෙන්නනන්නම් කිව්වා.."

"උඹ කවුරු ගැහුවා කියලද ගෙදරට කිව්වෙ..?"

"අශේනයගෙ බත් බැලයො ගැහුවා කියලා මට කියන්න තිබ්බා බං.. ඒත් එහෙම උනා නම් සම්මානිවයි, උඹවයි මේ කතාවට ගෑවෙනවා.. ඒ නිසා මං කිව්වෙ කවුරු ගැහුවද.. මොකට ගැහුවද දන්නෙ නෑ කියලා.."

තීක්ෂණ ඥාණයක් ඇති රංගගේ පියා එය විශ්වාස නොකිරීම පුදුමයක් නොවේ යැයි චේතියට සිතුණි..

"ඉතිං යකෝ උඹට තිබුණෙ නැද්ද අපි දෙන්නගෙන් කාට හරි කෝල් කරලා කියන්න.."

ගහෙන් වැටුණු මිනිසාට ගොනා ඇන්නා සේ කලන ඔහුට බැන වැදුනේය.. නමුත් ඒ තරහකින් නම් නොවේ..

“කොහේ කෝල් කරන්නද බං.. ගෙදරට ආවා විතරයි තාත්තා ෆෝන් එක රාජ සන්තක කරා.. අනික ඩොක්ටර් ඉන්ජෙක්ෂන් එකක් දීලා මම ගෙදර ආවා විතරයි නින්ද ගියා.. ආපහු අහැරුනේ මහ රෑ.. එවලේ ඉදලා තාම නිදි නෑ බං.. මුළු ඇගම රිදෙනවා.”

රංග අසීරුවෙන් පවසද්දී චේතියගේ මුළු ඇගම වෙව්ළුම් කෑවේය.. අශේන්ගේ මිතුරන් ගැන ඔහුගේ සිතේ ඇති වූයේ අසීමිත තරහකි..

“ඒක නෙමෙයි චේති සීන් එක කියන්නෙ.. උන් මට ගහලා වෑන් එකට නගිද්දි කියපු දේ උඹ දන්නවද.?”

රංග කීවේ කටහඩ තරමක් බාල කරය..

“උන් කිව්වා උඹ සතියක් විතර ඇදට වෙලා හිටපං උඹගෙ අනිත් දෙන්නව මං හෙට ඉස්කෝලෙදි අල්ලගන්නම් කියලා.”

“උන්ට ගැහුවෙ උඹලා දෙන්නා නෙමෙයි මමනේ.. උන් මොකටද ඒකෙ රිටන් එක උඹලගෙන් ගන්නෙ.. මාත් ඒක්ක ෆේස් ටු ෆේස් හැප්පෙන්න එන්න එපැයි..”

චේතිය ඉහ වහා ගිය තරහකින් කියා දැම්මේය..

“ඒවා මං දන්නෙ නෑ.. කොහොමටත් උන්ගෙ ටාගට් එක උඹ විතරක් නෙමෙයි.. අපි දෙන්නටත් එක්කනෙ එදත් ගේම සෙට් කරලා තිබුණෙ..”

අශේන්ගේ උපන්දිනය දා සිදුවීම කලන නැවතත් සිහිපත් කළාය..

“ඊයෙ මට වෙච්ච දේ අද උඹලට වෙන්න තිබ්බා.. ඒයි මං මුකුත්ම නොකියා සේනව එව්වෙ ඉස්කෝලෙ ළඟට.. උඹලා ඌ එක්කම ගෙදර පලයල්ලා.. තනියම යන්න එපා..”

චේතියගේ පළිය තමාගෙන් ගෙන තිබුණද අහිතක් නොසිතූ රංග තව දුරටත් මිතුරන්ව ප්‍රවේශම් කිරීමේ වගකීම කරට ගෙන උන්නේය..

“හරි.. උන් තුන්දෙනාව ආපහු මීට් වෙයිනෙ.. බලමුකො.. උන් මගේ යාළුවොන්ගෙනුත් පළි ගන්නවනං මං අශේන්ගෙනුත් පලි ගන්නවා”.

චේතිය සපථ කර කීවේය..

“මට තියෙන ලොකුම අවුල අපේ තාත්තව ෂේප් කරගන්න එක බං.. එයා හෙන අප්සට් එකේ ඉන්නෙ.”

තම එකම දරුවාට මෙවන් කරදරයක් වූ කල කලබල නොවන පියෙක් නැත.. රංගගේ පියාටද ඒ කැළඹීම නොඅඩුව දැනෙනු ඇතැයි කලනට සිතුණි..

“මූ මෙහෙම ඉද්දි අපට මේක ලේසියෙන් අතාරිනන්න බෑ තමයි චේති.. ඒත් මං උඹට කියන්නෙ උඹ මේකට ඩිරෙක්ට් මැදිහත් වෙන්න එපා.. මේ ප්ර ශ්නෙ එක කොනක සම්මානිත්නවා.. කෙල්ල ගැන ලීක් වුණොත් අවුල් ගොඩයි.. අන්තිමට ඒකිටත් ගෙදර ඉන්න නැති වෙනවා.. ලොකුම ප්ර.ශ්නෙ තියෙන්නෙ අනිත් පැත්තෙ.. මේක අනිත් කොණේ ඉන්නෙ අශේන්..”

“ඉතිං..”

කලන කුමක් කියන්නට අර අදින්නේදැයි නොදැනුන චේතිය විමසුවේය..

“අමතක කරන්න එපා උඹලගෙ අම්මා වැඩ කරන්නෙ ගල් කන්ද වලව්වෙ කියලා.. මේක දුර දිග ගියොත් උඹලගෙ අම්මට විතරක් නෙමෙයි මේ ප්ර.ශ්නෙ වෙන්නෙ.. උඹලට උන් හිටි තැනුත් අහිමි වෙනවා..”

කලනගේ කතාව අනුමත කරන්නට මෙන් රංගද හිස සැලුවේය..

“මමත් ඕක රෑ එළිවෙනකල්ම හිතුවා බං.. සම්මානියි උඹලගෙ ගෙදරයි ගැන හිතලා තමයි මමත් මේක අතාරින්න තීරණය කළේ”.

රංග කී දෑ අදහා ගත නොහැකිව මෙන් චෛතිය ඔහු දෙස බැලුවේ පුදුමයෙනි..

"අතාරින්න.. මෙච්චර දෙයක් වෙලත්.. උඹලා අතෑරියට මං නමං මේක ලේසියෙන් අතාරින්නෑ.."

ඔහු තරහින් කීවේය..

"අතාරින්න ඕනෙ කියලා මමත් කියන්නෑ.. ඒත් බං අපි ගේම දෙන්න ඕනෙ මොලෙන්.. මොකද අපි හිරවෙන තැන් වැඩියි.. අශේන්ලට තියෙන පිරිස් බලය කොහොමද කියලා මං අමුතුවෙන් කියලා දෙන්න ඕන නෑනෙ.. දැක්කනේ එදා ඇවිත් හිටිය තදයො ටික.."

අනුන්ගේ දේකට ගුටි කෑ තම සගයා නිසා මෙය අතහැර දැමීමට නොහැක.. එසේම ආවේගයෙන් කටයුතු කරන චෛතියව තවත් ප්‍රශ්නවල පැටලීමටයද නොහැක.. එහෙයින් කලන රංගගේ හා චෛතියගේ අන්ත දෙක සමබර කරමින් උන්නේය..

"මං තාත්තට කියලා ෂෙප් එකේ ෆෝන් එක ඉල්ල ගන්නං.. උඹලා දැන් ගෙදර පලයල්ලා.. අපි රෑ වෙලා කතා කරමු.."

රංග හැකි ඉක්මනින් ඔවුන්ව පිටත් කිරීමට උත්සාහ කරලේ කළුවර වැටෙන තුරු සිටියොත් ඔවුන්ගේ ජීවිතද අනතුරේ බව වැටහුණු නිසාය..

"උඹ ඕන වෙලාවක කතා කරපං.. අපි හෙටත් ඉස්කෝලෙ ඇරිලා මෙහෙ එන්නම්.."

කලන කීවේ රංගගේ පිටට තට්ටුවක් දමමිනි..

"උඹලා දෙන්නා තනියම මෙහෙ එන්න එපා.."

"නෑ.. නෑ.. අපි රත්නෙ අයියා එක්ක එන්නම්කො.."

රංගගේ සිත ඇස්වැසීම පිණිස චේතිය ත්‍රීද රෝද රථ සගයාව සිහිපත් කළේය..

"ගෙදර ගිහින් කෝල් කරපං මචං.."

ඔවුන් දොරෙන් නොපෙනී යන මොහොතේත් රංග කියා සිටියේය.. එයට හිස් සැලූ මිතුරන් දෙදෙන කතාබහකින් තොරව නිවසින් පිටතට පැමිණියහ..

"මල්ලිලා නගින්න.. මං ගිහින් දාන්නම්.."

ඔවුන් දුටු සැනින් රියදුරු රථය පණ ගන්වා ගත්තේය..

"සේන අයියත් මාර මනුස්සයෙක් තමයි.. එක්කං එන්න කලින් අපිට සීන් එක කියන්න තිබුණනේ.."

රථය පාරට පිවිසි සැනින් කලන ඔහුට බැන වැදුනේ තරහිනි..

"කොහෙ කියන්නද මල්ලි.. ලොකු මහත්තයා මට තර්ජනේ කලා මොනවත් කියන්නෙ නැතුව එක්කගෙන එන්න කියලා.. එහෙම කියලා තිබුණොත් මාව රස්සාවෙනුත් අස් කරනවා කිව්වා.."

ගැමි තරුණයකු වූ සේන එය කී ආකාරයටම චේතියට සිනා නැගුණි.. නමුදු රංග කියා ඇති ආකාරයට සේන යනු එතරම් නෝන්ජලයෙකු නොවේ..

"ඒ කියන්නෙ සේන අයියා ජොබ් එක බේරගන්න ඕනවට අපිට කොලේ වැහුවා.."

"එහෙම කියන්න එපා මල්ලි.. මං මේ ප්‍රේශ්නෙදි ඉන්නෙ ලොකු මහත්තයගෙ පැත්තෙ නෙමෙයි.. රංග මල්ලිගෙ පැත්තෙ.. එයා තමයි කිව්වෙ මල්ලිලා කලින් සිද්ධිය දැන ගත්තොත් ලොකු මහත්තයට මොනවා කියයිද දන්නෙ නැති නිසා මුකුත්ම නොකියා එක්ක එන්න කියලා.. ඒකයි මං එහෙම කලේ.."

ඔහු මිතුරන් දෙදෙනාට කීවේ විශ්වාසවන්ත අයුරිනි..

"මල්ලිලා දන්නෙ නෑ ඊයෙ වෙල ළඟ රංග මල්ලි වැටිලා හිටපු හැටි.. නැගිට ගන්න බැරුව.. ලේ පෙරාගෙන.. මට දැක්කම හෝස් ගාලා ගියා.. හොඳ වෙලාවට ෆෝන් එකට මුකුත් වෙලා තිබුණෙ නෑ.. නැත්තං එතන ලේ ගිහිල්ලම මැරෙනවා.."

මෙම විස්තරය චෛතියට අසා සිටීමට නොහැකි තරම් විය.. ඒ බව වැටහුණු කලන ඔහුව සන්සුන් කිරීමට උත්සාහ දැරුවේය..

"ඒ මදිවට බෙහෙත් දාපු ඩොක්ටර් කිව්වා මෙයාව ඉස්පිරිතාලෙට අරන් යන්න කියලා. කොහෙද, මෙයා බෑම කියලා කිව්වනේ.."

එම සිදුවීම සවිස්තරව පවසන අතරතුර සේන ඔවුන් දෙදෙනාව ප්‍රසවේශමෙන් නිවෙස් වලටම ඇරලූහ.
රංග පහරදුන් සිද්ධියෙන් පසු දින දෙක තුනක් යන තුරුම චෛතිය උන්නේ නොයිවසිල්ලෙනි.. ඔහු දිවා රෑ කල්පනා කලේ සම්මානිව නොගැවෙන සේ ඔවුනට පාඩමක් උගන්වන ආකාරයයි.. ඔහුගේ මුරණ්ඩු සිත කීවේම මෙම ප්‍රශ්ණය මුහුණට මුහුණවිසඳාගත යුතු බව වුවද කලන කීවා සේ එවිට මෙය දුරදිග යා හැකි බව ඔහුසිතුණේය..

"මොනවද පුතේ මේ අහස පොළව ගැටගහන්න වගේ කල්පනා කරන්නෙ..? ආයෙ මට හොරෙන් වලව්ව පැත්තෙවත් ගියාද?.."

මිදුලේ පොල් කොටයට බර දී ඈත බලා උන් චෛතිය වෙත පැමිණි ගුණවතී ඇසුවාය..

"මං වලව්වට ගියේ මට දැනගන්න ඕන දේවල් වගයක් තියෙනවා කියලා හිතුන හින්දා මිසක් ආසාවට නෙමෙයි.."

"මොනවද පුතේ උඹට ඔය හැටි දැනගන්න තියෙන්නෙ.. ? අනික එහෙම දෙයක් තියෙනවා නම් උඹට පුළුවන් නොවෑ හාමු මහත්තයා මුණගැහිලා කතා කරන්ඩ.."

"හොරාගෙ අම්මගෙන් ජේන ඇහුවට වැඩක් තියෙද අපෙ අම්මා.. උන් ඕවා යට ගහනවා මිසක් එළි කරන්නෙ නෑ.."

චෛතිය කීවේ තරහිනි..

"මොනවා දැනගන්නද මගෙ පුතේ උඹ ඔය හැටි හාර අවුස්සන්නෙ.? උඹට මොනවද දැනගන්න ඕනෙ.?"

මෑතක සිට තම පුතු සොයන්නේ මොනවාදැයි නොදැන උන් ගුණවතී එසේ විමසුවේය..

"හොයන්න හරියටම අහවල් දේ කියලා කියන්න මට තේරෙන්නෙ නෑ.. ඒත් අපේ පවුලට සම්බන්ධ මොකක් හරි රහසක් ඔය වලව්ව ඇතුලෙ හැංගිලා තියෙනවා කියලා මට ඉවෙන් වගේ තේරෙනවා.."

ඒ කතාවට ගුණවතී මොන තරම් තිගැස්සුනේද යත් ඇගේ මුහුණ සුදුමැලි විණි..

"කවුද පුතාගෙ ඔළුවට ඔය මනස්ගාත ඇතුල් කලේ.. ? නතාලි දුවවත්ද..?"

"නතාලි අක්කා මේකට ගාවගන්න එපා අම්මා.. එයා මේ කිසි දෙයක් දන්නෙ නෑ.. එයා අපිට උදව් කරන්නෙ චූටිගෙ ප්‍රශ්නෙට විතරයි.."

"ඕවා අවුස්සන්න ගිහින් උඹට තාත්තට උන දේම වෙයිද මංදා.."

මවගේ කතාවට චෛතියගේ සිතේ ඇතිවූයේ කුතුහලයකි.. තාත්තාට උන දේ ලෙස ඈ හැදින්වූයේ කුමක්දැයි ඔහුට වැටහුණේ නැත..

"තාත්තට මොනවද උනේ අම්මෙ.. ? එයා නැතිවුණේ වැවේ ගිලිලා නේද..?"

"වැවේ ගිලිලා නේන්නං.. කොහොම හරි ඒ මනුස්සයා නැති උනානේ.. මට බය තියෙන්නෙ උඹවත් මට නැතිවෙයි කියලා.."

"මං එච්චර ඉක්මනට අම්මව දාලා යන්නෙ නෑ අම්මෙ.. මං කවද හරි මැරෙන්නෙ ඔයාව මේ පැලෙන් මාළිගාවකට අරන් ගියාට පස්සෙ.."

මව තමා හා නැගණිය වෙනුවෙන් විදින දුක් කන්දරාව ඉවසිය නොහැකි වූ චෛතිය එවන් අදහසක් ඇති කරගත්තේ මීට අවුරුදු ගණනාවකට පෙරය.. කුඩා කල සිට ඔහු තමාට හැකි අයුරින් කීයක් හෝ උපයා ගැනීමට උත්සාහ කලේ එයට අධිතාලමක් වශයෙනි.. නමුත් මෑතක වූ සිදුවීම් නිසා එම කටයුත්තද ඔහුගෙන් මග හැරී ගියේය..

"උඹ මේ නාකි මං ගැන නොබැලුවට කමක් නෑ පුතේ.. පුළුවන් නං අර අහිංසකී ගැන හිතපං.. මං නැති කාලෙක ඒකිට අසරණ වෙන්න දෙන්න එපා.."

"රටේ ලෝකෙ මිනිස්සු මොන දේ කිව්වත් අම්මා හිතනවද මං නංගිව අතාරියි කියලා.. මට එයාගෙ ජාතකෙන් ඇති වැඩක් නෑ.. එයයි මමයි දෙන්නම එක බඩවැල කඩාගෙන ආපු අය.."

චෛති ඒ එල්ල කලේ ඇනුම්පද නොවුනද ගුණවතීගේ සිත තරමක් පෑරුණි.. චෛතිය සෘජුව නොඇසුවාට ඔහුගේ සිතේ මිහිරාවිගේ පියා පිළිබඳ වූයේ ගැටළුවකි.. එය කිසි දිනෙක තුරන් නොවන වග ඒ කතාවෙන් ඈ වටහා ගත්තේය..

"වෙලාව ආවම මං හැමදේම කියන්නං පුතේ.. උඹේ අම්මා නරක ගෑණියෙක් නෙමෙයි.. මාව විශ්වාස කරපං.."

මවගේ දෑසින් කඳුළු වැල් දෙකක් ගලා යනු දුටු චෛතිය ඈ ළඟට ගොස් ඒ කඳුළු තම දෑතින් පිස දැමීය..

"මං කවදාවත් අම්මා ගැන එහෙම හිතන්නෙ නෑ.. අපි දැන් ඔය කතාව නවත්තමු.."

ඔහුගේ ලෙංගතු හැසිරීමට ගුණවතීගේ කඳුලු අලුත් වූවා මිස නතර වූයේ නම් නැත..

"අම්මට ඉස්සරහට වැඩ වැඩි වෙයි නේද.. ? අම්මගෙ පුංචි හාමු බදින්නනේ යන්නෙ.."

මවගේ සිත වෙනතකට හැරවීමට මෙන්ම අශේන්ගේ විවාහ යෝජනාව ගැන මවගේ අදහස් දැනගැනීමටට අවැසි වූ නිසා චෛතිය විමසිය..

"ඒ දැරිවිට පුංචි හාමු පැහෙයිද මංදා.."

"ඇයි අම්මා එහෙම කියන්නෙ.?"

"අපේ හාමුලා වලව්කාරයො උනාට ඔය සේනාධීර මහත්තයා සල්ලි අතින් ගත්තම ඊට එහා.. උන්දලගෙ සල්ලි භාගෙ එක්ක බලද්දි ඇතුගල හාමුටයි කියලා මොනවද තියෙන්නෙ.."

තමා මෙතෙක් නොදැන උන් ඉසව්වක් කරා කතාව ගලා යන බව වැටහුණු චෛතිය මව දිරිමත් කළේය..

"ඇයි අම්මෙ.. ඇතුගල හාමුට මේ තියෙන වලව්වයි, වත්තයිම මැදෑ.. තව ඒවා මොකටද..?"

"ඇතුගල හාමුට කොයින්ද ළමයො වලව්වක්.. ? උන්දලා වලව්කාරයො තමා.. ඒත් මේ ගල්කන්ද වලව්ව අයිති ළමාතැනීට.. මේක ඒ ඇත්තිගෙ දෙමව්පියො දෑවැද්දට ලියලා දීපුඑකක්ලු.."

ගුණවතී ඒ කීවේ එකල ඇගේ සැමියා වූ ධර්මතිලපක ඇ සමග කී කතාවකි..

"එතකොට හාමුලා බදින්න කලින් මේ වලව්වෙ හිටියෙ කවුද.. ? මං හිතාන හිටියෙ මේක ඇතුගල හාමුගෙයි කියලා.."

ගමේ ඇත්තන්ගෙන් දැනගෙන උන් කතාබහ චෛතිය සිහිපත් කලේ මව ඊට පරස්පර කතාවක් කියන නිසාවෙනි..

"අන්තිම  කාලෙ හිටියෙනං ඇතුගල හාමුලා තමාලු.. ඒත් අයිතිය තිබිලා තියෙන්නෙ ළමාතැනීලගෙ පරම්පරාවට.. ඒ උදවියයි ඇතුගල හාමුගෙ දෙමච්පියොයි හරි හිතවත්ලු.. දෙගොල්ලොම වලව්කාරයොනෙ ඉතිං.. කොහොමහරි ළමාතැනීට බාල තව එක සහෝදරයෙක් ඉදලා තියෙනවා.. ඒ දරුවා පුංචි කාලෙ ඉදලා අසනීපෙන්ලු හිටියෙ.. එයාව හොද කරන්න පුළුවන් පිටරට ගෙනිච්චොත් විතරයි කියලා දොස්තර මහත්වරු කිව්වලු.."

චෛතිය පුදුමයෙන් තම මව දෙස බලා සිටියදී ගුණවතී මොහොතකට කතාව නවතා හති ඇරියාය..

"ඒ ඇත්තන්ට සල්ලි වලින් අග හිගයක් තිබිලා නැති නිසා දොස්තර මහත්වරු කියපු වෙලාවෙම උන්දැලා ඒකට කැමති වෙලා.. ඒත් එහෙම ගියාම මේ වලව්ව පාළුවට යන එක තමයි මුහන්දිරම් හාමුදුරුවන්ට තිබිලා තියෙන ප්ර ශ්නෙ.."

තම මව මුහන්දිරම් හාමු ලෙස හැදින්වූයේ ළමාතැනීගේ පියා වන්නට ඇතැයි චෛතියට සිතුනි.. නමුත් ඔහු ඒ පිළිබදව මවගෙන් ප්රරශ්න කලේ නැත..

"ඔය කාලෙ මුහන්දිරම් හාමුදුරුවන්ගෙ හොදම හිතවතා උන ඇතුගල හාමුගෙ අප්පොච්චා ඉදලාතියෙන්නෙත් ප්ර්ශ්න වගේක පැටලිලා.. ඒක ඒ උන්දැලගෙ නුවර වලව්වෙ මොකක්ද දේපල සම්බන්ධ ප්රනශ්නයක්ලු.. මට හරියට නිච්චි නෑ.."

"ඉතිං..?"

"අන්තිමට මුහන්දිරම් හාමුදුරුවො කිව්වලු ඒ ප්රේශ්නෙ නිරාකරණය වෙනකල් මෙහෙ ඇවිත් නවතින්න කියලා.. ඊට පස්සෙ මුහන්දිරම් හාමුදුරුවොයි ලොකු මැණිකෙයි අර අසනීප දරුවයි මේ වලව්ව ඇතුගල හාමුලට බාරදීලා රට ගිහින්.."

"එතකොට ළමාතැනී..?"

චේතියට ගැටළුවක් නැගිණි..

"ළමාතැනි හොඳ ලොකු බාලිකාවක නැවතිලාලු ඉගෙනගෙන තියෙන්නෙ.. ඒ ඇත්ති අප්පොච්චිලා එක්ක ගිහින් නෑ.. අනික ඒ කාලෙ ඇතුගල හාමුත් ගජ ඉලන්දාරියලු.. ඉදලා හිටලා ඉස්කෝලෙ නිවාඩුවට ගෙදර ආපු ළමාතැනී දැකලා ඇතුගල හාමුට හිත ගිහින්.. ඒත් උඹලගෙ තාත්තානං කිච්චෙ ඇතුගල හාමුගෙ දෙමච්පියො මේ මාලිගාවට වහ වැටුණාකියලයි.."

මව මේ භූමියට පැමිණෙන්නට පෙර මෙහි වූ දේ දැන ගත්තේ කෙසේදැයි පසුව විමසීමට උන් චේතියට ඊට පිළිතුරු නිරායාසයෙන්ම ලැබුණි.. තම මවට මේවා කියන්නට ඇත්තේ තම පියා බව ඔහු වටහා ගත්තේය..

"කොහොමින් කොහොම හරි ළමාතැනීගෙ මල්ලිට බෙහෙත් කරන්න ඒ උදවියට අවුරුදු කීපයක්ම රට ඉන්න උනාලු.. ඒ කාලෙ තමයි ඇතුගල හාමුගෙ ලොකු උන්දලා මෙහෙ පාලනය අතට අරන් තියෙන්නෙ.. උන්දැලා එක්ක ඉන්න බැරිකමට තමයි උඹලගෙ තාත්තා අපේ වලව්වට සේන්දුඋනේ.."

"කියන්නකො අම්මා ඉතිං.."

"ළමාතැනීගෙ විභාගෙ ඉවර වෙන කාලෙ වෙද්දි රට හිටපු ඒ ඇත්තිගෙ මල්ලි අන්තරා වෙලා.. ඊටපස්සෙ මුහන්දිරම් හාමුදුරුවොයි ලොකු මැණිකෙයි මෙහෙ ඇවිත් එහෙම ඉද්දි ඇතුගල හාමුගෙ දෙමාපියො කියලා ඇතුගල හාමුයි ළමාතැනියි අතරෙ දුරදිග ගිය සම්බන්ධකමක් තියෙනවා.. ඒ නිසා මේ මංගල්ලෙ කරලා දාමු කියලා.."

"ඉතිං ඒක ඇත්තක්ලුද අම්මා.?"

"ඒක බොරුවක්ලු.. ළමාතැනීගෙ හිතේ ඇතුගල හාමු ගැන එහෙම අදහසක් තිබිලා නෑ.. අනික හාමු ඒ කාලෙ ඉදලම සල්ලාලයෙක්ලු.."

ඒ කියන්නෙ ඔහු දැනටත් එසේදැයි අසන්නට සිතුණ චේතිය එය නතර කර ගත්තේ කතාව දිගටම ඇසිය යුතු නිසාය..

"ළමාතැනී  ඒ කාලෙ දෙව්දූවක් වගේලු.. ඒ වගේම ඒ ඇත්ති දෙමාපියන්ට හරිම කීකරුලු..   මල්ලිත් මැරිලා හිත් කලකිරීමෙන් ඉන්න දෙමාපියන්ට තවත් බරක් වෙන්න බැරි නිසා   ඒ ඇත්ති අන්තිමේදි මේ මගුලට කැමැත්ත දීලාලු.."

ගුණවතී තම සැමියගෙන් පමණක් නොව හේතුහාමිගෙන්ද දැනගත් කරුණු එකතු කර කතාව කියාගෙන ගියේය..

"ඒත්  ළමාතැනීගෙ අම්මට.. ඒ කිච්චෙ ලොකු මැණිකෙට දැනිලා තියෙනවා ඇතුගල හාමුගෙ මහ ජෝඩුව හරි කපටියි කියලා.. ඒ නිසා එයා කිව්වලු දුවගෙ දැවැද්දට මේ ගල් කන්ද  වලව්ව ලියලා දෙනවා.. හැබැයි දෙන්නට වලව්වෙ තනියෙන් ජීවත් වෙන්න දෙන්න ඕනෙ කියලා.."

"එයාලා ඒකට කැමති වෙලාද.?"

"කැමැත්තක්  තිබුනද නං දන්නෙ නෑ.. ඒත් මංගල්ලෙන් පස්සෙ එයාලා ආපහු නුවර වලව්වට ගිහින්.. මුහන්දිරම් හාමුදුරුවොයි ලොකු මැණිකෙයි දෙන්නා ආපහු රට ගිහින්..බැදපු අලුත ළමාතැනී උඹලගෙ තාත්තට පණිවිඩයක් එවලා තිබුනා ආපහු එන්න කියලා.. ඊට පස්සෙ තමයි උන්දැ අපේ වලව්වෙන් පිටවෙලා ආවෙ.."

"ඒ ආවෙ අම්මවත් එක්කගෙනද.?"

මනමාල හිනාවක් මුවේ රදවා ගත් චේතිය මවගෙන් ඇසුවේය..

"ඒ සංධියෙ මං ඉගෙන ගන්නවා.. මං උඹේ තාත්තා එක්ක ආවෙ ඊට අවුරුදු කීපයකට පස්සෙ.. "

ඒ විස්තර තම පුතු සමග පසු දිනෙක කීමට සිතා ගුණවතී නිහඬ වූවාය..

"එතකොට අම්මා හේතුහාමි.. එයා ළමාතැනීලගෙ කෙනෙක්ද..  ? ඇතුගල හාමුලගෙ කෙනෙක්ද.?"

"හේතුහාමි අයියයි උඹේ තාත්තයි තමයිලු මුහන්දිරම් හාමුදුරුවන්ට හිටිය විශ්වාසවන්තම සේවකයො.. උන්නාන්සෙ රට යද්දි ඇතුගල හාමුලගෙ ඇත්තන්ට කිව්වලු මොනම හේතුවකටවත් හේතු හාමි අයියව වලව්වෙන් පිටමං කරන්න එපා කියලා.. අනික ළමාතැනී හේතුහාමි අයියට හරිම හිතවත්ලු.."

එසේනම් හේතුහාමි ඇතුගල හාමුට මෙතරම් බය ඇයිදැයි චේතියට වටහාගත නොහැකි විය.. එක් පසෙකින් බලන කල දැන් මෙහි ඇතුගල හාමුට ඉහලින් යා හැකි කෙනෙක් නැති නිසා එසේ වන්නට ඇතැයි ඔහුට සිතුණි..

"අර සේනාධීර මහත්තයගෙ දෝණියැන්දෑ පුංචි හාමුව කර කාර බැදගත්තොත් ඒ දැරිවිට වෙන්නෙ ළමාතැනීට වෙච්ච සංහදියෙ අනිත් එක.."

සිය අත්ල නිකට මත තබාගත් ගුණවතී කීවේ හීල්ලුමක් සමගිනි..

"ඇයි අම්මා එහෙම කියන්නෙ.?"

"නෑ ඉතිං.. ඒ දැරිවිත් ළමාතැනී වගේම ඉටිරූපයක් උනාට පුංචි හාමුගෙ දහං ගැට වලට ඔළුව නමාන ඉන්න වෙයි.."

"අම්මා කැමති නැද්ද සේනාධීර මහත්තයගෙ දුවට?"

චේතිය සියුම් පරික්ෂාවක් කර බැලුවේය..

"ඒ දැරිවිට අකමැති වෙන්නෙ අහවල් එකටයැ.. පුදුම සිරියාවන්ත දරුවෙක්නෙ.. ඉන්න තැනක කිරි උතුරනවා.."

චේතියට තම මවගෙන් ලැබුණේ සිතා උන්නාටත් වඩා හොද ප්‍රතිචාරයකි.. ඔහුට සතුටක් දැනුණි..

"ඒ වගේ කෙනෙක් කවද හරි අම්මගෙ ලේලි උනොත්?."

ගුණවතී පළමුව තම පුතු දෙස විමතියෙන් බලා දෙවනුව දුක්බර සිනාවක් පෑවාය..

"මං කැමති උනාට මොකෝ.. මං එච්චර පිං කරලා නෑ.. අනික.. හද තියෙන්නෙ අහසෙ මගෙ පුතේ.. බිම ඉන්න අපිට ඒක අල්ලන්න බෑ.."

තමාත් අශේන් මෙන් අහසෙ උන්නා නම් හද ඇල්ලීමට එතරම් අමාරු නොවන බව චේතියට සිතුණි..

"කොහොමටත් මේ අගු පිලක ඉසගෙන අපට හද අල්ලන්න බෑ තමයි අම්මා.. මං අම්මව අහසට අරන් ගිහින් ඊට පස්සෙ හද අල්ලලා දෙන්නම්.."

ඔහු එය කීවේ කටට ආවාටම නොවේ.. නමුත් ගුණවතීට සිතුණේ පුතු තමා සමග විහිළු කරනා බවකි..

"එතකොට අම්මා ගල්කන්ද වලව්වෙ දැන් අයිතිය තියෙන්නෙ කාටද..? "

සම්මානි ගැන සිතීම මොහොතකට අමතක කල චේතිය ඔහුට ඇසීමට අමතක වූ කරුණක් මවගෙන් විමසා සිටියේය..

"ඇතුගල හාමුට වෙන්ටැති මයෙ හිතේ.. මං ඔය නීති රෙගුලාසි ගැන නං දන්නෙ නෑ.. ඒත්.. ළමාතැනී ඕක පුංචි හාමුගෙ නමට ලියලද දන්නෙ නෑ.."

ඇ කීවේ කිසි දිනෙක ළමාතැනී කියූ කරුණක් නොව තම සිතට නැගුණු දෙයකි.. එය ඇසූ චේතිය මදකට සැලී ගියේය..

තම නැගණිය පෙර භවයේ ළමාතැනී යැයි කියන උපකල්පනය නිවැරදි නම්.. ඇයට ඒ සිදුවීම මතක නම්.. තමාට ඇයගෙන් තොරතුරු

ලබාගත හැකි වෙයැයි චේතියට සිහිපත් උනි.. නමුත් දැන්ම ඉක්මන් නොවිය යුතු යන හැඟීම ඔහුගේ සිතට නැගුණි..

"ඇතුගල හාමුගෙ කට්ටිය වගේ සේනාධීර මහත්තයලා ඇහැ දාන්නෙත් වලව්වටද දන්නෙ නෑ නේද අම්මා..? නැත්තං ඉතිං ඒ ළමයට කසාද බඳින්න තරං වයසක් නැතුව ඇතිනෙ.."

චේතිය සම්මානි පිළිබඳ විස්තර තමා දන්නා බව ඇඟවීමට එතරම් හදිසි වූයේ නැත.. කොටින්ම ඔහුගේ නම පවා භාවිතා කළේ නැත..

"ඒ උදවියට ඔය වගේ වලව් දහයක් ගන්න සල්ලි බාගෙ ඇති.. ඕවා ගැන මොකටද පුතේ අපි ඔය හැටි නැහෙන්නෙ..? උන්දලාට කැමති විදියට වැඩ කරගත්තාවෙ.. අපේ මොකෝ.."

මව පොල් කොටය ළඟින් මෑත් වූයේ නැගණිය ගෙන ඒමට පාසලට යාමට බව වැටහුණ චේතිය ප්රශ්න සියල්ල එතෙකින් නතර කර ගත්තේය.. නමුත් ඒ කතාව තුළ ඔහුට සිතීමට කරුණු නම් කිසිදු අඩුවක් වූයේ නැත.
නිතර දුරකථනයෙන් අමතා සුවදුක් විමසන නතාලි අක්කාට රංගගේ සිදුවීම් චේතිය දැනුම් දුන්නේය.. ඒ ඇසුණු ඇ ඔහුට අවධාරණයෙන් කියා සිටියේ එම ගැටළුව සෘජුව මැදිහත් වී ප්රශ්න ඇතිකර නොගන්නා ලෙසය..

"එහෙම කියලා පැත්තකට වෙන්න බෑනෙ අක්කා.. ඌ ගුටිකෑවෙ මං නිසා.."

"උන් ඔයාගෙ පලිය අම්මගෙන් නංගිගෙන් එහෙම ගත්තොත් මොකද වෙන්නෙ..? ඒ නිසා මං කියන්නෙ කරන දෙයක් පරිස්සමින්.."

ඇය විස්තර කරද්දී කලන කීවේත් ඔය ටිකම නොවේදැයි චේතියට සිහිපත් විය..

"උන් තාම ගේම අතෑරලා නෑ.. දැන් කලනගෙයි මගෙයි පස්සෙ පන්නනවා.. ඊළඟ පාර උන් ඉස්සර වෙන්න කලින් අපි ඉස්සර වෙන්න ඕනෙ අක්කා.."

"අඩුව තියෙද්දි අත පුච්චගන්න ඕනෙ නෑනෙ.. මල්ලි අපි වෙන විදියක් බලමු.. මං විශ්ව අයියටත් කියන්නම්කො.."

ඇ කියූ අඩුව කුමකත්දැයි ඔහුට වටහා ගත හැකි වූයේ නැත.. කෙසේ වෙතත් ඈ එය කීවේ යම් සැලැස්මක් සිතේ තබාගෙන බවනම් ඔහුට වැටහිණි..

"දැන් කොහොමද චූටිගෙ වැඩේ.?"

"ඒ ගැන නම් අලුත් තොරතුරු මුකුත් නෑ.. අපි පන්සලේ හාමුදුරුවො එක්ක ඔය ගැන කතා කලා.. හාමුදුරුවො කිව්වා අක්කවයි චූටිවයි පන්සල පැත්තෙ එක්කගෙන එන්නකියලා.."

"ඒක හොයන එක කල් යවන්න එපා මල්ලි.. මම ළඟදිම දවසක එන්නම්.. අපි පන්සලට යමු.."

"අක්කා අපේ ගෙවල් පැත්තෙ එන්නෙ නැද්ද ළඟදි?"

"පන්සලට එනවනං මං ඔය පැත්තෙ නැවිත් ඉන්නවද ළමයො.. කොහොමටත් මං හිස් අතින් එන්නෙ නෑ.. ඔයාලට ලොකු තෑග්ගක් අරගෙනයි එන්නෙ.."

"ඒ කිව්වෙ..?"

ඔහුට ඇගේ කතාව වැටහුණේ නැත..

"හෝව්.. හොව්.. ඒක සප්‍රයිස් එකක්.. දැන්ම අහන්න එපා.."

"අයියා... නකාලි අක්කද.? මට කතා කරන්න දෙන්නකො.."

තම සුරතල් නැගණිය පසුපසින් විත් මුහුණට එබෙන තුරුම චේතියට ඇයව දුටුවේ නැත.. ඇගේ කැරලි කොණ්ඩය අතින් අවුල් කර ඔහු ඇයව තම උකුලට ගෙන නතාලි සමග කතා කිරීමට ඉඩ සලසා දුන්නේය..

එදින වෙනදාට කලින් පාසල් එන්නයි කලන දුන් දුරකථන ඇමතුමට අනුව චේතිය පැයකට පමණ පෙර පාසලට ළගා විය.. ඔහු යන විටත් පැමිණ උන් කලන ඉදිරියට ආවේ සිනා කටක් මුවරදවාගෙනය..

"ගුඩ් මෝනිං චේති.. උඹ අද නං වෙලාවටම ආවා.."

කලන උන්නේ වෙනදාටත් වඩා සතුටිනි..

"හරි.. හරි.. දැන් කියපං මොකක්ද කියන්න තියෙන්නෙ කියලා.."

"මේකයි.. මං උඹෙන් රත්නෙ අයියගෙ නම්බර් එක ඉල්ල ගත්තට පස්සෙ මිනිහට කෝල් කරා.. ඌ හොයාගෙන තියෙනවා අශේනගෙ ගැන්සිය යන එන තැන්.. ඒ ගැන්සිය හැමදාම හවස හය හත අතරෙ ටවුන් එකේ ලයන් ක්ලබ් එකට එනවලු.. ඒත් අශේනයා හැමදාම සෙට් වෙන්නෙ නැලු.."

කලන රත්නෙගෙන් දැනගත් තොරතුරු චේතිය හමුවේ දිග හැරියේය..

"එහෙනම් අපි අශේන් ඉන්න දවසක උන් ටිකට ගේම දෙමු.."

චේතිය ගත් කටටම කීවේය.. කලනද හිස ඉහල පහල වැනුවේ එය අනුමත කරන නියාවෙනි..

"ඒක තමයි මමත් හිතුවෙ.. අපි බොරුවක් කරලා උන් ටිකව කොහෙට හරි ගෙන්නමු.. ඊට පස්සෙ බැරියෑ රංගයගෙ වාඩුව ගන්න.."

"ඔව් මචං.. මට අපේ නතාලි අක්කා විශ්ව අයියගෙ නම්බර් එක දුන්නා ඕන උනොත් උදව්වක් ගන්න කියලා.. ඕනම උනොත් අපි මිනිහවත් සෙට් කරගමු.."

චෛතිය එය කීවේ සිතේ දහසකුත් දේ සැලසුම් කරමිනි..

"මිනිහා කැම්පස් කිව්වා නේද..? නියමයි.. කොහොමටත් චෛති දැන් රංගයත් නැති නිසා උඹටයි මටයි විතරක් මේ ගේම දෙන්න අමාරුයි.. අපිට විශ්ව අයියගෙත් උදව් ඕනවෙයි.."

"අපි මෙහෙම කරමු.. අශේනයා පණිවිඩයක් එව්ව විදියට උන් ටිකව ක්ලබ් එකෙන් එළියට ගමු.. ඒත්.. උන්ට වාහනයක් තියෙනවද දන්නෙ නෑ නේද..?"

කීමට ගිය දේ ගිලගත් චෛතිය හරස් ප්රතශ්නයක් නැගුවේ හොද හැටි සැලසුම් නොකර යමක් කීමෙන් තමන් අමාරුවේ වැටෙන බව දැන උන් නිසාය..

"උන් තුන්දෙනා එන්නෙ බයික් දෙකකින්ලු.. දවස් ගානක් උන් හන්දිය පැත්තෙ කැරකිලා කලර්ස් වගයක් දාලා තියෙනවා.. අනික උන් මේ කුරුණෑගල පැත්තෙ නෙමෙයිලු.."

"අ ශේනයා යන්නෙත් උන් එක්කමද?."

"අශේන් ආවෙත් එන්නෙ ටිකක් පරක්කු වෙලාලු.. මොකද කරන්නෙ.. අපි අද හෙටම ගේමට බහිමුද..?"

"හිටි තමා.. මං විශ්ව අයියටත් කෝල් කරලා බලලා පුළුවන්නම් මිනිහවත් සෙට් කරගෙනම උඹලගෙ ගෙවල් පැත්තෙ එන්නම්.. උඹ පුළුවන්නම් රත්නෙ අයියව ගෙන්න ගන්න බලපං.. හැබැයි මචං.. දැන්ම මේක රංගයගෙ කණට යවන්න එපා.."

දැඩි විශ්වාසයකින් මිතුරාට පහක් දැමූ චෛතිය කීවේ ඇසක්ද ඉගි කරමිනි..

ඔවුන් සැලසුම් කරගත්තා සේම විශ්ව අයියාවත් මෙම වැඩේට හවුල් කරගැනීමට චෛතිය ඔහුට දුරකථන ඇමතුමක් දුන්නේය..

"රායිට් මල්ලි.. මට නතාලි මුළු ස්ටෝරියම කිව්වා.. මට කොහෙටද එන්න ඕන කියන්න.."

"අයියට අද හවසට වැඩක් තියෙනවද.?"

"වැඩක් තිබුනත් නැතත් මස්සිනා වෙනුවෙන් ඒක කැන්සල් කරන එක මහ දෙයක් නෙමෙයිනෙ.. මල්ලි මට තැනයි වෙලාවයි කියන්න.."

ඔහු නතාලි අක්කාටම ගැලපෙන අයෙක් යැයි එම කතාවෙන් චේතියට වැටහුණි..

"හතරට විතර අපේ ටවුන් එකේ බස් ස්ටෑන්ඩ් එක ළඟට එන්න පුළුවන්ද අයියෙ..? මං ඒ වෙලාවට ඇවිත් ඉන්නම්.."

"ඕකේ.. මං ඇවිත් ඔයාට රින්ග් කට් එකක් දෙන්නම්.."

ඔහුගේ ඇමතුමෙන් පසුව චේතිය කාලය ගෙවා දැමුවේ ඉතාමත් අසීරුවෙනි.. සවස හතර වන තුරුපමා නොවූ ඔහු අවසානයේ තරමක් වේලාසන නිවසින් පිට වුණේය..

ඔහු බස් නැවතුමට පැමිණ පැය කාලක් පමණ ගතවද්දී විශ්ව පැමිණ සිටියේය.. මීට පෙර දින දෙකක් පමණ නුවරදී නතාලි අක්කා සමඟ මුණගැසී ඇති බැවින් චේතියට ඔහුව හඳුනා ගැනීමට අපහසු වූයේ නැත.. මොහොතක් සුහද කතා බහක නිරත වූ පසු චේතිය විශ්වට සිද්ධිය නැවත මුල සිට විස්තර කළේය..

"නගින්න මල්ලි.. අපි ඉතුරු ටික ගිහින් කතා කරමු.. අපි කොහෙටද යන්න ඕන..?"

ඔහු පැමිණි මෝටර් බයිසිකලයට චේතිය නංවා ගත්තේය..

"මේ ළඟට අයියෙ.. මං පාර පෙන්නන්නම්.. යමුකො.."

නගරයේ සිට කලනලාගේ නිවසට වූ දුර බයිසිකලයෙන් ගෙවා දැමීමට විනාඩි දහයක්වත් ගත වූයේ නැත..

"යමු අයියෙ.. මේ මගේ යාළුවෙක්ගෙ ගෙයක්.."

"මේ ගුටි කාපු යාළුවගෙ ගේ නෙමෙයි නේද..?"

විශ්ව ඇසුවේ සිනාසෙමිනි..

"නෑ.. නෑ.. ගුටි කෑවෙ වෙන කෙනෙක්.."

ඔවුන් බයිසිකලයෙන් බසින විටම කලන විත් ඔවුන් පිළිගත්තේය..

"මේ තමයි අයියෙ මගේ යාළුවා කලන.. මචං මේ විශ්ව අයියා.. දන්නවනේ.."

"අපෝ හොදට දන්නවා.. මේ අර නතාලි අක්කගෙ ඇම කාපු අයියා නේද..?"

"හරියට හරි මල්ලි.. දැන් ඒ ඇම ගලවගන්න බැරුව ඉන්නෙ.. උඹලා නං ඔය කෙල්ලන්ගෙ ඇම කන්න එපා.."

ටික වෙලාවක් යනතුරු සුහදව කතාබහක නිරත ඔවුන් තේ පානයෙන් පසුව ප්ලාස්ටික් පුටු තුනක් රැගෙන මිදුලේ අඹ ගස යටට ගියහ..

"අයියා අපේ මේ විස්තරේ දන්නවා ඇතිනේ.. අපි දැන් කොහොමද මේක ඉවරයක් කරන්නෙ..?"

කෙතරම් සුහද ලෙස කතා කලද විශ්ව වැඩිහිටියෙකු නිසා කලන මුල් තැන දුන්නේය..

"මල්ලිලා කැමතිනං මට පුළුවන් ඔයාලා දෙන්නා මැදිහත් කරගන්නෙ නැතුව මේක ඉවරයක් කරලා දාන්න.. ඔයාලා මොකද කියන්නෙ?."

"එහෙම හරියන්නෑ අයියා.. උන් අපේ යාළුවට කරපු දේට මට මගේ අතින්ම උන්ට රිටන් එක දෙන්න ඕන.."

චෛතිය කීවේ ඉක්මනින්ය.. කොහොමටත් රංගගේ තුවාල සිහිවන වාරයක් වාරයක් පාසා ඔහුගේ පපුව වෙව්ලුම් කෑවේය..

"උන් ඔයාලා තුන්දෙනාගෙම අතපය කඩන්න ලෑස්ති උනාලු නේද අරශේන්ගෙ උපන්දිනේ දවසෙ.. හරි.. අපි එහෙනං මෙහෙම කරමු.."

විශ්ව තම පුටුව මිතුරන් දෙදෙනා ළගට ඇදගන්නා ගමන් හඩ බාල කර කීවේය..

"අපි හෙට රෑට ගේමට බහිමු.. අපේ කැම්පස් එකේ කොල්ලො සෙට් එකකුත් මං අරන් එන්නම්.. ඔයාලා කියපු විදියට අශේන් එක එන ෂුවර් නෑනෙ.. අපි ඒ නිසා දෙවිදියටම ලෑස්ති වෙමු.. උන් හය හතර අතරෙ ක්ලබ් එකට එනවනං අශේන් ආවත් එනවා ඇත්තෙ ඊට පහුවෙලානෙ.."

එය අනුමත කරන්නට මෙන් කලන හිස සැලුවේය..

"අශේන් එනවද බලන්න අපි ඔය වලව්වෙ ගේට්ටුව හරියෙයි තව මග කොතනක හරියි කොල්ලො දෙන්නෙක් දාමු.. මගේ යාළුවෙක්ගෙ වෑන් එකක් තියෙනවා.. ඒකෙ මං කට්ටිය දාගෙන එන්නම්.. තව දෙනේනෙක්ව ඔය කියන ක්ලබ් එක ඉස්සරහ තියමු.. අනික් සෙට් එක.. මං කිව්වෙ අපි ටික ඔය දෙක අතර මැද තැනක සෙට් වෙමු.. මේ ඔයාලා ත්‍රී විල් එකකකෙනෙක් ගැන කිව්වා නේද..? එයා අද එන්නෙ නැද්ද..?"

විශ්ව ඇසුවේ කලන දෙස බලාය..

"එයාව දැන් උනත් ගෙන්නගන්න පුළුවං අයියෙ.. මං මේ ටිකක් පරක්කු කලේ අපි ප්ලෑන් එකක් හදා ගන්නකල්.."

කලන එසේ කීවාට විශ්ව පැමිණ ඇත්තේ සම්පූර්ණයෙන්ම සැලැස්ම සිතේ ඇදගෙන බව චෛතියට වැටහුණි..

"හරි.. අපි එයාව පස්සෙ ගෙන්නමු.. හැබැයි.. මල්ලිලාට මිනිහව ෂුවර් නේද..? මං කිව්වෙ මේ පාවා දෙන්නෙ නෑ කියලා.?"

"නෑ අයියෙ.. මිනිහා බොක්කෙන්ම සපොට් එක.. මේ ළඟදි එයාලගෙ පාර්ක් එකේ මුස්ලිම් කොල්ලෙකුටත් උන් ටික ලොකු සද්දයක් දාලා.. දැන් පාර්ක් එකේ කට්ටියත් උන්ටගේම දෙන්නලු බලන් ඉන්නෙ.."

කලනටත් පෙර චෛතිය විස්තර කළේ ඔහු දැන් විශ්ව මුණ ගැසීමට එන අතර ත්‍රීවීල් පාර්ක් එකටද ගොඩ වැදුණ නිසාය..

"එහෙනං වැඩේ අපිට ලේසියි.. ඔය වගේ ගැන්සියක් මේ ටවුන් එකෙන් එළවලා දාන එකම සමාජ සත්කාරයක් කියලා හිතලා අපි මේක කරමු.. කොහොමටත් මල්ලි අපි ගේමට බහින්න ඕන කළුවර වැටුනට පස්සෙ.. මෙන්න මේකයි මගේ ප්ලෑන් එක.."

මිතුරන් දෙදෙනා දෙසට කඳ බර කරගත් ඔහු එය කීමට පෙර කලනගේ නිවස දෙසද හොඳ හැටි බැලුවාය.. එහි අරුත වටහා ගත් කලන ඔහුව දිරිමත් කළේය..

"අවුලක් නෑ අයියෙ.. අම්මා විතරයි ගෙදර ඉන්නෙ.."

"මෙහෙමයි මල්ල.. මං අර කලින් කිව්ව විදියට අපි කට්ටිය තුන හතරකට බෙදිලා ඒ ඒ තැන්වල ඉන්න ඕනෙ.. ඔය ක්ලබ් එක ළඟ ඉන්න දෙන්නා උන්ගෙ බයිසිකල් දෙකෙන් එකක හුළං යවන්න ඕනෙ.. එතකොට.. අපි හිතමු අශේන් එනවා කියලා.. මිනිහා වලව්වෙන් පිටත් උන ගමන්ම එතන දෙන්නා අපිට ඔත්තුව දෙනවා.. මගදි අශේන් ගැන බලාගන්න මං කට්ටිය සෙට් කරලයි තියෙන්නෙ.. ඒ ගැන බයවෙන්න එපා.."

කලන චෛතිය දෙස බැලුවේ විමතියෙනි.. එය නොතැකූ විශ්ව එය දිගටම පැහැදිලි කරන්නට විය..

"මෙහෙන් අශේන්ට වැඩේ දෙන අතරෙ ඔයාලගෙ වීල් අයියා ගිහින් ක්ලබ් එකේ තුන්දෙනාව එළියට ගන්න ඕනෙ.."

"ඒ කොහොමද..?"

චෛතිය හරස් ප්‍රදශ්නයක් නැගුවේය..

"එගෙන්ස් එකට ගියොත් වැඩේ කරගන්න අමාරුයි.. ඒ නිසා එයා අශේන් එච්ච කෙනෙක් විදියට එතනට යන්න ඕනෙ.. ගිහින් කියන්න ඕනෙ අශේන්ට පොඩි කරදරයක් වෙලා.. ඒ නිසා ඔය තුන්දෙනාව ඉක්මනට එක්කගෙන එන්න කිව්වා කියලා.."

"උන් ත්‍රීවිල් පාක් එකත් එක්ක ඇටෑක් නිසා අවුලක් නැතුව ඒයිද..

කලනට තරමක් සැක සිතුනේ වැඩේ ගැස්සුනොත් රත්නේ අයියාටද රංගට සිදුවූ ආනිසංසයමඅත්වේ යැයි සිතුණු නිසාය..

"ඒක තමා පොඩි අවුලකට තියෙන්නෙ.. මල්ලිලා දැන් කියනකල් මං දන්නෙ නැනෙ උන් ත්‍රීමවිල්ර්ක් එකත් එක්ක කේස් එකක් දාගෙන කියලා.. ඒකයි මං එහෙම ප්ලෑන් කලේ.."

"ලොකු අවුලක් වෙන එකක් නෑ අයියා.. කොහොමත් ඔය වෙද්දි උන් ටිකක් වෙරි වෙලානෙ ඉන්නෙ.."

"අපි දැනට එහෙම හිතමු.. බැරි උනොත් එවෙලෙට වෙන විදියක් බලමු.. දැන් උන්ට ඔය රත්නෙ ගිහින් පණිවිඩේ කිව්වට පස්සෙ උන් බයිසිකල් වල එන්න වර යි කරයිරත්නෙට මුලින් හදිස්සි කරන්න එපා කියන්න.. අනික උන් වලව්වට කෝල් කලත් අශේන් වලව්වෙ නෑ.. මිනිහගෙ මොබයිල් එකට ගත්තත් එවලෙ අශේන්ට ආන්සර් කරන්න වෙන්නෙ නෑ.."

තම මිතුරන් ලවා ඒ මොහොතේ අශේන් දුරකථනයට පිළිතුරු දීම වැලැක්වියට යුතු බව විශ්ව තරයේ සිතා ගත්තේය.. කලන හා චෛතිය නම් පුදුමයෙන් අසා උන්නේ විශ්වගේ මෙම සැලැස්ම ඔවුනට අදහාගත නොහැකි වූ නිසාය..

"බයිසිකල් දෙකේම හුලං ඇරියොත් උං දන්නවා ඒක උගුලක් කියලා.. ඒ නිසා හුළං අරින්න ඕන එක බයිසිකලේක විතරයි.. දෙන්නෙක් ආපු එකේ හුළං අරිනවා නං වැඩිය හොදයි.. ඊට පස්සෙ

වෙලාවෙ හැටියට උන්ට වීල් එකට නගින්න වෙනවා.. නැත්තං වෙන විකල්පයක් නැනෙ..ඒකයි මං කිව්වෙ රත්නෙට වර්ඩ් එක දාන්න එපා කියන්න කියලා.. උන් වර්ඩ්එක දානකල් ඉන්න කියන්න.."

"එකෙක් හරි දෙන්නෙක් හරි බයික් එකේ එන්නම් කිව්වොත්?."

චෛතිය නැවත විමසුවේය..

"එහෙම වෙන එකක් නෑ.. අනික එහෙම උනත් ප්රශ්නයකුත් නෑ.. තුන්දෙනාම අන්තිමට එන්නෙ එකම තැනටනෙ.. මල්ලිලා මේ හරියෙ හොඳ ප්ලේස් එකක් කියන්න වැඩේට.. හරිද.. උන්ට කියන්න තියෙන්නෙ දැන් අශේන් මෙතනට වෑන් එකකින් එනවා කියලා විතරයි.. කොහොමත් අපේ වෑන් එක ඔය කියන පරක්කුවට එතනට එනවා.. මොකද උන් සෙට් එක ක්ලබ් එක ළඟින් පිට උන ගමන් එතන අපේ ඔත්තු බලන දෙන්නා.. මං කිව්වෙ බයිසිකලේ හුළං අරින දෙන්නා.. එයාලා අපිට මැසේජ් එක දෙනවා.."

"ෂුහ්... මාරයිනෙ විශ්ව අයියෙ.."

චෛතිය විශ්වගේ දෑතින්ම අල්ලා ගත්තේය..

"එහෙම තමයි මස්සිනා.. මේවා ඉන්ජිනේරු මොල.. අනික වැඩේ අනාගන්නෙ නෑ කියලා ෂුවර් එකක් තියාගන්නත් පුළුවන් මේකට සෙට් වෙන්නෙ කැම්පස් කොල්ලො නිසා.."

"නතාලි අක්කට දෙයියන්ගෙම පිහිටයි.."

කලන කීවේ දෑත් එකතු කර වදින ඉරියව්වක් මවා පාමිනි.. ඊට විශ්වගේ මුහුණේ හිනාවක් ඇඳී ගියේය..

"අනිත් ස්ටෙප් එක කෙරෙන්නෙ උඹලට ඕන විදියට මල්ලි.. අපි පාළු තැනකට කළුවර වැටිලා තියෙද්දි උඹලට හතුරො ටික ගෙනැල්ලා දෙනවා.. උඹලට තියෙන්නෙ හිතේ හැටියටඋන්ගෙන් වාඩුව ගන්න.."

දිගු සාකච්ඡාවක් නිමා කල විශ්ව පුටුවේ පසුපසට හේත්තු වී සැප පහසුවට හිද ගත්තේය..

"දැන් කවුද අශේන්ට ගේම දෙන්න මගදි සෙට් වෙන්නෙ?."

චෛතිය විශ්වගේ කතාවේදී සිත තබාගෙන උන් කරුණක් යළි විමසිය..

"ඒ ගැන ඔයාලා වොරි වෙන්න එපා මල්ලිලා.. ඒකට අශේන් එක්ක සාධාරණ තරහක් තියෙන පිරිසක් සැදී පැහැදී ඉන්නවා.."

"ඒ කවුද..?"

"ඔයාලා නොදන්නවා උනාට ඔය අශේනයා නුවර පේරාදෙණිය පැත්තෙත් ටිකක් ෆේමස්.. මිනිහගෙ තාත්තගෙ මහ ගෙවල් තියෙන්නෙ එහෙනෙ.. උෟ නිතරම ආච්චිලා සීයලා බලලා යන්න නුවර පැත්තෙ එනවා.."

එය බොරුවක් විය නොහැකි බව චෛතියට වැටහුණේ පෙර දිනක තම මව ඇතුගල වලච්ච ගැන කී කතාව නිසාය.. ඔහු එය කලනට හා රංගටද කියා තිබිණි..

"අකශේන්අපේ කැම්පස් එකේ ෆස්ට් ඉයර් ගර්ල් කෙනෙක් එක්ක යාළුයි.. ඒ කෙල්ල මිනිහට රැවටිලා ඉන්නෙ.. අනික උෟ වලච්චාකරයෙක් කියලා දැනගත්තම අපේ මෝඩ කෙල්ලො නිකම්ම අහුවෙනවනෙ.. ඒ කෙල්ලගෙ අයියා පේරාදෙණියෙම අපේ බැජ් එකේ එකෙක්.. උෟ අශේන් ගැන ටිකක් දන්නවා.. මං කිව්වා අශේන් ළගදි අපේ සේනාධීර ගෲප් එකේ දුවව බදින්න යනවා කියලා.. උෟ දැන් අශේන්ව මරන්න තරම් කේන්තියෙන් ඉන්නෙ.."

විශ්ව හෙළි කලේ චෛතියලා මෙතෙන් නොදැන උන් කතාවකි..

"අයියත් මාරයිනෙ.. කොහෙන්ද මේවා හොයාගත්තෙ?."

කලන පුදුම වී විමසිය..

"මට  නතාලි විස්තරේ කියද්දි මං ටිකක් හොයලා බැලුවා.. කොහොමටත් අපේ එකා උගේ නංගිගෙ පලහිලව්ව නිසා ගල් කන්ද වලව්ව ගැන කියව කියව හිටියෙ.. මං මේ වැඩේ ගැන කිව්වා විතරයි ඌ අශේනයට ගේම දෙන්න සැදී පැහැදී ඉන්නෙ.."

"හැබැයි මට නතාලි අක්කා නම් කිව්වා ප්‍රශ්න ඇතිකරගන්නෙ නැතුව අයියත් එක්ක කතා කරලා මේක විසදගන්න කියලා.."

චෛතිය කියද්දී විශ්ව අමුතු ආකාරයට සිනාවක් නැගිය..

"ඒ ගැන නං කියලා වැඩක් නෑ.. මටත් කිව්වෙ ඔය ටිකම තමා.. ඔය කෙල්ලො කියන විදියට බටර් ගාලා ප්‍ර ශ්න විසදගන්න බෑ මල්ලි.. උන්ට ඕවා තේරෙන්නෙ නෑ.. කොහොමටත් අපි මෙහෙම දෙයක් ප්ලෑන් කරා කියලා නතාලිට දැනගන්න තියන්න එපා.. අපේ ගෑණි මගේ ඔළුව කයි.."

විශ්ව කියද්දී කලන බොහෝ ආශාවෙන් ඔහුගේ හැසිරීම් දෙස බලා සිටියේය.. ඔහුට මේ අපූරු පුද්ගලයා ගැන දැඩි පැහැදීමක් දැනුනේය..

"එහෙනං අයියෙ අපි අර ත්‍රීවීල් එකේ රත්නෙ අයියට කෝල් කරලා එන්න කියන්නද..? එතකොට අයියටම පුළුවන්නෙ එයාට විස්තරේ කියන්න.."

එයට විශ්වගේ අනුමැතිය ලැබුණු පසු ඔවුන් දුරකථන ඇමතුමක් ලබාදී රත්නෙ අයියාව ගෙන්වා ගත්තේය.. විශ්ව සම්පූර්ණ කතාවම ඔහු හමුවේ දිග නොහැර ඔහුට අදාල රාජකාරිය පමණක් සවිස්තරව පහදා දුන්නේය..

"බය වෙන්න එපා සර්.. මං ඕන හෙල්ප් එකක් දෙන්නම්.. කොහොමටත් අපේ බජාර් එකේ සෙට් එක ඔකුන්ගෙ කොල බොක්ක අදින්න ලෑස්ති වෙලයි ඉන්නෙ.."

රත්නෙ බජාර් බාසාවෙන්ම කරුණු පැහැදිලි කලත් ඔහු විශ්ව හමුවේ ගරු සරුවක් පෑවේය..

"මට සර් කියන්න එපා අයියෙ.. මෙයාලට වගේම මටත් මල්ලි කියලා කතා කරන්න.. අනික ඔය  මිනීමරාගන්න තරම් දැනට මේක දුරදිග ගෙනියන්න එපා.. ඒවා පස්සෙ බලමු.."

විශ්ව  ඔහුව සන්සුන් කලේ ත්‍රී වීල් පාර්ක් එකෙන් ඔවුන්ට එවන් කරදරයක් කළහොත් එයත්  චෛතියලාගේ ගිණුමට වැටී නැති ප්‍රශ්න ඇතිවිය හැකි නිසාය.. අනික තමාගේ   මිතුරාට කළ හානියේ පළිය ගැනීමට මිස මිනීමරාගැනීමේ අදහසක් නම් ඔවුන්ගේ තුන්  හිතකවත් තිබුණේ නැත..

"උන්ට ගේම දෙන්න නම් මේ කට්ටිය මදි වෙයි සර්.. මං අපේ පාර්ක් එකේ උන්ට එන්න කියන්නම්.."

රත්නෙ කතා කලේට තරහටය.. චෛතියලා මොහුව විශ්වාසවන්ත බව කීවාට මොහුව ගාවා ගැනීමෙන්     ඔවුන් සියලු දෙනාම අමාරුවේ වැටෙයිදෝ බියක් විශ්වගේ සිතේ හටගත්තේය..

"මේක දුරදිග ගෙනියන්න බැනෙ අයියෙ.. එහෙම උනොත් අපේ මල්ලිලා ටික අමාරුවෙ වැටෙනවා.. අනික මුන් මේ පාර විබාගෙ ලියන්නත් ඉන්න ළමයිනෙ.."

විශ්ව බැරිම තැන තුරුම්පුවක් විසිකර බැලුවේ ඔහුගේ ප්‍රේතිචාරය දැනගැනීමටය..

"ඔවු සර් මට තේරෙනවා.. අනික මටත් ඉන්නවා ඉස්කෝලෙ යන ළමයි දෙන්නෙක්.. බය වෙන්න එපා සර්.. මං සර් කියන විදියට කරන්නම්.."

කොතරම් එපා කීවත් රත්නේ විශ්වට කතා කලේ සර් කියාය.. ඔහු දැන්වත් සාමකාමී වීම ගැන විශ්වගේ සිතට සතුටක් දැනුණේය..

"එහෙනම්  මල්ලිලා.. ඔක්කොම හරිනේ.. හෙට අපි ගේමට සෙට් වෙමු.. අපි කෝල් කරලා එන තැන්  ඇරේන්ජ් කර ගමු.. මට කලන මල්ලිගෙන් නම්බර් එක දෙන්න.."

විශ්ව  පිටව යාමට මත්තෙන් කලනගේ දුරකථන අංකයද ඉල්ලා ගත්තේය.. රන්තේ පළමුව පිටව ගිය   අතර විශ්ව නුවර බලා ගියේ චේතියවද නිවසට බැස්සවීමෙන් අනතුරුවය.
චේතිය සම්මානි සමග කතා කිරීමේදී ගල් කන්ද වලව්ව හා අශේන් ගැන කතාවක් ඇදී ආ නමුත්  ඔහු තමන්ගේ සැලැස්ම ගැන වදනකදු පිට නොකිරීමට ප්‍ර වේශම් විය.. ඇයට නොමිතාලි අක්කාටවත් ඔහු කිසිවක් කීවේ නැත..

නමුත් ඔහුගේ සිත නම් පුදුමතරම් නොසන්සුන් වී තිබිණි..

"වැඩේ ගැස්සෙන එකක් නෑ නේද චේති.?"

පසුදා පාසලේ චේතිය දුටු විගස කලන ඇසුවේ ඔහුගේ සිතේද වෙන කිසිවක් නොතිබූ බව කියාපාන්නට මෙනි..

"අවුලක් වෙන එකක් නෑ.. කැම්පස් එකේ සෙට් එකත් අපේ ළඟ ඉන්නවනේ.."

චේතිය කීවේ දැඩි විශ්වාසයෙනි..

ඔවුන් එදින ගෙවා දැමුවේ බොහෝ අසීරුවෙනි.. පාසල හැරී නිවසට ගිය පසුව චේතිය සිය ජංගම දුරකථනය පසෙකින් තැබුවේද නැත..

පසුව වෙලාව සවස හයට නැතත් විශ්ව සම්පූර්ණ සැලැස්ම ක්‍රියාවට නංවා තිබිණි.. කලන හා චේතිය ඔවුනට එක් වූයේ එකම වෙලාවටය.. ඒ වන විට ඔවුනට කිරීමට යමක් ඉතිරිව      තිබුණේ නැති තරම්ය..

"මල්ලි ඔය දෙන්නගෙන් එක්කෙනෙක් අපේ එකෙක් එක්ක අර කියපු ක්ලබ් එකට ළඟට යන්න වෙනවා.. මොකද නැත්තං උන්ව අඳුරගන්න බැනෙ.."

විශ්ව එය කීවේ ඍජුවම කලන දෙස බලමිනි.. එහි අරුත වැටහුණු කලන හිස සැලුවේ තමා එහි යන බව කියාපන්නටය..

"වලව්ව ළඟ ඉන්න ඕන දෙන්නා දැනටමත් එහෙ ගිහින් ඇති.. මං අර කිපු අශේන්ගෙ මස්සිනා කට්ටිය සෙට් කරගෙන අන්න පාරෙ.. ඔයාලගෙ රත්නෙ අයියත් දැන් මෙතනට එයිනෙ.. අපේ තව කට්ටියටක් මේ වෑන් එකේ ඉන්නවා.. අපිට තියෙන්නෙ වැඩේ කෝඩියනේට් කරන්න විතරයි.."

පසු පස තිබූ නිසාන් වෑන් රථය පෙන්වා විශ්ව කලනට හා චෛතියට පැහැදිලි කර දුන්නේය..

ඔවුන් එසේ සියල්ල සූදානම් කර ඒ ඒ පුද්ගලයන්ව අදාල ස්ථාන වලට යවා තම වේලාව එනතුරු රැඳී උන්හ.. චෛතිය විශ්ව සමග නතර වූයේ අශේන්ගේ මිතුරන් තිදෙනා රැගෙන එන ස්ථානයේය..

සැලැස්ම ආරම්භ කිරීමේ පියවර යෙදී තිබුණේ කලනටය.. ඔහු අදාල පුද්ගලයින් තිදෙනා ලයන් ක්ලබ් එකට පැමිණි වග අන් යට දැනුම් දෙද්දී වෙලාව හය හමාර පමණ වී තිබිණි..

"මල්ලි.. උඹ සිකියුරිටි අන්කල්ව පොඩි කතාවකට අල්ලගනිං.. මම පටස් ගාලා බයිසිකලේට වැඩේ දෙන්නම්.."

විශ්වගේ සමීප මිතුරෙකු වූ අසේල කලනගේ කණට කර කීවේ පිරිස ශාලාව තුලට ඇතුල් වී විනාඩි කිහිපයකට පසුවය.. ඔහුට එම වැඩට කිරීමට විනාඩි පහක්වත් ගතවූයේ නැත.. අසේල රථ ගාල දෙස සිට ඇසක් වසා ඉගිකරමින් පැමිණෙද්දී කලනද මුරකරුට සුභදව සමු දී එතනින් පිටවිණි..

"මගේ බයික් එකත් එතනම දාලා ආපු නිසා මිනිහට වැඩේ මීටර් උනේ නෑ.. යන්තං ෂේප්.."

ඔහු සිනාසී කියද්දී කලන පුදුම වූයේ මෙතරම් ඉක්මනින් ඔහු ටයරයේ හුළං ඇරියේ කෙසේද කියාය..

"අපි පාරෙන් එහා පැත්තට ගිහින් කවර් වෙලා ඉමු.. ඉතුරු ටික රත්නෙ අයියා අතේනෙ තියෙන්නෙ.."

කලන අසේලවද ඇදගෙන පාර පනිද්දී රත්නේද ත්රී විලය තුළට වී තමාට ඇමතුම එනතෙක් බලා සිටියේය..

එතැන් සිට පැය භාගයක් පමණ නිසොල්මනේ ගෙවී ගියේය.. ක්ලබ් එක තුළට ගිය පිරිස එළියටනොපැමිණි අතර රත්නේටද සිය දුරකථන ඇමතුමක් ලැබුනේ නැත..

"මේ තරම් පරක්කු වෙන්න බෑ මල්ලි.. වලව්ව පැත්තෙ මොකක් හරි අවුලක්ද දන්නෑ.."

විශ්ව කීවේ ඔහු සමීපයේ උන් චේතියටය..

"අයියා කෝල් එකක් දීලා බලන්න.."

ඉවසා බැරිම තැන චේතිය කීවේ තවත් පමා වුවහොත් නිවසට යාමට නොහැකි තත්වයක් උදාවන නිසාවෙනි..

"ෂිට්.. මේ අශේනයා තාම වලව්වෙන් ඇවිත් නැනෙ.. ඌට අද බීම එපාවෙලාද දන්නෑ.."

තම සැලැස්ම ගැන පසුතැවුනු විශ්ව වෙනත් විකල්පයක් ක්රියාවට නංගා බැලුවේය.. ඔහු තවකෙකුට දුරකථන ඇමතුමක් දී යමක් කීවේය..

"අයියා කාටද ඒ කතා කලේ.. ?"

චේතිය ඇසුවේ ඔහු කිසිවක් නොකී නිසාය..

"අපේ හොස්ටල් එකේ එකෙක්ට.. ඌ ගානට අශේන්ව තව ටිකකින් එළියට ගනියි.."

"ඒ කිව්වෙ.. ?"

"අශේන්ගෙ කැම්පස් කෙල්ල අශේන්ට හොස්ටල් එකේ ටර යිටෙල් බොක්ස්එකෙන් කෝල් කරනවලු.. අපේ යාලුවෙක් ඒ ගර්ල් විදියට

අශේන්ට කෝල් කරලා මිනිහව එළියට ගනියි.."

චේතියට මේ මොහොතේ අවැසි වූයේ හරස් ප්‍රශ්න ඇසීමට නොව කෙසේ හෝ අශේන්ව වලව්වෙන්පිටතට ගෙන්වා ගැනීමටය.. ඉන්පසු රංගට කල හානියේ වාඩුව ගත් පසු එම සිදුවීම මුලුමනින්ම අමතක කල හැකි බව ඔහුට සිතුනි..

තවත් පැය කාලක් පමණ ගතවූ පසු වලව්ව ළග රදවා තිබූ මිතුරන් දෙදෙනාගෙන් විශ්වට ඇමතුමක් ලැබුණි.. ඉන් කියවුණේ අශේන් බයිසිකලයේ නැගී වලව්වෙන් පිටතට ආ බවය.. එම ඇමතුම අශේන් එනතුරා බලා ඉන්නා වැන් රියේ පිරිසටද ලැබී ඇති බවවිශ්ව කීවේය..

"එහෙනං මල්ලි ඔයා රත්නෙ අයියට කොල් එකක් දෙන්න.. මිනිහට කියන්න පුළුවන් තරම් ෂේප් එකේ උන් තුන්දෙනාව එළියට ගන්න කියලා.."

හිස පමණක් සලා එය අනුමත කල චේතිය රත්නේට පමණක් නොව ලයන් ක්ලබ් එක ළගට වී බලා උන් කලනට හා විශ්වගේ මිතුරාටද පණිවුඩය ලබා දුන්නේය..

"වැඩේ හරි අයියෙ.. රත්නෙ අයියා කට්ටිය අරන් පිටත් උන ගමන් කෝල් කරයි.. අයියගෙ පැත්තෙන් අවුලක් වෙන එකක් නැනෙ.."

ඇමතුම අවසානයේ දුරකථනය තම සාක්කුවේ දමාගත් චේතිය විශ්වගෙන් විමසිය..

"බයවෙන්න දෙයක් නෑ මල්ලි.. මෙලහකටත් අශේන්ට සබ්බුව හම්බවෙනවා ඇති.."

සැනෙකින් චේතියගේ සිතට අමුතුම හැගීමක් ඇතුළු විය.. ඔහුට අහේතුකවම වලව්වේ ළමාතැනීගේ රුව මැවී පෙනෙන්නට විය.. ඈ තම පුතුට කරදරයක් නොකරන්නැයි වැනි ආයාචනයක් කරනා අයුරු චේතියට දිස් විය..

"විශ්ව අයියෙ.."

චේතිය විශ්වගේ අත දැඩිව අල්ලා ගනිද්දී විශ්ව පුදුම වී බැලුවේය..

"ඇයි මල්ලි අවුලක්ද.. ?"

"අශේන්ට ලොකු ඩැමේජ් එකක් කරන්න එපා අයියෙ.."

ඔහුගේ කටහඬ පවා තරමක් ගොරහැඩි වී තිබිණි.. විශ්ව චේතියගේ මේ ක්ෂණික වෙනස්වීම ගැන මවිත වී උන්නේය..

"මල්ලිමනෝ මුලින්ම කිව්වෙ අශේන්ටත් එක්ක රිටන් එක දෙන්න ඕන කියලා.. ඉතින් දැන් ඇයි අප්සට් වෙලා.."

"ප්ලීස්.. මං කියන එක අහන්න.. එයාලව නවත්ත ගන්න.."

දෑස විසල් කර චේතියගේ මුහුණ බලා උන් විශ්ව පසුව තම මිතුරන්ට දුරකථන ඇමතුමක් ලබා දුන්නේය.. ඒ වන විටත් අශේන්ට ඔවුන්ගෙන් හොඳ හැටි ගුටි සංග්‍රැහයක් ලැබී තිබිණි..

"මල්ලී.. දැන් ආපහු අරුන් ටිකටත් ගහන්න එපා කියලා නම් කියන්න එපා.. අපේ කොල්ලො ටික මට හිනාවෙයි.."

විශ්ව චේතියට කලේ උපහාසයක් උවද එහි තරමක් දැඩි බවක් ගැබ්ව තිබිණි.. නමුත් විශ්ව අදහස් කල හැඟීමක් චේතියගේ සිතේ තිබුණේ නැත.. ඔහුටද අවැසි වී තිබුණේ හිතේ හැටියට ඇගේ පතේ හිරි ඇර ගැනීමටය..

"උන්ගෙනම් අතපය කැඩුවත් මට අවුලක් නෑ.. ඒත් අශේන් ඩිරෙක්ට් මේකට සම්බන්ධ නෑනෙ.."

තමාට ක්ෂණිකව ළමාතැනී සිහි වූ වග.. තම සිතට කුමක්දෝ ගුප්ත හැඟීමක් දැනුණ වග විශ්වට නොකී චේතිය වෙනකක් කියා එය මග හැරියාය..

ඔවුන් කතාබහ කරන අතරතුර රත්නේ තම පියවර ක්‍රියයාවට නංවා

තිබිණි.. ඔහු බය සැකකින් තොරව ලයන්ස් ක්ලබ් එකට ගොස් අදාල පුද්ගලයන් තිදෙනාව එළියට කැදවාගෙන ආවේය.. ඒ වන විට ඔවුන් හොද හැටි මතින් උන් නිසා රත්නේට සිය කාර්ය්‍ය තරමක් පහසු විණි..

"අශේන්ට මොකක් වෙලා කියලද උඹ කිව්වෙ.. ?"

අසීරුවෙන් වදන් ගලපා ගත් එකෙක් රත්නේගෙන් නැවත විමසුවේ ඔහු ක්ලබ් එක තුලදී කල විස්තරය අමතකව තිබූ නිසාය..

"පුංචි හාමු විස්තරයක් නම් කිව්වෙ නෑ.. මහත්තයලා තුන්දෙනාව ඉක්මනට අරගෙන එන්න කියලා තමයි කිව්වෙ.."

බොහෝ බය පක්ෂපාතී මුහුණක් මවාගත් ඔහු කියද්දී මිතුරන් තිදෙනා අශේන්ගේ ජංගම දූරකථනයට ඇමතුම් ගැනීමට වෙහෙසුනහ..

"මූ ෆෝන් එක ගන්නෙ නෑනේ බං.. කෝකටත් වලව්වට අරන් බලමු.."

තිදෙනා වෙරිමතින් දොඩවන අයුරු මොහොතක් රත්නේ බලා උන්නේය..

"ඌ වලව්වෙ නැලු බං.. ටිකකට කලින් එළියට ගියාලු.."

ගල් කන්ද වලව්වට ඇමතුමක් ගත් කෙනා අනෙක් දෙදෙනා දෙස බැලුවේ ප්‍රශ්නාර්ථයක් රැදි දෑසිනි..

"පණිවිඩේට තැන්ක් යූ වෙන්න ඕනෙ.. උඹ පලයං මචං.. අපි ආවෙ බයික් වල.."

ඔවුන් රත්නේව පිටත් කිරීමට උත්සාහ කලද ඔහු තවමත් රැදී උන්නේ ඔවුන්ගේ බයිසිකලයට අත්වී ඇති ඉරණම නිසාය..

"මහත්තයලා බයික් අරන් එන්න.. මං එතනට යන පාර පෙන්නන්නං.."

රත්නේ ගරුසරුව කියද්දී දෙදෙනෙක් රථගාල දෙසට පිය මැනිය.. අනිකා රත්නේ අසල නතරව උන්නේ ඔවුන් පැමිණි පසු බයිසිකලයක නැගී යාමේ අරමුණිනි..

"මහත්තයලා මෙහෙ පාරවල් දන්නෙ නැතුව ඇති මයෙ හිතේ.. ඒකනේ පුංචි හාමු මහත්තයලා මට එක්කගෙන එන්න කිව්වෙ.."

තමා ළඟ ඉතිරි වූ එකාගෙන් යම් හෝඩාවාවක් දැන ගත හැකිදැයි රත්නේ උත්සාහ කර බැලීය..

"නෑ අයියෙ.. අපි කොළඹ.. අශේනයා ඉස්කෝලෙ යන කාලෙ හිටියෙ අපි එක්කම තමයි.."

"එහෙනං මහත්තයලා නිවාඩුවකට ඇවිත් වෙන්ටැති.."

"නිවාඩුවකට තමයි.. අශේන් එන්න කිව්වා.. අපි ආවා.. ඒත් මල්ලි ඌට කරදර කරන එක හරිනැනෙ.. ඒ නිසා අපි හොටෙල් එකක නතර උනා.. බිල ගෙවන්නෙ තමුසෙලගෙ පුංචි හාමු.."

වෙරිමතින් හතර අතට වැනෙමින් උන් ඔහු නානාප්‍රකාර ඇමතුම් වලින් රත්නේ අමතමින් උන්නේය.. ඔහු තම ගැටයට හසු වූ බව දැනගත් රත්නේද අනික් දෙදෙනා පැමිණෙන තෙක් ඔහුගෙන් බොහෝදෑ දැනගත්තේය..

"පොඩි අවුලක් වෙලා බං.. අපි දැනට මේකෙ යං.."

රත්නේ හා කතාකරමින් උන් කෙනා වෙත පැමිණි සගයන් දෙදෙනා ඔහුට වැඩි විස්තරයක් නොකියාම ත්‍රීපවිලයට නැගුණේය.. ;

"ඇයි මචං.. මොකක්ද අවුල.. ?"

රත්නෙ ත්‍රීංවිලයට නැග ගත්තද ඔහු කතා කල කෙනා තවම පාරෙය..

"බයික් එකේ පැච් එකක් මචං.. අපි එන ගමන් ඒක හදාගමු.. ඉස්සෙල්ලා ගිහින් බලමු අශේන්ට මොනවා වෙලාද කියලා.."

ඔහු ත්‍රී්‍රාවිලයට නැඟුන සැනින් කලන චේතියට ඇමතුමක් දී ඒ බව දැනුම් දුන්නේය..

"මෙතන තමයි තැන.. දැන් පුංචි හාමු වෑන් එකකින් එයි.. මහත්තයලා බහින්න.."

රත්නෙ, විශ්වලා උන් ඉසව්වෙන් ත්‍රීමවිලරය නතර කරද්දී කලන හා අසේලද බයිසිකලයෙන් එතනට ළඟාවිය..

ත්‍රීවිලරයේ උන් තිදෙනාගෙන් එකෙක් පමණක් බිමට බැස බැලුවේ තරමක් සැකයෙනි.. නමුත් ඔවුන් අසලට පැමිණි වෑන් රිය දුටු ඔහුගේ සැකය පහ විය..

වෑන් එක ආවා.. අශේන් වෙන්න ඇති.. බැහැලා වරෙන්..

තිදෙනාව ත්‍රී විලරයෙන් බැස වෑන් රථය වෙත ළගා වද්දීම ඉන් දොර හැර පැමිණි පිරිස ඔවුන්ව වටකර ගත්තේය.. කිසිවෙකුට කිසිවක් සිතන්නට ඉඩ නොතබාම හතර අතින් පහර එල්ල වෙද්දී එකා දෙන්නා කෑගසා බිමට ඇද වැටුණි.. කැම්පස් මිතුරන් සමග කලනද සබයට බැස තිබුණත් වැඩිපුරම අතපය ක්‍රි යාත්මක වූයේ චේතියගේය.. ඔහු උඩ පැන හතර අතට එල්ල කරන ප්‍රරහාරයන් දෙස විශ්වගේ මිතුරන් පවා මවිත වී බලා උන්නාය..

"උඹලගෙ කොළඹ පාට් කොළඹ ත්‍රීනවිල් පාක් වලට දාගනිං.. මේ කුරුණෑගල අපේ ටවුම හරිද.. මේකෙ ඉන්න උන්ට ආයෙත් පාට් දාන්න ආවොත් යවන්නෙ යටියන්තොට.. අන්න ඒක දැනගනිං.."

ඒ සද්දය දැම්මේ වෙනකෙකු නොව රත්නේය.. තිදෙනාට දින ගණනක් රෝහල් ගතවීමට වැඩ සිද්ධ වූ පසු එහි නම්බුව තමන්ගේ ත්‍රී්විල් පාක් ගිණුමට දමා ගැනීමට ඔහුඋත්සුක වී තිබිණි.. නමුත් විශ්ව දෙතොලට ඇඟිල්ලක් තබා නිහඬ වන ලෙස රත්නේට සන් කලේය..

රංගගේ තුවාල සහිත රුව සිහිපත් වූ චේතිය බිම ඇද වැටී උන් ඔවුනට තවත් ප්‍රවහාර කිහිපයක් එල්ල කලේය..

"ඔය ඇති මල්ලි.. තව ගැහුවොත් ඕකුන් මැරෙයි.."

විශ්ව චෛතියව පසෙකට කර ගත්තේ ඒ වනවිටත් ඔවුන්ගේ අතපය කැඩී ඇති බව වැටහුණු බැවිණි..

"මචං සයිරන් එකක් ඇහෙනවා.. පොලීසියෙන්ද කොහෙද.."

විශ්වගේ  මිතුරෙකුගේ කෑ ගැසීමට සැමදෙනාම කලබල විය.. සැබැවින්ම ඈත පැමිණෙමින් තිබුණේ  පොලිස් නිල රථයකි.. ඒ දුටු සැවොම සිද්ධිය වූ ස්ථානයට ළඟා වීමට පෙර එතනින්  පැන ගත්හ.. චෛතිය හා විශ්වට වෑන් රියට නැග ගැනීමට තරම් වෙලාවක් නොවූ නිසා  ඔවුන් දෙදෙනා නැග ගත්තේ රත්නේගේ ත්‍රීකරෝද රථයටය..

"දැන් අපි ටික ආපහු සෙට් වෙන එක ඩේන්ජරස් මල්ලි.. මං කියන්නම්.. කෝල් එකක් දීලා කලනව මේකට ගන්න.. මං අසේලයගෙ බයික් එකට නගින්නං.."

"එතකොට අයියලා කොහෙටද යන්නෙ..                    ?"

චෛතිය විමසුවේ ත්‍රීෙවිලරය අරමුණක් නැතුව ඉදිරියට ඇදී යද්දීය..

"අපි මෙහෙම්ම හොස්ටල් එකට යන්නං මල්ලි.. ඔයාලා රත්නෙ අයියා එක්ක ගෙදර යන්න.. අපි හෙට බලමු මොකද වෙලා තියෙන්නෙ කියලා.."

එයට  එකඟ වූ චෛතිය විශ්ව කීවා සේම කලනව ත්‍රීකවිලරයට නංවා ගත්තේය.. අසේලගේ  බයිසිකලය  හා අනෙක් වෑන් රථය පිරිස දමාගෙන නුවර බලා පිටත්විය..

"මල්ලි.. ඒ සර් නං රියල් මීටරයක්.."

විශ්ව පිටව ගිය පසු රත්නේ ඔහු ගැන වර්ණනා කරන්නට පටන් ගත්තේය..

"ඉස්සර වෙලා චේතියව බස්සලා එමු රත්නෙ අයියෙ.. අපේ ගෙදරින් එච්චර අවුලක් නෑ.."

කලනට අවැසි වී තිබුණේ චේතියගේ මව හා නැගණිය තනිවම හිදිනා නිසා හැකි ඉක්මනින් ඔහුව නිවසට ඇරලීමටය..

"එහෙනං රත්නෙ අයියෙ.. මේ ගැන දැන්ම කාටවත් කියන්න එපා.. දැක්කනේ.. මේක පොලීසියට ලීක් උන එකේ අපි පරිස්සම් වෙන්න ඕන.."

නිවස ළගින් ත්‍රී විලයෙන් බැසගත් චේතිය රත්නේට පූර්ව දැනුම් දීමක් කර මිතුරාට සමුදීමට සැරසුණාය..

"චේති.. රංගයට කියන්න එපා මචං.. පස්සෙ එන විදියක් බලමු.."

සිය මෙහෙයුම අවසන් කල දෙමිතුරෝ සමුගත්තේ එසේ කියමිනි. චේතිය හා කලන කතා බහ කර පසු දින පාසල් යාමෙන් වැළකී උන්හ.. දෙමිතුරෝ රංගගේ සුවදුක් බැලීමටද නොගියේ මේ දිනවල තරමක් ජ්. වේශම් වීම කාට කාටත් හොද බව්වැටහුණ හන්දාය.. එදින සුපුරුදු ලෙස මිහිරාවිය පාසලට ඇරලූ ගුණවතී ගල්කන්දවලව්ව බලා පිය නැගිය..

"උඹට ආරංචිද ගුණවතියෙ වෙච්ච දේ.?"

ගුණවතී වලව්වෙ මැද මිදුලට පා තබද්දීම ඉදිරියට දිව ආ හේතුහාමි ඇගෙන් විමසුවාය..

"මොකක්ද හේතු හාමි අයියෙ.? මං නං කිසිදෙයක් දන්නෙ නෑ.."

"ඊයෙ රෑ කවුදෝ කට්ටියක් පුංචි හාමුට හොදටෝම තඩිබාලා.. ඕං දැන් ඉස්පිරිතාලෙ.."

ඒ ඇසූ ගුණවතී ඉද්ද ගැසුවාක් මෙන් නැවතුණි.. ඊයේ රාත්‍රි්‍යේ චෛතිය ගිය ගමන ගැනද ඇගේ සිතේ සැකයක් ඉපිද තිබිණ..

"පුංචි හාමුට තඩිබාන්න තරම් හයිය කාරයො ඉන්නවයි මේ වැයික්කියෙ..?"

තම සැකය සිත තුළම සගවාගත් ගුණවතී කරුණු කාරනා හරි හැටි දැන ගැනීමට උත්සාහ ගත්තාය..

"මෙහෙ උදවිය නෙමෙයිලු ගහලා තියෙන්නෙ.. නුවරින් ආපු කට්ටියක්ලු.. විස්ස විජ්ජාලෙ උන් ටිකක්ද කොහෙද කියලයි කියන්නෙ.."

"ඒ අහවල් එකටද හේතුහාමි අයියෙ.?"

"ඕං ඔය විස්ස විජ්ජාලෙ ගැටිස්සියෙකුගෙ පලහිලව්වක් කියන්නෙ.;"

ගුණවතී තරමක් සැනසුම් සුසුමක් හෙලුවේ චෛතියගේ ගමන ගැන වූ සැකය මදකට අමතක කරමිනි..

"ඒ විතරක් නං මැදෑ.. තවත් ගුටි කෙලියක් ගිහින් තියෙනවා හංදිය පැත්තෙ.."

ඇතුගල හාමුට ලැබුණු දුරකථන ඇමුතුම් වලින් අහුලාගත් කරුණු කාරණාද හේතුහාමි ගුණවතී ඉදිරියේ දිග හැරියේය..

"ඒ කාටද ගහලා තියෙන්නෙ.?"

"අර අපේ  පුංචි හාමුගෙ වසවර්ති යාළුවො ටිකටලු.. ඒකෙ විස්තරයක්නම් මං හරිහැටි දන්නෙ නෑ බං.. ඒක නෙමේ කෝ උඹේ පුංචි එකී ඉස්කෝලෙ ගියයි.?"

"ඔව් මං ඉස්කෝලෙට දාලා ආවෙ.. ඒකි කරන කියන දේවල් ගැන හිතනකොට වෙලාවකට බයත් හිතෙනවා.."

ඇ එය  කීවේ දිගු සුසුමක්ද සමගිනි.. මිහිරාවි පුංචි සන්දියේ ඇතුගල හාමුගේ මුහුණට   කෙල ගැසූ සිද්ධියත් අශේන්ගෙ උපන්දිනයදා ඔහුගේ මුහුණ සිපගත් සිද්ධියත්  හේතුහාමි දැන උන් හන්දා ගුණවතී තම සිතැගි ඔහුගෙන් වසන් කිරීමට උත්සාහ ගත්තේනැත..

"ඔය  දැරිවි ඇරපු අතක් නෑ අපේ ළමාතැනීගෙ කපාපු පළුව.. මගේ හිතටත් වෙලාවකට මහ    විකාර හිතෙනවා බං.. ඒකිගෙයි අපේ ළමාතැනීගෙයි මොකක් හරි සම්බන්ධයක් තියෙනවද    කියලත් මට වෙලාවකට හිතෙනවා.."

තම සිතට දැනෙනා හැගීම් හේතු හාමි ඒ ආකාරයෙන්ම පිට කරද්දී ගුණවතීගේ මුහුණ රත්පැහැ ගැන්විණි..

"ඒකිගෙයි   ළමාතැනීගෙයි අහවල් සම්බන්ධයක්ද.. ළමැතැනී මියැදුනා.. ඒකි මගේ දරුවා.. හේතුහාමි අයියත් දොඩවන්නෙ හරියට කරුණු කාරණා දන්නෑ වගේනෙ.."

"උඹට ඔය හැටි ගිරිය පුප්පන්න දෙයක් මං කිව්වෙ නෑ.. මං කීවෙ මට හිතුන දේ.."

ගුණවතීට තරහා නැගුණු බව වැටහුණු හේතුහාමි ඇයව අස්වසන්නට උත්සාහ කළේය.. ඔහු නොදැන උන්නාට ගුණවතීට තරහා නැගුණේ හේතුහාමි කී දෙයට නොව චේතියලාගේ.. නතාලිලාගේ කතාබහෙන් කියවුන පුනරුත්පත්ති කතාව සිහිපත් වූ නිසාය.. එය මේ මොහොතේ හේතු හාමි දැනගන්නවාට ගුණවතීගේ සිතේ මනාපයක් වූයේ නැත..

"හරි.. හරි.. අපි දැන් ඔය කතාව නතර කරමු.. උඹට පුළුවන්නං හොඳ සුප් එකක් හදලා තියහං.. දවල්ට පුංචි හාමු බලන්න යද්දි ගෙනිහිං දෙන්ට.."

"කෝ දැන් ලොකු හාමු.?"

තමා අහේතුකව හේතු හාමි සමග තරහ ගත් බව වැටහුණු ගුණවතී සන්සුන්ව විමසා සිටියහ..

"උන්දැත් ඔය පාන්දරම ඉස්පිරිතාලෙ ගියේ.."

"පුංචි හාමුට ගොඩක් අමාරුද.?"

"මං තාම බලන්න ගියේ නෑ ගුණවතියෙ.. ආරංචියෙ හැටියට නං ගොඩක් තුවාලයිලු.."

ඔහුගේ කතාවට ගුණවතී අත නිකටේ තබාගත්තේ "අනේ අපොයි" කියමිනි..

"ඒ කොයි හැටි වෙතත් අර වසවර්ති රැලට නං ගහපු එවුන්ට මසුරන් දෙන්න වටිනවා.. උන් වැඩිහිටියන්ට ගරුසරු ඇතුව කතා කරන්නවත් දන්නෙ නෑ නොවැ.. නිතරම ඉන්නෙ දඟජරාව කටේ ගාගෙන.."

හේතුහාමිගෙ කතාව ගුණවතීද අනුමත කලේ එම පිරිස හේතුහාමිට කීපවරක්ම නාකියා ලෙස අමතනු ඇයට ඇසී තිබුණු බැවිනි..

"දැන් ඉස්සර වගේ පව් පලදෙන්න පමා වෙන්නෙ නෑ හේතුහාමි අයියෙ.. මේ ආත්මෙ කරන ඒවා මේ ආත්මෙම පල දෙනවා.."

එසේ කියූ ගුණවතී සේදූ වළං පිඟන් සියල්ල වතුර බේරීමට රාක්කයේ තැන්පත් කළහ.. හේතුහාමිද නැගිට ඉදිරිපසට ගියේ ලොකු හාමුද වලව්වේ නැති නිසා වත්ත පිටිය බලාකියා ගැනීමේ අදහසිනි..

**********************************

දවසම නිවසට වී පාඩම් කර චෛතිය සවස් වරුවේ ජංගම දූරකථනය රැගෙන මිදුලේ පොල් කොටයේ හිදගත්තේය.. නතාලිට , විශ්ව අයියාට, රංගට, කලනට, ආදී සියල්ලන්ටම ඇමතීමේ අවශ්‍ය තාවය තිබුණද ඔහු මුලින්ම ඇමතුම ගත්තේ සම්මානිටය..

"චෛතිය.. දන්නවද වැඩක්.. ඊයෙ රෑ ටවුන් එකේ ලොකු රණ්ඩුවක් ගිහින්ලු.."

චෛතිය ඇයට කිසිවක් නොකියා හිදීමට තීරණය කළද ඇමතුම ගත් සැනින් සම්මානී එසේ කීවාය..

"මොකක් ගැනද සම්මානි ඔය කියන්නෙ.?"

"ඔයාට මතකද අර දවසක් අපිට ක්ලාස් එක ළගදි විහිළු කරපු කොල්ලො ටික.. අන්න එයාලට ඊයෙ අතපය කැඩෙන්නම ගහලලු.."

චෛතිය පුදුම වූයේ මේ තරම් ඉක්මනට එම ආරංචිය ඇයට ලැබුණේ කෙසේදැයි සිතමිනි.. අශේන් රෝහල් ගතව ඇති සිද්ධියද ඈ කියනා තෙක් නොපවසන්නට ඔහු තීරණය කළේය..

"කවුද ගහලා තියෙන්නෙ.?"

"ආරංචියෙ හැටියට නම් හන්දියෙ ත්‍රීවෝවිල් පාක් එකේ අයලු ගහලා තියෙන්නෙ.."

ඇගේ කතාවට චේතිගේ යටි සිතින් සිනා නැගුණි.. ඔවුන් දෙවනි වරටද ගුටි කෑවේ තමන්ගෙන් බව කීමට සිතුණ මුත් චේතිය එය ගිල ගත්තේය..

"කවුද ඔයාට කිව්වෙ..?"

"අපේ සිරිල් මාමා.. එයාට කියලා තියෙන්නෙ තාත්ති.."

ඈ සිරිල් මාමා ලෙස හැඳින්වූයේ නිවසේ ඩ්‍රයිවර් බව චේතියට මතක තිබිණි..

"තාත්තිට උදේ පොලීසියෙ යාලුවෙක් කතා කරලා විස්තරේ කිව්වලු.. ඔයා දන්නවද චේතිය ඒ තුන්දෙනා මෙච්චර කල් පොලීසියෙන් කට්ටි පැන පැන හිටපු තුන්දෙනෙක්ලු.. එයාලා කොලඹ මසාජ් ක්ලිනික් එකකුයි ඩ්‍රග්ස් බිස්නසුයි කරලා තියෙනවා.."

"නෑ.."

චේතියගේ මුව විස්මයෙන් විවර වූයේ සම්මානි කියනා තෙක් තමා මෙවැන්නක් නොදැන උන් නිසාය..

"තාත්තිගෙ ඒ යාළුවා කියලා තියෙන්නෙ එයාලව ඒ වෙලාවෙම ඇරෙස්ට් කලා කියලයි.. දැන් පොලිස් ගාඩ් එකදාලා ඉස්පිරිතාලෙලු.."

සම්මානිගේ වචනයක් වචනයක් පාසා චේතියට නැගුනේ සතුටකි.. මෙම ආරංචිය කලනට හා විශ්වට පවසන තෙක් ඔහු නොසන්සුන් වී උන්නේය..

"වෙන මොනවද බබා තාත්තිට එයාලා කියලා තියෙන්නෙ.."

චේතිය ඇසුවට පිළිතුරු නොදුන් සම්මානි තරමක් හඬ නගා සිනාසෙන අයුරු ඔහුට ඇසුණි.. මේ වෙලාවේ ඇයට සිනාසීමට තරම් වූ කාරණය කුමක්දැයි නොවැටහුණු චේතියට දැනුණේකුතුහලයකි..

"ඒ මිනිස්සු ගුටි කාපු එකට ඔයා ඔය තරම් සතුටු වෙයි කියලා මට හිතුනෙ නෑ චේතිය.."

"ඇයි එහෙම කියන්නෙ..?"

"නෑ ඉතිං.. කවදාවත් නැතුව ඔයා මට බබා කියල කතා කලානේ.. ඒකයි.."

චේතියට දැනුණේ පොළව පලාගෙන යන තරමේ ලැජ්ජාවකි.. නමුත් සම්මානිගෙ සිතේ නම් සතුටක් ජනිත විය..

"සොරි සම්මානි.. මං හිතලා කිව්වෙ නෑ.. මට කියවුනා.."

"ඒකට කමක් නෑ.. මට බබා කියනවට මං කැමතියි.."

ඇය හුරතල් ලෙස කතා කරද්දී මෙතෙක් ඔවුන් කතා කරගෙන ආ මාතෘකාව පවා අමතකව ගියේය..

"අශේන්ටත් ඊයෙ හොඳ වැඩක් වෙලා.. එයා කෙල්ලෙක්ගෙ ප්‍රශ්නෙකට කොල්ලො කට්ටියකගෙන් ගුටි කාලා.. එයත් ඉන්නෙ යාලුවො ඉන්නෙ ඉස්පිරිතාලෙමලු.."

සම්මානි එය කීවේ සතුටිනි..

"අරුන් තුන්දෙනා ගුටි කාපු එකට මං සතුටුයි වගේම අශේන් ගුටිකාපු එකට ඔයා සතුටුයි වගේ නේද..?"

"සතුටු නැද්ද.. ඔය සිද්ධිය නිසා අන්න අපේ තාත්තගෙ ඇස් කන් ඇරිලා.. මේ වගේ ජරා යාළුවො ආශ්‍ර ය කරන.. මේ විදියට හතර අතේ කෙල්ලො එක්ක යාළු වෙලා ප්‍රශ්නදාගන්න කෙනෙක්ට මගේ දුව දෙනවද කියලා මං ආපහු කල්පනා කරලා බලන්න ඕන කියලා තාත්ති සිරිල් මාමට කිව්වලු.."

චේතියට සම්මානිගෙන් දිගින් දිගටම අසනන්ට ලැබුනේ සිත සතුටු කරන කාරණාමය.. සම්මානිව ඉක්මනින්ම අශේන්ට අයිත් වේ යැයි සිතා උන්නද එය එසේ නොවන බව දැනුණ ඔහු සැනසුම් සුසුමක් හෙළුවේය..

"ඔය සිද්ධි ඔයාට මුකුත්ම ආරංචි උනේ නැද්ද චේතිය?"

සියල්ල ඔහු ඉදිරියේ වැමෑරූ සම්මානි අවසානයේ චේතියගෙන් විමසුවේය..

අශේන් ගුටි කාලා කියලා නං අපේ අම්මට ආරංචි වෙලා තිබුණා.. ඒත් ඔය පොලීසියෙ කේස් ගැන නම් මං දන්නෙ නෑ..

ඔහු සිය මව ගැන සඳහන් කලේ සම්මානි විමසුවෝතින් ඇයට තම මව ගල්කන්ද වලව්වේ මෙහෙකාරකම් කරනා බව සෘජුව පැවසීමේ අදහසිනි.. සම්මානි මෙතරම් විවෘත වී හිදියදී තමා වංකව කතා කිරීම ඔහුට ඉවසුම් දුන්නේ නැත.. නමුත් ඔහු බලාපොරොත්තු වූ පරිදි සම්මානි ඔහුගේ මව ගැන දිගින් දිගටම විමසුවේ නැත..

"ඔයාට දෙයක් කියන්න තියෙනවා සම්මානි.. මට තවත් ඔයාට බොරු කාරයෙක් වෙන්න බෑ.."

ඈ කිසිවක් නොකීව නිසා චේතිය කතාවට මුල පිරුවේය..

"අපි ඒ දේවල් පස්සෙ දවසක කතා කරමු.."

ඇගේ පිළිතුරෙන් චේතිය පුදුමයට පත්විය.. ඇය වෙනදාට නම් මෙසේ හැසිරෙන්නේ නැත..

"ප්ලීස්.. මං මේ කියන ටික විතරක් අහන්න.. ඊට පස්සෙ තීරණය කරන්න මාව ආශ්‍ර ය කරනවද නැද්ද කියලා.."

සම්මානි එහා ඉමෙන් නැගූ සුසුමේ හඩ චේතියගේ සිතේ ගැඹුරටම දැනුණාය..

"මං ඔයා වගේ සල්ලි කාරයෙක් නෙමෙයි සම්මානි.. මං එදා වේල අමාරුවෙන් හොයාගන්න පවුලක දුප්පත් කොල්ලෙක්.. කොටින්ම.. මං.. මං.."

"කියන්න චේතිය.."

ඉතිරිය ගලපාගත නොහැකිව ඔහු ළතැවෙද්දී සම්මානි ඔහුව දිරිමත් කළාය.. නමුත් මොහොතක් යනතෙක් චේතිය ගොළුව උන්නේ මෙයට ඇසූ සැනින් ඈ ඇමතුම විසන්ධි කරාවි යන සැකයෙනි.. බලා හිද බැරිම තැන ඈ නැවත කීවේ චේතිය කිසිසේත්ම අපේක්ෂා නොකල දෙයකි..

"ඔයා ඔය කියන්න හදන්නෙ ඔයා ගල්කන්ද වලව්වෙ වැඩ කරන ගුණවතීගෙ පුතා කියන එක නම් ඒක මට එච්චර වැදගත් දෙයක් නෙමෙයි.."

"සම්මානි.. එතකොට ඔයා.?"

"ඔව් චේතිය.. ඒ හැමදෙයක්ම මං දන්නවා.. ඔයා ගෙදර අඩුපාඩු පිරිමහන්න අම්මට හොරෙන්කුලී වැඩ කරනවා කියලත් මං දන්නවා..

ඒ කිසි දෙයක් අපි දෙන්නගෙ යාලු කමට ප්‍රශ්නයක් නෙමෙයි චේතිය.. මං ඒ තරම් පටු විදියට හිතන කෙල්ලෙකුත් නෙමෙයි.."

ඇ කීවේ ඔහුගේ සිත අස්වසමිනි.. නමුත් ඇගේ කතාවට චේතිය අන්ද මන්ද වී උන්නේය..

"ඔයා මේ දේවල් දැනගත්තෙ කොහොමද සම්මානි?"

ගැඹුරු හුස්මක් පිටකල සම්මානි දිගු කතාවකට මුල පිරුවාය..

"ඔයා පංතියෙදි නිතරම මං දිහා බලන් ඉන්නවා කියලා දැනුණම.. ඔයා මං ගැන උනන්දුයි කියලා දැනුණම.. මං ඔයා ගැන විස්තර දැනගන්න උත්සාහ කලා.. මොකද ගොඩක් අය මං ගැන උනන්දු වෙන්නෙ මට තියෙන කැමැත්තට නෙමෙයි.. අපේ තාත්තගෙ සල්ලි වලට තියෙන කැමැත්තට.."

"ඔයා හිතුවෙ මමත් ඒ වගේ කෙනෙක් කියලද?"

ඇ කතාව කියනා තෙක් ඉවසිය නොහැකි වූ චේතිය හරස් ප්‍රශ්නයක් නැගිය..

"ඒක තමයි මටත් මුලදි දැනගන්න ඕන කලේ.. මං සිරිල් මාමට කියලා ඔයා ගැන විස්තර හෙව්වා.. එයා තමයි ඔය හැම දෙයක්ම මට කිව්වෙ.. එයා තව කිව්වා ඔයා කොච්චර දුප්පත් උනත් ගොඩක් ගුණ යහපත් කෙනෙක් කියලා.. ඊට පස්සෙ තමයි ඔයාව යාළුවෙක් විදියට පිළිගන්න මං තීරණේ කලේ.. මං දවසක් සිරිල් මාමට කියලා හන්දියෙ බස් ස්ටෑන්ඩ් එකෙන් බස්ස ගත්තෙත් ඔයා එක්ක කතා කරන්න හිතාගෙනමයි.. මතකද.. එදානෙ ඔයා මටත් ඔරවගෙවන ගිහිල්ලා අන්තිමට අර කොල්ලො තුන්දෙනාට හොඳටම ගැහුවෙ.."

ඇ යටගියාව සිහිපත් කරද්දී චේතියගෙ මුවේ සිනාවක් ඇඳුනේය..

"මට තේරුණා ඔයා මට කොයි තරම් කැමති උනත් අපේ තාත්තගෙ සල්ලි නිසා ඔයාගෙ දුප්පත්කම නිසා මට ළං වෙන්න බයෙන් ඉන්න විත්තිය.. ඒ නිසා තමයි මං දවසක් මගේ යාළුවගෙ අතේ ඔයාට මගේ ෆෝන් නම්බර් එක එව්වෙ.."

ඈ තමාට ළං වූයේ තමාගෙ පවුලේ තත්වය හරිහැටි දැනගෙන බව ඇගේ මුවින්ම දැනගත් පසු චෛතියගේ සිතේ මෙතෙක් පැවති අහේතුක බිය පහව ගියේය.. ඔහු සැනසුම් සුසුමක් හෙළුවේ ඒ නිසාවෙනි..

"ඔය ටික කියාගන්න බැරුව මං මොන තරම් හිතෙන් විදෙව්වද කියලා ඔයා දන්නෑ සම්මානි.. දැන් තමයි මගේ ඇගට ලේ ටිකක් ඉනුවෙ.."

"ආයිත් ඔය වගේ තැන් තැන් වල කුලී වැඩ කරන්න යන්න එපා චෛතිය.. ඔයාට සල්ලි ඕනෙ නම් මං දෙන්නම්.. මගෙන් ගන්න එක මදිකමක් කියලා හිතන්න එපා.. අපි දෙන්නා දැන් හොද යාළුවොනෙ.."

"මං ළගදි ඒ වගේ කුලී වැඩ වලට ගියේ නෑ බබා.. කොටින්ම මට ඒකට වෙලාවක් තිබුණෙ නෑ.."

තමා බබා ලෙස අමතනවාට කැමතියැයි සම්මානි විසින්ම පැවසූ නිසා ඔහු එසේ ආමන්ත්‍රනණය කළේය..

"බොරු කියන්න එපා.. ඔයා ළගදිත් දවසක කඩේක වහලෙ ගහන වැඩකට අත් උදව් දෙන්න ගිහින් තියෙනවා.. එදා ඔයා උදේ ඉදලම වැඩ කරලා හවස රුපියල් පන්සීයක් අරගෙන ගෙදරගියාලු.."

සම්මානි දිගින් දිගටම ඔහුව පුදුම කරමින් උන්නාය.. නමුත් ඈ කීවේ මෑතක සිදුවීමක් නොව.. මීට මාස තුනකට පමණ පෙර වූවක්ය..

"ඔයාට දිවැස් තියෙනවද සම්මානි.. ඔයා කොහොමද මේවා දන්නෙ..?"

"දිවැස් නෙමෙයි.. ඔයා එදා ඒ ගිහින් තියෙන්නෙ මගේ හොඳම යාළුවා.. නිරාශාගෙ අලුත් කඩේට.. එයා හවස අම්මා එක්ක කට්ටියට තේ අරගෙන එනකොට ඔයා පලංචියක් උඩ නැගලාඥාඩිය පෙරාගෙන වැඩලු.. ඔයා එයාව දැක්කොත් අඳුරගනියි කියලා එයා ඔයා ළඟට ඇවිත් නෑ.."

"කවුද නිරාශා කියන්නෙ.?"

ඇගේ සම්පූර්ණ කතාවට සවන් දුන් චෛතිය විමසුවේය..

"නිරාශා කියන්නෙ මගේ හොඳම යාළුවා.. අර එදා ඔයාට ෆෝන් නම්බර් එක දීලා ගියේ.."

"ආ.. නියුරෝනෙ නේද.?"

චෛතිය ක්ෂණිකව කීවේ කලන එදා ඇයට දැමූ නම සිහිපත් වූ නිසාය.. එහි තේරුම කුමක්දැයි සම්මානි ඇසූවට චෛතිය කලනගේ උපමාව ඇයට විස්තර කර පැවසුවේය.. ඒ ඇසුනු සම්මානි කිකිණි හඬින් හිනැහුණි..

"දැන් අම්මි එන වෙලාව ළඟයි චෛතිය.. එහෙනම් මං තියන්නද?."

ඔහු සමග කතා කරද්දී වෙලාව ගත වන බව නොදැනුන සම්මානි ඔරලෝසුව දෙස බලා බියපත් වුණි..

"තියන්න කලින් මං තව දෙයක් කියන්නද සම්මානි.. හැබැයි මේක නම් ඔයා දන්නවා වෙන්න බෑ.."

ඇ මෙතෙක් තමාව පුදුම කලා සේ ඇයවද පුදුම කිරීමේ ආශාවක් චේතියගේ සිතේ හටගත්තේය..

"එහෙනං ඉක්මනට කියන්නකො බලන්න.."

"ඔයා කිව්වා නේද අර මැරයො තුන් දෙනාට කවුද කට්ටියක් ගහලා කියලා.. අශේන්ටත් කවුද  කට්ටියක් ගහලා කියලා.. ඔයා දන්නවද කවුද ඒක කලේ කියලා.. ඒ හැමදේම කලේ මම.මමයි කලනයි.."

"මොනවා.."

ඇ එය ඇසූ තාලයට එය ඇයට අදහා ගත නොහැකි වූ බව චේතියට වැටහුණි.. ඔහු සිනා නැගුවේ ඒ නිසාය..

"හෝව්.. හෝව්.. හෝව්.. දැන් අම්මා එන්න ළගයි කිව්වා නේද.. එහෙනම් අපි හෙට කතා කරමු.. බුදු සරණයි.. පරිස්සමින් ඉන්න.. සතුටින් ඉන්න.."

ඇයට  තවත් කල්පනා කිරීමට කාලය දිය යුතු බව වැටහුණු ඔහු ඇමතුම විසන්ධි කලද ඒ   සැනින් නැවත ඇ ඔහු ඇමතිය.. එවරනම් කතාව මුල සිට අගටම පැහැදිලි කිරීමටචේතියට සිදුවුණි. අශේන් ඇතුලු පිරිසට පහර දුන් සිද්ධිය චේතිය හා කලන රංගට කීවේ ඔහු තරමක් සුව   ලැබුවාට පසුවය.. තමා වෙනුවෙන් තම මිතුරන් දෙදෙනා මෙතරම් අවධානමක් දරා තිබීම  ගැන රංගගේ සිතේ ඇතිව තිබුණේ දැඩි පැහැදීමකි..

"උඹලා නොකිව්වට එහෙනං ගානට රිටන් එක දීලා නේද..     ?  මං දන්නවා උඹලා මේ වගේ දේවල් කරන්නෙ මං හින්දා කියලා.."

රංග ඔවුනට මුව නොසෑහෙන ස්තුති කළේය.. කලන විශ්වගේ සැලැස්ම ගැන මා චේතියගේ විශිෂ්ඨ ගණයේ පහාරය ගැන රංගට පුන පුනා පැවසිය..

"උඹලා ගුටි බැට හුවමාරු කර ගනිද්දි දන්නවද මං මොනවද කලේ කියලා.. මං මේ ටිකේම ඇදට වෙලා මෙන්න මේ පොත් ටික කියෙව්වා.."

රංග තම පොත් මේසය මත වූ පුනර්භවය හා සම්බන්ධ පොත් ගොඩක් ඔවුන්ට පෙන්වද්දී කලන හා චේතිය පුදුමයෙන් මුහුණට මුහුණ බලා ගත්හ..

"එතකොට උඹ දැන් ඔය පුනර්භවය විශ්වාස කරනවද..?"

කලන විමසුවේ රංග මෙතෙක් කලක් එය පිළිගැනීමට මැලි වූ හන්දාය..

"ඔව් මචං.. අපි හැමෝම මේ සංසාර චක්රවය පුරාවට මැරි මැරී යළි ඉපදෙනවා කියන එක මං දැන් පිළිගන්නවා.."

"යකෝ.. මූ ගුටි කෑවට පස්සෙ හැදිලනෙ.. බලපංකො වචන ටික.."

කලන ඔහුට විහිළු කරද්දී රංග වෙනදා මෙන් ඔහු හා එකට එක කීමට ගියේ නැත..

"ඒක නෙමෙයි.. අපි විශ්ව අයියගෙ සෙට් එකටයි ත්රී විල් රත්නෙටයි ගෙන්නලා හොඳ බෝජන සංග්රවහයක් දෙමු.. මොකද කියන්නේ..

එවන් අදහසක් චේතියගේ සිතෙත් තිබුණද එම යෝජනාව ගෙන ආවේ රංගය..

"මටත් ඔකම හිතුනා බං.. ඒත් කැම්පස් සෙට් එකකට කන්න දෙනවා කියන්නෙ නන්නත්තාර වෙන වැඩක්.. අනික ගෙවල් වල මිනිස්සු උනත් බලයි දන්නෙ නැති එවුන්ට අඩගහලා කන්න දෙන්න අපිට පිස්සුද කියලා.."

"එහෙනං අපි මෙහෙම කරමු.. විශ්ව අයියට සල්ලි දෙමු යාළුවන්ට ට්රීබට් එකක් දෙන්න කියලා.. ඒක හොඳයිනෙ.."

චේතිය කී දෙයට අනෙක් දෙදෙනාම එකඟ වූයේ එය බාහිර ප්‍රශ්න වලින් බේරීමට ඇති හොදම පිළිවෙත වන බව දැන උන් නිසාය.. ඊටත් වඩා අශේන්ගේ මැරයන් ටවුමේදී ගුටි කෑවේ විශ්ව විද්‍යාල සිසුන්ගෙන් බව මුළු කුරුණෑගලම දැන උන් නිසා එම පිරිස කැදවා සංග්‍රහයක් දීම අවධානමකට අත වැනීමක් වැනි විය..

"උඹලා දෙන්නා ඒකට සල්ලි වියදම් කරන්න ඕනෙ නෑ.. මං සම්පූර්ණ වියදම දෙන්නම්.."

රංග කීවේ තමාට මුදල් ඇති නිසා පමණක් නොව මිතුරන් දෙදෙනා ඔවුන්ගේ ජීවිත පරදුවට තබා තමාට වූ හානියේ පළිය ගෙන තිබූ නිසාය..

"එහෙනං මං විශ්ව අයියට කෝල් කරලා විස්තරේ කියන්නම්කො.. උඹ හෙට ඉස්කෝලෙ එනවනේ.?"

චේතිය සමුගැනීමට පෙර රංගගේ පිටට තට්ටුවක් දමා කියද්දී ඔහු ඊට පිළිතුරු ලෙස හිස සැලිය..

******************************

රංග චේතිය හා කලන සමග එක්ව පසුගිය කාල සීමාවේ ඔහුට මග හැරුණු පාඩම් සියල්ල සටහන් කර ගත්තේය.. උසස් පෙළ විභාගය අත ළගටම පැමිණ තිබූ නිසා ඔවුන් පාසල් ගියේ සතියට දින දෙක තුනක් පමණි.. අන් හැමදාකම ඔවුන්ගේ කාලය ගෙවුණේ අමතර පංති වලට හා නිවසට වී පාඩම් කිරීමටය.. මෙසේ නිවසේ ගත කරන කාලය වැඩි වීම නිසා චේතියට තම නැගණිය මිහිරාවි හා ගත කිරීමට ලැබෙන කාලයද වෙනදාට වඩා වැඩි වූයේය.. ඔහු පසුගිය දින කිහිපයේ තමාට මග හැරුණු නිරීක්ෂණයන් සදහා එම කාලයම්ඩංගු කළේය..

"අම්මා.. ඔයා පිළි ගත්තත් නොගත්තත් අපේ චූටි කියන්නෙ ළමාතැනීගෙ පුනරුත්පත්තිය කියන එක මට සියට අනූවක් විතර

විශ්වාසයි.. ඒත්.. මට ඉතුරු ටිකත් හරියට හොයා ගන්න ඕනෙ අපෙ අම්මා.. ප්ලීස්.. ඒකට මට උදව් කරන්න.."

නැගණිය හා ගෙවූ කාලයේදී බොහෝ කරුණු කාරණා එක්රැස්කරගත් චේතිය අවසානයේ ඔහුගේ ගැටලු සියල්ල නිරාකරණය කර ගැනීමට මවගේ සහය පැතුවේය..

"මේ විභාගෙ කටේ තියාගෙන මොකටද දරුවො ආයෙත් ඕවා භාර අවුස්සන්නෙ.. ඔන්න ඕවා අමතක කරලා දාලා පාඩම් කරහං.."

"මං පාඩම් කරනවනෙ අම්මා.. ඒත් මේ ප්‍රශ්නෙ මගේ ඔළුවට හරි බරක්.. ඒ නිසා අම්මා දන්න දෙයක් තියෙනවනං මට කියන්න.."

චේතියගේ කතාවට මද වේලාවක් කල්පනා කල ගුණවතී කුස්සි කෑල්ලේ තිබූ ලී බංකුව රැගෙන විත් පුතු අසලින් ඉදගත්තාය.. මව දිගු කතාවකට අර අදින බව වැටහුණු චේතිය තම ජංගම දුරකථනයේ පටිගත කිරීමේ බොත්තම එබුවේ එම සාකච්ඡාව නතාලි අක්කාටද වැදගත් වේ යැයි සිතුණ හෙයිනි..

"උඹ දවසකුත් මට කීවනේ චූටිගෙ ජාතකෙන් ඇති වැඩක් නෑ කියල කතාවක්.. මං එතනින්ම පටන් ගන්නම්කො.."

කතාවට මුල පුරද්දී චේතියට සතුටක් දැණුනේ තමා අපේක්ෂා කලාට වඩා වැඩි යමක් මවගෙන් කියවෙන බව වැටහුණු නිසාය..

"පුතාලගෙ තාත්තා නැතිවෙද්දි පුතාට අවුරුදු අටක් නවයක් විතර ඇති නේද..? ඒ කාලෙ පුතාටත් මතක ඇතිනේ.. එතකොටනං මට හැමෝගෙම කරුණාව ලැබුණා.. කොටින්ම අපේ අප්පච්චිත් ඉදලා හිටලා තිරික්කලෙන් ගෙදරට ඕන බඩු භාණ්ඩ එව්වා.. ඒත් උන්දැලානං ආවෙ නෑ.. වලව්වෙ වැඩට හිටිය අන්දිරිස් අයියා එක්ක ඉදලා හිටලවත් ඇවිත් ගියේ නතාලි දුව විතරයි.. මොනවා උනත් ඒ කාලෙ ගල්කන්ද වලව්වෙ ඇත්තො උඹටයි මටයි පිටුපෑවෙ නෑ.. ළමාතැනී අපි ගැන හරියට හොයල බැලුවා.. වැඩිය ඕනෙ නෑ.. අපිට ඒ කාලෙ කෑම ටික පවා එව්වෙ ඒ ඇත්ති.."

චෛතිය කතාව අසා ඉන්නේදැයි දැන ගැනීමට මෙන් ඔහුගේ මුහුණ බැලූ ගුණවතී යලි කතාව ඇරඹීය..

"අපරාදෙ කියන්න බෑ ඇලිසත් ඒ කාලෙ හරියට උම ගැන හොයලා බැලුවා.. දැන් වගේ නෙමෙයි.. ඒ කාලෙ ඔය ඇතුගල හාමු හරියට ගං තුලානෙ කරක් ගහනවා.. ඒ යන ගමන තැඹිලි ගෙඩියක් එහෙම බීලා යන්න මෙහාටත් ගොඩ වැදුනු වෙලාවල් තිබුණා.. ඒත් අවුරුද්දක් දෙකක් යද්දි උන්දෑ මේ පැත්තෙ කැරකෙන එක තරමක් වැඩි උනා.. ඒ කාලෙ හාමු මහත්තයා ළමා තැනී එක්කත් හරි හරියට ගෝරි.. උඹටත් මතක ඇතිනෙ.."

චෛතිය හිස සැලුවේ මවගේ කතාවේ බොහෝමයක් කරුණු ඔහුගේ මතකයේ ලාවට තැන්පත් වී තිබූ හන්දාය..

"ළමාතැනී එක්තැන් උනාට පස්සෙ අපි දෙන්නා වැඩියම හිටියෙ වලව්වෙනෙ.. එතකොට මට දැණුනා හාමු මහත්තයා මගේ වටේ කැරකෙන විත්තිය.. මං කෝකටත් කියලා ඒ ගැන හේතු හාමි අයියටත් කියලා තිබ්බා.. ඊට පස්සෙ හේතුහාමි අයියා මාව ආරස්සා කොරන්ඩ වගේ හැම වෙලේම හිටියෙ ඇහැ ගහගෙන.. හාමු මහත්තයට ටිකින් ටික තේරුණා වලව්ව ඇතුලෙ ඉද්දි හේතුහාමි අයියයි, ළමාතැනියි නිසා මට ළංවෙන්න බැරි විත්තිය.. පස්සෙ උන්දෑ රාත්තිරියෙත් අපේ මේ ගෙවල් පැත්තෙ බඩවැටි අස්සෙ රිංගන්න ගත්තා.."

සිදුව ඇති දේ ඉවෙන් මෙන් වැටහුණු චෛතියගේ ගත වෙව්ලුම් කෑවේය.. ඒ නොදුටු ගුණවතී තම කතාව දිගටම කරගෙන ගියේය..

"මං මේ කියන දවස් වෙද්දි ළමාතැනිත් හොඳටම ඔත්පල වෙලා හිටියෙ.. මට මතක විදියට ඒසංධියෙ පුංචි හාමු උනත් හිටියෙ කොළඹ කොලීජියෙමයි.. නිකමටවත් අම්මව බලන්නකියලා ගමේ ආවෙ නෑ.. ඒ ඇත්තිට දරුවෙක් නැති අඩුව උඹයි මගෙ පුතේ.."

ඇ මදක් පහත් වී තම චිත්තයෙන් නෙත් කෙවෙනි පිසදාගෙන යළි කතාව ඇරඹිය..

"පාළු ගෙවල් වල වලං බිඳින්න කවුරුත් බය නෑ කියන්න වගේ දවසක් මං මේ ගේ ඇතුලෙදිම හාමු මහත්තයට කොටු උනා මගෙ පුතේ.. මේ ගේත් වලව්වටම අයිති එකක් වෙච්චි..උන්දැ ගමේ ලොකු හාමු වෙච්චි.. මං අසරණ උනා පුතේ.. කෑ කොස්සන් ගහලා උන්දැගෙ මූණෙ දැලි ගෑවා කියලා මොකෝ මට උඹවත් අරන් යන්න තැනක් තියෙන එකක්යෑ.. ඉතිං මං කට පියාගෙන උන්නා.. ඒත් ඒ පාහර මූණ බලන්න බැරි කමට මං වලව්ව පැත්තෙ නෑවිදින් හිටියා.. උන්දෑ හේතුහාමි අයියා අතේ කී දොහක්ම පණිවිඩ එව්වත් මං ඒවා ගාණකට ගත්තෙ නෑ.."

"ඒ කියන්නෙ හේතුහාමි මාමා දැනං හිටියද අම්මට උන කරදරේ?."

මව අසීරුවට පත්වන නිසා හරස් ප්රශ්න නෑසුවද චේතියට එයනම් නොඅසා සිටින්නට බැරිවිය..

"හාමු මහත්තයා කියලත් නෑ මගෙ හිතේ.. මං කියන්න ගියෙත් නෑ.. ඒ කාලෙ ඉඳලම හේතුහාමි අයියට ඒ ගැන සැකයක් තිබුණා.."

"ඉතිං..?"

"මං වලව්ව මග හැරියට උඹ ඒ කාලෙ හිටියෙ වලව්වෙමයි.. කොටින්ම ළමාතැනීගෙ තුරුලෙ.. ගේ අස්සට වෙලා කන්නෙ බොන්නෙ නැතුව අඩ අඩා ඉද්දි තමයි මට තේරුනේ මගේ බඩට දරුවෙක් ඇවිත් විත්තිය.."

තවම පාසල් යන වයසේ පසු වූ තම පුතුට මෙවන් කතාවක් පැවසීම කෙතරම් අසීරුදැයි ගුණවතීට වැටහුණෙන් ඇ මදකට නිහඩ වූවාය.. දහසක් ප්රශ්න හිත තුල තෙරපෙද්දී චේතිය තම මවගේ මුහුණ බලා උන්නේ ඇ ඉතිරිය පවසන තෙක්ය..

"ඊට  පස්සෙ මට මේ ජීවිතේ එපා උනා දරුවො.. මං නොකරපු වරදකට.. එක දවසකට උන දේකට..      මෙහෙම වෙයි කියලා මං හිතුවෙ නෑ.. මං ජීවිතේ නැති කරගත්තොත් උමට යන කල  දසාවක් නැති වෙන හිංදා මට නිදහසේ මැරෙන්නවත් පුළුවන් උනේ නෑ.. අන්තිමට ටික දොහක් යද්දි ගමේ හැමෝම දැනගත්තා මං ගැබ්බරයි කියලා.. උන් නොයෙකුත්  කටකැඩිච්ච කතා කියන්න ගත්තා.. මට එළියට බහින්න බැරි තත්වයක් තිබුණෙ.. එහෙම උන්නු දවසක තමයි උඹ අඬාගෙන ගෙදර දුවන් ආවෙ ළමාතැනී නැති උනා කියලා.."

මවගේ පැත්තෙන් ඈ මුහුණ දුන් සිද්ධිය නොදැන උන්නද චේතියට ළමාතැනී නැති වූ ඒ දවස අද මෙන් මතකය..

"ඊට  පස්සෙ මට වලව්වට නොගිහින් බැරි උනා පුතේ.. හාමු මහත්තයා කරපු පාහර වැඩේට අර  දේවතාවිගෙන් පළිඅරන් වැඩක් නැනෙ ඉතිං.. මං මරණෙ වැඩ කටයුතු වලට සහභාගි      උනා.. ඒත් පුදුමෙ කියන්නෙ ඊට පස්සෙ කවදාකවත් හාමු මහත්තයා නරක ඇහැකින් මං   දිහා බැලුවෙ නෑ.. ළමාතැනිත් නැතිකොට උඹව බඩගින්නෙ තියන්න බැරි කමට මං ආපහු  වලව්වටම සේන්දු උනා.. ඔය කාලෙ වෙද්දි මෙහෙ වෙච්චි කරුණු කාරණා අපේ අප්පච්චිලටත් ආරංචි වෙලා තිබුණා.. ඒකෙන් උනේ ඉදලා හිටලවත් එහෙන් ලැබිච්ච කෑම ඩිංගිත්ත නැති වෙච්ච එකයි.."

"ඉතිං.. නංගි ලැබුණ විස්තර කියන්නකො.."

"කෙල්ල  හම්බවෙන්න අමාරු උනෙත් මං වලව්වෙ වැඩ කර කර උන්නු වෙලාවක.. එදා හාමු  මහත්තයා තමයි මාව ඇලිසත් එක්ක ඉස්පිරිතාලෙට පිටත් කරලා ඇරියෙ.. කොහොමින්   කොහොම හරි දහදුකක් විදලා අන්තිමට ඔය හුරතල් කෙල්ල හම්බඋනා..

ඇත්තටම මගෙ පුතේ.. චූටිගෙ මූණ දැක්ක ගමන්ම මගේ මතකෙට ආවෙ ළමාතැනීව.. කෙල්ල උපන් දා  ඉදලම ඒ වගේ.. මං හිතාගෙන උන්නෙ ඒකි බඩේ ඉන්න සන්ධියෙ මං කල්පනා කළේම   ළමාතැනී ගැන නිසා කෙල්ල ඒ හැඩ හුරුකම ගත්තා කියලා.."

ගුණවතී ඒ කියමින් උන්නේ තම දුක්බර කතාවේදී ඈ ලද සොදුරුතම තිළිණය ගැනය..

"ළමාතැනි නැති උනාට පස්සෙ උඹ වලව්ව පැත්ත පලාතෙ ගියේ නෑ.. උඹ කැරකුණේම චූටිගෙ වටේ.."

"අම්මා එතකොට වලව්වෙ වැඩට ගියේ නැද්ද.. ? චූටිව එහෙ ගෙනිච්චෙ නැද්ද..?"

"කෙල්ලවනං ගෙනිච්චෙ නෑ පුතේ.. ඒකිගෙ සිරියාවන්තකම දැක්කම ඒකිගෙ අප්පොච්චා වෙච්චි හාමු මහත්තයා කෙල්ලව ඉල්ලයි කියලා මට බය හිතුනා.. අනික ඉතිං කෙල්ලගෙ මූණවරත් උන්දැගෙ ළමාතැනී වගේනෙ.."

"එතකොට අපිට කෑම බීම.?"

චෛතිය එදවස තමාට නොදැණුන බොහෝමයක් ගැටළු නිරාකරණය කර ගැනීමට තීරණය කළේය..

"කෙල්ල තරමක් ලොකු වෙනකල් වලව්වෙන් අඩුපාඩුකම් හම්බ උනා.. හේතුහාමි අයියා උනත් ගෙදරට බඩු මූට්ටු ටිකක් ගෙනත් දැම්මා.. අනිත් කෙනා ඇලිසා.. ඒකි විතරයි මගේ දුක සැප බලන්න ආව ගියේ..

ආ.. නතාලි දුව උනත් ඉදලා හිටලා කවුරු හරි එක්ක මේ පැත්තෙ ඇවිත් ගියා.. ඒකිත් පුංචි කමට ආවොත් කීයක් හරි මගේ අත මිට මොලෝනවා.."

චෛතිය මවගෙන් ඇසීමට බලාපොරොත්තු වූයේ නැගණියගේ බාල කාලයේ වූ සිදුවීම් වුවද මව මේ වන විට ඔහු නොදැන උන් වෙනත් කරුණු රාශියක් හෙළිකරමින් උන්නාය.. ඇතුගල හාමුට දාව තම මවට ලැබුණු දරුවා.. ඇතුගල හාමුගේම මිය ගිය බිරිදගේ යළි ඉපදීම විය හැකිදැයි චෛතියට මේ වන විට ගැටලුවක් පැන නැගී තිබිණි.. එවැන්නක් විමසනවා නම් විමසිය හැක්කේ පොඩි සාදුගෙන් බව

"උඹලා කොයි කවුරුත් කියනවා වගේ මගේ පුංචි එකීගෙයි ළමාතැනීගෙයි මොකක්දෝ සමානකමක් තියෙනවා කියලා මටත් ඒ කාලේ ඉඳලම දැනුණා පුතේ.. ඒත් චූටිගෙ තාත්තා හාමු මහත්තයම නිසා ඒ කතා එළියට යනවට මං කැමති උනේ නෑ.. එහෙම උනොත් දවසක ඒකිට පාරෙ බැහැලා යන්න බැරි වෙනවා.. ඒකයි මං හැම වෙලාවෙම ඒවා යට ගැහුවෙ.. කෙල්ලව උනත් වලව්ව පැත්තෙ ඇන්න ගියේ නැත්තෙ.."

"එහෙම ප්රතශ්නයක් වෙන්න මං ඉඩ දෙන්නෙ නෑ අම්මා.. මට චූටිගෙ එකම අයියා.."

චෛතිය එසේ කියද්දී ගුණවතීට සිහිපත් වූයේ අශේන් බේබි හෙවත් වලව්වෙ පුංචි හාමුය.. තම දියණියගේ සැබෑ සොයුරා මොවුන් දෙදෙනාගෙන් කවුදැයි ඈ සිතා බැලුවාය.. තමා චෛතියගේ හා මිහිරාවිගේ මවය.. ඇතුගල හාමු අශේන්ගේ හා මිහිරාවිගේ පියාය.. එසේ නම් තම දියණියගේ සොයුරා අශේන් නොවන්නේද.? ඉතිං.. ඈ පැටලැවිනි..

"අම්මා හිතන දේ මට තේරෙනවා.. මට වඩා සම්බන්ධයක් අශේන්ගෙයි චූටිගෙයි තියෙනවා නේද.. ? අනික ඒක ගිය ආත්මෙ ඉඳලා එන එකක්.. එයාලා කලින් අම්මයි පුතයි.. දැන් අයියයිනංගියි.."

චෛතියගේ දෑසින් කඳුළක් ගලා ගියේ ඔහුටත් නොදැනිමය.. ඒ කඳුළ දුටු ගුණවතීගේ සිත සසැලිණි..

"නෑ මගේ පුතේ.. චූටි අශේන්ගෙ කවුරුවත් නෙමෙයි.. ඒකි හැමදාටම උඹේ නංගි.. ඒකයි මං උමට කියන්නෙ ඔය යටගිය කතා හාර අවුස්සන්න එපා කියලා.. ඒකෙන් අපිට කාටත් සිද්ධ වෙන සෙතක් නෑ.."

නමුත් දැන් පමා වැඩිය.. මෙම අතුරු කතා කිසිවක් නොදැන උන් චෛතිය තම නැගණිය වලව්වේ ළමාතැනීගේ පුනරුත්පත්තිය බව තම

සමීපතමයන් හා කතා කර තිබිණි.. එය දැනටමත්රංග, කලන, නතාලි හා පන්සලේ හාමුදුරුවන් වැන අය දැන උන්නාය..

"මේ වලව්වයි ගේයි දාලා යන්න පුළුවන් කමක් තිබ්බා නං මං යනවා පුතේ.. එහෙමනං මේ යටගිය ප්රළශ්න ආපහු ඇතිවෙන්නෙ නෑ.. ඒත් අර පුංචි කෙල්ලවයි උඹවයි ජීවත් කරවන්නෙ කොහොමද මං.. ළිදට වැටිච්චි එකා ළිං කටින්ම ගොඩ එන්න ඕනෙ කියලා කියමනක් තියෙනවනෙ.. ඒකයි උඹ ලොකු මහත් වෙනකල් වලව්වට කඹුර කඹුර මං මේ පැලටම වෙලා උන්නෙ.."

ඇ දිගු හුස්මක් පිට කලේ තම මුවට පමණක් නොව සිතටද විරාමයක් අවැසි වූ හන්දාය..

"අම්මා බයවෙන්න එපා.. මේ දේවල් දන්නෙ මගේ යාළුවො දෙන්නයි නතාලි අක්කයි විතරයි.. එයාලා මට විශ්වාසයි.. ඒ නිසා අපි මේ ප්රලශ්නෙ වෙන විදියකට විසඳමුපුළුවන්නං චූටිට මේ දේවල් අමතක වෙන්න අපි එයාව මේ පරිසරයෙන් ඈත් කරමු.."

චෛතිය එය කීවේ නැගණිය නුවර බාලිකාවක නේවාසිකව තැබීමේ දිගුකාලීන අරමුණක් ඇතිවය.. ඈ අම්මාට හා තමාට කොතරම් බැදී සිටියද ඇගේ අනාගතය සාර්ථක කිරීමට නම් එය නොකර බැරිය.. එයටද තමාට පිහිට පැතිය යුතු වන්නේ නතාලි අක්කාගෙන්ම බව ඔහුට වැටහුණි..

"චූටිට උඹයි මායි නැතුව ඇහැ පියවෙයිද මගෙ පුතේ.. මොනව උනත් ඒකි දකින දකින හැමෝගෙම හිත යන සිරියාවන්ත කෙල්ල.."

ඇගේ කතාවට චෛතියට තම නැගණියගේ සුන්දර මුහුන මැවී පෙණුනි.. තම වියැකුණු කඳුළ යළි අළුත් වන වග දැනුන චෛතිය එය මවට වසන් කරනු පිණිස එතනින් නැගිට ගියේ ජංගම දූරකථනයේ පටිගත කල කතාවටද තිත තබමිණි.
චෛතිය සිය මව සමග කළ කතා බහේ හඩ පටය නතාලිට ඇසීමට අවකාශ ලැබුණේ දින දෙක තුනක් ඉක්ම ගිය පසුවය.. තම පුංචි අම්මා

ඇගේ හඬින්ම කරන ලද එම ප්රකකාශයන් තුළාතාලිට නම් සිතීමට බොහෝ කරුණු ගැබ්ව තිබිණි..

"පුංචි මේ අන්තිමට කරපු යෝජනාව ගැන බයවෙන්න දෙයක් නෑ මල්ලි.. චූටිගෙ තාත්තා ඇතුගලහාමු කියන එක අපි කාටවත් නොකිය ඉමු.. කිව්වත් වගේ ඒක දැනගත්තොත් නැති ප්රශ්න ඇති වෙන්න පුළුවන්.."

නතාලිව මුණ ගැසීමට නුවර ගිය චෛතියට ඈ කීවේ වැව රවුම වටා ඇවිදයන විටය..

"ඒත් අක්කෙ අපි පන්සලේ පොඩි සාදුට පොරොන්දු උනානෙ මේ ගැන විස්තර හොයාගෙන පන්සලට එන්නම් කියලා.. ඒ නිසා මේ පුනර්භවය ගැන කතාව එක සැරේ යට ගහන්න බෑ.."

චෛතිය කීවේ ඔවුන් පන්සලට යාමට දැනටමත් කල්පසු වූවා වැඩි බව සිහිපත් කරමිනි..

"ඒක යටගහන්න අවශ්යද නෑ මල්ලි.. මේක දැනට දන්නෙ අපි හතර පස් දෙනා විතරයිනෙ.. අපි අපි විතරක් එකතු වෙලා මේ ගැන හොයමු.. පිට අය දැනගන්නෙ නෑනෙ එතකොට.. අනික චූටිට හොස්ටල් එකක් බලන වැඩේ මං කරන්නං.. එයාව අපේ හයි ස්කූල් එකට දාන්න බැරිවෙන එකක් නෑ.."

"ඒක ඉක්මන් කරන එකනං කෝකටත් හොදයි අක්කෙ.. මමත් ඔය ගමේ ඉස්කෝලෙට යන කාලෙ අපේ දුප්පත්කමයි, අම්මගෙ මේ ප්ර ශ්නෙයි නිසා හරියට බැට කෑවා.. තාම චූටි පොඩි නිසා හොදයි.. එයාටත් තේරෙන වයස වෙද්දි ඔය ප්ර ශ්න අනිවාර්යෙන්ම එයි.. මං වගෙත් නෙමෙයි.. එයා කෙල්ලෙක්නෙ.."

චෛතිය තම පුංචි සොයුරිය ගැන කීවේ දැඩි ආදරයකිනි.. ඒ බව වැටහුණු නතාලි ඔවුනට උදව් කිරීමට දැඩිව අදිටන් කරගත්තේය..

"ලබන  සතියෙ මං අනිවාර්යෙන්ම පන්සලට යන්න එනවා.. ඔයා යාළුවො දෙන්නවත් එක්කගෙන     එන්න.. පුළුවන් උනොත් අපි ගුණවතී පුංචිවත් ගෙනියමු.. එතකොට කාගෙ කාගෙත්          හිත් සුද්ධයිනෙ.."

ඔවුන් දෙදෙනා කතා කරන අතරතුර නතාලිට දුරකථන ඇමතුමක් දුන් විශ්වද ඔවුනට එක්විණි.. ඔහු දුටු වහාම චෛතිය කළේ සුභද ලෙස අත් අල්ලා ගැනීමය..

"ඉතිං මස්සිනා.. කොහොමද.? කාලෙකට පස්සෙ නේද.?"

චෛතියට ඇසක් ඉගිමැරූ විශ්ව එසේ කීවේ ඔවුන් කුරුණෑගලදී මුණ ගැසුණු සිද්ධිය මෙතෙක් නතාලිට නොකී නිසාය..

"කාලෙකට පස්සෙ වෙන්නෙ කොහොමද..  ?  ඇයි ඔයාලා ළගකදි කුංෆු ෂෝ එකකට සෙට් උනේ.."

නතාලි ගත් කටටම අසද්දී චෛතියගේ පමණක් නොව විශ්වගේද ඇස් උඩ ඉන්දවිය.. එදා අශේන් ඇතුලු පිරිසට පහර දුන් සිද්ධිය ඈ දන්නවා ඇතැයි විශ්ව වුව නොසිතුවේය..

"මොකද දෙන්නා ඇස් ලොකු කරගෙන බලන් ඉන්නෙ?."

"ඔයා මොන කුංෆු ෂෝ එකක් ගැනද කියන්නෙ බබා?."

විශ්ව නොදරුවෙකු සේ නතාලිගේ මුහුණට එබුණු ආකාරයට චෛතියගේ මුවේ සිනාවක් ඇදුණි..

"මං  මෙච්චර කල් ඔයාගෙන්වත් ඇහුවෙ නෑ විශ්ව.. ඒත් ඔයාලා එකතුවෙලා කරපු ඒ වැඩේ මං දන්නවා.. මොකෝ මම වෙන කැම්පස් එකකයෑ.. මං ඔයාට මේ පොඩි එකාව සෙට් කරලා  දුන්නෙ උදව්වක් කරන්න මිසක් යුද්ධෙකට ගෙනියන්න නෙමෙයි.. කොහොම උනත් ඒකෙන් උනේ හොඳක් නිසයි මං මෙහෙමවත් කට වහගෙන හිටියෙ.."

නතාලි එම සිදුවීම ගැන බොහෝ තරහා ගෙන උන් බව දැනුණ චෛතිය වදනක්වත් දෙඩුවේ නැත.. නමුත් විශ්වට නම් කට පියාගෙන ඉන්න නොහැකි විණි..

"අනේ.. මූ හොඳ පොඩි එකා.. ඔයා දන්නෑ නතාලි එදා මං ඇති ඇති කියද්දි මූ තමයි උඩ පැන පැන හතර අතට නෙලුවෙ.. අපේ කැම්පස් එකේ සෙට් එකත් කොරවෙලා බලන් හිටියෙ.."

විශ්ව එය කීවේ කේලමක් කීමේ අදහසින් නොවුණද නතාලි චෛතිය දෙස රවා බැලුවේය..

"ඒ උනාට අක්කෙ ඒකෙන් පවක් උනේ නෑනෙ.. අපි නොදැන උනත් ගහලා තියෙන්නෙ පොලීසියට ඕනම කරලා හිටපු ගැන් එකකට.. උන් හෙන ජාවාරම් කාරයොලු.."

චෛතිය සම්මානිගෙන් දැන ගත් තොරතුරු වීරයා සේ කීවද එම කරුණු සියල්ලම නතාලි දැන උන්නාය..

"ඒක තමයි මං කිව්වෙ ඒකෙන් උනේ හොඳක් කියලා.. ඒත් නිකං හිතන්න.. උන් ඔය විදියෙ අය නම්.. උන් ළග ආයුධ මොනවහරි තිබුණා කියලා.. එහෙමනං මොකද වෙන්නෙ.? එහෙම උනානං විශ්ව මං මුලින්ම අල්ලගන්නෙ ඔයාව.."

නතාලි විශ්ව දෙසට දඹරගිල්ල උලුක්කරද්දී විශ්ව දෑත් එකතු කොට ඇයට වැන්දේය.. චෛතිය සිනා සිසී මේ සොදුරු යුවල දෙස බලා සිටියේ ආශාවෙනි..

"අපි මේ තරම් ප්ලෑන් කරලා ගේම දීලත්.. බලපං මස්සිනා.. අන්තිමට ක්රෙඅඩිට් එක ගියේ ෂෙරී විල් පාර්ක් එකට.. කොහෙද අර රත්නෙ කියන එකා ඕනෙ නැති බහුශ්රැකත ටෝක්කුම්මනේ.."

විශ්ව කීවේ මෙතරම් සමාජ සත්කාරයක් කලද එහි නම්බුව තම පිරිසට හිමි නොවීම ගැන සැබෑම ශෝකයෙනි..

"එහෙම උන එක හොදයි.. උන් මොන විදියකින් හරි ඉක්මනට එළියට එයි.. එහෙම ආපු දාක ඔය ක්රෙවඩ්ට් එකේ රිටන් එකනම් වරදින එකක් නෑ.."

නතාලි කල්පනා කල තරම් දුර දිග විශ්ව කල්පනා කර නොතිබිණ.. ඔහුට ඇවැසි වූයේ තම කොලුකාරකම් ගැන කීමට මිස බොරු නම්බුනාම ලබා ගැනීමට නොවේ..

"හරි.. හරි.. ඔය දෙන්නා එහෙනං පාඩුවෙ මේ බංකුවක් උඩට වෙලා මරාගන්න.. මට පරක්කු වෙනවා.. මං යන්නම්.."

චෛතිය දෙදෙනාගෙන් සමුගත්තේ සතුටිනි..

******************************

චෛතිය පාසලේදී කලනට හා රංගට තම මව සමග ඇති වූ කතාබහේ සාරාංශය පැවසුවේ ඔවුන් දෙදෙන තම ප්රාඇණසම මිතුරන් වූ හන්දාම පමණක් නොව තම මව පියෙකු නැති දරුවෙක් බිහි කළාය යන කතාව නිසා චෛතිය අපහසුතාවයට පත්වූ සෑමවිටකම ඔවුන් තම සහයට ළග උන් හන්දාය.. කොටින්ම නගරයේ පාසලෙන් එම කරුණ වසන් කිරීමට පවා උදව් දුන්නේ ඔවුන්දෙදෙනාය..

"ඒක මාර කතාවක්නෙ චෛති.. එතකොට උඹලගෙ අම්මට නංගි හම්බවෙන්න ඉද්දි ළමාතැනී ජීවත්වෙලා තියෙනවා.. ඒ කියන්නෙ ළමාතැනී උඹලගෙ අම්මගෙ කුසේ ප්රවතිසන්ධිය ලබලා තියෙන්නෙ කළලයට අඩුම ගානෙ මාසයක් දෙකක් ගෙවුනට පස්සෙ.."

චෛතියගේ කතාවට බැරෑරුම්ව සවන් දුන් කලන කීවේ තරමක පුදුමයෙන් වුවද එවන් ආකාරයේ කතා කිහිපයක් ඔහු කියෙව්වාද ඔහුට මතක තිබුණි..

"ඔව්.. ඒක එහෙම වෙන්න පුළුවන් කලන.. ඒවගේ පර්යේෂණයක් ගැන මං කියෙව්වා මේ ළගකදි.. ඒකෙ ඒ ළමයා ඉපදිලා තිබුණෙ එක්දාස් නවසිය අනූ හතරෙදි.. ඒත් එයා ඒ පෙර භවය ගැන කියපු

කෙනා මැරිලා තියෙන්නෙ එක්දාස් නවසිය අනූ පහේදි.. ඒක ටිකක් අස්වාභාවික තමයි.. ඒ උනාට ඒ ළමයා අර කලින් කෙනාගෙ විස්තර හරියටම කියලා තියෙනවා.. එයාගෙ ගේ තිබුණ තැන.. ගෙදරට යන පාර.. පවුලෙ අයගෙ නම් ගම්.. එයාලා ආස කරපු දේවල් පවා.. ඉතිං එහෙම බලාගෙන යද්දි ඒ ප්‍රයතිසංධියෙ වෙනසක් තිබුණත් ඒක බොරුයි කියන්න බැහැ.. අනික මචං පුදුමෙ කියන්නෙ මේක ලංකාවෙම රත්නපුරේ පැත්තෙ වෙච්ච සිදුවීමක්.."

චෛතියගේ කතාවට සාවධානව අසා උන් රංගද එය අනුමත කලේ තමාද මෑතක එවන් පොතක් ගැන කියවූවා සිහිපත් වූ බැවිනි..

"උඹෙ නංගිගෙ සිද්ධියෙදි අපි තාම දන්නෙ නංගි අශේන් ගැනයි වලව්ව ගැනයි කියන එකයි ලේස් ගවුම් වලට ආස එකයි වගේ සීමිත දේවල් ටිකක් විතරනෙ.. ඔය අපි පොත් පත් වල කියෙව්වා වගේ විශේෂ සිදුවීමක් මුකුත් නංගි කියන්නෙ නැද්ද.?"

අධ්‍යයනයට ඉතාම රසවත් වූ මෙම මාතෘකාව ඔස්සේ කරුණු සෙවීමට රුචි වූ කලන චෛතියගෙන් විමසුවේය..

"මටත් ඔය ගැන හරියටම දෙයක් දැනගන්න පුළුවන් උනේ දැන් සතියකට දෙකකට විතර කලින් තමයි.. චූටි මහා පුදුම කතාවක් කියනවා බං.. කොටින්ම එයා පුංචි කාලෙ අපේ අම්මට කතා කලෙත් ගුණවතී කියලලු.. අම්මා තමයි බැනලා බැනලා ඒක හරි ගස්සවලා තියෙන්නෙ.. මටත් කීප දවසක්ම චූටි පුතේ.. සුදු පුතේ කියලා කතා කලා.. මං නං හිතුවෙ එහෙම කිව්වෙ අම්මා කතා කරනවා ඇහිලා වෙන්න ඇති කියලා.."

"වෙන.."

"චූටිව ඉස්කෝලෙන් ගන්න ගිය දවසක මට එයාගෙ පංතියෙ ටීචර් හම්බ උනා.. එයා කියනවා අපේ චූටිට අනික් ළමයින්ට නැති මට්ටමේ දියුණු ඉංග්‍රීසි දැනුමක් තියෙනවලු.. අනික එයාගෙ හැසිරීම් හරිම වෙනස්ලු.."

"මොන වගේ වෙනසක්ද..?"

කලන කුතුහලයෙන් විමසිය..

"එයා වෙන ළමයි වගේ වැඩිය දඟලන්නෙ නැතිලු.. හරිම තැන්පත්ලු.. හරි වැදගත් විදියට හැසිරෙනවලු.. ඒ ටීචර් කියපු විදියට ඉස්කෝලෙ හැමෝම ගුරුවරු නංගිට මාරආදරෙයිලු.."

"ෂා.. එහෙනං ගමේ ඉස්කෝලෙ උඹට තිබුණ තැන නංගි දෙක වසරෙදිම අයිතිකරගෙන වගේ.."

රංග එසේ කීවේ ඔවුන් තිදෙනාද ගමේ පාසලට යන කාලයේ චේතිය ගුරුසිත් දිනා ගැනීමට දක්ෂ වූ හන්දාය..

"ඒක නෙමෙයි චේති.. උඹ මුලදි වෙස් මාරු කරගෙන ගල් කන්ද වලව්වට ගියේ උඹට මොනවද දැනගන්න ඕනෙ කියලනෙ.. උඹ කිව්වෙ උඹලගෙ පවුලට සම්බන්ධ මොකක්ද රහසක් ඒකෙ හැංගිලා තියෙනවා වගේ දැනෙනවා කියලා.. දැන් ඒ කුතුහලේ හරි නේද.. ? දැන් අපි හැමදේම දැනගත්තනෙ.. උඹේ නංගිගෙ තාත්තා ඇතුලග කාරයයි කියලා.. නංගි ළමාතැනීගෙයලි ඉපදීම කියලයි.."

"නෑ කලන.. එහෙම දෙයක් නෙමෙයි.. මට දැණුනෙ වෙනමම හැඟීමක්.. ඒත්.. ඒක මෙහෙමයි කියලා මට විස්තර කරන්න තේරෙන්නෙ නෑ.."

කලන කියාගෙන ආ දෙය අතරමග නතර කල චේතිය තම සිතැගි පැවසුවේ තරමක් කල්පනා බරවය..

"වෙන මොන මගුලක්ද බං.. තව මොනවද දැනගන්න ඕනෙ.. ? උඹලත් හදන්නෙ හොරෙන් හොරෙන් වලව්වට රිංගලා ඇතුගල කාරයගෙන් වෙඩි කන්නද..?"

රංග පැවසුවට චේතියගේ මුවේ සිනාවක් විසිරුණි..

"වෙඩි  කන්න හරි මං මේ පාර යන්නෙ හොරෙන් නෙමෙයි .. කෙලින්ම ගුණවතීගේ පුතා විදියට.. ඇතුගලයට බෑ මට චැලේන්ජ් කරන්න.. ඌ මොනවහරි කිව්වොත් මං මිනිහගෙ පට්ටන්දරේ මුළු ගමටම කියනවා.."

"උඹ හදන්නෙ උඩ බලාගෙන කෙල ගහගන්නද චේති?"

"එහෙම එකක් නෙමෙයි බං.. ගමේ මිනිස්සු හිතාගෙන ඉන්නෙ වලව්ව අයිති මිනිහට කියල.. අනික උගේ පුතාගෙ චරිතෙ ගැනයි.. මැරයන්ට ආරක්ෂා කරලා දීපු එක ගැනයි.. හැමදේම අපි දන්නවනෙ කලන.."

"මේ අහපං චේති.. උඹට දෙයක් දැනගන්න ඕනෙ නං ඔහොම වලියට බරවෙලා ගිහින් බෑ.. පොඩ්ඩක් දැහැමින් සෙමින් හොයලා බලපං.. එහෙම ගියොත් මිනිහා උඹට බකට් එක අදිනඑකක් නෑ.."

ඉක්මනින් තරහා ගන්න තම මිතුරා තවත් ප්‍රශ්නයක් දා ගනීවියැයි සැක සිතුනු දෙමිතුරෝ ඔහුව සන්සුන් කිරීමට උත්සහ දැරිය..

"දැන් මොනවද ඔය වලව්වට ගිහින් කරන්න හදන්නෙ?"

"මං  යන්නෙ හාමුව මීට් වෙන්න නෙමෙයි.. හේතුහාමි මාමව මුණගැහෙන්න.. එයා අපේ අම්මට  තාත්තට විතරක් නෙමෙයි.. පුංචි කාලෙදි මටත් හරිම හිතවත්.. මට එක සැරයක් මිනිහව කතාවට අල්ලගත්තොත් ඇති.. මට එයාගෙන් දැනගන්න දෙයක්තියෙනවා.."

කලන කුතුහලය මුසු දෑසින් චේතියගේ මුහුණට එබුණි..

"අපේ චූටි කීප සැරයක්ම වීරවර්ධන කියලා කෙනෙක් ගැන කිව්වා.. ඒත් එහෙම කෙනෙක්ව අපේ අම්මා දන්නෙ නෑ.. මට හේතු හාමිගෙන් දැනගන්න ඕනෙ ඒ කෙනා කවුද කියලා.."

"මොනවද නංගි කිව්වෙ.?"

"මිස්ටර් වීරවර්ධන හම්බවෙන්න යං කියලම කියනවා.. එයා ළඟ ලියුමක් තියෙනවලු.. ගිහින් ඒක අරන් එන්නලු.."

"ඉන්න තැනක් ගැන කියන්නෙ නැද්ද.?"

රංග දීප්තිමත් දෑසින් විමසුවේ කතාව කුතුහලාත්මක ඉසව්වක් කරා ගමන් කරන බැවිනි..

"ඉන්නෙ කොළඹලු.. කෝල් එකක් දීලා එන්න කියන්නලු.. ඒකයි මං හේතුහාමිගෙන් අහන්න යන්න හදන්නෙ.."

රංගට හා කලනට චෛතියගෙන් දැන ගැනීමට අවශ්‍ය දෑ මෙන්ම චෛතියට ඔවුන් දෙදෙනාට කීමට තිබූ දෑ ඔවුනොවුන්ගේ සිත් සතන් තුළම සඟවා ගැනීමට සිදු වූයේ විවේක කාලය අවසන් වන සීනුව නාද වූ නිසාය.
එදින නතාලි චෛතියලාගේ නිවසට ආවේ වෙනදා මෙන් තනිව නොව විශ්ව සමගය.. ඔහුව දුටු ගුණවතී මිදුලට බැස්සේ තරමක චකිතයකිනි..

"දුවේ.. මේ අර කියපු ළමයද.?"

ඈ නතාලිගෙන් විමසුවේ නිවස තුළ උන් මිහිරාවි හා චෛතිය මිදුලට බසිද්දීය..

"ඔවු පුංචි අම්මෙ.. මේ තමයි විශ්ව.. මෙයාව අපේ මල්ලි නං හොඳට අඳුරනවා.."

ගුණවතී විශ්වට සුහද සිනහවකින් සංග්‍රාහ කරද්දී මිහිරාවි දිව විත් නතාලිගේ අතේ එල්ලී ගත්තාය.. චෛතියද විශ්වට ළංවී ඔහුව නිවස තුළට කැඳවාගෙන ගියේ සුපුරුදුලෙංගතුකමිනි..

"පුංචි.. අද ඔයා වලව්වට නොගිහින් අපි එක්ක ඉන්න බැරිද.. ? අපේ මේ උදේම ආවෙ වැඩ ගොඩක් ඔළුවෙ තියාගෙන.."

නතාලි අක්කා සිය මවට නොකියා කියූ කතාව චෛතිය දැන උන්නාය.. ඈ අම්මාවද රංග හා කලනවද රැගෙන ගමේ පන්සලට යාමට ඔවුන් කතිකා කරගත්තේ දුරකථන ඇමතුම් හරහාය..

"අද නං  වලව්වෙ ඒ හැටි රාජකාරියක් නෑ දරුවො.. හාමුලා නුවර ගිහින්ලු.. හේතුහාමි  අයියා විතරයි ඉන්නෙ.. දවාලෙට උන්දැට බත් එකක් ගෙනිහිං දුන්නම ඇති.."

තේ පානයෙන් අනතුරුව ඈ සිය එකගතාවය ව්‍යංයගයෙන් පවසද්දී නතාලි තම අත් බෑගය හැර ෆයිල් කවරයක් අතට ගත්තාය..

"මල්ලිට මතකයි නේද මං කිව්වා ළඟදිම ඔයාලට තෑග්ගක් අරන් එන විත්තිය.. ඔන්න මං අද ගෙනාවා.. ආ පුංචි අම්මෙ.. ගන්න.."

නතාලි  සිනාසෙමින් පුටුවෙන් නැගිටිද්දී බියපත් දෙනෙත් දල්වා ගුණවතී පුටුවටම ඇලී   උන්නාය.. නමුත් නතාලි තමා ළඟටම විත් දෝතින්ම පිදූ එම ෆයිල් කවරය අතට    ගනිද්දී නම් ඇයව ඉබේටම නැගිට්ටවුනි..

"මේ මොකක්ද පුතේ..?"

"මේ තමයි මං මෙච්චර කාලයක් ලොකු අප්පච්චිලා එක්ක ෆයිට් කරලා ගත්තු පුංචි අම්මගෙ අයිතිය.."

ඈ කීවේ ජයග්‍රාංහී ලෙස සිනාසෙමිනි.. මෙවන් කතාවක් ගැන නතාලි අක්කා තමාටවත් නොකී නිසා චෛතිය සිය මව අත වූ ෆයිල් කවරය ගත්තේ දැඩි කුතුහලයෙනි..

"ඔප්පුවක්.. අක්කර හයක්.."

චෛතිය විස්මයෙන් මුමුණද්දී ගුණවතීගේ දෑස් නලලටම ගියේය.. පුංචි මිහිරාවිද පොඩිකමට සිය සොයුරා අත වූ ෆයිල් කවරයට එබී බැලුවේ විශ්වගේ මුහුණට සිනාවක්කැදවමිනි..

"අයියේ.. මගෙත් ලියුමක් තියෙනවා.. අපි මිස්ට වීරවර්ධන ළඟට යමු.."

ඔප්පුව  දෙස කුතුහලයෙන් බැලූ මිහිරාවි කී දෑ අසා එවර පුදුමයට පත්වූයේ නතාලි හා   විශ්වය.. ඈගේ පුනර්භව කතාව දන්නා විශ්ව

නතාලි දෙසට හැරෙද්දී නතාලි චෛතිය  දෙස ප්‍ර ශ්නාර්ථය මුසු දෑසින් බැලීය..

"ඒක තමයි අක්කෙ ඊළඟට හොයන්න ඕනෙ.. මම කියන්නම්කො.."

නැගෙණිය ළඟ තබා එය කතාකිරීම නුසුදුසු නිසා චෛතිය එය පසුවට කල් තබා ගනිද්දී ගුණවතී නැවත ඔප්පුව ඉල්ලාගෙන මුල සිට අගටම කියවා බැලුවේය..

"මේ අත්සන අප්පච්චිගෙනෙ පුතේ.. එතකොට මේ කජු ලන්ද මගේ නමට ලීවෙ අපේ අප්පච්චිද.?"

ගුණවතී නතාලිගෙන් විමසුවේ අදහාගත නොහැකි යමක් නෙත ගැටුණු විලසිනි..

"ඔව් පුංචි.. ඕක ලිව්වෙ ලොකු අප්පච්චි.. එයාම තමයි මට කිව්වෙ මේක පුංචිගෙ අතටම දෙන්න කියලා.. ඉන්නකො ටිකක්.."

ගුණවතී අස්වැසූ නතාලි පුටුවෙන් නැගිට ගොස් තම ජංගම දුරකථනයෙන් ඇමතුමක් ගත්තේ පිරිස බලාහිඳිද්දීමය..

"ආ.. පුංචි.. ලොකු අප්පච්චි කතා කරනවා.."

ගුණවති නැවත වරක් විස්මයෙන් මුව අයා ගනිද්දී නතාලි ඇගේ අත තිබූ දුරකථනය ගුණවතීට  පෑවාය.. ඈ එය ගත්තේ සැලෙන අතැගිලි වලිනි.. එය රැගෙන කණ තබා ගත්තද ගුණවතීගේ  මුව නම් එක වර විවර වූයේ නැත..

"චූටි මැණිකෙ.. ඔයා අහගෙන නේද පුතේ ඉන්නෙ?"

එහා  ඉමෙන් ඇසුනු වියපත් ගාම්භිර කටහඬට ගුණවතීගේ මුවින් ඉකියක් පිට වූයේද දෙනෙතින් කඳුළු රූරා වැටුණේද එක විටය.. 'චූටි මැණිකේ' ඒ ඇගි පියා එකල ඇයව  ඇමතූ සුරතල් නාමයයි.. ඒ හඬ නැවත දශක දෙකකට පසුව සවන් වැකෙද්දී ඇයට සිය  හැඬුම පාලනය කරගත හැකි වූයේ නැත..

"අප්පච්චි.. මට සමාවෙන්න අප්පච්චි.."

ඈ බොහෝ ආයාසයෙන් සිය හඬ අවදි කරද්දී චෛතියගේ දෑසඳ කඳුළු පටලයකින් වැසී ගියේය..

"චූටි මැණිකෙ සමාව ඉල්ලන්න ඕනෙ නෑ.. අපියි වැඩිහිටියො විදියට වැරැද්ද කලේ.. අපියි උඹව පිට එකෙක් ගාණට අතෑරලා දැම්මෙ.."

ඔහුගේ හඬ සිය සවන් පත් තුළට ග්‍රහණය කර ගැනීමට මෙන් ගුණවතී දුරකථනය සිය සවනට ළං කර ගත්තාය..

"උඹලගෙ අම්මගෙ මුරණ්ඩු තීරණ වලට ඔළුව නමලා මං වස වැරැද්දක් පුතේ කරගත්තෙ.. උන්දෑ දැන් ලෙඩ ඇඳේ.. මමත් දැන් යන්න ළගයි.. ඊට කලින් මට මෙච්චා එකලාසයක් කරලා දාන්න ඕනෙ උනා.. නතාලි දුව තමයි කිච්චෙ උඹලා හරියට කන්න විදියක් නැතුව දුක් විඳිනවා කියලා.."

කඩින් කඩ කතාව කියූ ගුණවතීගේ පියා මොහොතක් නිහඬව උන්නේය..

"අම්මා අකමැතිනං මට මේවා එපා අප්පච්චි.. මං පුළුවන් විදියකට පිරිමහගන්නං.."

ගුණවතී ඔප්පුව දෙසට දෑස් යොමා කියද්දී ඇගේ පියාගේ කට හඬ බිඳී ගියේය..

"එහෙම කියන්න එපා දරුවො.. මට යන ලෝකෙකටවත් සැනසීමෙන් ඇහැ පියාගෙන යන්න දෙන්න.. මං මැරුණ දාකට මූං මේකට කුලල් කා ගනී.. ඊට කලියෙනුයි මං මේවා එකලාසයක් කරලා දැම්මෙ.. උඹ දරුවො දෙන්නා එක්ක ඇවිත් ඔය ඉඩමෙ පදිංචි වෙයං.. ඕකෙ ගේ පොඩ්ඩකුත් තියෙනව නොවැ.."

"අම්මා තාමත් තරහින්ද අප්පච්චි.?"

"උන්දැව වෙනස් කරන්න අමාරුයි දරුවො.. ඒ උනාට ඒකෙන් කාරි නෑ.. උම දවසක දරුවො  දෙන්නත් එක්ක වලව්වට ඇවිදින් පලයං.. මට මැරෙන්න කලින් උඹේ මූණ දකින්න ආසයිවුටි මැණිකෙ.."

ගුණවතීගේ ඉකි බිඳුම විසල් වරුසාවකට පෙරලෙද්දී එහා ඉම උන් ඇගේ පියා ඇමතුම විසන්ධි කර දැමුවේ ඔහුටද හැඬුම් ආ බැවිනි..

"හරිනේ පුංචි.. දැන් ප්‍රශ්නෙ ඉවරයි.. ලොකු අප්පච්චිලට මේ දේවල් තේරුං කරලා දෙන්න මං ගොඩක් මහන්සි උනා.. දැන් මටත් සතුටුයි.. පුංචිලාට දැන් තමන්ගෙම කියලාතැනක් තියෙනවා.."

නතාලි  එම කතාව එතෙකින් නතර කලේ කතාව දිගින් දිගටම ගියහොත් පන්සලට යාමට සිතා උන්    ගමන මග හැරෙන හෙයිනි.. නතාලිට මුව නොසෑහෙන සේ ස්තුති කල චෛතිය, රංගට හා කලනටද දුරකථන ඇමතුම් දීමෙන් අනතුරුව මව හා නැගණිය පන්සලට යාමට සූදානම් කරගත්තේය..

ඔවුන් පස්දෙනා ගල් තලාව නැග පන්සල් භූමියට අවතීර්ණ වද්දි රංග හා කලනද වෑන්  රථයෙන් පැමිණ ඔවුනට එකතු වූහ.. කලනව දුටු විශ්ව ඔහුට අතට අත දී පිළිගනිද්දී      චෛතිය ඔහුට රංගවද හඳුන්වා දුන්නේය..

"අපි වැදලා ඉවරවෙලාම හාමුදුරුවො මුණ ගැහෙන්න යමු නේද පුංචි.."

නතාලි පෙරමුණ ගත්තෙන් හැමෝම ඈ අනුගමනය කර වන්දනාමාන කර ගත්හ.. රංග කලන හා එක්ව  ආවාස ගේ පැත්තට ගමන් ගත්තේ හේමවංශ පොඩි හාමුදුරුවන් කැදවාගෙන ඒමටය.. ඔවුන්        ධර්ම ශාලාවේ පාඩිගෙන බලාහිදිද්දී පොඩි හාමුදුරුවන් සමග පන්සලේ නායක හාමුදුරුවෝ වූ සීලරතන හිමියන්ද වැඩම කළහ..

පිරිස  නැගිට හාමුදුරුවන් දෙනමට වැඳ පසෙකින් හිද ගනිද්දී පුංචි මිහිරාවි අනෙක් අය   පුදුම කරවමින් නායක හිමියන්ගේ පය පාමුල සන්සුන්ව හිද ගත්තේය.. ඔවුන් පැමිණි   ආකාරය චෛතියගෙන් දැන

උන් හේමවංශ හිමියන් එය තම ලොකු හාමුදුරුවන්ට දැනුම්දී තිබිණි.. නමුත් මිහිරාවිගේ පියා ඇතුගල හාමු බව චෛතිය ස්වාමින් වහන්සේලාට කීවේ නැත..

පුනර්භවය යන වදන භාවිතා නොකල නායක හිමියන් මිහිරාවිය සාමාන්‍යය ලෙස සුහද කතා බහකට එකතු කර ගත්හ..

"චූටි දූ.. ඔයාට මේ පන්සල කලින් මතකද.?"

"එහෙමයි.. මං ඉස්සරත් මෙහෙ එනවනෙ හාමුදුරුවනෙ.."

ලොකු හාමුදුරුවන්ගේ කතාවට පුංචි දැරිය පරිණත ලෙස පිළිතුරු දෙද්දී සැවොම පුදුමයෙන් බලා උන්හ..

"ඉස්සර කිව්වෙ..?"

"වලව්වෙ ඉන්නකොට.."

"වලව්වෙ ඉන්නකොට තව කවුද එහෙ හිටියෙ.?"

"කලින්ම හිටියෙ අපි.. මං ඉස්කෝලෙ යද්දි ඇතුගල අන්කල්ලා පදිංචියට ඇවිත් හිටියා.."

ලොකු හාමුදුරුවන් සූක්ෂම ලෙස දැරියගෙන් කරුණු කාරණා විමසන ආකාරයත් පුංචි මිහිරාවි ගිරවියක සේ නොපැකිල ඒවාට පිළිතුරු දෙන ආකාරයත් දුටු පිරිස මවිතවිය..

"ඇයි ඇතුගල අන්කල්ලා එහෙ ආවෙ.?"

"අපේ වැඩිලා රට ගියානේ මල්ලිට බෙහෙත් ගේන්න.."

ඩැඩී කියන වදන ඇසී රංග හා කලන පුදුම වුවද ඉංග්‍රීසි නැඹුරුවකින් යුතු වූ ළමාතැනීගේ පවුලේ විස්තර දැන උන් සීලරතන හිමියන් පුදුම වූයේ නැත..

"ඊට පස්සෙ මොකද උනේ.?"

"මමත් මල්ලි බලන්න එක පාරක් ඉස්කෝලෙ නිවාඩුවට රට ගියා.. ඒත් ඉස්කෝලෙ යන්න ආපහු ආවා.."

ළමාතැනී රට ගොස් තිබූ කතාව මේ කියනා තුරු ගුණවතී පවා දැන උන්නේ නැත.. චෛතියට නම් ක්ෂණිකව සිහිපත් වූයේ නංගිගේ පංතිභාර ගුරුතුමිය ඈ ඉංග්‍රීසි බසට දක්ෂ බව කීතාවය..

"මල්ලිට මොකද උනේ.?"

"එයාට සනීප නැති උනානෙ.. ඔපරේෂන් කරන්නයි රට ගෙනිච්චෙ.. ඒත් මල්ලි මැරුණා.."

චෛතිය අදහා ගත නොහැකිව බලා උන්නේ පෙර දිනක ගල්කන්ද වලව්ව ගැන මවගෙන් අසා දැනගත් කතාව ඒ ආකාරයෙන්ම තම නැගණියගේ මුවින් පිටවද්දීය..

"එතකොට ඔයාගෙ ඩැඩී.?"

"මම්යි ඩැඩියි ඊට පස්සෙ ලංකාවට ආවා.. ඒත් ඇතුගල අන්කල්ලා වලව්වෙන් ගියේ නෑ.. එයාලා අපේ ඩැඩීලට බොරු කිව්වා.."

මිහිරාවි එය පැවසුවේ බිම බලාගෙන දුක්බර ඉරියව්වක් මවා පාමිණි.. හැමදෙනාම නිහඬව ඈ දෙස බලා උන්නද ගුණවතීගේ සිත නම් පුදුම තරම් නොසන්සුන් වී තිබුණි..

"මොනවද එයාලා කියපු බොරු.?"

එවර ප්‍රශ්න නැගුවේ මෙතෙක් නිහඬව උන් හේමවංශ හිමියන්ය..

"මමයි ගාමිණියි යාළුයි කියලා.."

ඈ ලැජ්ජාවෙන් තෙපලද්දී කලන චෛතියගේ මුහුණට එබුණේ ගාමිණී කවුදැයි දැනගැනීමටය..

"ගාමිණී කියන්නෙ ඔය හාමු.. ගාමිණී ඇතුගල.."

චෛතිය අශේන්ගේ පියාගේ නම කලනට කීවේ රංගටද ඇසෙන සේය..

"ඉතිං.. ඔයා ගාමිණීත් එක්ක යාළුවෙලා හිටියෙ නැද්ද?."

"නෑ.."

ලොකු හාමුදුරුවන්ගේ පැණයට ඈ පිළිතුරු දුන්නේ පෙර මෙන්ම ලැජ්ජාවෙන්ය.. ඒ දුටු විශ්වට සිනා නැගුණද නතාලි නම් සංවධානව එම ඉරියව් නිරීක්ෂණය කරමින් උන්නාය.. ඈ මේ සාකච්ඡාව මුල සිටම ජංගම දුරකථනයේ පටිගත කර ගැනීමටද අමතක කළේ නැත..

"ඊට පස්සෙ..?"

"මට ගාමිණීව බදින්න උනා.. ඊට පස්සෙ අපේ ඩැඩීලා ආපහු රට ගියා.."

"එතකොට ඇතුගල අන්කල්ලා.?"

නායක හිමියන් පුංචි දැරියගේ නෑකමෙන්ම විමසූහ..

"එයාලත් අපි බැන්දට පස්සෙ නුවර ගියා.."

"වෙන කවුද වලව්වෙ හිටියෙ.?"

"මමයි, ගාමිණියි, හේතුහාමියි තව වත්තෙ වැඩට ආව ගිය අයයි.."

තම ඥාති සොයුරිය සිය පූර්ව ජන්මය ගැන හොඳ මතකයකින් පසු වන බව දුටු නතාලිට දැනුණේ දැඩි විස්මයකි..

"වෙන කවුරුවත් හිටියෙ නැද්ද.?"

"මම හේතුහාමිට කියලා ධර්මෙව ගෙන්න ගත්තා.."

ගුණවතී දෑස් විදහා තම දියණිය දෙස බැලුවේ පුදුමයෙණි.. ළමාතැනී ධර්මතිලක නම් වූ තම සැමියාට ධර්මේ ලෙස ඇමතූ අයුරු ඇයට දැනුදු මතකය..

"ඇයි එයාව ගෙන්න ගත්තෙ.?"

"එයා ඉස්සර ඉදලම එහෙනෙ හිටියෙ.. එයා හරි හොදයි.."

මිහිරාවි එයා ලෙස හඳුන්වන්නේ තම පියාව බව වැටහුනු චේතිය පවා බලා උන්නේ ගල් ගැසීය..

"ධර්මෙ කියන්නෙ කවුද.?"

"හේතුහාමිගෙ යාළුවා.. එයා බැන්දෙ ගුණවතීව.."

ඈ එහිදී තම මව නමින් පමණක් ඇමතීම ගැන හේමවංශ හිමියන් පවා පුදුම විය..

"ධර්මෙ හිටියෙ කොහෙද.. ?"

"අපේ ගෙදර.."

මෙතෙක් පරිණත ලෙස පිළිතුරු දුන් ඇගේ මෙම ප්රපකාශයන් සමග නතාලිගේ මුවට සිනාවක් ගලා ආවේය.. ඈ අපේ ගෙදර ලෙස හැදින්වූයේ මේ භවයේ තමාගේ නිවස බව ඇයට වැටහුණි..

"ධර්මෙට මොකද උනේ.. ?"

"මැරුණා.."

"මොනව වෙලාද.. ?"

ඈ එයට පිළිතුරු දෙනු වෙනුවට ගුණවතීගේ මුහුණ දෙස මොහොතක් බලා උන්නාය.. ගුණවතී එවර තම දියණිය දෙස බලා උන්නේ ළමාතැනී දෙස බලන තරමේ ගෞරවයකිනි..

"දන්නෙ නෑ.."

බොහෝ වේලා නිහඬව උන් ඈ අවසානයේ දුන් පිළිතුර සැමගේ සැකයට පාත්‍ර වූවද ඈ ඒ පිළිබඳව ඉන්පසු වදනක්වත් දෙඩුවේ නැත..

"කවුද චූටි වීරවර්ධන කියන්නෙ.. ?"

දිගු වේලාවක් ගලා ගිය නිහඬතාවයට තිත තැබුවේ චෛත්‍ය විසිනි..

"ඩැඩීගෙ යාළුවෙක්.."

"එයා කොහෙද ඉන්නෙ.. ?"

වීරවර්ධන කතාවක් ඈදී ආවේ ඇයි දැයි නොදැන උන්නද හේමවංශ හිමියන් තවත් ප්‍රශ්නයක් නැගුවේ එය පසුවට වැදගත් වේ යැයි හැඟුණු නිසාය..

"එයා කොළඹ.. එයා ළඟ මගේ ලියුමක් තියෙනවා.."

ඈ නිවසේදී කී කතාව යළිත් වරක් පිරිස ඉදිරියේ පැවසූවේ සැම වුවේ කුතුහලයක් ඉතිරි කර තබමිනි..

"දැන් කෝ ඩැඩීලා.. ?"

"එයාලා රට ගියානෙ.. දැන් නං මැරිලද දන්නෙත් නෑ.."

"එතකොට කෝ ගාමිණී.. ?"

"ඔය ඉන්නෙ පුතත් එක්ක වලව්වෙ.."

සැවොම මිහිරාවි දෙස බලා උන්නේ ඈ සුරතල් බසින් කියන වැඩිහිටි කතා අදහාගත නොහැකි ලෙසින්ය..

"ඇයි ඔයා ගාමිණී එක්ක රණ්ඩු කලේ.. ?"

වලව්වේ අඩ දඹර ගැන හොඳාකාරව දැන උන් සීලරතන හිමියන්

විමසුවේ එකල ළමාතැනී ඒ පිළිබඳව තමා සමග කතිකාකර තිබූ බැවිණි..

"එයාට ගමේ ගෑණු හිටියා.. තව.."

ඇ මොහොතක් කල්පනා කරන්නට ගත්තාය..

"තව කිව්වා වලව්ව එයාගෙ නමට ලියලා දෙන්න කියල.."

"ඉතින් ලිව්වද.. ?"

"නෑ.."

සීලරතන හිමියන් ඒ ගැන වැඩිදුර නොවිමසුවේ වලව්වේ අයිතිය තිබුණේ ළමාතැනීට බව උන් වහන්සේ දැන උන් නිසාය..

"චූටි දූවට මේ සන්ධාර කුළුණ මතකද.. ?"

සන්ධාර කුළුණේ කතාව හේමවංශ හිමියන් චෛතියලාට කියූ බව නොදැන උන් නායක හාමුදුරුවෝ එය විමසුවේ මිහිරාවිගේ පිළිතුර දැන ගැනීමටය..

"ඔව්.. මේක හැදෙව්වෙ මං.."

"ඒ කොහොද.. ?"

"ඇයි මං හාමුදුරුවන්ට සල්ලි එව්වෙ.. ?"

"කා අතේද.. ?"

"හේතුහාමි අතේ තිස් දාහක් එව්වෙ.."

මිහිරාවි සිය පුංචි දෑස් ලොකු කර නායක හාමුදුරුවන්ට කීවේ උන්වහන්සේට එය අමතක වී ඇත්දැයි සැකයෙනි..

"ඇයි දූ වලව්වෙ ඉඳලා ගුණවතීලගෙ ගෙදර ආවෙ.. ?"

තමා ඉදිරියේ වාඩි වී ඉන්නා මෙම සිගිත්තිය වලව්වේ ජීවත්ව මියගිය ළමාතැනීගේ  පුනරුත්පත්තිය බව සීලරතන හිමියන්ට තව දුරටත් නැඹුරුව තහවුරු කරගැනීමට  අවශ්‍යයි වූයේ නැත.. එය මේ වන විට වඩාත් සවිස්තරව තහවුරු වී තිබිනි.. ඒනිසා   උන් වහන්සේ ඇසුවේ තමාට ඇසීමට තිබූ අවසන් පැනයයි..

"මං මැරුණනෙ.."

"මොනව වෙලාද..                                                    ?"

"ගාමිණී ගැහුවා.. ඊට පහුවෙනිදා තමයි මං මැරුණෙ.."

"කවුද එතකොට ඔයා ළඟ හිටියෙ..                                  ?"

මෙතෙන් නිහඬව උන් නතාලි විමසුවේ පිළිතුර දැන දැනමය..

"සුදු පුතානෙ.."

මිහිරාවි එය කීවේ චේතියගේ දෑස් දෙස සෘජුව බලමිනි.. ඒ බැල්මට චේතිය තිගැස්සී ගියේය..

මෙතෙක් බාහිරව සන්සුන්ව උන්නද ඇතුළතින් කැළඹී උන් ගුණවතී උන් නැතින් නැගිට සිය දියණියව තම උකුලට ගත්තාය.. ඇගේ දෑසේ වූයේ බොඳව ගිය කඳුළු පටලයකි..

"ගිය ආත්මෙ මෙයා කාගෙ කවුරු උනත් මේ ආත්මෙ මෙයා මගේ දරුවා හාමුදුරුවනේ.. මට මගේ කෙල්ලව නැති කරගන්න බෑ.."

ඈ කීවේ සැම දෙනාගේම සිත්වල අනුකම්පාවක් ජනිත කරවමිනි.. ඒ දුටු සීලරතන හිමියන් ගුණවතීගේ සිත සනසන්නට මඳ වේලාවක් දහම් දේශනා කලහ..

"එහෙනං චේතිය පුතා.. දැන් කට්ටිය එක්ක ගෙදර යන්න.. අපි පස්සෙ මේ ගැන වැඩි දුර කතා කරමුකො.."

සාකච්ඡාව නිම වී හිමිවරුන් දෙනම වැඳ පිරිස නික්ම යන්නට සැරසෙද්දී හේමවංශ හිමියන් චෛතියව පසෙකට කැඳවූහ..

"දැං මේ ගැන තව දුරටත් කතා කරන්න බෑ මල්ලි.. හෙට අනිද්දා දිහාට යාළුවො දේනනා එක්ක මේ පැත්තෙ ඇවිත් යන්නකො.."

"හොදයි පොඩි.. සාදු අපි එන්නම්.."

ඔහු සමුගත්තේ කැළඹුම, නොසන්සුන්කම, දෙගිඩියාව යන සියළුම හැඟීම් නොඅඩුව සිත්හි දරා ගනිමිනි.
සතියේ දින කිහිපයක් එක දිගට පාසල් හා අමතර පංති ගිය චෛතිය නිවාඩු ලද එම සෙනසුරාදාව යොදා ගත්තේ ගල් කන්ද වලව්වට ගොස් හේතුහාමි මුණ ගැසීමටය.. ඇතුගල හාමු හා අශේන් වලව්වේ නොමැති බව සැක හැර දැනගත් ඔහු එදින වලව්ව බලා පිටත් වූයේ මවටද පූර්ව දැනුම් දීමෙන් අනතුරුවය..

වෙනදා මෙන් බොරු කොණ්ඩ , උපන් ලප , ඇස් කණ්නාඩි වලින් තොරව සැබෑ ස්වරූපයෙන් පෙනී සිටීමට හැකි වූ නිසා ඔහුගේ සිතට යම් සැහැල්ලුවක් දැනෙමින් තිබුණි.. රංගලාසමග ගිය ලෙස වලව්වේ ඉදිරිපසින් නොගොස් ඔවු වලව්වේ වත්ත හරහා වැටී තිබූඅඩිපාර දිගේ පා එසවිය..

"කාවද ළමයො හොයන්නෙ.?"

පොල් වත්ත හරහා පැමිණි හේතුහාමිව ළඟට එන තෙක්ම නුදුටු චෛතිය තිගැස්සිණි.. ඔහු මොහොතක් හේතුහාමි දෙස බලා උන්නේ ඔහුට තමාව හඳුනාගැනීමට ඉඩ ප්‍රඹස්ථාව සලසීමට වුවද හේතුහාමිට චෛතිය හඳුනාගැනීමට හැකි වූයේ නැත..

"මාමට මාව අඳුරන්න බැරිද.?"

"මේ දරුවා.."

"මං ගුණවතීගෙ පුතා.."

"හප්පේ.. මට නිච්චි නැතිඋන තරමක්.. දැන් යස ඉලංදාරියෙක් නොවැ.."

හේතුහාමි ඔහුව සුහදව පිළිගනිමින් වලව්ව කරා රැගෙන ගියේය..

"උඹලගෙ අම්මා අද තාම මේ පැත්තෙ ආවෙ නෑ.."

"අම්මා දවල් වෙලා එයි මාමෙ.. මං මේ ආවෙ මාමව හම්බවෙන්න කියලා.."

වසර ගණනාවකට මෙම භූමියට පා නොතැබූ මොහු හදිසියේ පැමිණීම ගැන හේතුහාමිගේ සිතේ කුතුහලයක් ඉපදුණි..

"මේක නිකමට ආපු ගමනක් වෙන්න නං බෑ.. ළමාතැනීගෙ මරණෙන් පස්සෙ උඹ මේ පැත්තෙ නාවේ ඇයි පුතේ.?"

"ළමාතැනි නැතුව මට එහෙ එන්න හිතුනෙ නෑ මාමෙ.. අනික ලොකු හාමුයි අශේන් බේබියි උනත් එක විදියක්නෙ.."

චේතියගේ කතාවට මදක් සිනාසුන හේතුහාමි ඔහුව වලව්ව තුළට රැගෙන ගොස් පුටුවක හිඳුවා තමාද ඒ අසලින් වාඩි ගත්තේය..

"උඹත් උඹලගෙ අප්පොච්චා වගේම මුරණ්ඩුයි.. උන්දෑ හාමු මහත්තයා එක්ක ඉන්න බෑ කියලා කාලයක් මේ ගම් පලාතත් දාලා ගියා නොවැ.."

හේතුහාමි සිය සමීපතම සගයා වූ ධර්මතිලක ගැන කතා කලේ සැබෑම ලෙංගතුකමිනි.. නමුත් ඒ  පිළිබඳ දිගින් දිගටම කතා කිරීමට චේතිය මනාප වූයේ නැත.. ඔහුට අවැසි වූයේ ළමාතැනී මිය ගිය ආකාරය හා වීරවර්ධන යන තැනැත්තා ගැන දැනගැනීමට පමණි.. නමුත්   එකවර කාරණය හෙළි කළ නොහැකි නිසා ඔහු මොහොතක් නිහඬව උන්නේය..

"මොකක්ද දරුවො ඔය හැටි කල්පනා කොරන්ඩ කාරණේ.. ? බය වෙන්න කාරි නෑ.. මං විතරයි දැන් වලව්වෙ ඉන්නෙ.. කියහං.."

"මේකයි හේතු හාමි මාමේ.. මට දැනගන්න ඕනෙ ළමාතැනී නැතිවුණේ කොහොමද කියලා.."

චෛතිය ඉද්ද ගැසුවාක් මෙන් ඇසූ පැනයට හේතුහාමිගේ දෑස් විසල් විණි..

"ඒ ඇත්ති ගැන මොකටද උඹ හොයන්නෙ.? අනික පුතේ.. ළමාතැනී නැති උනේ උඹේ ඇස් පනාපිටමනෙ.."

"ඒක හරි මාමෙ.. ඒත් මං අහන්නෙ ළමාතැනීගෙ මරණෙට හේතුව.. ඒක ළමාතැනීගෙ අසනීපෙ නිසා උන දෙයක් නෙමෙයිනෙ.."

චෛතිය විමසුවේ පෙර දිනක පන්සලේදී නැගණිය කී කතාවකි.. ඈ කීවේ මරණයට හේතුව ඇතුගල හාමු තමාට පහර දීම බවයි.. ඉතිං.. එවැන්නක් සිදු වූවා නම් වලව්ව තුළම උන් හේතුහාමි එය නොදැන ඉන්නට කාරණාවක් නැත..

එසේ චෛතිය තමාගේ අන්තයෙන් මෙ පිළිබඳව සිතද්දී හේතුහාමි සිතින් අතීතය කරා ගමන් කරන්නට විය.. ඔහුට ළමාතැනී මිය ගිය දිනට පෙරදා රාත්‍රිගයේ ඇති වූ කලබගෑනිළිදු සිහියට නැගුණි.. තමා බඩ වියත රැකගෙන ජීවත්වෙන වලව්ව පාවා දීමට බැරිකමින් මෙන්ම තම දූකට සැපට ළග උන් සමීපතමයාගේ පුතුට බොරුවක් කීමට බැරිකමින් හේතුහාමි දෙලොවක් අතර තනි විය..

"හේතුහාමි මාමා ඔය තරමට කල්පනා කරන්නෙ ඒකෙ මොකක් හරි රහසක් තියෙන නිසානෙ.."

ඔහු කතාව කියනට හේතුහාමිව දිරිමත් කළේ මෙම කාරණය හරි හැටි දන්නා එකම පුද්ගලයා ඔහු පමණක් වූ බැවිණි..

"ඒ ඇත්ති නැති උන දාට කලින් දා රාත්තිරියෙ අපේ ලොකු හාමු බීගෙන ඇවිත් ළමාතැනී එක්ක රණ්ඩුවක් ඇල්ලුවා නං මට මතකයි පුතේ.."

"ඒ මොකටද..?"

"ඒ මේ ඉඩම් පලහිලව්වකට කොහෙද.."

ඔහු කීවේ මුසාවක් නොවේ.. දෙන්නා දෙමහල්ලන් රණ්ඩු වූ බැසෑ කරණය එය නොවුවද එය හේතුහාමි දැන උන්නේ නැත.. ඔහු දන්නේ උස්ව නැඟුණු දෙසබ් වලින් තම කණට වැටුණු කොටස පමණය.. ඒ කතාබහේදී ගුණවතී, ධර්මතිලක, අශේන්, ඉඩම් වැනි වදන් කීපය කිහිපවරක්ම ඇසුනද ඒවා නිරවුල් නොවූ නිසා හේතුහාමි එය චේතියට කීවේ නැත.. මොහු තරුණ කමට ඇතුගල හාමු සමග රණ්ඩුවකට පැටලුනෝතින් එය තමාටද පාපයක් වනුඇත..

"ඒකෙන් කමක් නෑ.. හාමු මහත්තයා ළමාතැනීට ගැහුවද?."

මේවා චේතිය දන්නේ කෙසේදැයි මෙන් පුදුමයෙන් ඔහු දෙස බැලූ හේතුහාමි අවසානයේ එය අනුමත කිරීමට මෙන් හිස සැලුවේය.. සැබැවින්ම ඔහු ඕනවටත් වඩා විවෘත වූවා නොව.. කිසියක් අදෘශ්‍යනමාන බලවේගයකින් ඔහු සියල්ල හෙලි කළා වැනිය..

"ඒ ඇත්ති මර ලතෝනි දෙන සද්දෙට මමයි මැද්දට පැනලා බේර ගත්තෙ.. හාමු මහත්තයා අර දහජරාව කටේ ගාගෙන මත් වෙලා හිටියෙ.."

ඇතුලග හාමු එලෙස ඇදේ උන් ළමාතැනීට යකඩ බටයකින් පහර දුන් අයුරු යළිත් සිහිපත් වද්දී හේතුහාමිගේ ගතේ හිරිගඩු පිපුණි..

"ඒකෙන් නේද ළමාතැනී නැතිවුණේ.?"

ඔහු රහස් පොලීසියෙන් විලස ප්‍රශ්න කරද්දී අසරණ වියපත් මිනිසා මදක් තැතිගත්තේය..

"එහෙමම කියන්න බෑ පුතේ.. ළමාතැනී ඒ කාලෙ කොහොමටත් දුර්වල වෙලානේ හිටියෙ.."

ඔහු පිළිතුරු දුන්නේ බයාදු ලෙසිනි.. නමුත් ඔහු ඇතුගල හාමුව සාධාරණීකරණය කිරීමට පිළිතුරු දුන්නද චේතියට ඊට වඩා තම නැගණියගේ කතාව විශ්වාසවන්ත විය.. ළමාතැනීගේ මරණයට හේතුව ඇතුගල හාමුම බව ඔහු මේ වන විට තදින් විශ්වාස කළේය..

"ළමාතැනි කළින් අසනීප උනේ ඇයි.. ? මං අහන්නෙ ඔය ඇදට වැටෙන්න තරම් ඔත්පල උනේ.?"

මිය යන විටද ලාබාල වියේ පසු වූ රූමත් ඇය අසනීප වූයේ ඇයි ද යන ගැටළුව චේතියගේ සිතේ කුඩා කාලයේ පටන්ම පැවතුණි..

"ඒකත් උනේ හාමු මහත්තයා නිසාමයි දරුවො.. ළමාතැනී කාමරේ මාරු කරලා පහළට ආ දා ඉඳලම ගුටි බැට ඉවරයක් නෑ.. අම්මා තාත්තත් මේ රටෙ නැතිව තනිවෙලා හිටිය ඒ ඇත්ති අන්තිම කාලෙ නරා දුක් වින්දෙ.."

"ඒ කිච්චෙ මාමෙ..?"

"දවසක් ඔය ගෑණු හුටපටේකට රණ්ඩු වෙලා ළමාතැනීට හොඳටෝට කෑගැහුවා.. ඒ ඇත්ති කිච්චා නුවර ගිහින් ඇතුගල හාමුගෙ මහ උන්දැලට මේ ගැන කියනව කියලා.. එදා ඇතුගල හාමු දොර පොල්ලකින් ඒ ඇත්තිට ගහපු පාර තමයි කොඳු ඇට පෙල ඔය විදියට බිඳිලා තියෙන්නෙ.."

මෙතරම් වසර ගණනාවක් පැවති රහසක් තමා හෙළි කළේ මන්දැයි හේතුහාමිටම වටහා ගත නොහැකි වුවද ඔහුට චේතියගේ තේජස් බව ඉදිරියේ බොරුවක් කීමට දිව නැමුණේ නැත..

"බලං යනකොට හාමු මහත්තය කියන්නෙ මිනීමරුවෙක්නෙ.. ගෙදර රණ්ඩුවකට ඔය විදියට ගහන්න ඒ මනුස්සයා මහා දරුණු කෙනෙක් වෙන්න එපැයි.."

"රණ්ඩුවකට කියන්නෙ ළමයො.. ඔය ඇලිසා ඉන්නවා නේද.. උන්දෑ තමයි ඒ කාලෙ උඹලගෙ අම්මා   එන්නෙ නැති දාට වලව්වෙ ඉවුම් පිහුම් කලේ.. කොහොමින් කොහොම හරි ඒකි වලව්වට   එන එක නතර කලේ බඩට දරුවෙකුත් ආවට පස්සෙයි.."

ඒ කතාවට චෛතිය මහත් සේ තැති ගත්තේය.. ඒ දුටු හේතු හාමි චෛතියගේ කණට ලංව මුමුණන්නට විය..

"ඇලිසගෙ ඔය බාල කෙලී අපේ හාමු මහත්තයගෙ කියල කටකතාවක් තියෙනවා.. උඹලගෙ අම්මත් ඕවා දන්නව මයෙ හිතේ.."

ඇතුගල  හාමු සල්ලාලයෙකු යැයි දැන උන්නද ගමේ ගැනුන්ව මෙතරම් අමාරුවෙ දැමූ වසලයෙකු   බව චෛතිය මේ වනතුරු දැන උන්නේ නැත.. ඔහු තම මවට කලා යැයි කියූ හානිය සිහිවී චෛතියගේ සිතේ නැවත තරහක් ඉපදුනි..

"මාමා දන්නවද වීරවර්ධන කියලා කෙනෙක් ගැන.?"

තමාට නැගෙන තරහව හේතු කොටගෙන ඇතුගල හාමු පැමිණියෝතින් ප්රහශ්නයක් වේයැයි හැගුණු චෛතිය ඉක්මනින් පිටව යාමට තීරණය කළේය..

"වීරවර්ධන කීවෙ..?"

චෛතියගේ මුහුණ දෙස කුතුහලයෙන් බැලූ හේතු හාමි මදක් කල්පනා කළේය..

"නෑ මට මතකයි ඒ කාලෙ ළමාතැනී මං එක්ක එහෙම නමක් තියෙන කෙනෙක් ගැන කියලා තියෙනව.. මට එයාව හොයාගන්න ඕනෙ.."

තම නැගණිය වසන් කල චෛතිය තමාගේ සිහියේ තිබූ කාරණයක් සේ හැගවිය..

"මට හරියටම නිච්චි නෑ පුතේ.. ඒත් මතක විදියට ඔය නම තියෙන හිතවතෙක් අපේ මුහන්දිරම් හාමුදුරුවන්ට නං උන්නා.."

හේතුහාමි නිවැරදි මගට පිවිසි හෙයින් චේතියගේ සිතට සතුටක් දැණුනද ඔහු එය එළිපිට ඇඟවූයේ නැත..

"ළමාතැනී කියපු විදියට නං මිස්ටර් වීරවර්ධන එයාලගෙ පවුලෙ හිතවතෙක් තමයි.."

"එහෙනං ඒ මහත්තයා වෙන්ටැති.. දන්න තරමින් උන්දැ නීතීඥයෙක්.."

"එයා මේ පැත්තෙ කෙනෙක්ද.?"

"ගම් පළාත නම් මෙහෙ තමයි.. ඒත් රස්සාවල් කලේ කොළඹ රටේ.. ඉස්සර මුහන්දරම් හාමුදුරුවො ඉන්න කාලෙ නං නිතර මෙහෙ ආවා ගියා.."

චේතිය  මොහොතක් කල්පනාවට වැටිණි.. ඔහු නීතීඥයෙකු නම්.. නැගණිය නිතර කී අර ලියුම  කිසියක් නෛතික වටිනාකමකින් යුතු වූවක් විය යුතුය.. එනිසා ඔහුට කිසියක්        සතුටුදායක කුතුහලයක් දැනෙන්නට විය..

"අනේ හේතුහාමි මාමෙ.. පුළුවන්නම් මට මිස්ටර් වීරවර්ධනගෙ ටෙලිෆෝන් නම්බර් එක හරි ඇඩ්රස් එක හරි හොයලා දෙන්න.. ලොකු උදව්වක්.."

ඔහුගේ ඉල්ලීමට හේතුහාමිද මද වේලාවක් කල්පනා කරන්නට වූ අතර අවසානයේ ඔහු ඉද උන් පුටුවෙන් නැගිට ගත්තේය..

"හරියටම කියන්න නං බෑ දරුවො.. ඒත් ඒක හොයලා දෙන එකෙන් මැරුනු ළමාතැනීමට සෙතක් වෙනවා නං මං උදව් කරන්නං.."

හේතුහාමි එය කීවේ ඉණ පටියේ ගසා තිබූ යතුරු කැරැල්ල සියතට ගනිමිනි.. ඔහු කන්තෝරු කාමරය දෙසට යතැයි චේතිය සිතා උන්නද හේතුහාමි ගමන් ගත්තේ ළමාතැනී අවසන්       කාලයේ උන් පහළ මාලයේ කාමරය වෙතය..

"මේක නිතර අරින්න හාමු මහත්තයගෙන් මටවත් අවසර නෑ.. ඒත් කාරි නෑ පුතේ.. උඹට ඕන කරන දේ ඔය ලාච්චුවලින් හොයා ගනිං.."

ළමාතැනී පරිහරණය කළ සියළු ලිපිගොනු විසල් බුරුත අල්මාරියක දමා අගුලු ලා තිබිනි.. චේතිය හේතුහාමි දුන් යතුරෙන් එය හැර හනිකට ලිපි පිරික්සන්නට විය..

"හාමු මහත්තයගෙ කාමරේ නැතුව ඇතිද මාමෙ.."

"ළමාතැනීගෙ සේරම දේවල් ඔතන තමයි තියන්නෙ.. විගහට බලන්න පුතේ.. දැන් හාමු මහත්තයලා මග එනවත් ඇති.."

හේතුහාමිගේ කතාවෙන් පසු චේතියගේ දෑත් වඩාත් කඩිසර විය.. ඔහු පොත් පත් සීරුවෙන් පිරික්සා බලා තමාට අවශ්‍ය යැයි හැගුණු දිනපොත් දෙකක්ද දුරකථන අංක හා ලිපිනයන් සටහන් කරන ළද සී ආර් පොතක්ද විශේෂ පුද්ගලයන්ගේ දුරකථන අංක සඳහන්වියාදපාරික කාඩ් පත් ඇතුලත් කවරයක්ද සියතට ගත්තේය..

"මාමේ මං මේ පොත් දෙක තුන තව දවස් කීපයකින් ගෙනත් දෙන්නම්.. කමක් නෑ නේද.?"

චේතිය මෙතෙක් කතා බහ කල විලාසයෙන් මිදී ලෙන්ගතුලෙස විමසද්දී හේතුහාමිට එපා කීමටනොහැකි විණි.. ඒ අවසරයෙන් පොත් කිහිපය තුරුලු කරගත් චේතිය හේතුහාමිට මුවනොසෑහෙන සේ ස්තුති කර වලව්වෙන් නික්ම ගියේය..

******************************

චේතිය ඇතුළු මිතරන් දෙදෙන මේ වන විට තම විභාගයටත් වඩා උනන්දුවෙන් මිහිරාවිගේ පුනර්භවය ගැන පර්යේෂණ කරන්නට විය.. තිදෙනා පාඩම් පොත් වෙනුවට වැඩි වශයෙන් කියවූයේ යළි ඉපදීම ගැන සඳහන්ව තිබූ පොත්පත්ය.. හේමවංශ මිහියන්ගේ ඉල්ලීම පරිදි ඔවුන් ඉඩ ලද සැනින් නැවත පන්සල කරා පා නැගුවේ මේ ගැන වැඩිදුර සාකච්ඡා කිරීමටය..

"එදා ඔයාගෙ නංගි කියපු දේවල් ගැන අපේ ලොකු හාමුදුරුවන්ට පුදුමයි මල්ලි.. උන්වහන්සෙ කිව්වා ආපහු ඔයාලා ආපු වෙලාවක උන්නාන්සෙට දැනුම් දෙන්න කියලා.. ඉන්නකො මං ගිහින් කියලා එන්නම්.."

සවස් භාගයේ පන්සල වෙත ළඟාවූ මිතුරන් තිදෙනා සුහදව පිළිගත් පොඩි හාමුදුරුවෝ ඔවුන්ව බෝ මළුවේ රඳවවා ගොස් ලොකු හාමුදුරුවන්ව කැටුව ආහ..

"මේ ළමයි ආපු එක හොඳයි.. කොහොමද එදා සිද්ධියෙන් පස්සෙ ළමයගෙ වෙනසක් නෑ නේද.?"

චෛතියගෙන් විමසූ ලොකු හාමුදුරුවන් ඔවුන් ආවාස ගෙය තුළට කැඳවාගෙන ගියේ නිදහසේ කතා කිරීමේ අමරුණෙනි..

"එදා ගුණවතී උපාසක අම්මා කලබල නොවුනා නං අපිට ඔයිට වඩා දෙයක් ඒ දරුවගෙන් දැනගන්න තිබුණා.. චෛතිය පුතා වෙන මුකුත් අහලා බැලුවෙ නැද්ද.?"

ලොකු හාමුදුරුවන් චෛතියගෙන් විමසද්දී ඔහු නැතැයි හිස සැලිය..

"අපේ අම්මා ඒ ගැන භාර අවුස්සනවට කැමති නෑ හාමුදුරුවනෙ.."

"එහෙම හිතන එක වැරදියි දරුවො.. ඒ ළමයා කියන දේවල් තරවටු කරලා නතර කරන එකෙන් වෙන්නෙ දරුවා අසනීප වෙන එක.. අනික කීයෙන් කී දෙනාටද තමන්ගෙ පෙර බවය ගැනකියන්න මතක තියෙන්නෙ.. ඒක හරිම දුර්ලභ දෙයක්.. ඒ විතරක් නෙමෙයි ලෝකෙ බොහෝමයක් පුනර්භව පර්යේෂණ වලදී ඔප්පු වෙලා තියෙනවා පෙර බවය ගැන සඳහන් කරන දරුවො අනිත් අයට වඩා සහජයෙන්ම බුද්ධිමත් කියල.."

"මමත් ඕක චෛතිය මල්ලිට පැහැදිලි කරා ලොකු හාමුදුරුවනෙ.. මිහිරාවි කියන්නෙ ඇත්තටම උසස් ගතිගුණ තියෙන දරුවෙක්.. දහම්

පාසලේදි උනත් එයාගෙ දැනුම බොහොම ඉහළ මට්ටමක තියෙනවා.."

පොඩි හාමුදුරුවන්ද තම අදහස් කතාවට එක් කරද්දී ලොකු හාමුදුරුවෝ එය අනුමත කිරීමට මෙන් හිස සැලූහ..

"ඔය දරුවන්ට මතක ඇතිනෙ එදා ඒ දැරිවි එයාගෙ පෙර භවයෙ අම්මයි තාත්තයි ගැන සඳහන් කරපු විදිය.. එයා කිව්වෙ මමී ඩැඩී කියල.. ඔය දරුවො දන්නවද දන්නෙ නෑ ඒ කාලෙවලව්වෙ ළමාතැනී එයාගෙ දෙමාපියන්නට කතා කලෙත් ඒ විදියට.."

රංග හා කලනද එම කතාව සාවධානව අසා උනනේ මවිතයෙනි..

"ඒ කාලෙ ඔය වලව්වෙ ඇත්තො හැඩ ගැහිලා උන්නෙ ඉංග්‍රීිසි පන්නෙට.. මං දන්න තරමින් ළමාතැනී ඉගෙන ගත්තෙ ඉංග්‍රීපසි මාධ්‍යටයෙන්.. පිටරටවල එයාලගෙ නෑදෑයො හිටියා..ඒකනේ පොඩි දරුවගෙ අසනීපෙ වෙලාවෙත් එයාව අරන් රට ගියේ."

"ඒක වෙන්න ඇති හාමුදුරුවනේ නංගි දැනුත් ඉංග්‍රීයසි භාෂාවට මේ තරම් දක්ෂ.."

චෛතිය සිය නැගණියගේ භාෂා දැණුම ගැන සීලරතන හිමියන්ට ප්‍රිකාශ කර සිටියේය..

"පෙර ආත්මෙ දක්ෂතා, පුරුදු මේ ආත්මෙට ගේන දරුවෙ ඕන තරම් ඉන්නවා.. ඔය විදියෙ පර්යේෂණ වල සීයට අනූවක්ම දරුවො පෙර ආත්මෙ මොකක් හරි දේකට මේ ආත්මෙත් නැඹුරුවෙනවා.."

"ඒ කිව්වෙ අපේ හාමුදුරුවනෙ.?"

මෙම විෂයට ඉතා උනන්දුවක් දැක්වූ කලන ලොකු හාමුදුරුවන්ගේ ප්‍ර කාශය සවිස්තරව විමසුවේය..

"මෙහෙමයි.. පෙර භවයෙ හමුදා නිලධාරීන් වෙලා හිටපු පුංචි දරුවො මේ ආත්මෙ කතා කරන්න පටන් ගන්න කලින් ඉදලම වෙඩි තියන

හැටි පෙන්නන්න පුරුදු වෙලා තියෙනවා.. සමහරු බහ තෝරන අවධියට ආවම කියනවලු ඒ වෙඩි තියන්නෙ ටෙරාලට කියල.. ඒ විතරක් නෙමෙයි එයාලා ගෙදර තියෙන කොට්ට වට කරලා බංකර හදනවලු.."

"ඔවු හාමුදුරුවනෙ.. කලින් ආත්මෙ ආබාධිත වෙලා හිටපු අය මේ ආත්මෙ හොඳ නිරෝගි වෙලා ඉද්දිත් හැරමිටි, අත්වාරු වගේ දේවල් ඉල්ලලා තියෙනව.. සමහර බොද්ධ දරුවෙ ඔළුවෙ තොප්පි දාගෙන, බිම ලේන්සු එළලා යාඥා කරපු කතා තියෙනව.."

කෙටි කාලයක් තුල මෙම ක්ෂේත්‍රනය ගැන මනා දැනුම් සම්භාරයක් එක් කරගත් රංගද කතාවටහවුල් විය.. මෙම මිතුරන් තිදෙනාගේ උනන්දුව ගැන මෙන්ම මෙම විෂය ගැන තිබූ පුළුල් දැනුම සීලරතන හිමියන්ගේ සිතට සතුටක් කැදවීමට සමත් විය..

"ඔය ළමයිගෙ දැනීම ගැන මට හරිම සතුටුයි.. මං හිතන්නෙ ඔයාලා තුන්දෙනාම ඉයන් ස්ටීවන්සන්, එඩ්ගාර් කේසි වගේ විද්වතුන් ගැන අහලා.. කියවලා ඇති.?"

එයට පිළිතුරු ලෙස තිදෙනාම හිස් සැලුවේ එවන් පොත්පත් රාශියක් මේ වනවිටත් ඔවුන් සතුව තිබූ නිසාය..

"ඔය ඉයන් ස්ටීවන්සන් කියන මහාචාර්යතුමා කීපවරක්ම ලංකාවට ඇවිත් ලංකාවෙ දරුවන්ගෙ පුනර්භව සිද්ධි ගැන පුළුල් ලෙස පරීයේෂණ කරලා තියෙනව.. එතුමා ජීවත් වෙලාහිටියනං මේ මිහිරාවි කියන දැරිවිගෙ පර්යේෂණේ උනත් අපිට සැකයකින් තොරව භාරදෙන්න තිබ්බා.."

හේමවංශ හිමියන් එසේ කීවේ මෙම පුනර්භව සිද්ධිය උන්වහන්සේට ඒ තරමටම විශ්වාසවන්ත එකක් වූ හන්දාය..

"මට පොඩි ප්‍රශ්නෙකට තියෙන්නෙ හාමුදුරුවනේ අම්මට චූටිව හම්බවෙන්න ඉද්දි තමයි ළමාතැනී නැතිවෙලා තියෙන්නෙ.. ඒක එහෙම වෙන්න පුළුවන්ද.?"

එවන් සිද්ධි තමා පොත පතින් කියවුවද එය තරමක් අස්වාභාවික වූ හන්දා චේතිය විමසා සිටියේය..

"එහෙම උන සිදුවීම් තියෙනව දරුවො.. දරුවෙක් පිළිසිඳගෙන කළලයට මාස කිහිපයක් ගත වුනාට පස්සෙ විතරක් නෙමෙයි මේ ආත්මෙ දරුවා ඉපදුනාට පස්සෙ පෙර භවයෙ කෙනා මැරුනු වෙලාවල් වලදිත් අති සාර්ථක විදියට කරුනු කාරණා ඔප්පු වෙච්ච පුනර්භව පර්යේෂණ තියෙනවා.."

සීලරතන හිමියන් එය විශ්වාසයෙන් කියූ නිසා චේතියගේ සිතට යම් අස්වැසිල්ලක් දැණුනි..

"මට තේරෙන විදියට ඔය දරුවා පෙර බවයෙ මොකක් හරි රහසක් තවම හිතේ හංගගෙන ඉන්නවා.. ඒක ඒ දරුවට මතක නෑ නෙමෙයි.. මතකයි.. ඒත් කියන්නෙ නෑ.. සමහර විට ඒක දැනගත්තම කාගෙ හරි හිත රිදෙයි නැත්තං ප්රශ්න ඇතිවෙයි වගේ දේවල් ගැන එයා හිතනවද දන්නෙ නෑ.."

නායක හාමුදුරුවෝ අවධාරණය කර ගත් වටිනාම කාරණය උන්වහන්සේ චේතියලාට හෙළි කලේ ඔවුන්ව පුදුමයට පත් කරමිනි..

"මටත් ඒක කලේක ඉඳලා හිතුනා අපේ හාමුදුරුවනේ.. ඔය ගල්කන්ද වලව්වෙ හැංගිච්ච මොකක් හරි රහසක් තියෙනව.. ඔබ වහන්සෙ කිව්වා වගේ සමහර විට ඒ ගැන අපේ නංගි දන්නවා ඇති.. මං ඒක කොහොම හරි හොයාගන්නවා.."

එසේ කී චේතිය තම නැගණිය කී වීරවර්ධන ගැන කතාව හා තමා වලව්වට ගොස් හේතුහාමි සමග කළ කතාබහ පිරිසට හෙළිකර සිටියේය..

"දැන් ඒ පොත්පත් වලින් ඔය කියන තැනැත්තගෙ තොරතුරු හොයාගන්න පුළුවන් උනාද.?"

"අනුමාන  කරන්න පුළුවන් විදියෙ ලිපිනයක් නම් හම්බවුනා හාමුදුරුවනේ.. මං හිතාන ඉන්නෙ නිවාඩු දවසක මේ දෙන්නත් එක්ක ගිහින් ඒ ගැන ටිකක් හොයල බලන්න.."

එම  දිනපොත් වල තිබූ ඇතැම් කරුණුද ළමාතැනී ගැන තමා සොයාගත් අනෙකුත් කරුණුද  හෙළිකල චෛතිය තම මවට ඇගේ පවුලෙන් ලද ඉඩම් ඔප්පුව ගැනද හාමුදුරුවන්ට හෙළිකළේය..

"ගුණවතී උපාසක අම්මට ඒ දේවල් ලැබෙන්න ඕනෙ දරුවො.. ඒ මනුස්සයා ඔහොම මුළු ගැන්විලා  හිටියට බොහොම උසස් පවුලක ගුණගරුක විදියට හැදුනු කෙනෙක්.. අනික   හරිම  වාසනාවන්ත තැනැත්තියක්.."

ලොකු හාමුදුරුවෝ චෛතියගේ මවගේ පවුල ගැන විස්තර දැන උන් බවක් ඔහු මෙතෙන් නොදැන උනි..

"ඇයි හාමුදුරුවනේ එහෙම කිව්වෙ.?"

"එහෙම කිව්වෙ ඒ තැනැත්තිට සැප සම්පත් භාග්‍ය්‍ය පිහිටලා තියෙන නිසා.. බලන්න ගුණ  ගරුක ස්වාමියෙක් ලැබුණා.. ඉගෙනීමට දක්ෂ හොද ජවයකින් යුතු පුතෙක් ලැබුණා..   වාසනාවන්ත දූ සිගිත්තක් ලැබුණා.. කාලයක් දුක් වින්දා තමයි.. ඒත් දැං ඉඩ කඩං වුනත් ලැබිලා තියෙනවනෙ.. ඒ ලැබීම ඔතනින් නතර වෙන්නෙ නෑ.. බලන්නකො තව ඉස්සරහට.."

තව ඉස්සරහට කුමක් වේදැයි නොපැවසුවද උන්වහන්සේ එය කීවේ දැඩි විශ්වාසයෙනි.. ඒ කතා බහෙන් අනතුරුව සමුගැනීමට මත්තෙන් චෛතිය තම නැගණියට නේවාසිකව අධ්‍යාපනය ලැබීමට ඇයව හොස්ටල් යොමු කිරීමේ අදහසද පවසා සිටියේය..

"ඒකනං කාගෙ උනත් බුද්ධිමත් තීරණයක්.. උපාසක අම්මටත් අවශ්‍ය දරුවව ඔය මානසික තත්වයෙන් මුදවන්නනං කරන්න තියෙන හොදම දේ ඒක.. එතකොට ටික කාලයක් යද්දි ඔය හැමදේම දරුවට අමතක

වෙලා යයි.. ඒ වගේම ඔය අනික් කයි කතන්දරත් ගම්මුන්ට අමතක වේවි.."

උන්වහන්සේ කී දෑ චේතිය මෙන්ම මිතුරන් දෙදෙනාද දැන උන් නිසා ඔවුන් හරස් ප්‍ර ශ්න ඇසුවේ නැත.. පිරිස පන්සලෙන් නික්ම යාමට සැරසුනේ සැදෑ අඳුර පන්සල් භූමිය ගිලගනිද්දීය..

"මේවට හිත යොමු කෙරුවයි කියලා පොතේ පතේ වැඩ මගහරිනවා එහෙම නෙමෙයි ඕං.. අක්කලා  අයියලා වගේම මලලිලා තුන්දෙනත් විශ්ව විද්‍යාඕලෙ යන්න ඕනෙ.."

"එහෙමයි හාමුදුරුවනෙ.."

ලොකු හාමුදුරුවන්ගේ අවසන් ඉල්ලීමද ඔවුන් එක සිතින් පිළි ගත්හ. ළමාතැනීගේ පොත්පත් ඩයරි පිරික්සූ චේතියට වීරවර්ධන යන අයගේ මූලික තොරතුරු සොයාගැනීමට අසීරු වූයේ නැත.. ඔහු ළමාතැනීගේ පියා වූ මුහන්දිරම්තුමාගේ සමීප හිතවතෙක් වූ  අතර ඔහුගේ පවුලේ නීතීඥයාද විය.. ඔහුගේ කොළඹ පිහිටි නිවසේ ලිපිනය සොයාගත් චේතිය එම නිසව සොයා යාමට සිතා.. ඊට පෙර නතාලිට ඇමතුමක් දුන්නේය..

"මල්ලි  ඔයා ඔය වැඩේට කාලෙ යෙදෙව්වා දැන් හොඳටම ඇති.. විභාගෙ ඇඩ්මිෂන් එන්නත් ළඟයි  නේද..? දැනට ඔය වැඩේ ටිකකට නතර කරලා මේ ටිකේ පාඩම් කරන්න.."

"මේ ගැන  හෙව්වා කියලා මං පාඩම් වැඩ පාඩු කරගන්නෙ නෑ අක්කෙ.. අපිව දැන් කැඩෙටින්  වලිනුත් රිලීස් කරලා තියෙන්නෙ.. දැන් ඉස්සර වගේ පාට් ටයිම් ජොබ් කරන්නෙත්නෑ.."

ඔහු කෙසේ හෝ කොළඹ ගමන යාමට අවැසි නිසා නතාලිට නිදහසට කරුණු පෑවේය..

"දැන් මොකටද පාට් ටයිම් ජොබ් කරන්නෙ.. අච්චර ආදායම් එන ඉඩමකුත් තියෙද්දි.."

ඇ ඒ සිහිපත් කලේ චෛතියගේ මවට පිය උරුමයෙන් ලැබුණු විසල් භූමි භාගයයි..

"අපි මෙහෙම කරමු.. ඔයා ඔය ඇඩ්‍රස් එක විශ්වට දෙන්න.. එයා බයික් එකේ ගිහින් තැන හොයාගනියි.. චූටි කියපු විදියට විශේෂ ලියුමක් තියෙනවනං අපිට බැරියෑ පස්සෙඑයාව මීට් වෙන්න.."

උසස් පෙළ විභාගය ළග නිසා නතාලි සිය ඥාති සොයුරාව රස්තියාදු නොකර ඊට පිළියමක් යෙදුවාය..

"හරි අක්කෙ.. මං විශ්ව අයියට ඒ ගැන කතා කරලා ඩීටෙල්ස් ටික දෙන්නං.. හැබැයි එයාගෙ ෆෝන් නම්බර් නං වැඩ කරන්නෙ නෑ.. ගිහිල්ලම තමයි බලන්න වෙන්නෙ.."

"එයා ඒක හොයාගනී මල්ලි.. වෙලාවක් තිබුණොත් මමත් යන්නං.. ඔයා මං කියපු විදියට වැඩ කරන්න.. මට ඕනෙ අපේ පරම්පරාවෙ මට පස්සෙ කැම්පස් යන කෙනා ඔයා වෙනවාදකින්නයි.."

ඇගේ ලෙන්ගතුකම චෛතියගේ සිතේ ශක්තිය වැඩි කිරීමට සමත් විය.. එනිසා ඊට පිටින් වැඩනොකළ ඔහු විශ්වට කතා කර එම වැඩය බාර දී අධ්‍යා පන කටයුතු වල නියැලුණි..

සති අන්ත නිවාඩු දිනයක විශ්ව ඔහුගේ මිතුරෙකු සමග මොරටුවේ පිහිටි එම ලිපිනයට හොයා ගියද ඔහුවන අදාල පුද්ගලයා හමු වීමට හැකි වූයේ නැත.. ඒ වන විට එම ලිපිනයේ පදිංචිව සිටියේ වීරවර්ධන මහතාගේ ඥාති පිරිසකි.. ඔවුන්ගෙන් වීරවර්ධන මහතාගේ නව ලිපිනය ඉල්ලා ගත් විශ්ව තවත් දිනක් වෙහෙසී කෙසේ හෝ ඔහුව මුණ ගැසුණි..

චෛතියගෙන් ඉල්ලාගත් තොරතුරු අනුව ළමාතැනී ලෙස හැදින්වූ අමායා ඉද්දමල්ගොඩ මහත්මියගේනම හා ගල් කන්ද වලව්ව ගැන කී සැනින් ඔවුනට ලැබුණේ උණුසුම් පිළිගැනීමකි..

"ඔයාලා මාව හොයාගෙන නාවත් මං ඔයාලව හොයාගෙන එන්න තමයි හිටියෙ.. ඒත් මට තව කාලෙ ඉතිරි වෙලා තියෙනවා.."

විශ්ව තමා චෛතියගේ ඥාති සොයුරෙකු ලෙස හඳුන්වා දුන් පසු වීරවර්ධන මහතා කීවේය.. ඒ ඇසි විශ්වගේ නෙතු පුදුමයෙන් විසල් වුණි..

"ඒ කිව්වෙ සර්..?"

වියපත් වුවද ප්‍රතාපවත් පෙනුමැති නීතීඥවරයාට විශ්ව ගරු සරුව ආමන්ත්‍රවණය කළේය..

"මට සර් කියන්න එපා පුතා.. මං දැන් රිටයර් වෙච්ච ලෝයක් කෙනෙක්.. මට අන්කල් කියලා කතා කරන්න.."

විශ්වගේ පිටට තට්ටු කළ ඔහු කීවේ සුහද ලෙස සිනාසෙමිනි..

"අපිට මේ දේවල් තනියම කතා කරන්න බෑ.. මෙතන අනිවාර්යෙන්ම චෛතිය පුතත් ඉන්න ඕනෙ.. මම කියන්නද මං ළඟදි දවසක කුරුණෑගල පැත්තෙ එනව පොඩි පෞද්ගලික වැඩකට.. මං ඒ ගමන් ඇවිත් ඔයාලව මුණ ගැහෙන්නම්.. හැබැයි දරුවො මට ගුණවතීලගෙ ගෙදරට නං එන්න බෑ.."

මෙම නීතිවේදියා නතාලිගෙ පුංචි අම්මාගේ නම කී හුරුපුරුදු ආකාරයට විශ්වට පුදුම සිතුණි..

"අන්කල් කැමති නං අපි මෙහෙම කරමු අපි කට්ටිය එහෙ පන්සලේදි මුණ ගැහෙමු.."

"අන්න ඒක නං හොඳ අදහසක් පුතා.. කොහොමටත් ස්වාමීන් වහන්සෙ නමක් වගේ කෙනෙක් සාක්කියට ඉන්න එක කෝකටත් හොඳයි.. එතකොට අනාගතේ එන්න තියෙන ප්‍රශ්න බොහෝ දුරට අඩුවෙන්න පුළුවන්.."

"මට තේරෙන්නෑ අන්කල්.."

"ඒ ගැන දැන්ම තේරුම් කරන්න විදියක් නං නෑ දරුවො.. දැනට කියන්න පුළුවන් ඔයාගෙ මල්ලි චේතිය ගොඩක් වාසනාවන්තයි කියන එක විතරයි.."

විශ්වට තම නව දුරකථන අංක සියල්ල ලියා දුන් වීරවර්ධන මහතා විශ්වගේ සිතේ කුතුහලයක් ඉතිරි කර තබමින් සිය සාකච්ඡාව නිම කළේය..

******************************

සම්මානි ගැන දහසකුත් එකක් සොඳුරු සිතිවිලි පහළ වුවද ඒවා සිත තුළම සගවා ගත් චේතියපාඩම් වැඩ වලට මුල් තැන දුන්නේය.. ඇයත් මෙවර උසස් පෙළ විභාගයට සූදානම් වන නිසා ඔහු නිතර ඇයට දුරකථන ඇමතුම් දීමෙන්ද වැළකී සිටියේය.. නමුත් ඔවුන් දෙදෙනා අමතර පංතියේදි මුණ ගැසීම නම් නතර වූයේ නැත..

මෙසේ කාලය ගෙවී යද්දී චේතිය නොඉවසිල්ලෙන් බලා උන් දුරකථන ඇමතුම විශ්වගෙන් ලැබිණි.. ඔහු කීවේ එදින සවස වීරවර්ධන මහතා චේතියලාගේ පන්සලට පැමිණීමට නියමිත බවය.. තමාද නතාලි සමග එම අවස්ථාවට සහභාගී වන බව කී විශ්ව චේතියගේ මිතුරන් දෙදෙනාද රැගෙන එන ලෙස දැනුම් දුන්නේය.. කලනට හා රංගට පණිවිඩය දී ඉන් නොනැවතුණු චේතිය සම්මානිටද මෙම අවස්ථාවට සහභාගී වන ලෙස ආරාධනා කළේය..

"මචං අපි උඹලගෙ අම්මවයි නංගිවයිත් ගෙනියමු.. අපිට එතකොට පුළුවන්නෙ නංගි එයාව අඳුරගනීද කියලා බලන්නත්.."

කලන කී කතාවට චේතිය කැමති වූයේ නතාලි සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුවය.. මෙම පුනර්භව කතාව යට ගැසීමට බලාපොරොත්තු වන නිසා එය තවෙකෙකු දැන ගන්නවාට චේතිය අකමැති වුවද නතාලි එයට විරුද්ධ වූයේ නැත..

සවස තුනට පමණ චේතිය තම අම්මා හා නංගි සමගත්.. නතාලි විශ්ව සමගත්.. කලන රංග සමගත් පන්සල් භූමියට ළගා වූ අතර.. සම්මානි සුපුරුදු ලෙස ඇගේ රියදුරු වූ සිරිල් මාමා සමග පැමිණුනි.. පන්සලේ පින්කමකට සහභාගී වන බවට බොරුවක් කී හෙයින් ඈ පැමිණ තිබුණේ සුදු ඇදුමින් සැරසීගෙනය..

"මේ අපේ බේබි හාමුට තීන්දු කරපු දැරිවි නේද පුතේ?."

චේතිය සමග සුහදව කතා කරමින් උන් සම්මානි වෙත පැමිණි ගුණවතී විමසුවේ අදහාගත නොහැකි ලෙසය.. සේනාධීර මහතාගේ දියණිය තමාගේ ලේලිය ලෙස පිළිගැනීමට කැමතිදැයි චේතිය දිනක් ඇසූ අයුරු ගුණවතීට සිහිපත් උනි.. ඈ උන්නේ කිසිවක් වටහාගත නොහැකි ලෙස කැළඹීගෙනය..

චේතියගේ මවට සුහද සිනාවක් පෑ සම්මානි තම මිතුරාගේ නැගණිය වූ පුංචි මිහිරාවි සිය ඔඩොක්කුවේ හිඳුවා ගත්තේය.. අශේන්ගේ උපන්දිනය දා මෙම පුංචි දැරිවි ඔහුගේ මුහුණ සිපගත් අයුරු සිහිවී සම්මානිගේ මුවේ සිනාවක් ඇඳුනි..

"අන්න චේති හාමුදුරුවො වඩිනවා.."

සීලරතන ලොකු හාමුදුරුවන් හා හේමවංශ හිමියන් පිරිස අතරට ළගා වද්දී උන් තැනින් නැගිට හාමුදුරුවරු දෙපලට වැද නමස්කාර කළහ..

"වීරවර්ධන මහත්තයා තවම ආවෙ නැද්ද දරුවනේ?"

කාරණාව දැන උන් ලොකු හාමුදුරුවෝ විමසද්දී පන්සල් භූමියට පැමිණි මෝටර් රථයක් තුරු සෙවනක නතර කරන ලදී.. ඉන් බැසගත් පුද්ගලයා හඳුනාගත් විශ්ව ඉද උන් තැනින් නැගිටිද්දී සැවොම එදෙස හැරී බැලූහ.. ඉන්පසු සිදු වූයේ කිසිවෙකුත් අපේක්ෂා නොකල දෙයකි.. සම්මානිගේ ඔඩොක්කුවේ හිද උන් මිහිරාවි ක්ෂණයකින් බිමට බැස ගත්තාය.. රථයෙන් බැසි වීරවර්ධන මහතා දෙස මොහොතක් බලා උන් ඈ එදෙසට දිව ගියේවිශ්වද පසු කරමිනි..

"අන්කල්.."

පුංචි දැරිවිය වීරවර්ධන මහතාගේ සුරතේ එල්ලෙද්දී ඔහු තැති ගැන්මට ලක් වූ අතර බලා උන් පිරිස පුදුමයට පත්විණි..

"මාව මතක නැද්ද.. මං අමායා.."

ඒ ඇසි වියපත් නීතිවේදියාගේ පමණක් නොව ස්වාමීන් වහන්සේලා දෙනමගේද මුව පුදුමයෙන් විවර විය.. මෙම පුනර්භව සිද්ධිය ගැන කිසිවක් නොදැන උන් ඔහු සිය තැති ගැන්ම මොහොතකට අමතක කර පුංචි දැරිවිය වඩාගත්තේ මෙය ඇ පුංචි කමට කළ හුරතල් වැඩක් ලෙස සිතමිනි..

"මහත්තයා මෙහෙන් ඇවිත් වාඩි ගන්නකො.. අපි නිවී සැනසිල්ලෙ කතා කරමු.."

හාමුදුරුවන්ට නමස්කාර කළ වීරවර්ධන මහතා තමා අත තිබූ ෆයිල් කවරය මේසය මත තබා මිටි අසුනක හිඳ ගනිද්දී මිහිරාවිද ඔහුට තුරුළුව ඒ අසලින්ම හිඳගත්තාය..

"මේ පුංචි දරුවා කාගෙද අපේ හාමුදුරුවනේ.. මෙයාගෙ නමත් අමායලු නේද..?"

ඔහු නායක හාමුදුරුවන්ගෙන් විමසිය..

"මේ දැරිවි ඉස්සර අමායා.. දැන් මිහිරාවි.."

ඔහු නැවතත් පුදුම වී මිහිරාවිගේ මුහුණ දෙස පරීක්ෂාකාරීව බැලුවේය.. ඔහුට සැනෙකින් අමායා ඉද්දමල්ගොඩ සිහියට නැගිණි.. අගේ ඡවි වර්ණය , මුහුණුවර, කැරලි හිසකේ.. ඒවා කිසිදු අඩුවක් නැතිව මැයටද පිහිටා තිබිණි..

"ඇත්තටම මේ කවුද හාමුදුරුවනේ.?"

"මේ තමයි මහත්තයො ඔය ගුණවතී නෝන මහත්මියගෙ දැරිවි.. මේ ඉන්නෙ චෛතිය පුතා.."

උන්වහන්සේ පිරිස හඳුන්වා දෙද්දී වීරවර්ධන මහතා චෛතියගේ හිසේ සිට පාදාංතය දක්වා බැලුවේය..

"ගුණවතී නෝනවයි චෛතිය පුතාවයි මං වරක් දෙකක් දැකලා තියෙනවා.. එතකොට පුතානං ගොඩක් පොඩියි මං හිතන්නෙ.."

"මහත්තයා මෙහෙ ඇවිත් ඇත්තෙ ළමාතැනි නැතිවෙන්න කලින්නෙ.. එතකොට නං චෛතිය පුතා ගොඩක් පොඩියි තමයි.."

"මෙයාගෙ තාත්තා ධර්මතිලකනං මාව හොඳට දන්නවා.. අමායගෙ තාත්තා ඉද්දමල්ගොඩ හාමු මෙහෙ ඉන්න කාලෙ මං නිතර ආව ගියා.."

ඒ කතා අතර තුර පුංචි මිහිරාවිය වීරවර්ධන මහතාගේ ෆයිල් කවරයේ වූ ලිපිගොනු පිරික්සනවා පොඩි හාමුදුරුවන්ගේ නෙත ගැටුණි..

"මොනවද දූ ඔයා හොයන්නෙ.?"

"මං අන්කල්ට දීපු ලියුම.."

ඇගේ පිළිතුරෙන් තෙවන වරටත් වීරවර්ධන මහතාගේ සිතේ කුතුහලයක් හට ගත්තේය.. ඔහුව තව දුරටත් වෙහෙස කිරීමට නොසිතූ සීලරතන හිමියන් ඇගේ පුනරුත්පත්ති කතාව ඔහුට කෙටියෙන් විස්තර කළේය..

"මේ වගේ කතා අහල තිබුණට.. පොත් පත්වලින් කියවල තිබුණට හැබැහින් මෙහෙම දෙයක් දකින්න වේවි කියලා මං හීනෙකින්වත් හිතුවෙ නෑ.. ඊටත් මගේ හොඳම යාළුවගෙ දුව ගැන.."

ඔහුගේ වදන් අමතකව ගියා වැනිය.. සිය කණ්නාඩි කූට්ටම මදක් බුරුල් කර නෙත් කෙවෙනි පිසදා ගත් ඔහු තමාට ළංව හිද උන් මිහිරාවිය උකුලේ හිදුවා ගත්තේය..

"මං ඉස්සරත් ගල්කන්ද වලව්වට ආවම අමායා ඉදගත්තෙ මගේ ඔඩොක්කුවෙ.. එයාගෙ මිලලි චෛතියට වඩා එයා මගෙත් එක්ක එකතුයි.."

"චෛතිය..?"

නිහඬව සංවාදය අසා ඉන්නවා යැයි තමාටම සපථ වූ කලනගේ මුව ඉබේම විවර විණි..

"ඔව්.. චෛතිය කියන්නෙ අමායගෙ මිලලි.. එයා තමයි ඉංග්ලන්ඩ් වලදි නැති වුණේ.."

චෛතියගේ ඇගේ හිරිගඩු පිපුනේ ඔහුටත් නොදැනිමය.. ඔහු තමා ළග උන් රංගගේ අත තද කර අල්ලා ගත්තේය..

"ඒ බවක් මට නිච්චි නෑ මහත්තයො.. මං අපේ පුතාට නම තිබ්බෙ අපේ මහත්තයා කියපු නිසා.."

ගුණවතී දෙනෙතේ කඳුළු පුරවා කියද්දී මිහිරාවි අමුතුම ඇසකින් සිය මව දෙස බැලුවාය..

"දරුවට ඒ නම තියන්න කියලා ධර්මෙට කිව්වෙ මම.."

මිහිරාවි කීවේ පුංචි දැරියකට උචිත නොවන ආකාරයේ ගාම්භීර ස්වරයෙනි..

"දූ දන්නවද මං අද ආවෙ ඇයි කියලා.?"

ඇය  සැබැවින්ම මියගිය අමායා ඉද්දමල්ගොඩ නම් ඇයට මෙම කාරණය මතක ඇතැයි සිතූ ඔහු  විමසුවේය.. ඔහුට අවැසි වූයේ මෙම කරුණ සැකයකින් තොරව ඔප්පු කර ගැනීමටය..

"අන්කල් ආවෙ අර ලියුම දෙන්නනෙ.."

ඈ කියූ ලියුම කුමක්දැයි අනෙක් අය නොදැන උන්නද වීරවර්ධන මහතා නම් එය දැන උන්නේය..

"එහෙනං ඒක ඔය ෆයිල් එකේ ඇති.. හොයලා ගන්නකො.."

කරුණු කාරණා ඔප්පු වීමෙන් තොරව කිසිවෙක් පිළි නොගන්නා තීක්ෂණ දැනුමෙන් යුතු වූ නීතිවේදියා මිහිරාවි මෙතෙක් පිරික්සූ ෆයිල් කවරයනොව තුනට නවන ලද අනෙක් ෆයිල් කවරය ඇගේ අත තැබුවේය.. එහි වෙන වෙනම අමුණන ලද ලියකියවිලි හතරක් පමණද විශාල ප්‍රමාණයේ ලියුම් කවර දෙකක්ද විය..

"මේ තියෙන්නෙ.."

ඈ අතට ගත්තේ වලව්වේ ළමාතැනී මිය යාමට පෙර ලියා තැබූ ඇගේ අන්තිම කැමති පත්‍ර යයි.. ඒ දුටු චෛතිය ඇතුළු පිරිට කුතුහලයක් දැණුනද වීරවර්ධන මහතාගේ දෑත් පවා සැලෙන්නට ගත්තේය.. ඔහුට දැන් නම් සැකයක් වූයේ නැත.. මේ තමාගේ මිතුරාගේදියණියම බව.. අමායා ඉද්දමල්ගොඩගේ යළි ඉපදීම බව ඔහු සැකයකින් තොරව පිළිගත්තේය..

"ඔය ලියවිල්ල මොකක්ද මහත්තයො.. ? ඕක ඇත්තටම අපේ වලව්වෙ ළමාතැනි ලියපු එකක්ද.?"

මෙවන් සුවිශේෂී අවස්ථාවකට තමාගේ පැවිදි දිවියේදී පමණක් නොව තමාගේ මුළු ජීවිත කාලයේදීම මුහුණ නොදුන් සීලරතන හිමියන් පවා විමසුවේ සැලෙන හඬිනි..

"මේක අමායා ඉද්දමල්ගොඩගෙ අන්තිම කැමති පත්‍රණය අපේ හාමුදුරුවනේ.."

චෛතිය ඉද උන් පුටුවෙන් නැගිට්ටෙන්නට ගිය තැන දෙපස උන් රංග හා කලන ඔහුව නැවත ඉන්දුවේය.. සිතට දැණුන වික්ෂිප්ත හැඟීම දරාගත නොවුණු සම්මානි තමාගේ ළග උන් නතාලිව මෙතෙක් දැන හඳුනාගෙන නොඋන්නද ඇගේ අත තද කර අල්ලා ගත්තේය..

"මෙතන සාක්ෂියට ඕනවටත් වඩා අය ඉන්න නිසා මට මේක කියවන්න අවසර තියනවා.. ඒත් මට අමායනං කිව්වෙ චේතිය පුතා ඉස්කෝලෙ ගිහින් ඉවර වෙනකල් හරි.. වෙන යම් විශේෂ සිදුවීමක් වෙනක්ල හරි මේක ප්‍ර සිද්ධියට පත් කරන්න එපා කියලා.. කොහොමටත් මේකෙ කොපි අපේ සාක්ෂිකාරයො ළග විතරක් නෙමෙයි අමායගෙ අම්මා ළගත් තියෙනවා.."

ඔහු තම පියා ගැන සදහන් නොකළේ මන්දැයි සැක සිතුණු මිහිරාවි ඒ ගැන විමසා සිටියාය..නමුත් ඇගේ පියා.. දැන් ජීවතුන් අතර නොමැති බව කීමට දිව නොනැමුණු ඔහු එයනෑසුනු විලස ලිපි ගොනුව දිග හැර ගත්තේය..

"අපේ හාමුදුරුවරු දෙනමත් සාක්කියට ඉන්න නිසා මං මේක දැනට කියවන්නං.. ඒත් මට මේ ලියකියවිලි නීත්‍යා නුකූලව භාර දෙන්න පුළුවන් වෙන්නෙ මේ දරුවගෙ විභාගෙන්පස්සෙ.."

ඔහු අමායාගේ අවසන් ඉල්ලීමට පිටින් යා නොහැකි නිසා එය මූලිකවම ඉදිරිපත් කර සිටියේය..

"ඇයි මහත්තයො අමායා නෝනා අන්තිම කැමති පත්‍ර යක් ලිව්වෙ?. අසනීපෙන් උන්නා මිකස ඒ ඇත්තිට ඒ හැටි වයසක් තිබුණෙ නැහැනෙ..?"

නතාලිගේ සිතේ මෙතෙක් කැකෑරෙමින් තිබූ පැනය වීරවර්ධන මහතාට ඉදිරිපත් වූයේ පොඩි හාමුදුරුවන්ගේ හඩිනි..

"ඔය ඇතුගල හාමුලා හරි එක විදියක අය හාමුදුරුවනේ.. අමායාගෙ දෙමව්පියො රට ගියාටපස්සෙ මං උනත් එහෙ ආවෙ ගියේ නැත්තෙ ඒ නිසා.. ඒ උනාට අමායා මට ඉදලා හිටලාකතා කරා..

අන්තිම කාලෙ ඔය ගාමිණී ඇතුගල අමායට නොසෑහෙන්න වද දීලා තියෙනවා.. කීප සැරයක්ම පහර දීලත් තියෙනවා.. කොයි වෙලාවෙ හරි එයාගෙ ජීවිතේ ගාමිණී අතින් නැතිවෙයි කියලා එයාට ලොකු බයක් තිබුණා.."

එම කතාවට සාවධානව කන් දුන් මිහිරාවි තමා මිය ගියේ ගාමිණී ඇතුගලගේ පහර දීමකින් බව ඔහුට හෙළි කළාය.. එම කතාව මීට පෙර දැන උන් අනෙක් අය පුදුම නොවුනද වීරවර්ධන මහතා ඉන් බොහෝ කැළඹුනි..

"මට ඔය ගැන නීතිය පැත්තෙන් කරන්න පුළුවන් හැමදේම මං කරනවා.. අමායා මට මගේ දරුවෙක් වගේ.. මං අනිවාර්යෙන්ම එයාට සාධාරණේ ඉෂ්ඨ කරනවා.."

"එහෙනං මහත්තයො ඕකෙ තියෙන කරුණු කාරණා කෙටියෙන් කියමුකො බලන්න.."

ලොකු හාමුදුරුවන්ට ගෞරව පූර්වකව හිස නැමූ වීරවර්ධන මහතා යළිත් එම ලියවිල්ලට දෙනෙත් යොමු කළේය..

"ඔය ඉද්දමල්ගොඩ හාමුලට මෙහෙ විතරක් නෙමෙයි ලම්පොල පැත්තෙත් ඉඩකඩම් තිබුණා.. තව මඩ ඉඩම් අක්කර ගණනාවකුත් තිබුණා.. ඒ දේවල් සේරම අයිති අමායගෙ අම්මා තාත්තට.. ඒ අම්මා තවම ජීවතුන් අතර ඉන්න නිසා අපිට දැන්ම ඒ ඉඩකඩම් බෙදීමක් කරන්න බෑ.. ඒත් මේ ගල්කන්ද වලව්වයි ඒ වලව්වට අයිති අක්කර ගණනාවක ඉඩමයි අමායගෙ විවාහයෙදි එයාගෙ දෑවැද්දට ලියලා දුන්නා..

ඇත්තම කියනවනං ලියලා දුන්නා නෙමෙයි.. දෙන්න උනා.. ගාමිණී ඇතුගලගෙ දෙමව්පියො මේ කසාදෙ කරෙත් මේ ඉඩකඩම් වලට තිබුණ තණ්හාවට තමයි.. කොහොම හරි අමායා අවුරුදු තිහක් වෙන්නත් කලින්ම එයාගෙ ස්වාමි පුරුෂයගෙන් ගුටි කාලා ඔත්පල උනා.. ඒ වෙලාවෙදි උනත් එයා මට නීතිමය පියවරක් ගන්න ඉඩ දුන්නෙ නෑ එයාගෙ පුතා ගැනහිතලා..

ඒත් ඒ දරුවත් උස් මහත් වෙද්දි අම්මව නොසලකා හැරියා.. එයා හැදුනෙ තාත්තගෙ පදේට.. කොටින්ම ඔය ගාමිණී ඇතුගල අමායගෙ නැති වැරදි කියලා පුතාගෙ මනසට විස පෙව්වා.. ඒකෙන් තමයි

අම්මයි දරුවයි ඇත් උනේ.. එක්තැන් වෙලා හිටපු කාලෙ අමායගෙ ළඟම ඉදලා සැප දුක බැලුවෙ ගුණවතී කියලා එයා මට කිව්වා.. එයාගෙ දරු දුක තුනී කරලා තියෙන්නෙ චෛතිය පුතා.. තමන්ගෙ නැතිවුණු මල්ලිගෙ නම දාලා තිබුණ චෛතිය පුතාට අමායගෙ හිතේ තිබුණෙ පුදුම ආදරයක්.. එයා ඒ කාලෙ එයාගෙ කුසින් වදාපු අශේන්ට වඩා ඔය දරුවට ආදරේ කළා.."

වීරවර්ධන මහතා එය කීවේ තමා දෙස ඇස පිය නොහෙලා බලා උන් චෛතිය දෙසට හැරීය.. එම කතාවය මෙතෙක් නිහඬව අසා උන් මිහිරාවි එය අනුමත කිරීමට මෙන් හිස සැලීය..

"අමායා ලෙඩ ඇදේ හිටියා උනත් ගාමිණී එයා එක්ක රණ්ඩු අල්ලන එක නතර කළේ නෑ.. කොටින්ම ගාමිණී හරි සල්ලාල චරිතයක්.. එයා ගමේ ගෑණු පස්සෙ යන එකට තමයි අමායටවැඩිපුරම තරහ ගියේ.."

ඒ ඇසුණු ගුණවතී අන් අයට නොදැනෙන සේ තම හිස බිමට නැඹුරු කරගත්තාය.. තම පුංචිඅම්මාගේ එම වෙනස දුටු නතාලිට ඇ ගැන දැඩි අනුකම්පාවක් දැණුනි..

"මේ ගල්කන්ද වලව්ව තියෙන්නෙ අමායගෙ නමට නිසා ගාමිණී අන්තිම කාලෙ අමායට හරියට කරදර කලාලු ඒක එයාගෙ නමට හරවන්න කියලා.. ඒවා දුරදිග යද්දි තමයි අමායා මට එන්න කියලා මේ අන්තිම කැමැත්ත ලිව්වෙ.. මේකෙ හැටියට.."

මොහොතකට කතාව නැවතූ වීරවර්ධන මහතා පිරිස දෙස නෙත් යොමා අවසානයේ මිහිරාවි දෙස බැලුවේය..

"මෙතන හේතුහාමිත් හිටියනං හරි.."

තමා දෙස බැලූ වීරවර්ධන මහතාට ඇ කී එම කතාව සැමගේ පුදුමයට හේතු වුණි.. ඇගේ කතාව තහවුරු කිරීමට මෙන් සිහ සැලූ ඔහු නැවත තම හඬ අවදි කළේය..

"මේකෙ හැටියට.. වලව්ව එක්ක තියෙන මේ ඉඩම අක්කර දහ හතරකට ටිකක් වැඩී.. මේකෙන් මේ පන්සල් වත්තට මායිම් වෙන කොටසින් අක්කර දෙක්ක පන්සලට ලියල දීලා තියෙනවා.. දැන් ඔය ගුණවතීලා පදිංචිවෙලා ඉන්න ගේත් එක්ක ඒ මායිමෙන් අක්කරයක් හේතුහාමිගෙ නමට ලියලා තියෙනවා.. අනික් අක්කර එකොළහයි ඔය ගල්කන්ද වලව්වයි.. සම්පූර්ණ නිරවුල් ඔප්පුවක් මගින් චෛතිය පුතාට ලියලා තියෙනවා.."

සම්මානි හා නතාලි පුදුමයෙන් විවර වූ මුව තමන්ගේ දෑතින් වසා ගත්තේත් ගුණවතී ඉකි ගසා හඬා වැළපුනේත් එකම මොහොතකය.. චෛතියනම් උන් හිටි තැන් පවා අමතකව ගල්ගැසී බලා උන්නේය.. රංග හා කලන තම මිතුරාට හදිසියේ ලද මෙම වාසනාව ගැන උද්දාමයට පත් වූ අතර ස්වාමීන් වහන්සේලා දෙනම මේ සෑම අයෙක් දෙසම උපේක්ෂාවෙන් බලාඋන්හ..

"එතකොට අන්කල් ඇතුගල හාමුටයි අශේන්ටයි.?"

තරමක් හෝ කතා කර ගත හැකි මට්ටමේ උන් විශ්ව ක්ෂණිකව ප්‍රකශ්ණයක් නැගුවේය..

"අමායා ලියලා තියෙන විදියට කවදා හරි එයාගෙ අම්මා තාත්තගෙන් එයාට උරුම වෙන දෙයක්තියෙනවානං ඒ දේවල් එයාගේ ස්වාමියටයි පුතාටයි උරුම වෙන්න ඕනෙ.. කොහොමටත්ඉතිං නීතිය ඒකනේ..

ඒ මොනවා උනත් මේ ගල්කන්ද වලව්වට එයාලගෙ කිසිම අයිතියක් නෑ.. මේක දැන් නීත්‍යානුකූලවම අයිති චෛතිය පුතාට.. මේක බොහොම පැහැදිලිව පිරිසිදුව ලියපුඔප්පුවක්.."

ඔහු වැඩිදුරටත් කරුණු පහදද්දී නතාලිට දැනුණේ ඉහවහා ගිය සතුටකි.. තමන්ගේ පවුලෙන්.. වලව් පරම්පරාවෙන් නෙරපා දැමූ තම ඥාතිවරයි හා ඇගේ පුතු දැන් ඊටත් වඩා විසල් වලව්වක හිමිකරුවන්ය..

"ඒක තමයි අම්මෙ චූටි හැම වෙලේම කිව්වෙ මේ වලව්ව අපේ කියලා.. මට ඒක දැනුයි තේරෙන්නෙ.."

චෛතිය තම සිඟිති නැගණිය වඩාගෙන ඇගේ දෙකොපුල් තදින් සිප ගත්තේය..

"ඔයාලා බය වෙන්න එපා පුතා.. මං නීතිය පැත්තෙන් මේ හැමදේම නිරවුල් කරලා දෙන්නම්.. ඔය ඇතුගලලව වලව්වෙන් අයින් කරන එක මං කරන්නම්.. ඒත් දැන්ම නෙමෙයි.. ඔයාගෙ විභාගෙ ඉවර වෙලා.. මොකද තරහ කාරයො තියාගෙන.. ප්‍රශ්න ඇති කරගෙන විභාගෙ ලියන්න බෑ.. ඒ නිසා මේ හිටියා වගේ ඔය මාස දෙකත් ඉවසගෙන ඉන්න.."

එසේ කී නීතීඥවරයා තම ලියකියවිලි සියල්ල ෆයිල් කවරය තුළට දමා වසා පුටුවෙන් නැගිට ගත්තේය..

"අමායා නැති උනාට පස්සෙ එයාගෙ ලාස්ට් වීල් එකක් තියෙනවද අහ අහා ගාමිණී මගේ පස්සෙන් ආවා.. එයා හැදුවෙ මට ලක්ෂ ගාණක පගාවක් දීලා මේක එයා අතට ගන්න.. ඒත් මං කවදාවත් මගේ යාළුවෙගෙ පවුලෙ අයට ද්‍රෝහි වුණේ නෑ.."

"තැන්ක්ස් අන්කල්.. තැන්ක්ස් අ ලොට්.."

සිය මෝටර් රථය වෙත පිය නගින වීරවර්ධන මහතා පසුපස ගිය මිහිරාවි තරමක් උස් හඬින් කීවාය.. ඇයට අත වැනූ ඔහු රථයට නැගී ඉහල ගියේ හැකි ඉක්මනින් යළි එන බවපවසමිනි..

ඔහු නික්ම ගිය පසු පන්සල තුළ නිර්මාණය වූයේ එකම සතුටු ලෝකයකි.. මෙතෙක් ගල්කන්ද වලව්වේ මෙහෙකාරිය වූ ගුණවතී මේ වන විට එහි නීත්‍යානුකූල හිමිකරුගේ මෑණියන් වී උන් අතර දුප්පත් චෛතිය විසල් ධනයක උරුමකරුවෙකු වී සිටියේය..

"චේති.. උඹට මතකද අශේන්ගෙ උපන් දිනේ දවසෙ ඇතුගල හාමු කිව්වා සම්මානි කියන්නෙ මේ  වලව්වෙ අනාගත හිමිකාරිය කියලා.. මොකද කියන්නෙ.. අපි ඒක ඇත්තක් කරමුද.?"

චේතියට සුභප තා තම රථය වෙත දිව ගිය සම්මානිව හිසින් පෙන්වූ කලන ඇසුවේ සැමදෙනාටම ඇසෙන පරිදිය..

"කොහොමටත් ඉතිං හිමිකාරිය එයා තමයි.. ඒත් ඉතිං තාම විභාගෙ ඉවර නැනෙ.. ඒ නිසා ඒක පසුවට සලකා බලමු නේද.?"

මනමාල සිනාවක් මුව රඳවා චේතිය කීවේ සැබෑවටමය.. මෙතෙක් තම දුප්පත්කම නිසා සම්මානිගෙන් ඈත් වීමට උත්සාහ දැරුවද තව දුරටත් එසේ කිරීමේ අවශ්‍යවතාවක්බුණේ නැත..

"දැන් එතකොට උඹලගෙ ගෙදර අයිතිකාරයා හේතුහාමි මාමා නේද..?"

රංගද ළමාතැනීගේ අන්තිම කැමති පත්‍රායේ වූ කරුණක් සිහි කළේය..

"දැනට ඒ ගේ අපේ.. වලව්ව ඇතුගලගෙ.. මගේ විභාගෙන් පස්සෙ අපේ ගේ හේතුහාමි මාමගෙ.. එතකොට වලව්ව මගේ.."

"ඒකනෙ  මං කවදත් කිව්වෙ.. ගුණවතී උපාසක අම්මා හරි වාසනාවන්තයි කියලා.. සංසාරගත බැඳීම් නැග දැනං හිටියට මෙහෙම බැඳීමක් මං කවදාවත් දැකල නෑ.."

චේතියගේ කතාවට සිනාසුන ලොකු හාමුදුරුවෝ එය කීවේ තවමත් කිසිවක් අදහාගත නොහැකිව කඳුළු සලන ගුණවතීටය..

"එහෙනං මේ ඇත්තො ගිහින් එන්න.. දැන් රෑ බෝ වීගෙනත් එනවා.. අපි හෙට අනිද්දා දිහාට පිරිතක් කියලා කට්ටියට සෙත් සාන්තියක් කරගමු.."

හාමුදුරුවන්ට වැඳ නමස්කාර කළ ඔවුහු පන්සල් භූමියෙන් පිටවූයේ සිතේ සතුට දෙගොඩතලා යද්දීය..

"එහෙනං චෛතිය හාමු.. අපිට යන්ඩ අවසර.."

පන්සලේ භූමියේ මායිමට වන්නට නතර කර තිබූ තම වෑන් රථය වෙත පැමිණි රංග තම මිතුරාට කීවේ එක් දණහිසක් පහත් කරගනිමිනි.. ඒ දුටු සැමට සිනහ පහල විණි..

"මං ඉතිං හාමු කෙනෙක් උනේ වෙන කවුරු නිසාවත් නෙමෙයි.. මෙන්න මේ පුංචි හුරතලේ නිසා.."

නතාලිගේ අතැගිල්ලක එල්ලී උන් තම පුංචි නැගණියව චෛතිය දෑතින් ඔසවා ගත්තේ හද පිරි සෙනෙහසිනි.

END …………..

www.sinhalaelibrary.com